දහසය වැනි සියවසේ මුල් අවධියේ සිට යුරෝපීය ප්‍රධාන බලවතුන් ත්‍රිත්වයක් වූ පෘතුගීසීන් (1505-1658), ලන්දේසීන් (1658-1796) සහ බ්‍රිතාන්‍යයන් (1791-1948) යන යටත්විජිත බල අධිකාරීන්ට සිලෝනය යටත් ව පැවතිණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම දූපතේ එතෙක් පවත්වා ගෙන ආ සමස්ත සමාජ, දේශපාලන සහ ආර්ථික පිළිවෙත් දැඩි වෙනසකට ලක් විය. පෘතුගීසීන් සහ ලන්දේසීන් මූලික වශයෙන් මෙම දූපතේ මුහුදුබඩ ප්‍රදේශවල බලය පැතිරවූ අතර, බ්‍රිතාන්‍යයෝ පසු ව සමස්ත දූපත ම තම අණසකට යටත් කර ගැනීමට සමත් වූහ. බ්‍රිතාන්‍යයන්ගේ පාලනය සිලෝනයේ සමස්ත සමාජ දේශපාලන ක්‍රමවේද වෙනස් කිරීමට තරම් ප්‍රබල වූ අතර, ඔවුන් විසින් මෙහි වාණිජ කෘෂිකර්මය ආරම්භ කරන ලදි. එහි දී කුරුඳු, කෝපි, තේ, පොල්, රබර් සහ කොකෝවා වගාව වාණිජ මට්ටමෙන් ආරම්භ කිරීම සිදු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් එතෙක් පවත්වා ගෙන ආ දේශීය ආර්ථික සහ සමාජ ක්‍රම විශාල ලෙස වෙනස් වීමකට නතු විය. එය සමස්ත සාම්ප්‍රදායික පාලන ක්‍රමය ප්‍රතිශෝධනයට තරම් ප්‍රබල වූ අතර, ඒ හේතුවෙන් විශේෂයෙන් ම ආගමික ආයතන පද්ධතියේ ක්‍රියාකාරිත්වය විශාල වෙනස් වීමකට බඳුන් විය.

ලාංකේය ආගමික ආයතන පද්ධතිය සහ කලාව අතර වූයේ ඍජු අන්තර්-සබඳතාවකි. එහෙත් යටත්විජිත බල අධිකාරියේ වර්ධනය අභිමුඛ ව එතෙක් සාම්ප්‍රදායික ව පවත්වා ගෙන ආ අනුග්‍රහකත්වය පිළිබඳ රාජ්‍ය සහ සංස්කෘතික සංස්ථා අතර තිබුණු සබඳතා බිඳවැටිණි. එසේ ම, ලංකාවේ සාම්ප්‍රදායික රාජ්‍ය පාලන විධි ක්‍රමය තුළ රාජකාරි ක්‍රමයක් පැවති අතර, නිර්මාණ ශිල්පීන්ගේ වෘත්තීය පසුබිම එමඟින් ආරක්ෂා විය (උදයංග, 2018). සිරි ගුනසිංහ (1978) විග්‍රහ කරන පරිදි, සාම්ප්‍රදායික සිත්තර ගුරුකුල අඛණ්ඩ ව පැවතීමට බලපෑ ප්‍රධාන සාධකයක් ලෙස ඒ සඳහා ලැබුණු රාජ්‍ය අනුග්‍රහය සැලකිය හැකි ය. ආනන්ද කේ. කුමාරස්වාමි ඔහුගේ 'මධ්‍යකාලීන සිංහල කලා' (1908) පොතේ සාකච්ඡා කරන ආකාරයට, දේශීය කලා කර්මාන්තවල අඛණ්ඩ පැවැත්ම රඳා පැවැත්මට බලපෑ මුඛ්‍ය සාධකය අනුග්‍රාහකත්වය බවත්, බෞද්ධ රජුගෙන් කලා ශිල්ප සඳහා ලැබුණ දායකත්වය ක්‍රිස්තියානි ආණ්ඩුකාරයකුගෙන් කෙසේ වත් අපේක්ෂා කළ නොහැක්කක් බවත් පැහැදිලි ය. කුමාරස්වාමි පවසන පරිදි:

*What befell the royal craftmen when the Buddhist King was replaced by the Christian Governor? (Coomaraswamy, 1908, pp 170)*

කුමාරස්වාමි එසේ වාද කළ ද ඓතිහාසික සාක්ෂි විමසීමේ දී ලාංකේය බෞද්ධ කලාව නිරන්තරයෙන් සංස්කෘතික සංශ්ලේෂණයට ලක් වී ඇති බව නිරීක්ෂණය වේ. ඊට එක් ප්‍රධාන හේතුවක් වන්නේ මෙම දූපත අසල්වැසි ඉන්දියාව ඇතුළු සෙසු ආසියාතික රාජ්‍යයන් සමඟ පැවැත්වූ සමීප දේශපාලන සහ සංස්කෘතික සබඳතාව වෙයි. ලෝනා එස්. දේවරාජාට (2018) අනුව මහනුවර රාජධානිය අසල්වැසි ඉන්දියාව සමඟ සමීප දේශපාලන සබඳතා පැවැත්වූ අතර, හර්ෂණ රඹුක්වැල්ල (2018) ද මෙය සනාථ කරයි. දහඅට වැනි සියවසින් පසු ප්‍රචලිත වන චිත්‍ර කලා නිර්මාණ ක්‍රමවේදය පශ්චාත්-යටත්විජිත දේශීය බුද්ධිමතුන් මහනුවර යුගයේ නිර්මාණ ලෙස හැඳින්වුව ද එය අත්‍යන්තයෙන් ම සම්මිශ්‍රණය වූ නිර්මාණ සම්ප්‍රදායකට අයත් වෙයි.

මහනුවර සම්ප්‍රදායේ නිර්මාණවලට අතිශය සමාන වන නිර්මාණ අසල්වැසි ඉන්දියාවෙන් විශාල වශයෙන් හමු වීමත්,

ඒවා සමාන්තර කාල-වකවානුවලට අයත් වීමත් මීට එක් හේතුවක් ලෙස සැලකිය හැකි ය. සිරි ගුනසිංහ විසින් 1962 සැප්තැම්බරයේ පළ වූ 'කලා' සඟරාවේ 8 වැනි කලාපයට ලියූ *මහනුවර යුගයේ සිතුවම්* යන ලිපියේ සාකච්ඡා කරන පරිදි, මෙම සිතුවම්වලට සමාන සිතුවම් දකුණු ඉන්දියාවේ පමණක් නොව සියම් දේශයේ බෞද්ධ කලාවේ ද දැකිය හැකි බවටත්, ඒවායෙන් ආභාසය ලද බවටත් තර්ක කරයි. එසේ ම, මා නව දිල්ලියේ පිහිටි ජාතික ශිල්ප සහ අත්කම් කලා ඇකඩමියේ (National Crafts Museum & Hastakala Academy) සහ ඔඩිස්සාහි 2024 දී කළ අධ්‍යයන චාරිකාවක දී මහනුවර යුගයේ සිතුවම්වලට අත්‍යන්තයෙන් සමාන පට චිත්‍ර ප්‍රදර්ශනය සඳහා තබා තිබෙන අයුරු නිරීක්ෂණය කිරීමට අවකාශය උදා විය. එසේ ම, තමිල්නාඩුවේ Bodinayakkanur Zamin palace හි ඇති 18 වැනි සියවසට අයත් සිතුවම් අත්‍යන්තයෙන් ම මහනුවර යුගයට සමාන ඒවා වෙයි (රූපය 01).



*රූපය 01 : Bodinayakkanur Zamin Palace murals (Detail), 18th century, British Library*

*මූලාශ්‍ර : Bodinayakkanur Zamin Palac Tamil Nadue, India.*

ඒවායේ නිරූපිත චිත්‍ර ලක්ෂණ මහනුවර සම්ප්‍රදාය හා සමාන වන අතර, එම නිර්මාණ අතර දැඩි සමානත්වයක් නිරූපිත ය. එහෙත් වර්තමානයේ නුවර යුගයේ චිත්‍ර කලාව පිළිබඳ රචනයේ යෙදෙන බහුතර රචකයන්ගෙන් පවා මේ කරුණ මඟහැරී ඇති බව නිරීක්ෂණය වෙයි.

හර්ෂණ රඹුක්වැල්ල (2018) විග්‍රහ කරන පරිදි, කුමාරස්වාමි ආදි ප්‍රාචීනවාදි විද්වතුන් මහනුවර රාජධානියේ සංස්කෘතිය විග්‍රහ කරන්නේ අමිශ්‍ර, නොකිලිටි සංස්කෘතියක් වශයෙනි. එහෙත්, පෙර සාකච්ඡා කළ පරිදි, මහනුවර යුගය යනු විශාල වශයෙන් ඉන්දියාව සමඟ දේශපාලන සහ සංස්කෘතික සබඳතා පැවැත්වූ සමයකි. එබැවින් කිසි සේත් ම ලාංකේය සිතුවම් කලාව මෙම ද්වීපතට අනන්‍ය වූවක් ලෙස වර්ධනය නොවූවකි. නීරා වික්‍රමසිංහ (2004) මහනුවර යුගයේ සංස්කෘතිකාංග පිළිබඳ විග්‍රහ කරන ආකාරයට, ඒවා අත්‍යන්තයෙන් වෙනස් වීමටත් දෙමුහුන්කරණය වීමටත් ලක් වූයේ වෙයි.

කුමාරස්වාමි ආදි රචකයන්ගේ අවධානය යොමු වන්නේ සමස්ත කලා සහ කර්මාන්ත පිළිබඳ ව ය. එහෙත් යටත්විජිතකරණය අභිමුඛ ව ලාංකේය බෞද්ධ චිත්‍ර කලාවේ හැසිරීම ඉතා සූක්ෂ්ම ව අධ්‍යයනය කළ හොත් 'යටත්විජිතකරණයේ ප්‍රතිඵලයක් ලෙස දේශීය චිත්‍ර කලාව වියැකී යෑම සිදු වූයේ ය,' යන තර්කය අර්ධ සත්‍යයක් බව පසක් වෙයි. මන්ද යත්: ලංකාව යටත්විජිතයක් ලෙස පැවති කාලවකවානුවේ වුව ද බෞද්ධ ගොඩනැඟිලි පාදක ව චිත්‍ර නිර්මාණකරණය අඛණ්ඩ ව සිදු වූ බවට සාක්ෂි එමට පවතින බැවිනි. 1815න් පසු ඉංග්‍රීසීන් සමග උඩරට ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරු ව මහනුවර රාජධානිය නිල වශයෙන් අවසන් විය. එහෙත් සිරිනිමල් ලක්දුසිංහ (1990) පවසන ආකාරයට, ඉන් පසුව ද එම සම්ප්‍රදායට අයත් හෝ නැකම් කියන හෝ සිතුවම්

විශාල ප්‍රමාණයක් බෞද්ධ විහාර මන්දිරයන්හි නිර්මාණය වී ඇත. එසේ ම, දකුණු ප්‍රදේශ මුල් කර ගෙන ගොඩනැගෙන බෞද්ධ පුනරුදයත් සමඟ ද සැලකිය යුතු නව විහාරස්ථාන ප්‍රමාණයක් බිහි වන අතර, බෞද්ධ සිතුවම් අතිශය ජනප්‍රිය අංගයක් බවට පත් විය. එසේ ම, බොරැල්ලේ ගෝතමී විහාර සිතුවම් මෙන් ම පසුකාලීන ව නිර්මාණය වන බෙල්ලන්විල සිතුවම් පවා විහාර සිතුවම් සම්ප්‍රදාය නොනසා ඉදිරියට ගෙන ආ ඓතිහාසික ව්‍යාපෘති වශයෙන් වැදගත් සන්ධිස්ථාන වෙයි.

උක්ත ප්‍රවාද ක්‍රමික සූත්‍රායනය උදෙසා මෙම අධ්‍යයනයේ දී රූපාන්තරණය සහ දෙමුහුන්කරණය, යටත්විජිත සමාජ පරිවර්තනය සහ විහාර චිත්‍ර කලාවට එහි බලපෑම, 20 වැනි සියවසේ මුල් භාගයේ ආගමික චිත්‍ර කලාව පිළිබඳ කෙටි දෘශ්‍ය සංස්කෘතික කියවීමක් සිදු කිරීමත්, එසේ ම අවසානයේ සොයිලියස් මැන්දිස්ගේ නිර්මාණ ක්‍රමවේදය මඟින් පිළිබිඹු වන රූපාන්තරණය සහ දෙමුහුන්කරණ ලක්ෂණ පිළිබඳ විග්‍රහ කිරීමත් කෙරිණි. එම විග්‍රහය සිතුවම් මූලික කර ගෙන කළ දෘශ්‍ය සාධක පාදක අධ්‍යයනයක් වූ අතර, සොයිලියස් මැන්දිස්ගේ නිර්මාණ මාලිගාවගේ සාර්ලිස්ගේ නිර්මාණ සමඟ සංසන්දනාත්මක ව විමසීමක් ද වෙයි. එමඟින් 'විසි වැනි සියවසේ ප්‍රථම භාගයේ දී ගොඩනැගෙන බෞද්ධ චිත්‍ර නිර්මාණ මඟින් සම්ප්‍රදායේ අඛණ්ඩතාව ආරක්ෂිතව පැවතීම සිදු වන්නේ කෙසේ ද,' යන්න පිළිබඳ විමසීමත් එමඟින් පිළිබිඹු වන සංස්කෘතික පරස්පරතා හෝ සංස්කෘතික සංශ්ලේෂණය හෝ විග්‍රහයට ලක් කිරීමත් කෙරිණි.

### *1.1. පර්යේෂණ ගැටලුව*

මෙම අධ්‍යයනයේ මුඛ්‍ය ගැටලුව වන්නේ 'කැලණි නව විහාර මන්දිරයේ නිර්මිත බිතු සිතුවම් මඟින් රූපාන්තරණ සහ දෙමුහුන්කරණ ලක්ෂණ නිරූපණය වන්නේ කෙසේ ද,' යන්න වාදයට නැඟීමයි. එසේ ම, 'යටත්විජිත සංස්කෘතියේ ස්ථායිතාව අභිමුඛ ව සම්ප්‍රදාය වියැකී යයි,' යන ඒකාකෘතිකවාදය ප්‍රශ්න කිරීමත් 'රූපාන්තරණය සහ දෙමුහුන්කරණ ලක්ෂණ මඟින් නව ක්‍රම හෝ ආකාර හෝ බිහි වන්නේ කෙසේ ද,' සහ 'ප්‍රතිවිරුද්ධ සංස්කෘතික සන්දර්භ එකට සම්බන්ධ වී නව ප්‍රස්තුත ගොඩනැගෙන්නේ කෙසේ ද,' යන්න විමර්ශනය කිරීමත් සිදු කෙරෙයි.

### *1.2. පර්යේෂණ අරමුණ*

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ කැලණි විහාර සිතුවම් මඟින් රූපාන්තරණය සහ දෙමුහුන්කරණ ක්‍රියාවලිය පිළිබිඹු වන්නේ කෙසේ දැයි අධ්‍යයනයට ලක් කිරීම ය. ඊට අදාළ සමාජ, දේශපාලන සහ සංස්කෘතික පසුබිම අධ්‍යයනයට ලක් කිරීම සහ ඒවා සංකල්පමය හෝ දෘශ්‍ය ප්‍රවේශ ආකාරයෙන් හෝ රූපාන්තරණයට හෝ දෙමුහුන්කරණයට ලක් වී ඇත්තේ කෙසේ දැයි ගවේෂණය කිරීම ද අරමුණු වෙයි. ඊට සමානුපාතික ව, 'යටත්විජිත සංස්කෘතියේ ස්ථායිතාව අභිමුඛ ව සම්ප්‍රදාය වියැකී යයි,' යන ඒකාකෘතිකවාදය තර්කයට නතු කිරීමත්, රූපාන්තරණය සහ දෙමුහුන්කරණය මඟින් ප්‍රතිවිරුද්ධ සංස්කෘතික සන්දර්භ එකට සම්බන්ධ වී, නව ප්‍රස්තුත ගොඩනැගෙන්නේ කෙසේ ද? යන්න කැලණි විහාරයේ සිතුවම් මාර්ගයෙන් අධ්‍යයනයත් අරමුණු වෙයි.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා භාවිත මුඛ්‍ය විධික්‍රමය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයයි (Qulitative Research). මූලික තර්ක ක්‍රමික සූත්‍රායනය උදෙසා ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනය සිදු කළ අතර, එම ක්‍රියාවලිය කැලණි නව විහාර මන්දිරයේ සිතුවම් සමීප නිරීක්ෂණයට ලක් කිරීම සහ මාලිගාවගේ සාර්ලිස්ගේ නිර්මාණ අධ්‍යයනය මඟින් සාක්ෂාත් කර ගන්නා ලදි. ආකෘතික අධ්‍යයනය මඟින් රූප විග්‍රහ කිරීම, සංසන්දනයට සහ පාඨනයට ලක් කිරීම සිදු කෙරිණි. ඒ සඳහා දෙමුහුන්කරණය වැනි පශ්චාත්-යටත්විජිත ඥානවිභාග ප්‍රවේශයත්, දෘශ්‍ය රූප ඥානවිභාගයට නතු කිරීම උදෙසා විශ්ලේෂණාත්මක විශ්ලේෂණ ක්‍රමවේදයත් (Descriptive Analysis Method) භාවිත කෙරිණි.

### *2.1.රූපාන්තරණය සහ දෙමුහුම්කරණය පිළිබඳ කෙටි හැඳින්වීමක්*

රූපාන්තරණය යනුවෙන් ග්‍රීක භාෂාවේ අදහස් වන්නේ වෙනස් වීම, පරිවර්තනය හෝ පරිණාමයයි (Barkan, 1986). එමඟින් සංචලනය, අඛණ්ඩතාව, නැවත නැවත සිදු වීම හෝ විවිධ විෂයයන් අතර ඇති එකිනෙකට බැඳී පවත්නා තත්ත්වය පිළිබඳව ද විග්‍රහ කරයි. එසේ ම, Sonia Muczink ගේ (2017) අදහසට අනුව රූපාන්තරණය යන්නෙන් හැඳින්වෙන්නේ යමක් ක්‍රමික ව ආකෘතික වෙනස් වීමකට පත් වීමයි. එසේ ම, ඇය තවදුරටත් විග්‍රහ කරන පරිදි, ඒ ආකාරයෙන් ක්‍රමික ව ආකෘතික වෙනස් වීමකට ලක් විය හැක්කේ භෞතික වස්තුවකට පමණක් නොවන්නේ ය; එය ඇතැම් විට ඇසට නොපෙනෙන ප්‍රස්තුතයක් වුව ද විය හැකි බවට ද තර්ක කරයි. එබැවින් යමක වෙනස් වීම යථාවාදී ව දැකිය හැක්කා සේ ම, වරෙක එය මනෝමූලික ද විය හැකි ය (Barkan, 1986). උදාහරණයක් ලෙසඃ යම් සිතුවමක අන්තර්ගත මිථ්‍යා රූපයක් රූපාන්තරණය වී ඇත්තේ කෙසේ ද යන්න ඓතිහාසික ව නිරීක්ෂණය කළ හැකි ය. එසේ රූපයක වෙනස් වීම වාස්තවික ව ගවේෂණය කළ හැකි වුව ද එසේ නොපෙනෙන යම් කිසි විශ්වාසයක, සම්ප්‍රදායක හො චාරිත්‍රයක වෙනස් වීම තාත්වික ව දැකිය නොහැකි ය. එය හඳුනා ගත හැක්කේ අපගේ පරිකල්පනය මෙහෙයවීමෙන් පමණි. උදාහරණයක් වශයෙන්ඃ සංස්කෘතික විශ්වාස වැනි දේ සැලකිය හැකි ය. ඒවායේ රූපාන්තරණය ඇසට නිරීක්ෂණය නොවන අතර (Farebrother, 2009), එවැනි සංස්කෘතිකාංගයන්ගේ රූපාන්තරණය හැදෑරීම ඥනවිභාගයෙන් සිදු කළ යුතු කාර්යයකි.

යම් දෙයකට හෝ තත්ත්වයකට තනි ව හෝ ස්වීය ව රූපාන්තරණයට පත් විය නොහැකි ය. ඊට විවිධ සාධක බලපායි. උදාහරණ ලෙසඃ සමාන්තර සමාජ, දේශපාලන, ආර්ථික සාධක ආදියේ හැසිරීම යමක රූපාන්තරණයට බලපාන තීරක සාධක වෙයි. ඉන් අදහස් වන්නේ යමක රූපාන්තරණ ක්‍රියාවලිය හඳුනා ගැනීමේ දී හෝ අධ්‍යයනයේ දී එය තනි ව නොව, ඊට බලපෑ සෙසු සාධක දෙස ද අවධානය යොමු කරමින් අධ්‍යයනය කළ යුතු බවයි. මන්ද යත්ඃ ඇතැම් ප්‍රස්තුත අපට හමු වන විට හෝ නිරීක්ෂණය වන විට පූර්ණ වශයෙන් රූපාන්තරණයට ලක් ව තිබිය හැකි බැවිනි; එසේ ම, තවත් දේවල් කාලාන්තරයක් තිස්සේ රූපාන්තරණයට පත් වෙමින් ද පැවතිය හැකි බැවිනි (Muczink, (2017). උදාහරණයක් වශයෙන්ඃ මහනුවර යුගයේ සිතුවම් අපට

මුණගැසෙන්නේ පූර්ණ වශයෙන් රූපාන්තරණයට පත් වූවක් ලෙසයි. එහෙත් අප වර්තමානයේ භාවිත කරන ඇඳුම් පැලඳුම් හෝ අප අතර පවතින වත්පිළිවෙත් සහ චාරිත්‍ර හෝ සැලකුව හොත් ඒවා අඛණ්ඩ ව රූපාන්තරණයට පත් වෙමින් පවතින්නේ වෙයි.

මෙම වාදය සංස්කෘතිය පිළිබඳ විෂය ධාරා අධ්‍යයනයට සාපේක්ෂ ව මෙසේ විග්‍රහ කළ හැකි යඃ කලාව නිරන්තරයෙන් ක්‍රමික ප්‍රගමනයට හෝ වෙනස් වීමට හෝ ලක් වීම සිදු වෙයි. එහි ප්‍රතිඵලය වන්නේ නව ආකාර, ක්‍රම සහ ශෛලීන් ආදිය නිර්මාණය වීමයි. මෙහිදී එකකට එකක් ප්‍රතිවිරුද්ධ වස්තු, සංකල්ප හෝ භාව සම්මිශ්‍රණය වීම සිදු වන අතර, එකී ප්‍රතිවිරුද්ධ ප්‍රපංචයන්ගේ සාම්‍යයෙන් නව රූප තත්ත්ව ක්‍රම ආදිය නිර්මාණය වෙයි. මින් ඇඟවෙන්නේ රූපාන්තරණය හේතුවෙන් යමක අවසානය නොව, අඛණ්ඩතාව නිර්මාණය වන බවයි (Sorensen, Friedrich, and Soholm, 2018). උදාහරණයක් වශයෙන්ඃ 'යටත්විජිත සංස්කෘතික බල අධිකාරිය අභිමුඛ ව යටත්විජිතයන්ට අනන්‍ය සංස්කෘතික අංග වියැකී යන්නේ ය,' යනු ජනප්‍රිය වාදයකි. එහෙත් උක්ත වාදය අතිප්‍රමුඛ කර ගනිමින් 'යටත්විජිත සංස්කෘතික බල අධිකාරිය අභිමුඛ ව යටත්විජිතයන්හි අනන්‍ය සංස්කෘතික අංග වියැකී යන්නේ ය,' යන චෝදනාව ඥානවිභාගයට නතු කළ හැකි ය. මන්ද යත්ඃ එමඟින් වියැකී යෑමට හෝ අතුරුදන් වීමට හෝ වඩා මිශ්‍ර වීමත් සංශ්ලේෂණය වීමත් සිදු වන බවට තර්ක කළ හැකි බැවිනි. මින් ප්‍රත්‍යමාන වන එක් අදහසක් නම්ඃ පවත්නා සියල්ල වෙනස් වන බවත්, කිසිවක් වියැකී නොයන බවත් ය. එබැවින් රූපාන්තරණය මඟින් ප්‍රතිවිරුද්ධතා නිර්මාණය වීම හෝ සට්ටන ගොඩනැඟීම හෝ සිදු නොවේ යැයි තර්ක කළ හැකි ය.

රූපාන්තරණය දෙමුහුන්කරණ ක්‍රියාවලිය හා සබැඳි, අතිශය වැදගත් සංකල්පයක් වෙයි. හෝමි කේ. බාබා වැනි පශ්චාත්-යටත්විජිතවාදි න්‍යායාචාර්යවරුන්ගේ විග්‍රහ අනුව රූපාන්තරණය පශ්චාත්-යටත්විජිතවාදි සංස්කෘතික අධ්‍යයනයේ අග්‍රස්ථානයෙහි ලා සැලකෙයි. බාබා විග්‍රහ කරන අයුරින් අන්තර්-සංස්කෘතික ක්‍රියාවලිය මඟින් ගොඩනැඟෙන්නේ දෙමුහුන්කරණය වූ අවකාශයකි. දෙමුහුන්කරණය ස්වභාව විද්‍යාත්මක පදනමක් සහිත ව, 19 වැනි සියවසේ ප්‍රචලිත වූ සංකල්පයකි. ශබ්දකෝෂ විග්‍රහයට අනුව දෙමුහුන්කරණයට යෙදෙන එක් අර්ථයක් වන්නේ 'එකට එකක් ප්‍රතිවිරුද්ධ ප්‍රස්තුත දෙකක් (සත්ත්ව හෝ ශාක) මුසු වීමෙන් නිර්මාණය වන තත්ත්වයක්' යන්න ය. එහි දී තෙවැන්න මඟින් පිළිබිඹු වන්නේ මවු ප්‍රස්තුත දෙකේ ලක්ෂණ ද සහිත ව, ඊට වඩා වෙනස්, ඊට ම ආවේණික වූ ගුණාංග සමඟ නිර්මාණය වූ නව තත්ත්වයකි. එය සත්ත්වයකු නම් *the offspring of two animals of different races, varieties, species* ලෙස සැලකෙයි. එසේ බිහි වන නව සත්ත්වයා මවු සත්ත්වයන්ගේ ලක්ෂණ සහිත ව, නව මුහුණුවරකින් බිහි වන්නෙකි.

උක්ත සංකල්පය හෝමි කේ. බාබා (2004) සමාජ විද්‍යාත්මක සහ පශ්චාත්-යටත්විජිතවාදි දෘෂ්ටියකින් විග්‍රහ කළ අතර, වර්තමානයේ දෙමුහුන්කරණ න්‍යාය ස්වභාවවිද්‍යා ක්ෂේත්‍රය අබිබවා මානවවිද්‍යා ක්ෂේත්‍රයේ විශාල වශයෙන් සාකච්ඡාවට ලක් වෙයි. එම සංකල්පය සංස්කෘතික අධ්‍යයනය හා බද්ධ කරමින් අර්ජුන් ගුණරත්න (2002) විග්‍රහ කරන්නේ වර්තමානයේ සියලු සංස්කෘතීන් එකකට

එකක් සම්මිශ්‍රණය වී ඇති බවත් පරිශුද්ධ සංස්කෘති තවදුරටත් නොපවතින බවත් ය. එසේ ම, නීරා වික්‍රමසිංහගේ (2002) විග්‍රහය වන්නේ දෙමුහුන්කරණය කලා කෘති වැනි දේවල් සමඟ ද සමානුපාත වන අතර, ඒවා ද කාලානුරූප ව දෙමුහුන්කරණයට ලක් වන බවයි. එහෙත් එය ක්ෂණයකින් සිදු වන්නක් නොව, ඇතැම් විට ඒ සඳහා දීර්ඝ කාලයක් ගත විය හැකි බවට ඇය තර්ක කරයි. චිත්‍ර ශිල්පීහු විවිධ සම්ප්‍රදායන්, සංස්කෘතීන් සහ තාක්ෂණික ක්‍රමවේද සහ මාධ්‍ය භාවිතයෙන් දෙමුහුන්කරණය වූ නිර්මාණ බිහි කරති.

බාබා තර්ක කරන පරිදි, 'යටත්විජිතකරණ ක්‍රියාවලියේ දී දේශීය සංස්කෘතීන් යටපත් කිරීමේ, වෙනස් කිරීමේ හෝ බටහිරකරණයට ලක් කිරීමේ ප්‍රයත්නය පමණක් දියත් වූයේ ය,' වශයෙන් තර්ක කිරීම හුදු ආන්තික මෙන් ම බුද්ධිගෝචර නොවන්නකි. ඒ වෙනුවට එම සමාජ, දේශපාලන සහ සංස්කෘතික ක්‍රියාවලිය පුළුල් දෘෂ්ටියකින් අධ්‍යයනය කර බැලීමට ප්‍රවේශ විවර කර දෙයි. එනම්: යටත්විජිතකරණ ක්‍රියාවලිය මඟින් අතරමැදි අවස්ථා නිර්මාණය කරනවා මෙන් ම එහි ප්‍රතිඵලයක් ලෙස දෙමුහුන්කරණය වූ සමාජ සංස්කෘතික ප්‍රවාහයක් ගොඩනැඟීම සිදු වන ආකාරය විදහා දක්වයි. ඉන් සට්ටනය හෝ විෂම ජාතිකත්වය හෝ පිළිබඳ අදහස වියැකී යයි (Sorensen, Friedrich and Soholm, 2018). විවිධත්වයෙන් යුතු සංස්කෘතික ප්‍රවාහ සහ සමාජ එකකට එකක් මුණගැසීමෙන් පරස්පර විරෝධි ක්‍රම හෝ සමාජ තත්ත්ව ගොඩනැඟීම වෙනුවට අන්තර්-සංස්කෘතික සංශ්ලේෂණය මඟින් නව අනන්‍යතා ගොඩනැඟීම සිදු වෙයි.

පෙර දී ද අවධාරණය කළ පරිදි, 'යටත්විජිතකරණයේ ප්‍රතිඵලයක් ලෙස පැවති සාම්ප්‍රදායික සමාජ සහ සංස්කෘති ක්‍රම අඩපණ වී ය,' යන්න ජනප්‍රිය වාදයක් ලෙස සැලකිය හැකි ය. එය 'චිත්‍ර කලාවට සාපේක්ෂ ව ගත හොත් සාම්ප්‍රදායික චිත්‍ර කලාව අභාවයට පත් වූයේ ය,' යන වාදයයි. එහෙත් උක්ත වාදය ප්‍රකාර රූපාන්තරණය සහ දෙමුහුන්කරණයේ දී සිදු වන්නේ චිත්‍ර ඇඳීමේ එතෙක් පැවති ශෛලියේ අඛණ්ඩතාව බිඳවැටීම ලෙස තර්ක කළ හැකි ය. එහෙත් විහාර ගෘහයන්හි සිතුවම් නිර්මාණය යන සම්ප්‍රදාය අඛණ්ඩ ව නොනැසී පැවතිණි. උදාහරණ වශයෙන්: දේශීය චිත්‍ර ඇඳීමේ එතෙක් පැවති මහනුවර යුගයේ සම්ප්‍රදාය ක්‍රමිකව බිඳවැටුණ ද, ඒ වෙනුවට නව සම්ප්‍රදායන්ගේ ආරම්භය ද ඊට සමගාමී ව සිදු වන බව නිරීක්ෂණය කළ හැකි බැවිනි. මාලිගාවගේ සාර්ලිස්ගේ නිර්මාණ සහ සොයිලියස් මැන්දිස්ගේ නිර්මාණ මඟින් පිළිබිඹු වන්නේ පෙර පැවති ක්‍රමවේදය බිඳවැටුණ ද විහාර ගෘහයන්හි සිතුවම් නිර්මාණය යන සම්ප්‍රදාය අඛණ්ඩ ව නොනැසී පවතින බවයි. එය වර්තමානයේ ද අඛණ්ඩ ව පවතින්නකි.

මෙම ක්‍රියාවලිය දෘශ්‍ය කලාවට පමණක් සීමා නො වෙයි. එම තත්ත්වය වෙනත් සංස්කෘතිකාංග මඟින් ද ප්‍රත්‍යමාන වෙයි. උදාහරණ වශයෙන් ගත හොත්: රූපාන්තරණය සහ දෙමුහුන්කරණ ක්‍රියාවලිය සිදු වීම කරණ කොට ගෙන ආගම, අධ්‍යාපනය, ආහාර, අර්ථ ක්‍රම, විලාසිතා, ඇඳහිලි ආදි මෙකී නොකී සියලු අංග වෙනසකට භාජනය වී හෝ වෙමින් ඇත. එබැවින් රූපාන්තරණය සහ දෙමුහුන්කරණ ක්‍රියාවලිය මඟින් ප්‍රති තත්ත්ව මඟහැරී, ආන්තික නොවූ සංස්කෘතික ප්‍රතිරෝධයක් ගොඩනැඟීමට අවකාශ නිර්මාණය වෙයි.

## 2.2. යටත්විජිත සමාජ පරිවර්තනය සහ චිත්‍ර කලාව

සියවස් හතරකට ආසන්න කාලයක් පුරා බටහිර ආධිපත්‍යයට හා බලපෑමට නතු වූ දකුණු හා බටහිර වෙරළබඩ ජනතාව උඩරට සිංහලයන්ට වඩා සංස්කෘතික වශයෙන් සම්මිශ්‍රණය වූ පිරිසක් ලෙස වැඩෙන්නට වූහ (Jayawardena, 2002). වර්ෂ 1815 වන තෙක් උඩරටියෝ යුරෝපීයයන්ගෙන් නිදහස් ව සිටියහ. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ට එතෙක් පවත්වා ගෙන ආ සාම්ප්‍රදායික සමාජ, සංස්කෘතික සහ දේශපාලන නිදහස සහ ජන ජීවිතය යම් තාක් දුරකට ආරක්ෂා කර ගැනීමට හැකි විය. ඊට සාපේක්ෂ ව මුහුදුබඩ ජනතාව සංස්කෘතික, ආර්ථික හා දේශපාලනික වශයෙන් උඩරටට වඩා වෙනස් ලක්ෂණ පිළිබිඹු කරන්නට වූහ.

උක්ත කරුණ 18 වැනි සහ 19 වැනි සියවස්වලට අයත් ලේඛන මෙන් ම දෘශ්‍ය සාක්ෂි ද විමසීමේ දී මනාව පිළිබිඹු වෙයි. පහතරට දේශීය ප්‍රභූන් නිරූපණය කරමින් නිර්මිත චිත්‍ර, ඡායාරූප සහ පහතරට පන්සල් චිත්‍ර මඟින් නිරූපිත දෘශ්‍ය සංස්කෘතිය මෙන් ම පහතරට ගෘහ නිර්මාණ ශිල්පය ද අධ්‍යයනයේ දී ඔවුන් බටහිරින් ලද ආභාසය මනාව පිළිබිඹු වෙයි. 1785 දී යාන් බ්‍රැන්ඩස් විසින් නිර්මාණය කරන ලද කටුසටහන් චිත්‍ර (රූපය 02) උක්ත වාදයට දෘශ්‍ය සාක්ෂි සපයයි (Wagenaar, 2016). ඔහු විසින් නිර්මිත ඉහළ සිංහල නිලධාරීන්ගේ රූප මඟින් උඩරට සහ පහතරට ප්‍රභූන්ගේ නිල ඇඳුමේ ස්වරූපය විස්තරාත්මක ව දෘශ්‍යායනය කර ඇත. එපමණක් නොව, ඊට අදාළ විස්තර නිර්මාණය මත ලිඛිත සටහන් ආකාරයෙන් සවිස්තරාත්මක ව ලේඛනගත කිරීම ද සිදු කර ඇත. නිකලස් ඩයස් අබේසිංහ අමරසේකරගේ ප්‍රතිරූපය විස්තර වන රූප සටහන් නිර්මාණ මේ අතරින් ප්‍රමුඛ වන අතර, ඔහු ලන්දේසි ආණ්ඩුකාරවරයා යටතේ මහමුදලි තනතුරක් දැරූවෙකි. ඔහු කොළ පැහැති වෙල්වට් රෙද්දෙන් නිම වූ කබායකින් සැරසී, රත්රන් පාට බැන්ඩෝලියර් එකකින් සැරසී සිටින අතර ඉණෙහි දරා සිටින කඩුව රත්රන් පැහැයෙන් යුක්ත විය. එසේ ම රන් මාලයක් උරහිස වටා පැලඳ ඇත. යටි කය කම්බායකින් සැරසී සිටින අයුරින් නිරූපිත ය.



*රූපය 02 : යාන් බ්‍රැන්ඩස්, ලන්දේසි නිලධාරීන්, මහමුදලි නිකලස් ඩයස් අබේසිංහ අමරසේකර සහ උඩරට ප්‍රභූන්, 1785, දිය සායම්. රයික්ස් කෞතුකාගාරය.*

*මූලාශ්‍ර : රයික්ස් කෞතුකාගාරය, ඇම්ස්ටර්ඩෑම්.*

ඊට සාපේක්ෂ ව උඩරට ප්‍රභූන් සාම්ප්‍රදායික නිල ඇඳුමින් සැරසී සිටින අයුරු දක්වා ඇති අතර ලන්දේසි, පහතරට සිංහල සහ උඩරට සිංහල ප්‍රභූන් අතර සංස්කෘතික පරතරය මනාව දෘශ්‍යමාන කර ඇත. පහතරට සිංහලයන් උඩරටියන්ට ප්‍රථම බටහිර අධ්‍යාපනයේ ආලෝකය (Goonetilleke, 1990) ලැබූ අතර ඔවුහු බටහිර චිත්‍ර කලාව, ගෘහනිර්මාණ ශිල්පය සහ සාහිත්‍යය ආදි සංස්කෘතිකාංග සමීප ව ඇසුරු කළහ. නීරා වික්‍රමසිංහ (2002) විග්‍රහ කරන ආකාරයට දකුණු මුහුදුබඩ ලාංකිකයෝ සංස්කෘතිමය වශයෙන් දෙමුහුන්කරණය වූ පිරිසකි. ඔවුන්ගේ ජීවන රටාව මඟින් නව සංස්කෘතික අනන්‍යතා

පිළිබිඹු කරන අතර, බටහිරට සංස්කෘතික වපසරිය පිළිබඳ වඩාත් විවෘත මනස් ඇති පිරිසක් ලෙසත් සැලකිය හැකි ය.

සොයිලියස් මැන්දිස් විසින් කැලණි විහාරයේ සිතුවම් කරන ලද හෙලේනා විජයවර්ධන සහ එම පවුලේ සාමාජිකයන් නිරූපිත සිතුවම් මඟින් ද උක්ත කරුණ ප්‍රකාශමාන ය. උදාහරණ වශයෙන්: මංගල ශිලා ස්ථාපනය (රූපය 03) නම් සිතුවමේ හෙලේනා විජයවර්ධන ඇතුළු පවුලේ සාමාජිකයෝ යුරෝපීය ආරක් ගත් දෙමුහුන්කරණය වූ වස්ත්‍රාභරණයන්ගෙන් සැරසී සිටිති.



*රූපය 03 : සොයිලියස් මැන්දිස්, මංගල ශිලා ස්ථාපනය (කොටසක්) (1930-1948).*

*මූලාශ්‍ර : නව කැලණි විහාරය, කැලණිය.*

එහි නිරූපිත ළමයි දෙදෙන යුරෝපීය ඇඳුමින් සැරසී සිටිති. ඔවුහු සියල්ලෝ සුදට හුරු වර්ණයෙන් සැදුම් ලත් වස්ත්‍රාභරණයන්ගෙන් සැරසී සුභ කර්තව්‍යයක නියැළී සිටිති. එම නිර්මාණයන්හි විජයවර්ධන මැතිනියට ප්‍රමුඛ ස්ථානයක් දෙමින් නිරූපිත ය. එය පැවති සම්ප්‍රදායට පටහැණි දෙයකි. සාම්ප්‍රදායික සමාජ සංස්ථාවක් පැවති එම අවධියේ ස්ත්‍රියක විසින් මුල්ගල් තැබීම, ධාතු කරඬුව වැඩමවීම ආදි කර්තව්‍යයන් සිදු වූයේ අවම වශයෙනි.

එවැනි සුභ කර්තව්‍ය පුරුෂයන් විසින් කළ යුතුය යන්න සාම්ප්‍රදායික මතයයි. එසේම, මෙවැනි මහා පරිමාණයේ විහාර කර්මාන්ත සඳහා අනුග්‍රාහකත්වය දැක්වීමේ දී පුරුෂ පාර්ශ්වයේ මැදිහත් වීම ප්‍රමුඛ විය. වජිර ජයතිලක (2022) සාකච්ඡා කරන පරිදි, මෙවැනි වැදගත් අවස්ථා සඳහා රාජ්‍ය මැදිහත් වීම සාම්ප්‍රදායිකව සිදු වුව ද එය මෙහි දී සිදු නො වෙයි. ඔහුගේ මතයට අනුව එය යටත්විජිත බල අධිකාරිය නොසලකා හැරීමක් ලෙස ද සැලකිය හැකි ය (ජයතිලක, 2022). නොඑසේ නම් එය සම්ප්‍රදාය බිඳීමට විජයවර්ධන පවුල තැබූ පෙරටුගාමී පියවරක් මෙන් ම ඔවුන් සතු වූ නූතනවාදී දැක්ම මෙයින් පිළිබිඹු නොවන්නේ ද යන්නත් වාද කළ යුතු කරුණු වෙයි. මාගේ තර්කය වන්නේ විජයවර්ධන පවුල සාම්ප්‍රදායික අදහස් ප්‍රතික්ෂේප කළ පිරිසක් බවකි. එසේ ම, එම ක්‍රියාවලිය මහත් උත්කර්ෂයෙන් දෘශ්‍යායනයට මැන්දිස් සතු වූ විවෘත නිර්මාණාත්මක මනස ද අතිශය වැදගත් වෙයි. මින් ගම්‍ය වන්නේ කාලානුරූප ව හැඩගැසීමට, එසේත් නැති නම් රූපාන්තරණයට සහ දෙමුහුන්කරණට දේශීය ධනේශ්වර පන්තිය සතු වූ නිසග ශක්‍යතාවත්, එසේ රූපාන්තරණයට ලක් වුව ද අභ්‍යන්තරික ව සම්ප්‍රදාය සහ දේශීයත්වය රැකීම කෙරෙහි ඔවුන් තුළ වූ දැඩි බැඳීමත් ය.

එමෙන් ම, මෙම සමාජ පන්තියේ ක්‍රියාකාරිත්වය දෙස විමසිලිමත් ව බැලීමෙන් නිරීක්ෂණය වන්නේ ඔවුන් ඉතා නිර්ලෝභි ලෙස බෞද්ධ ප්‍රබෝධය සඳහා ධන පරිත්‍යාග සිදු කළ බවකි (Jayawardena, 2019). මේ අතරින් බහුතරය ක්‍රිස්තියානි ආගම වැලඳ ගත් හෝ විවාහය ආදි සාධක මත ක්‍රිස්තියානි ආගම සමඟ සමීප සබඳතා පැවැත්වූ හෝ එහෙත් බුද්ධාගමට සමාන ව සැලකූ දානපතියෝ වූහ (Dharmadasa, 1974). ඔවුහු විශාල ප්‍රමාණයක් වූ දකුණු මුහුදුබඩ ප්‍රදේශයවල අභිනවයෙන් ගොඩනැගුණු විහාර කර්මාන්තවල ප්‍රධාන දායකයන් ලෙස කටයුතු කළෝ වෙති (ජයතිලක 2009). ඇතැම් විහාර ඔවුන්ගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් ඉදි වූයේ ද වෙයි. ජයවර්ධන විග්‍රහ කරන අයුරින්:

*The link between Sinhala merchants and Buddhist causes become strong from the 1860s onwards. When financial support began to flow into the Buddhist revival movement.. Sinhala – Buddhist merchants, plantation owners, renters and professional were among the main financial backers of the Buddhist movement (Jayawardena,2019,Pp 264 – 265)*

මින් ගම්‍ය වන්නේ යටත්විජිතකරණයේ ප්‍රතිඵලයක් ලෙස අනුග්‍රාහකත්වය අහිමි වීම පිළිබඳ වාදය අර්ධ සත්‍යයක් බවයි. මන්ද යත්: නව සමාජ ආර්ථික ක්‍රියාවලිය අභිමුඛ අනුග්‍රාහකත්වය ද රූපාන්තරණය වී හෝ වෙනස් වී හෝ ඇත්තා සේ ම අනුග්‍රාහකත්වයේ අඛණ්ඩතාව සම්පූර්ණයෙන් අඩපණ නොවූ බැවිනි. ඒ වෙනුවට සිදු වී ඇත්තේ පැවති ක්‍රමය වෙනුවට නව ක්‍රමයක් ආදේශ වීමයි.

මෙම නව ධනපති පැළැන්තියේ අනුග්‍රාහකත්වයෙන් ගොඩනැගුණු බෞද්ධ විහාරස්ථාන ප්‍රධාන වශයෙන් හමු වන්නේ ලංකාවේ දකුණු මුහුදුබඩ ප්‍රදේශය මූලික කරගෙන ය (ජයවර්ධන, 2019). එයට සමීපතම හේතුව ලෙස යටත්විජිතකරණයත් සමඟ බිහි වූ දේශීය ධනවතුන් බහුතරය දකුණු මුහුදුබඩ ප්‍රදේශයෙන් බිහි වීමත්, ඊට සාපේක්ෂ ව නව බෞද්ධ පුනරුදයේ ආරම්භය දකුණෙන් සිදු වීමත් හඳුනා ගත හැකි ය (ජයතිලක, 2009). එසේ ලැබුණු ධන පරිත්‍යාගයන්ගෙන් නිමවන ලද බහුතරයක් බෞද්ධ ගොඩනැගිලි බටහිර ගෘහ නිර්මාණ ශිල්පයේ ආභාසයෙන් නිම වූ අතර, එම විහාරස්ථානයන්හි බුද්ධ මන්දිරය අභ්‍යන්තරයේ නිර්මිත සිතුවම් බටහිර දෘශ්‍ය කලා මූලිකාංග පෙරදැරි කර ගෙන නිර්මාණය වූ ඒවා වෙයි. ඊට චිත්‍ර ශිල්පීන්ගේ පෞද්ගලික කැමැත්ත හෝ ඔවුන්ගේ නිර්මාණ ශෛලිය පමණක් ම බලපෑවේ යැයි සිතීම තාර්කික නො වෙයි. ඊට අනුග්‍රාහක පැළැන්තියේ රුචිකත්වය මෙන් ම අවබෝධය ද මූලික වූ බවට තර්ක කළ හැකි ය.

සේනක බණ්ඩාරනායකගේ සහ ඇල්බට් ධර්මසිරිගේ (2009) අදහස වන්නේ 19 වැනි සියවසේ සිට නැගී ආ සිංහල ප්‍රභූ පැළැන්තියේ පවුල් අතර ප්‍රතිරූප චිත්‍ර, භූමි දර්ශන චිත්‍ර සහ ඡායාරූප එකතු පැවති බවයි. මින් පැහැදිලි වන කරුණක් නම්: උඩරටියන්ට සාපේක්ෂ ව බටහිර දෘශ්‍ය සංස්කෘතිය පිළිබඳ ප්‍රාමාණික අවබෝධයක් දකුණේ ප්‍රභූන් සතු ව පැවති බවයි. එසේ ම ඔවුන්ගේ පැවැත්ම බටහිර පන්නයේ එකක් වූ බැවින් එම කලාව පිළිබඳ විශේෂ කැමැත්තක් සහ අවධානයක් තිබූ බව මැනවින් ප්‍රත්‍යක්ෂ වෙයි. එහි ප්‍රතිඵලයක් ලෙස දකුණු පළාතේ බිහි වූ බහුතරයක් චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ මඟින් බටහිර කලාව පිළිබඳ වූ ඇල්ම මෙන් ම ඉන් ලැබූ ආලෝකය සහ ආභාසය ද පිළිබිඹු වෙයි.

### 2.3. විසි වැනි සියවස මුල්භාගයේ බෞද්ධ විහාර චිත්‍ර කලාව

විසි වැනි සියවසේ මුල් භාගයේ ශ්‍රී ලාංකේය ආගමික චිත්‍ර කලාවේ ස්වතන්ත්‍රතාව පිළිබඳ කථිකා එකකට එකක් ප්‍රතිවිරුද්ධ ඒවා වෙයි. ඇතැම් විචාරකයෝ බෞද්ධ ආගමික කලාවේ පරිහානිය මේ යුගයේ සිදු වූ බවට තර්ක කරති. ඊට ප්‍රතිපක්ෂ ව එය එසේ නොවූ බවටත්, යටත්විජිතකරණයේ බලපෑම මත ආගමික චිත්‍ර කලාව අවසන් වීම වෙනුවට නව ආරක් ගත් බවටත් තාර්කික මතවාද ඉදිරිපත් කරති. සේනක බණ්ඩාරනායකගේ සහ ඇල්බට් ධර්මසිරිගේ (2009) අදහසට අනුව, 20 වැනි සියවස මුල් භාගයේ නිමැවූ බෞද්ධාගමික සිතුවම් සංක්‍රාන්තික යුගයට අයත් නිර්මාණ ලෙස සැලකේ. ඊට හේතුව නම්: බෞද්ධ චිත්‍ර කලාව සාම්ප්‍රදායික ලක්ෂණයන්ගෙන් සම්පූර්ණයෙන් ම පාහේ ගිලිහීමත්, ඊට සමාන්තර ව නව ආරකින් යුතු ආගමික චිත්‍ර කලාවක් බිහි වීමත් ය. මෙම වකවානුවේ ආගමික චිත්‍ර කලාවේ යෙදුණු චිත්‍ර ශිල්පීන් දෙපළක් ලෙස රිචඩ් හෙන්රිකස් සහ මාලිගාවගේ සාර්ලිස් හඳුනා ගත හැකි වෙයි. මොවුන්ගේ නිර්මාණ 20 වැනි සියවස මුල් භාගයේ ඉතා ප්‍රචලිත වූ අතර, ප්‍රධාන සිත්තරුන් දෙපළක් ලෙස ද සලකන ලදි. ඔවුන්ට චිත්‍ර ශිල්පීන් ලෙස විශාල ඉල්ලුමක් තිබූ අතර 20 වැනි සියවසේ මුල් භාගයේ නිමැවූ බහුතරයක් විහාරස්ථානයන්හි නිර්මාණ ශිල්පීන් ලෙස කටයුතු කළහ.

එතෙක් පැවති මහනුවර යුගයේ චිත්‍ර සම්ප්‍රදාය යටපත් කොට නව දෘශ්‍ය රූප නිමවීමේ ක්‍රමවේද මත පදනම් ව ගොඩනැගුණු නව්‍ය නිර්මාණ ක්‍රමවේදයක ආරම්භය මොවුන්ගේ නිර්මාණ මඟින් සලකුණු වෙයි. එමඟින් නිරූපණය වන්නේ යුරෝපා චිත්‍ර කලා රීතින්ගෙන් ලැබූ ආලෝකයත් ඉන්දීය සංස්කෘතික පරිසරයෙන් උකහා ගත් හෝ ණයට ගත් දෘශ්‍ය සංස්කෘතික අංගත් සම්මිශ්‍රණයෙන් ගොඩනගාගත් නව රූප ඇඳීමේ ක්‍රමයකි. සාර්ලිස් සහ *කලාදීප* සංස්කාරක අතර වන සංවාදයේ දී බෞද්ධ චිත්‍ර කලාව බටහිරකරණය වීම පිළිබඳ වැදගත් කරුණු ඉදිරිපත් වෙයි. සාර්ලිස් පවසන පරිදි:

> *ඒ කාලයේ රට පුරා පතළ කීර්තියක් ඇතිව සිටි ශිල්පියා තමයි රිචඩ් හැන්රිකස් මහත්මයා. ඒ මහත්මයා යුරෝපීය ක්‍රමයට සිත්තම් කළ කෙනෙක්. ජිනරාජ වංශය, සම්බුද්ධ චරිතය හා කුස ජාතකය ආදි බණ පොත්වල රිචඩ් හැන්රිකස් මහත්මයා (විසින්) අඳින ලද චිත්‍ර පළ වුණා. හැන්රිකස් මහත්මයගෙ චිත්‍ර කර්මවලට කාගෙත් සිත් ඇදී ගියා. සංඝරත්නයත් දායක ප්‍රභූනුත් හැන්රිකස් මහත්මයා (විසින්) අඳින ලද චිත්‍ර බොහෝම උසස් අන්දමින් අගය කළා.*
>
> *මෙන්න මේ අන්දමට අපේ රටේ චිත්‍ර කලාව හැන්රිකස් මහත්මයාගෙ චිත්‍ර කර්මය නිසා යුරෝපීය තාලයට වෙනස් වුණා. මහජනයා තුළ මේ ක්‍රම යුරෝපීය ක්‍රමය නිසා උසස්ය කියා හැඟීමකුත් ඒ වගේම විවිධ වර්ණ නිසා අලංකාරයට ආශාවකුත් පහළ වීම නිසා හැන්රිකස් මහත්මයගෙ චිත්‍රවලට කවුරුත් පාහේ ප්‍රශංසා කළා (කලාදීප, 1953).*

එසේ නව ආරකින් බිහි වන බෞද්ධ චිත්‍ර කලාවෙන් පිළිබිඹු වන ප්‍රධාන ලක්ෂණයක් නම් බටහිර චිත්‍ර කලාවේ මූලිකාංග පිළිබඳ වූ කැමැත්තතයි. ඉන් ගම්‍ය වන්නේ බටහිර කලාව උසස් කොට සැලකූ බවත් භික්ෂූන් පවා ඊට වැඩි ඉඩක් දුන් බවත් ය. උදාහරණ වශයෙන්: මෙම චිත්‍ර ශිල්පීහු තම නිර්මාණ සඳහා බටහිර සිතුවම්කරණයේ මූලික නිර්මාණ ප්‍රයෝගයක් වන පර්යාලෝක සංසිද්ධීන් සහ ත්‍රිමාන ලක්ෂණ පෙන්වීම අත්‍යවශ්‍ය අංගයන් ලෙස යොදා ගනිති; එමඟින් ගොඩනැඟිලි ත්‍රිමානාකාර ලක්ෂණ සහිත ව නිර්මාණය කරති. නාට්‍යාකාරයෙන් ගොඩනැගෙන සංරචන ඉතා සවිස්තරාත්මක ව චිත්‍රණය කර ඇති අතර, මානව රූප ත්‍රිමානාකාර ව මෙන්ම සජීව

අන්දමින් නිර්මාණය කිරීමට වෙර දැරා ඇත.

එසේ ම මෙම නිර්මාණ මඟින් දකුණු ඉන්දීය රංග කලාවේ අංගරචනා සහ වස්ත්‍ර නිර්මාණ ආදියෙන් ලද ආභාසය ද විශාල වශයෙන් පිළිබිඹු වෙයි. ඔවුන්ගේ ඇඳුම් පැලඳුම් මඟින් පිළිබිඹු වන්නේ ඍජු ඉන්දීය ආභාසයකි. එසේ ම ගොඩනැගිලි, ආභරණ මෙන් ම සැරසිලි නිර්මාණ මඟින් ද පිළිබිඹු වන්නේ ඉන්දීය ආභාසයයි. ඔවුන් අතිශය මටසිලිටු සාමාන්‍යයකින් යුතු හැඩ භාවිතයෙන් බුද්ධ චරිතයේ අවස්ථා මෙන් ම ජාතක කථා නිර්මාණය කළ අතර, එමඟින් ඉන්දීය චිත්‍ර ශිල්පී රාජ් රවී වර්මාගේ (රූපය 04) නිර්මාණ ක්‍රමවේදය තරමක් සිහිපත් කරයි.



*රූපය 04 : මාලිගාවගේ සාර්ලිස්. යසෝධරා සහ රාහුල කුමරු (කොටසක්). 1920.*

*මූලාශ්‍ර : ඉසිපතනාරාමය මහා විහාරය, කොළඹ.*

ගාමිණී ජයන්ත මෙන්ඩිස්ගේ විග්‍රහයට අනුව (2009) රිචඩ් හෙන්රිකස් මරදානේ ටවර් රඟහලේ රඟදැක්වූ නාට්‍ය සඳහා පසුතල ඇඳීමේ නිර්මාණ ශිල්පියකු ලෙස සම්බන්ධ වූ අතර, එම නාට්‍ය බෞද්ධ තේමා පාදක කරගෙන නිර්මාණය වූ ඒවා විය. එසේ ම එම නාට්‍ය සඳහා දකුණු ඉන්දීය ආභාසය අත්‍යන්තයෙන් ලැබුණු අතර, හෙන්රිකස්ගේ සහායකයකු ලෙස සාර්ලිස් ග්‍රෑන්ඩ්පාස් ජයතිලකාරාමයේ චිත්‍ර නිර්මාණයට සහභාගි වූ බව සඳහන් කරයි. මෙය ඔවුන්ගේ නිර්මාණ මඟින් ඉන්දීය අනන්‍යතා පිළිබිඹු වීමට බලපෑ ප්‍රධාන හේතුවක් ලෙස සාකච්ඡා වෙයි.



*රූපය 05 : Raja Ravi Varma, Krishna as envoy (Reproduction), 1890, Dimensions: 50 x 71 cm*

*මූලාශ්‍ර : Sandeep and Gitanjali Maini Foundation.*

ක්‍රමික ව මෙම නිර්මාණ ජනතාව අතර ඉතා ප්‍රබල ලෙස ප්‍රචලිත වුව ද ඒවා දෙස විචාරාත්මක ව බලන කලා විචාරකයකුට පෙනීයන්නේ ආගන්තුක බවකි. පෙර සාකච්ඡා කළ පරිදි මෙකී නිර්මාණ සඳහා ආභාසය සහ ආලෝකය යුරෝපා චිත්‍ර කලාවෙන් මෙන් ම ඉන්දීය සංස්කෘතික පරිසරයෙන් ද උකහා ගන්නා ලදි. එහෙත් එම අංග සම්මිශ්‍රණයෙන් ලාංකේය අනන්‍යතා සහිත නව සම්ප්‍රදායක් බිහි කිරීමට තරම් එම නිර්මාණකරුවන්ගේ ප්‍රතිභාව ප්‍රබල නොවූ බව පෙනී යයි. සාර්ලිස්ගෙන් පසු බිහි වන, ඔහු අනුගමනය කරන බොහෝ චිත්‍ර ශිල්පීන් විහාරස්ථාන

මුල් කර ගෙන චිත්‍ර නිර්මාණයේ යෙදුණ ද ඒවා දියුණු ආගමික කලාවක ආරම්භය සලකුණු කරන අවස්ථා ලෙස සැලකීම අපහසු ය. මන්ද යත්: එම නිර්මාණ මඟින් පිළිබිඹු වන්නේ විවිධ සංස්කෘතිකාංගයන්ගෙන් ලද සෘජු ආභාසය සහ බලපෑමත් ඒවා බෞද්ධ තේමා නිර්මාණයට භාවිත කිරීමත් පමණකි. එකී විවිධ සංස්කෘතික අංග සම්මිශ්‍රණය හෝ සුසංයෝගී කිරීම මඟින් නව නිර්මාණ ක්‍රමවේදයක් බිහි කිරීමට ඔවුන් අපොහොසත් වී ඇත.

එම චිත්‍ර මඟින් ඉන්දීය ඇඳුම් පැළඳුම්වලින් සැරසී ගත් ඝන රැවුළ සහිත රජවරුන්, සිටුවරුන් මෙන් ම සෞම්‍ය මෘදු පෙනුමෙන් යුතු බිසෝවරුන් හා ඔවුන්ගේ පරිවාර සෙනග ද චිත්‍රණය කර ඇත. ඒවා සමීප වන්නේ හින්දු කතාවල එන වීර චරිතවලට ය. කාන්තා චරිත ද අත්‍යලංකාරයෙන් නිරූපිත අතර, ඔවුන් මංගල්‍යයකට සැරසී සිටින ආකාරයක් නිරන්තරයෙන් පිළිබිඹු කරයි. චිත්‍ර මතුපිට දැකිය හැක්කේ සැණකෙළියක උද්දාමයකි. එම රූපවල මුහුණු, අඟපසඟ, හස්තමුද්‍රා ආදියෙන් ප්‍රබල අභිනයන් හෝ හැඟීම් නිරූපණයක් සිදු නොවන අතර, සියල්ලෝ ම පිරුණු ශරීරයෙන් යුත් අඟ-පසඟ ඇත්තෝ වෙති. ඒ අකාරයට සාර්ලිස් විසින් නිර්මාණය කරන්නේ අතිශය ලෞකික පරිසරයකි. එහි දී මෙම චිත්‍ර ශිල්පීන් නව චිත්‍ර ක්‍රමවේදයක් පමණක් ඉදිරිපත් කිරීමට උත්සුක වූවා යැයි නිගමනය කළ හැකි ය. ඒ හැර, ඔවුන් එතෙක් පැවති දේශීය සම්ප්‍රදායන් හෝ ඒ හා සබැඳි වර්ණ කිරීමේ ක්‍රම, හැඩ හෝ සංරචන විධික්‍රම ආදිය පිළිබඳ අවධානය යොමු නොකළේ මන්දැයි ප්‍රශ්නයක් මතු වෙයි. ඔවුන් ඒ වෙනුවට රෝමාන්තික පසුබිමක ප්‍රාචීනවාදී දෘෂ්ටියකින් බෞද්ධ කතා වස්තු නිර්මාණ කළ බවට තර්ක කළ හැකි ය. පෙර සාකච්ඡා කළ පරිදි මෙම නිර්මාණ සඳහා ධන පරිත්‍යාගයෙන් සහය වූ දේශීය ධනේශ්වර බහුතරයකට යම් ප්‍රමාණයකට හෝ බටහිර කලාව පිළිබඳ අවබෝධයක් තිබීම ද මේ චිත්‍ර ශිල්පීන්ට මෙවැනි නිර්මාණ කිරීමට සහයක් වූ බවට තර්ක කළ හැකි ය.

## *2.4. කැලණි නව විහාර මන්දිරයේ බිතුසිතුවම්*

විසි වැනි සියවසේ බෞද්ධ සිතුවම් කලාවේ වැදගත් නිර්මාණ එකතුවක් ලෙස විචාරකයෝ කැලණිය නව විහාර මන්දිරයේ සොයිලියස් මැන්දිස් විසින් නිර්මිත සිතුවම් සමූහය පිළිබඳ සාකච්ඡා කරති. සිත්තරා මෙහිදී බුද්ධ චරිතයේ සිද්ධීන් මෙන් ම ඒ හා බැඳුණු ශ්‍රී ලාංකේය ඉතිහාසයේ වැදගත් සිදුවීම් ද නිරූපණය කිරීමට විශේෂ අවධානයක් යොමු කර ඇත. ඇතැම් නිර්මාණ විශාල පරාසයක් පුරා සිතුවම් කර ඇති අතර, තවත් ස්ථාන තීරු ආකාරයට බෙදා වෙන් කර ගත් චිත්‍ර තල මත නිර්මාණය කර ඇත. මැන්දිස්ගේ නිර්මාණ පිළිබඳ විමසිලිමත් ව බලන කල එමඟින් රූපාන්තරණය සහ දෙමුහුන්කරණය වූ ලක්ෂණ පිළිබිඹු වෙයි. විසි වැනි සියවසේ බෞද්ධ සිතුවම් පිළිබඳ සාකච්ඡා කරන විට සොයිලියස් මැන්දිස් අතිප්‍රමුඛ ස්ථානයේ ලා සාකච්ඡා වන අතර ම, මෙම නිර්මාණ තීව්‍ර ලෙස දේශීය ජන විඥානය සමඟ ඒකාත්මික වී ඇති බවත් පැහැදිලි වන්නේ ය. එසේ මැන්දිස්ගේ නිර්මාණ ජන විඥානයට තරයේ සමීප වීමට කරුණු කිහිපයක් බලපා ඇත. ඒවා මඟින් සාමාන්‍ය ජනතාවට ඉතා සමීප, ඔවුන් දන්නා සහ අසා ඇති සිද්ධීන් චිත්‍ර ලෙස නිර්මාණය කර තිබීම එක් හේතුවකි. කැලණි විහාරයේ පැරණි චිත්‍ර සහ නව නිර්මාණ අතර ගොඩනැගෙන ශිල්පීය ශක්‍යතා සහ දෘශ්‍ය භාෂාව තවත් හේතුවකි. සීමිත වර්ණ ප්‍රමාණයකින් නිර්මිත, ශිල්පීයත්වයෙන්

එතරම් පූර්ණ නොවූ, මූලික වශයෙන් සම්ප්‍රදාය පමණක් අනුගමනය කරමින් නිමැවුණු මෑත මහනුවර යුගයට අයත් පැරණි විහාර ගෙය තුළ ඇති නිර්මාණවලට සාපේක්ෂව ශිල්පීය බවින් පූර්ණ වූත්, බෞද්ධ ඉතිහාසය උත්කර්ෂයට නංවන්නා වූත්, විශාල අවකාශයක නාට්‍යානුසාරයෙන් සංරචනය කර ඇති නව නිර්මාණ සමුච්චයක් නැරඹීමට බැතිමතුන් මෙන් ම කලාලෝලීන් ද මහත් උනන්දුවක් දක්වන බව පැහැදිලි ය.

මැන්දිස් තම නිර්මාණ ශෛලිය ගොඩනඟාගැනීමේ දී ආසියාවේ මහා සම්ප්‍රදායෙන් සහ යුරෝපා කලාවේ ඇතැම් මූලයන්ගෙන් ද ආභාසය ලැබා ඇත. එම ආභාසයේත්, ඔහු සතු වූ ස්වායක්ත නිර්මාණශීලි ප්‍රතිභාවේත් සම්මිශ්‍රණයෙන් කැලණියේ නිර්මාණ බිහි කළ බව පැහැදිලි වෙයි. අජන්තා, සීගිරි හෝ පොලොන්නරු තිවංක පිළිමගෙයි නිර්මාණ හෝ මඟින් පිළිබිඹු වන දෘශ්‍ය ලක්ෂණ මැන්දිස්ගේ නිර්මාණ මඟින් පිළිබිඹු වුව ද තම නිර්මාණ සඳහා ඔහු ඒවායෙන් ලබා ගන්නේ ආභාසය සහ ආලෝකය පමණකි. ඔහු අසියාවේ මහා සම්ප්‍රදාය අධ්‍යයනය කර, එය නැවත ඒ ආකාරයෙන් ම ප්‍රතිනිර්මාණය කර දැක්වීමක් නොකරයි; ඒ වෙනුවට බහු සංස්කෘතික සහ ශෛලීය ලක්ෂණ සංශ්ලේෂණය මඟින් රූපාන්තරණය වූ නිර්මාණ ක්‍රමවේදයක් බිහි කිරිම සිදු කරයි. මේ පිළිබඳ ධනපාල විස්තර ආකාරයටඃ

*Out of there masterpieces of the past in India, out of the extent ancient prescos in Ceylon,* out of traditions of the Sinhalese, Soliyas Mendis re-created *in Modern Ceylon something of his own on the walls of Kelaniya for nearly twenty years (Dhanapala, 1952, pp. 182).*

මැන්දිස්ගේ මුල්කාලීන නිර්මාණ මඟින් යුරෝපීය දෘශ්‍ය කලා රීති සහ ශෛලීන්ගේ ආභාසය පිළිබිඹු වේ. මේ බව මැන්දිස් විසින් සිතුවම් නිර්මාණය කළ කුලියාපිටියේ රණස්ගල්ල ශ්‍රී සුධර්මාරාමය සහ පිටිදූව කැලණියන්ගොඩ විහාරය (Samaraweera, Herath, Kumari, Ranasinghe and Athukorala. 2018) ආදි ස්ථානවල සිතුවම් නිරීක්ෂණයෙන් පැහැදිලි වෙයි ( රූපය 06).එහෙත් ඔහු පොලොන්නරුවේ ශ්‍රී ජයමහාරාමය, මල්වාන ලෙනගම්පොල විහාරය සහ ගිරිඋල්ල මැද්දේපෙළ විහාරය සිතුවම් කිරීමේදී ක්‍රමානුකූල ව තම ශෛලිය වෙනස් කර ගන්නා ආකාරය නිරීක්ෂණය කළ හැකි ය (රූපය 06). මෙම සිතුවම් නිර්මාණයේ දී මැන්දිස් මහනුවර යුගයේ සිතුවම් සහ පොලොන්නරුව තිවංක පිළිම ගෘහයේ සිතුවම් ( රූපය 06) නිරීක්ෂණය කළ බවත් ඉන් ආභාසය ලැබූ බවත් පෙනී යයි. උදාහරණයක් ලෙසඃ පොලොන්නරුව ශ්‍රී ජයමහාරාමය සහ මල්වාන ලෙනගම්පොල විහාරය ආදියේ ඇඳි සිතුවම් මඟින් තිවංක පිළිම ගෘහයේ නිර්මිත දේවාරාධනාව සහ මහනුවර සිත්තරා මහත් අභිරුචියකින් ඇඳි නෙලුම් මල් අත දරා සිටින භික්ෂු රූප ආදි සිතුවම් අධ්‍යයනයෙන් ලද ආභාසය තරයේ නිරූපණය වන බැවිනි. ඉන් පිළිබිඹු වන්නේ මැන්දිස්ගේ නිර්මාණ ශෛලියේ සිදු වූ රූපාන්තරණයයි. එම රූපාන්තරණය ක්ෂණික ව සිදු වූවක් නොවන අතර, එය ක්‍රමික සහ සියුම් අධ්‍යයනයක ප්‍රතිඵලයකි.



*රූපය 06 : සොයිලියස් මැන්දිස්, පිටිදූව කැලණියන්ගොඩ විහාරය (වම), මල්වාන ලෙනගම්පොල විහාරය (මධ්‍යය) සහ පොලොන්නරුව තිවංක පිළිම ගේ සිතුවම් (දකුණ).*

*මූලාශ්‍ර : පිටිදූව කැලණියන්ගොඩ විහාරය (වම), මල්වාන ලෙනගම්පොල විහාරය (මධ්‍යය) සහ පොලොන්නරුව තිවංක පිළිම ගේ සිතුවම් (දකුණ).*

මැන්දිස් කැලණිය සිතුවම් ඇඳීමේ දී විහාර ගෘහයේ අවකාශය මනාව සැලසුම් කර ගත් බව පැහැදිලි වෙයි. ඔහු සිතුවම් ඇඳීමට පූර්වයෙන් සිතුවමට අදාළ සිද්ධියේ දළ සටහනක් ඇඳීම සිදු කර ඇත. උදාහරණ වශයෙන්ඃ කැලණිය සිතුවම් ඇඳීමේ දී අදාළ සිද්ධිය කඩදාසියක් මත රේඛාවෙන් සටහන් කර, පසුව එය බිත්තියේ පිටපත් කිරීම මැන්දිස් භාවිත කළ එක් ක්‍රමවේදයකි. ඉන් ගම්‍ය වන්නේ සිතුවම ඇඳීමට පෙර අදාළ අවකාශයට ගැළපෙන ආකාරයට සිතුවම සංරචනය කර, මනා පෙර සූදානමක් ඇතුව නිර්මාණ කාර්යය කළ බවයි. නිර්මාණය කරන වස්තු විෂයයට සම්බන්ධ ඓතිහාසික දත්ත සහ ඊට අදාළ චරිත පමණක් නොව, ඒවායේ චරිත ලක්ෂණ සහ ඉරියවු පිළිබඳ පෙර අධ්‍යයනයකින් යුතුව සිතුවම් ඇඳීම සිදු කළ බවයි. එම දළ සටහන් (රූපය 07) කොළඹ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සංරක්ෂණය කර ඇත.

වියළි බදාම පෘෂ්ඨයක් මත නිර්මාණය කරන කැලණි නව සිතුවම් සඳහා භාවිත කරන මාධ්‍ය සාම්ප්‍රදායික සිතුවම් කිරීමේ ක්‍රමවේදවලින් ලද ආභාසයෙන් සිදු කරන ලද්දකි. සාර්ලිස් ආදීන් අනුගමනය කළා සේ පෙර සැකසූ, ආනයනය කළ වර්ණ කැලණියේ සිතුවම් ඇඳීමට භාවිත නොකරන මැන්දිස් ඒ වෙනුවට ස්වාභාවික දේශීය අමුද්‍රව්‍ය භාවිත කර වර්ණ සකසා ගනී.



*රූපය 07 : මැන්දිස් කැලණිය සිතුවම් ඇඳීමේ දී කළ දළ සටහන් (කොටසක්), ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සංරක්ෂණය කර ඇත.*

*මූලාශ්‍ර : ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, කොළඹ.*

කැලණියේ සිතුවම් සංරක්ෂණ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් ප්‍රකාශිත වාර්තාව ප්‍රකාරඃ

*සායම් සකස් කර ගැනීමට ප්‍රදේශ කීපයකින් ම ස්වාභාවික අමුද්‍රව්‍ය සොයා ගෙන ඇත. මකුළුමැටි, කටුනෙරෙංචි, හිරියල්, මදටිය කොළ, පාට බෙරළු, දියමිත්ත කොළ, නිල්අවරිය කොළ හා සාදලිංගම් යනාදිය මෙන් ම නොයෙක් ගස් වර්ගවල මුල් ද වර්ණ සඳහා යොදා ගෙන ඇත. මෙම වර්ණ සකස්*

*කර ගැනීමේ දී මුලින් ම කළේ තැඹිලි වතුරෙන් දිය කර රෙදි කැබැල්ලකින් පෙරා අවුවේ තැබීමයි.ජලය වාෂ්ප වී ගිය පසු බිත්තර සුදු මද, දිවුල් මැලියම්, කුරුඳු යුෂ, කජු මැලියම් සහ වර්ණ මිශ්‍ර කර ගනු ලබයි. ඉන් පසුව පල්මානික්කම් ස්වල්පයක් ද ඊට මිශ්‍ර කරනු ලැබී ය (ධර්මසිරි සහ වගාච්චි, 2003, පිටු.20).*

ඉන් විස්තර වන්නේ මැන්දිස් ආසියාතික සාම්ප්‍රදායික තාක්ෂණ ක්‍රම භාවිත කර වර්ණ නිපදවීම සිදු කළ ආකාරයකි. ඔහුගේ වර්ණ පැලටය සමාන වන්නේ සීගිරි, පොලොන්නරු සහ භාරතීය සිත්තරුන්ගේ වර්ණ තේරීමටයි. මැන්දිස්ගේ ඉන්දීය ගමනින් ලද ආභාසයන් මීට බලපෑවේ යැයි ද අනුමාන කළ හැකි ය. මන්ද යත්: මේ වකවානුව වන විට යටත්විජිත කලාවේ මූලධර්ම ප්‍රතික්ෂේප කරමින් ඉන්දීය සාම්ප්‍රදායික කලා මූලිකාංග මත පදනම් ව නව නිර්මාණ කරන ශිල්පි කණ්ඩායම් භාරතයේ බිහි වීම සිදු වූ බැවිනි. උදාහරණයක් ලෙසඃ බෙංගෝලි ගුරුකුලයේ සිත්තරුන් (රූපය 08) අතර භාරතීය රීති අනුගමනය කර සිතුවම් ඇඳීම ප්‍රකට වූ අතර, පිරිසක් සේදුම් (wash) ක්‍රමයට සිතුවම් කිරීම (Guha-Thakurta, 1922) දැක්විය හැකි ය. ඔවුහු සාම්ප්‍රදායික අමුද්‍රව්‍ය, හැඩතල මෙන් ම වස්තු විෂයයන් ද තම නිර්මාණ සඳහා භාවිත කළහ. එම ආභාසය මැන්දිස්ට ද ලැබුණු බව පුරෝකථනය කළ හැකි ය.

කැලණිය සිතුවම් නිර්මාණය වන්නේ හුනු පිරියම් කළ බිත්තියක් මත ය. එසේ ම වියළි සුමට බදාම පෘෂ්ඨයක් මත වර්ණ හැසිරවීම අභියෝගයෙකි. තව ද, දේශීය අමුද්‍රව්‍ය භාවිත කර සාදා ගත් සායම්වලින් වර්ණ මිශ්‍ර කිරීම මඟින් නව වර්ණ නිපදවීමේ සම්භාවිතාව ද සීමා සහිත ය. මහනුවර යුගයේ ශිල්පීන් එම අභියෝගය ජය ගන්නේ චිත්‍ර පෘෂ්ඨය මත පැතලි වර්ණ තැවරීමෙනි. මැන්දිස් එම අභියෝගය ජය ගන්නේ තමාට ම අනන්‍ය වර්ණ තැවරීමේ ක්‍රමවේදයක් භාවිත කිරීමෙන් බව කැලණි සිතුවම් නිරීක්ෂණයේ දී හැඳින ගත හැකි වෙයි. ඔහු ප්‍රථමයෙන් කහ හෝ රත් පැහැය පදනම් වර්ණය ලෙස සිතුවම්හි භාවිත කර ඇත (ධර්මසිරි සහ වගාච්චි, 2003).



*රූපය 08 : Abanindranath Tagore, Journey's End (1913), Dimensions: 50 x 71 cm*

*මූලාශ්‍ර : (National Gallery of Modern Art, New Delhi.*

එම පදනම් වර්ණය මත සෙසු විස්තර එකතු කිරීම අනතුරු ව සිදු කරයි. පසුව, ක්‍රමානුකූල ලෙස ඉතා කෙටි සහ සියුම් පින්සල් පහරවල් ක්‍රමික ව යෙදීමෙනුත්, රිද්මයානුකූල බාහිර රේඛා කර්ම භාවිතය මඟිනුත්, සියුම් වර්ණ ඡායායනය (shadings) මඟින් අඳුර, ආලෝකය සහ ඝනත්වය නිර්මාණය කිරීමත් සිදු කරයි. එසේ ම ඔහු ඝනත්වය පිළිබිඹු කර දක්වන්නේ අවශ්‍යය ම විටක පමණක් වන අතර, ඉන් ගොඩනැඟෙන්නේ අතිශය සෞම්‍ය චිත්‍ර පෘෂ්ඨයකි. එසේ ම, යමක ඝනත්වය මතු කර දැක්වීම උදෙසා පසුබිම දැඩි අඳුරක ගිල්වීමත්, එසේ මතු කර පෙන්විය යුතු වස්තුවේ ඇතැම් ස්ථාන ආලොකවත් කර දැක්වීමත් සිදු කරයි. එසෙම ඔහු ප්‍රධාන චරිත හෝ වස්තු හෝ සෙසු චිත්‍ර අංගයන්ට සාපේක්ෂව ආලෝකවත් ලෙස,පැහැපත්ව හෝ විශාලනය කර හෝ දැක්වීම ද උපක්‍රමයක්

ලෙස භාවිත කරයි . එමගින් නිර්මාණය වන්නේ කාව්‍යමය චිත්‍ර භාෂාවකි. මැන්දිස්ගේ වර්ණ භාවිතයේ තාක්ෂණය තවදුරටත් අවබෝධ කර ගැනීම උදෙසා සාර්ලිස්ගේ නිර්මාණ ක්‍රමය සමග සැසඳිය හැකි ය. සාර්ලිස් එළිය සහ අඳුර පිළිබිඹු කිරීමේ දී වර්ණ ඡායායනය (shadings) කර දැක්වීම දැඩිව සිදු කරයි. සාර්ලිස්ගේ ඝන වර්ණ තැවරීම සහ එළිය අඳුර දැක්වීම මඟින් පිළිබිඹු වන්නේ ඔහු ඍජු ව ම යුරෝපීය සිතුවම් මඟින් ලද ආභාසයයි. එහෙත් ඉන් දෘශ්‍යායනය වන්නේ ආගන්තුක ත්‍රිමාන බවක් මෙන් ම ඔහු සතු වූ යුරෝපීය ශිල්පීය ක්‍රම කෙරෙහි වූ නිපුණතාව සහ කැමැත්ත පමණකි. ඒ මක් නිසා ද යත්ඃ සාර්ලිස් සතු වූ යුරෝපා කලාව පිළිබඳ නිසග නිපුණතාව දේශීය අනන්‍යතා සමග බද්ධ කර ගැනීම මඟින් නව අනන්‍යතා සහිත නිර්මාණ ක්‍රමවේදයක් ගොඩනඟා ගැනීමට තරම් පසුබිමක් ඔහුට නොවූ බව පෙනී යන බැවිනි.



*රූපය 09 : අජන්තා, සීගිරිය, මහනුවර යුගයේ සිතුවම් සහ මැන්දිස් ගේ රේඛාව භාවිතය.*

*මූලාශ්‍ර : අජන්තා ගුහා සිතුවම්, සීගිරිය සිතුවම්, දඹුල්ල ගුහා සිතුවම් සහ නව කැලණි විහාරය සිතුවම් (පිළිවෙළින් වම සිට දකුණට).*

ආසියාතික කලාවේ මූලික ආකෘතික පදනම වන්නේ ලයාන්විත, රිද්මයානුකූල සහ වරෙක ක්ෂණික රේඛා භාවිතයයි. එහෙත් සොයිලියස් මැන්දිස් එම සම්ප්‍රදාය එලෙස ම අනුගමනය කළ බවක් නො පෙනෙයි. මැන්දිස්ගේ රේඛාකරණය අඛණ්ඩ සේ ම ක්‍රමානුකූල වූ එකකි. ඔහු රේඛාව යම් හැඩයක් බාහිර අවකාශයෙන් වෙන් කර දැක්වීම සඳහා භාවිත කරන අතර, අඳුර සහ එළිය අතර සීමා මායිම් වෙන් කර දැක්වීම සඳහා ද භාවිත කරයි. සීගිරියේ මෙන් ක්ෂණික හෝ වේගවත් හෝ රේඛා භාවිත නොකරන මැන්දිස්ගේ රේඛාව යාන්ත්‍රික ශික්ෂණයකින් යුතු ව ඇන්දා වූත්, එසේ ම ලයාන්විත වූත් එකකි (රූපය 09). එය සීගිරිය, අජන්තා, එල්ලෝරා ආදි චිත්‍ර නිරීක්ෂණයෙන් ආරෝපණය කර ගත් ලයාන්විත රේඛා භාවිතය පිළිබඳ අවබෝධයත්, මහනුවර යුගයේ සිතුවම්වල මෙන් ම රාජ්පුට් ආදි සම්ප්‍රදායන්හි රේඛා ඇඳීමේ දී දැකිය හැකි තාක්ෂණික ශික්ෂණයත් සම්මිශ්‍රණයෙන් ගොඩනඟා ගත්තක් ලෙස සැලකිය හැකි ය. එම සුසංයෝගයේ ප්‍රතිඵලය වන්නේ ඉතා සියුම් ලෙස එළිය සහ අඳුර දැක්වීම් අතර මායිම සටහන් කරන මෙවලම ලෙස රේඛාව ඔහුගේ ඇඳීමේ ක්‍රමවේදයේ මූලිකාංගය බවට පත් වීමයි.

තව ද, මැන්දිස් රේඛාව භාවිත කරන්නේ වස්තුවක ඝනත්වය පෙන්වීම පිළිබඳ පූර්ණ අවබෝධය සහිත ව ය. සීගිරිය සහ අජන්තා

ආදි නිර්මාණවල ආභරණ නිරූපණය පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වන්නේ එම සිත්තරුන් සතු වූ සනත්වය මෙන් ම ඒවා ත්‍රිමාන ශරීර අවකාශය සමඟ සම්බන්ධ වන ආකාරය යථාවාදී ව ඇඳ දැක්වීමට තරම් වූ නිර්මාණාත්මක කුසලතාවයි. මැන්දිස් තම රේඛා භාවිතයේ දී එම සිද්ධාන්ත මනාව අධ්‍යයනය කර සිට ඇති බව පැහැදිලි ය. එමගින් ඔහු මානව රූප, සත්ත්ව රූප, ගෘහ භාණ්ඩ, ගෘහ නිර්මාණ අවකාශ මෙන් ම කඳු ගස් ආදි ස්වාභාවික වස්තු ද ඉතා සංයමයෙන් නිර්මාණය කළ බව විද්‍යමාන වෙයි. තව ද එම වස්තූන්ගේ රිද්මය, වයනය මෙන් ම සනත්වය උද්දීපනය වන ආකාරයෙන් ඉතා සියුම් ව රේඛාව හැසිරවීම සිදු කර ඇත. එය 20 වැනි සියවස මුල් භාගයේ නිර්මාණකරණයේ යෙදුණු ආගමික චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ කෙරෙන් පිළිබිඹු වන්නේ නැති තරම් ය. ඔවුන් මූලික අවධානය යොමු කරන්නේ ආයාසයෙන් එළිය සහ අඳුර දැක්වීම මගින් යුරෝපා සිත්තරුන්ගේ නිර්මාණ හා සමපාත වන චිත්‍ර පෘෂ්ඨයක් නිමැවීමට ය.

තම නිර්මාණයන්හි පර්යාලෝකය දැක්වීමේ දී මැන්දිස් මූලික වශයෙන් භාවිත කරන්නේ ද රේඛාව ය. මැන්දිස් ඍජු යාන්ත්‍රික රේඛා භාවිතයෙන් ගොඩනගන ගෘහ නිර්මාණ අවකාශ මගින් සිතුවම්හි ගැඹුර ගොඩනගන අතර ම, ඊට අමතර ව අඳුර සහ ආලෝකය අතර වර්ණයන්ගේ තීව්‍රතාව දෝලනය කිරීම මගින් ද චිත්‍රයේ ගැඹුර නිර්මාණය කරයි. මෙහි දී ඔහු ඉතා පරිස්සමින් වර්ණ ප්‍රභේද භාවිත කරයි. එය යුරෝපා ශිලපීන්ගේ අඳුර සහ ආලෝකය දැක්වීමේ ක්‍රමවේදයට කිසි සේත් සමාන නැත. වර්ණ තීව්‍රතාවේ විශාල පරතරයක් මැන්දිස්ගේ නිර්මාණ කෙරෙන් දක්නට නොලැබෙන අතර ම, එය සාක්ෂාත් කර ගන්නේ වර්ණයේ පැහැය සහ රේඛාව ඔහුට ම අනන්‍ය වූ සංයමයකින් ක්‍රමානුකූල ව හැසිරවීම මගිනි. එසේ ම, සිතුවම්කරණයේ දී පර්යාලෝක රීති භාවිත කරන්නේ සිත්තම් කළ වස්තුවිෂයයේ අවශ්‍යතාවට සහ එහි අර්ථ උත්තීරණයට මිස, හුදු තාක්ෂණික කාර්යයක් ලෙස සලකා නොවීම ද විශේෂත්වයකි.

මැන්දිස්ගේ මානව දේහ නිරූපණය සම්ප්‍රදාය රැකීමක් නොව, එය උත්තීරණය කිරීමකි. දිගටි මානව රූප ලයාන්විත ඒවා වන අතර, ඉන් පිළිබිඹු වන්නේ ආසියාතික මුහුණුවරකි. සාර්ලිස්ගේ නිර්මාණ කෙරෙන් පිළිබිඹු වන පිරුණු අඟපසඟින් යුත් සෞම්‍ය අතිශයෝක්තියට පාත්‍ර කළ මානව රූප වෙනුවට කාය ව්‍යූහ විද්‍යාව පිළිබඳ මනා අවබෝධයකින් නිර්මිත ආසියාතික ශරීර මැන්දිස් නිර්මාණය කරයි (රූපය 10). මැන්දිස් සතු වූ දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ අවබෝධය මීට ඉවහල් වූවාට නොඅනුමාන ය. ජයතිලක මේ පිළිබඳ දරන්නේ වෙනත් අදහසකි. ජයතිලකට අනුවඃ

*යුරෝපීය ශාස්ත්‍රාලයීය කලාව අනුදත් කාය ව්‍යූහ ලක්ෂණ මත පදනම් වූ මානව ශරීර බැහැර කිරීම නව කැලණි විහාර සිතුවම්වල තවත් වැදගත් ලක්ෂණයකි. අස්ථි හා මාංසපේශිවල ස්වාභාවික සැකැස්ම ගුරු කොට ගත් ශරීර වෙනුවට දිගටි, නම්‍යශීලි ලාලිත්‍යයෙන් යුතු සිරුරු සොයිලියස් මැන්දිස් හඳුන්වා දී තිබේ (ජයතිලක, 2022, pg.184).*

ජයතිලක මෙම වාදය ගොඩනගන්නේ හුදෙක් 'කැලණි සිතුවම් මගින් යටත්විජිත ක්‍රමය ප්‍රතික්ෂේප කළේ ය,' යන මතය තහවුරු කිරීම මත පදනම් ව පමණක් විනා, ඒ පිළිබඳ ගැඹුරු අධ්‍යයනයකින් හෝ ඥානවිභාගයකින් නොවන බව පැහැදිලි ය. මන් ද යත්ඃ චිත්‍ර ශිල්පියකු වශයෙන් මා සතු දැනුමට අනුව කාය ව්‍යූහ ලක්ෂණ මැන්දිස් ප්‍රතික්ෂේප කළා නම් ප්‍රතිඵලය විකාරරූපි එකක් විය හැකි වූ බැවිනි. මා මෙහි තර්ක කරන්නේ 'මැන්දිස් ශෛලීගත ආකාරයෙන්

මානව රූප නිරූපණය කළ ද, ඒ හේතුව මත කාය ව්‍යූහ ලක්ෂණ ප්‍රතික්ෂේප කළ නොහැකි ය,' යන මතයේ පිහිටමිනි. උදාහරණ වශයෙන්: කාය ව්‍යූහ ලක්ෂණ උත්කර්ෂයට නැංවූ ග්‍රීක මූර්ති ශිල්පීහු පරමාදර්ශී මානව රූප නිරූපණය උදෙසා මානව සිරුරේ පරිමාණ වෙනස් කර නිරූපණය කළහ (Tobin,1975). එසේ ම සීගිරි ශිල්පියා මෙන් ම අජන්තා ශිල්පීන් ද ශෛලීගත රූප නිර්මාණය කළ ද ශරීරයේ අවයවයන්හි පිහිටීම පිළිබඳ මනා අවබෝධයකින් සහ අධ්‍යයනයකින් එය සිදු කළ බව නිරීක්ෂණය වෙයි.



*රූපය 10 : සොයිලියස් මැන්දිස් මානව සිරුරේ, කාය ව්‍යූහ ලක්ෂණ, නම්‍යශීලිත්වය සහ රිද්මය නිවැරදිව නිරූපණය. නව කැලණි විහාරය.*

*මූලාශ්‍ර : නව කැලණි විහාරය, කැලණිය.*

මැන්දිස් මානව සිරුරේ නම්‍යශීලිත්වය සහ රිද්මය පිළිබඳ විශේෂ සැලකිල්ලක් දැක්වා ඇත. එසේ ම මුහුණේ ප්‍රකාශනයෙන්, හස්ත මුද්‍රා සහ සරුරේ ඉරියව් මඟින් භාව උද්දීපනය වන අයුරින් චිත්‍රණය කර ඇත. නර්තන ශිල්පියකු තම ශරීරයේ නම්‍යශීලි බව, බැල්ම සහ හස්ත මුද්‍රා සූක්ෂ්ම අයුරින් හසුරවමින්, හැඟීම් සහ හැඩ ජනනය කරන්නේ කෙසේ ද, මැන්දිස් ද මානව ශරීරයේ රිද්මය සහ නම්‍යශීලි බව කාව්‍යාත්මක ව තම නිර්මාණ සඳහා භාවිත කරයි. මැන්දිස් මෙම ලක්ෂණ රූපයෙන් රූපයට අවස්ථානුකූල ව වෙනස් කරමින් නිරූපණය කරයි. ත්‍රිභංග ඉරියව්, හිසෙහි පිහිටීම, මුහුණෙහි භාව සහ එහි බැල්ම මෙන් ම හස්ත සංඥා භාවිත කර ඇත්තේ සවිඥානක ව සහ නාට්‍යානුසාරයෙනි. මැන්දිස් නිර්මාණය කරන වස්තු විෂයයට අදාළ සංසිද්ධිය වඩාත් තීව්‍ර ලෙස දෘශ්‍යායනය වන අයුරින් ශරීරාංග චිත්‍රණය කර ඇති අතර, මැන්දිස් භාරතීය නර්තන විලාස මඟින් යම් ආභාසයක් ලබා ඇති බව නිරීක්ෂණය වෙයි.

මැන්දිස්ගේ මානව රූප නිරූපණයේ අනෙක් වැදගත් ම ලක්ෂණය වන්නේ ඒවා ඍජු මෙන් ම පෞරුෂයෙන් අනූන රූප ලෙස නිර්මාණය කිරීම ය. සාර්ලිස්ගේ මානව රූප අධ්‍යයනයේ දී පසක් වන ලක්ෂණයක් වන්නේ එම රූප අජීව, යාන්ත්‍රික මෙන් ම ඒකාකාරී බවකින් නිරූපණය වී තිබීම ය. ඔහුගේ සිතුවම්වල හැඟීම් නිරූපණය අල්ප ය. අඟපසඟ නිරූපණය කර ඇත්තේ ද ඒකාකාරී බවකිනි. තව ද, මේ යුගයේ යටත්විජිත චිත්‍රශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යයනය කළ හොත් ඔවුන් දේශීය මානව දේහය නිරූපණය කළේ කාලවර්ණ, කුදු වූ, අඩ නිරුවත් ශරීර සහිත (Tobin, 1999) ඒකාකෘතික ක්‍රමයකට ය. එහෙත් දැඩි යටත්විජිත පසුබිමක වුව ද මැන්දිස්ගේ

නිර්මාණ මගින් නිරූපිත දේශීය දේහය ඍජු, ජවසම්පන්න අභිමානවත් එකකි. එම දේහය නිරූපණය සඳහා ඔහු යොදා ගන්නේ ගුරු, දුඹුරු මෙන් ම හිරියල් වර්ණයේ ප්‍රභේද ය. එය සාර්ලිස් විසින් නිර්මාණය කළ සුමට, සෞම්‍ය, රෝස පැහැයට හුරු මානව දේහ වර්ණයට වඩා දේශීය ජන විඥානයට සමීප වූවකි.

මැන්දිස්ගේ නිර්මාණයන්හි පසුබිම දැක්වීම ද විශේෂිත ය. ඔහු ගොඩනැඟිලි, ගස්කොළන්, කඳු ආදිය ඇඳ දක්වන්නේ නරඹන්නා තුළ විශ්වසනීයත්වය ගොඩනැඟෙන පරිදි ය. මෙම කරුණ වඩාත් පැහැදිලි කර ගැනීම උදෙසා සාර්ලිස්ගේ චිත්‍රවල පසුබිම දැක්වීම සමඟ සංසන්දනය කළ හැකි ය. සාර්ලිස්ගේ චිත්‍ර පසුබිම විවිධ අලංකරණ අංගයන්ගෙන් සමලංකෘත වූ එකකි. යුරෝපීය ශෛලියෙන් නිර්මිත, මලින් බර ගහකොළ මෙන් ම, බටහිර ශෛලියෙන් නිරූපණය කළ මෝගල් හෝ භාරතීය හෝ ගෘහ නිර්මාණ ශිල්පය උත්කර්ෂයට නංවන ගොඩනැඟිලි ආදිය මඟින් නිර්මාණය වන්නේ ඇස පිනවන අලංකාරෝක්තියක් පමණි.

එහෙත් මැන්දිස් ඉතා ශූර ලෙස තම නිර්මාණයන්හි පසුබිම නිරූපණය කරයි. ඔහු විසින් අඳිනු ලබන ගහකොළ මෙන් ම ගොඩනැඟිලි මඟින් සිදු වන්නේ චිත්‍රයෙන් නිරූපිත කතා වස්තුවට අවශ්‍ය දෘශ්‍ය පසුබිම මෙන් ම මනෝභාව නිර්මාණය කිරීමකි. උදාහරණයක් වශයෙන්: මංගල ශිලා ස්ථාපනය (රූපය 03) යන සිතුවම නිරීක්ෂණය කළ හොත් මැන්දිස් එම අවස්ථාවට අදාළ පසුබිම නිරූපණයේ දී ගොක්කෙළ සැරසිලි ආදි දේශීයත්වය පිළිබිඹු කරන සැරසිලි, පුන්කලස් සහ සාම්ප්‍රදායික පිත්තල පහන් ආදිය භාවිත කර ඇත්තේ අදාළ අවස්ථාව තත්ත්වාකාරයෙන් පිළිබිඹු කිරීමට ය. එසේ ම එමඟින් නරඹන්නා තුළ අදාළ සිතුවමින් නිරූපිත වස්තුවිෂයය පිළිබඳ විශ්වසනීයත්වයක් මෙන් ම සමීප සංස්කෘතික සබැඳියාවක් ද නිර්මාණය කරයි. ඔහු සාම්ප්‍රදායික දේශීය ශාක සැරසිලි මෙන් ම නිවර්තන කලාපීය පරිසරයේ ශාක හා සත්ත්ව රූප සැරසිලි ආදිය ඉතා සූක්ෂ්ම ලෙස තම නිර්මාණ වෙත දායක කරගනු ලබයි.

මැන්දිස්ගේ නිර්මාණ කෞශල්‍යය පිළිබඳ විග්‍රහ කරන දියෝගු බඩතුරුගේ ධනපාල පවසන අයුරින් මැන්දිස්ට සිතුවම් ඇඳීමේ නිසල කුසලතාවක් තිබුණා මෙන් ම ඉතිහාසය හැදෑරීම පිළිබඳ ඇල්මක් ද වූ බවයි. ධනපාලට අනුව:

*The late Mr. D.C. Wijewardene who was in charge of the execution of work in the new section of the Kelaniya Temple went in serch of his remarkable man to his home. He found him not only a good painter but also a great student of history (Dhanapala, 1962, pg. 182).*

මැන්දිස් සතු වූ බෞද්ධ ඉතිහාසය පිළිබඳ පෘථුල දැක්ම සහ පුරාවෘත්ත ලෙස පැවත එන්නා වූ සංසිද්ධි දෘශ්‍ය රූපක ලෙස ප්‍රතිනිර්මාණය කිරීමට වූ ශක්‍යතාව නව කැලණි විහාර සිතුවම් නිරීක්ෂණයේ දී පැහැදිලි වන තවත් ප්‍රධාන සාධකයකි. එය කලාකරුවකුට පහසු කාර්යයක් නොවන්නේ ය. ජාතක කතාවක් නිර්මාණය කරන්නේ නම් ඊට අදාළ සංසිද්ධි ජාතක කතාවේ ඉතා සවිස්තරාත්මක ව විග්‍රහ කෙරෙයි. එසේ ම එම අවස්ථාවට අදාළ චරිත මෙන් ම පසුබිම ද එහි මනාව විග්‍රහ වෙයි. එහෙත් ඓතිහාසික සිද්ධියක් චිත්‍රණය කිරීම පහසු කාර්යයක් නොවන්නේ ය. ඒ සඳහා චිත්‍ර ශිල්පියා සතු ව ඉතා ශූර කතා කීමේ හැකියාවක් මෙන් ම නෘත්‍ය විද්‍යාත්මක දෘෂ්ටියක් ද තිබිය යුතු ය. චරිතවල හැඩරුව කෙසේ විය යුතු ද,

අදාළ අවස්ථාව නිරූපණයට සුදුසු ම භාවය, ඒ සඳහා සුදුසු සංරචන සිද්ධාන්ත සහ වර්ණ කිරීමේ ක්‍රමවේද ආදිය පිළිබඳ පූර්ව නිගමන අතිශය වැදගත් වන කරුණු ය.

මැන්දිස්ගේ නිර්මාණ නිරීක්ෂණයේ දී පැහැදිලි වන තවත් කරුණක් වන්නේ විවිධ අවස්ථා නාට්‍යානුසාරයෙන් සහ චලනය නිරූපණය වන ලෙස නිර්මාණය කර දැක්වීමට ඇති හැකියාව යි. සීගිරි ශිල්පියා චලනය මනාව තම නිර්මාණ සඳහා යොදා ගත් බව වේගවත් පින්සල් පහරවල්, කඩඉරි සහ ක්ෂණික වර්ණ භාවිතය ආදියෙන් පැහැදිලි වෙයි. එසේ ම මැන්දිස් නිර්මාණය කරන්නේ ද සක්‍රීය ජව සම්පන්න සංසිද්ධි ය. එය නිශ්චල දෘශ්‍ය ප්‍රකාශනයක් නොවන්නේ ය. මෙම නිර්මාණවලින් නිරූපිත පුද්ගල චරිතවල හැසිරීම මෙන් ම ඉරියවු ද එකකට එකක් වෙනස් වෙයි. උපේක්ෂාව, භය සහ ත්‍රාසය අවස්ථෝචිත ව භාවිත කරයි. වේගය සහ ආලෝකය ජවනිකාවෙන් ජවනිකාවට වෙනස් වෙයි. ඔහුගේ චිත්‍රවල ගහකොළ රිද්මයානුකූලව ඇඳ ඇති අතර, ඒවා අවස්ථාවට ගැළපෙන අයුරින් නිරූපිත ය. එසේ ම වරෙක පසුබිමේ ඇති කැටි වලාකුළු සිතුවමට එක් කරන්නේ සුන්දරත්වයක් මෙන් ම විවිධ රසභාවයන් ය. මානව රූප, ගොඩනැඟිලි, ගහකොළ පිළිබඳ පූර්ණ අවධානය යොමු කරනවා මෙන් ම දියසුළියක ස්වභාවය, වියනක රැලි වැටෙන්නේ කෙසේ ද සහ එය ගැටගසා ඇති වරපට සත්‍ය වශයෙන් ම පිහිටා ඇත්තේ කෙසේ ද ආදි සියලු කරුණු පිළිබඳ පූර්ණ අවධානය යොමු කර ඇත. සාර්ලිස්ට එවන් පරිචයක් තම නිර්මාණ මඟින් ප්‍රකට කිරීමට හැකි වූයේ නැත.

එපමණක් නො ව, මැන්දිස් ඇතැම් සංසිද්ධි චිත්‍රණය කිරීමේ දී ඒ සඳහා අවශ්‍ය දැනුම ගවේෂණය උදෙසා දෘශ්‍ය නිදර්ශන අධ්‍යයනය කළ බව නිරීක්ෂණය වෙයි. උදාහරණ වශයෙන්: මැන්දිස් හෙලේනා විජයවර්ධන සහ එම පවුලේ පවුලේ සාමාජිකයන් දැක්වෙන මංගල ශිලා ස්ථාපනය, කැලණි විහාරයේ ධාතු කරඬුව දරා සිටින අවස්ථාව, කැලණි විහාර පෙරහර ආදි සිතුවම් නිර්මාණයේ දී එහි පෙනී සිටින විජයවර්ධන පවුලේ සාමාජිකයන් නිරූපණය කරන්නේ ඔවුන්ගේ අනන්‍යතා හඳුනා ගත හැකි අයුරිනි (රූපය 11). මා මෙම අධ්‍යයනයේ දී හෙලේනා විජයවර්ධන සහ එම පවුලේ පවුලේ සාමාජිකයන් පෙනී සිටි ඡායාරූප අධ්‍යයනය කළ අතර, මැන්දිස් ඔවුන් හඳුනාගත හැකි ලෙස තම සිතුවම්හි නිරූපණය කර ඇති බව එමඟින් තහවුරු විය. එහි දී ඔහු බටහිර සිතුවම් ඇඳීමේ පූර්වාදර්ශ යම් පමණකට භාවිත කරනු දැකිය හැකි අතර, එම රූප මඟින් මෙන් ම ඒවායේ සංරචනයෙන් ද ඡායාරූමය ලක්ෂණ විශද වෙයි.



*රූපය 11 : හෙලේනා විජයවර්ධන (ඡායාරූපය කොටසක්) සහ මංගල ශිලා ස්ථාපනය (කොටසක්) සිතුවමේ නිරූපිත හෙලේනා විජයවර්ධන ගේ රුව. නව කැලණි විහාරය.*

*මූලාශ්‍ර : (වම) J. R. Jayewardene in Pictorial Retrospect by K. D. Paranavitana (දකුණ) නව කැලණි විහාරය, කැලණිය.*

එම සිතුවම්හි පිළිබිඹු වන ආකාරයට විජයවර්ධන පවුල සැරසී සිටින්නේ දේශීයත්වය පිළිබිඹු වන ආකාරයේ ඇඳුම් පැලඳුම්වලින් නො වේ. ඔවුහු එවකට ඉහළ සමාජය අතර වඩාත් ප්‍රකට ව පැවැති ඇඳුම්

මෝස්තරවලින් සැරසී සිටිති. ඒවා යුරෝපීය මෝස්තර මෙන් ම දේශීය මෝස්තර ද එක් වී ගොඩනැඟුණු, දෙමුහුන්කරණයට නතු වූ වස්ත්‍ර ය. විහාර කර්මාන්තයක් කිරීමේ දී අනුග්‍රාහකයන්ගේ මූර්ති නෙළීම මහනුවර යුගයේ ඇතැම් විහාරස්ථානවල දැකිය හැකි ලක්ෂණයකි. මැන්දිස් එම සම්ප්‍රදාය ඉදිරියට ගෙන යමින් විජයවර්ධන පවුලේ සාමාජිකයන් දැක්වෙන නිර්මාණ සිතුවම් කරන අතර, අනුග්‍රාහකයන්ගේ රූප විහාර අවකාශයේ නිරූපණය සාර්ලිස් විසින් ද කළ බව නිරීක්ෂණය වෙයි. සාර්ලිස් එය සිදු කළේ හුදු අනුග්‍රාහකයන්ගේ රූප නිරූපණය කර දැක්වීමේ අරමුණින් වුව ද මැන්දිස් එය සිදු කරන්නේ විජයවර්ධන පවුලේ ශාසන මාමකත්වයේ ඓතිහාසික වැදගත්කම මෙන් ම සම්ප්‍රදායන් අබිබවා යෑමට ඔවුන් සතු බලය ද නිරූපණය වන අයුරිනි.



*රූපය 12 : සොයිලියස් මැන්දිස් (1930-1948) රාමඤ්ඤ භික්ෂූන්ට උපසම්පදාව පිහිටුවීම සඳහා ආරාධනය (කොටසක්). නව කැලණි විහාරය.*
*මූලාශ්‍ර : නව කැලණි විහාරය, කැලණිය.*

මැන්දිස්ගේ ගවේෂණාත්මක සිතුවම් කිරීම පිළිබිඹු වන තවත් අවස්ථා ලෙස වස්ත්‍රාභරණ නිරූපණය, සත්ත්ව රූප නිරූපණය මෙන්ම ගෘහ නිර්මාණ අවකාශ, විවිධ උපකරණ සහ නාවික යාත්‍රා ආදි සෙසු අංග ඇඳ දැක්වීම වැදගත් වෙයි. ඔහු වස්ත්‍රාභරණ නිරූපණයේ දී ඒවා සමීප ව අධ්‍යයනය කර ඇත. ඒ බව ඕලන්ද අධිපතීන් සහ සොල්දාදුවන් දැක්වෙන සිතුවම් නිරීක්ෂණයෙන් මෙන් ම රාමඤ්ඤ භික්ෂූන්ට උපසම්පදාව පිහිටුවීම සඳහා ආරාධනය ආදි සිතුවම් විමසීමෙන් ද පැහැදිලි වෙයි.

එම සිතුවම්වල ඒ ඒ අවස්ථාවට ගැළපෙන ඇඳුම් පැළඳුම් මෙන් ම ගෘහ අවකාශය ද අදාළ අවස්ථාවට උචිත පරිදි නිරූපිත ය. උදාහරණ වශයෙන්: රාමඤ්ඤ භික්ෂූන්ට උපසම්පදාව පිහිටුවීම සඳහා ආරාධනය සිතුවමේ ගෘහ අභ්‍යන්තරය බුරුම සංස්කෘතික ලක්ෂණ මැනවින් අධ්‍යයනය කොට සිතුවම් කර ඇති බව නිරීක්ෂණය වෙයි. එම අධ්‍යයනයන් ඡායාරූප ආශ්‍රයෙන් කළ බවට උපකල්පනය කළ හැකි ය (රූපය 12). එසේ ම ගවයන්, ඇතුන්, අශ්වයන් මෙන් ම සුනඛයන් පවා ඇඳ දක්වන්නේ ඔවුන්ගේ කාය ව්‍යූහ ලක්ෂණ මනාව පිළිබිඹු වන අයුරිනි.

මැන්දිස් තම චිත්‍ර තලය සංරචනය කරන්නේ අදාළ වස්තු විෂයයට සමානුපාතික ව ය. මෙම යුගයේ නිර්මාණය වූ බහුතර පන්සල් චිත්‍රයන්හි ආකෘතිය වන්නේ ප්‍රධාන චරිතය මධ්‍යගත ව නිර්මාණය කර, සෙසු චරිත ඒ වටා ස්ථානගත කිරීම ය. මුල් අවධියේ මැන්දිස් ද මෙම ක්‍රමය අනුගමනය කළ බව නිරීක්ෂණය වන නමුත් කැලණි සිතුවම් නිර්මාණයේ දී එම ක්‍රමය අතික්‍රමණය කරයි. ඔහු විවිධ කෝණවලින් ප්‍රධාන ජවනිකා නිරූපණය කරන අතර, අදාළ සිද්ධියට සබැඳි අනු සිද්ධීන් ද විශේෂ අවධානයකින් චිත්‍රණය කර දක්වයි. උදාහරණයක් වශයෙන්: නාගදීපං සිතුවම නිරූපණයේ දී එම සිද්ධිය දෙස ඉහළ කෝණයක සිට බලන අයුරින් සංරචනය කර ඇති අතර, ලක්දිවට සිරි මා බෝ වැඩමවීම සිතුවම නිරූපණයේ දී ඉතා පහළ ස්ථානයක සිට එය දකින අයුරින් නිරූපිත ය. එසේ ම චිත්‍රය අරා විහිදී ඇති සියලු ප්‍රස්තුතයන්ට එක සේ අවධානය යොමු කරන අතර, ඇතැම් සිද්ධි නිරූපණයේ දී එය නිරූපණය කරන්නේ පැනෝරාමා දර්ශනයක් ලෙසිනි.

එසේම මැන්දිස් තම සිතුවම් නිර්මාණයේ දී වරෙක සිද්ධි කිහිපයක් එක චිත්‍ර තලයක සිතුවම් කර දක්වයි. එම අවස්ථාවන්හිදී සිද්ධියකින් අනෙකන් වෙන් කිරීමේ උපක්‍රමයක් ලෙස ගසක්, ලියවැලක් හෝ විටෙක ජ්‍යාමිතික හැඩයක් භාවිත කරයි. උදාහරණ වශයෙන්: කැලණිතිස් තෙරුන් තෙල් කටාරමෙහි ධ්‍යාන සුවයෙන් වැඩ හිඳීම, ඇමැතියන්ගේ ධර්මාවවාද අසාත් රජු සන්තෝෂ නොවීම සහ දේව කෝපයෙන් කෙත්වත් ගම් නියම්ගම් යට කරමින් මුහුද ගැලීම යන සිද්ධි නිරූපිත තලයේ එම සිද්ධි වෙන් කර ඇත්තේ සිතුවම් දෙකක් වෙන් වන සථානයේ වැඩුණු වෘක්ෂයන් නිරූපණයෙනි. එසේ ම, කැලණිතිස්ස හා උත්තිය කුමරුවන්ගේ අකුරු උගැන්ම, කැලණිතිස් තෙරණුවන් පිඬු පිණිස රජගෙට පිවිසීම සහ උත්තිය කුමරු සහ බිසවගේ විෂමාචාරය දත් රජ කිපී ඔහුට නිග්‍රහ කරවයි අණ කිරීම දැක්වෙන චිත්‍රාවළියේ සිද්ධි ඡේදනය සඳහා භාවිත කරන්නේ ගෘහ නිර්මාණ අංග ය. එසේ ම භූමියේ උස් පහත් බව පෙන්වීම මඟින් ද එය සිදු කළ අතර, ඒ උදෙසා වරෙක ජ්‍යාමිතික හැඩ ද භාවිත කරයි.

මැන්දිස් තම සිතුවම්හි ගෘහ අවකාශ සහ භාණ්ඩ මෙන් ම ඒවායේ සැරසිලි සහ අංග නිරූපණය කරන්නේ තත්කාලීන සමාජයෙන් ලද උදාහරණත්, ඇතැම් සාම්ප්‍රදායික සැරසිලි සහ මෝස්තර ආදියෙන් ලද ආභාසයත් සම්මිශ්‍රණයෙනි. ඒවා නිරූපණය කරන සිද්ධියට ගැළපෙන අයුරින් සිතුවම් කිරීමට විශේෂ අවධානයක් ද දරා ඇත. උදාහරණයක් වශයෙන්: බෝධිසත්ත්වයන්ගේ ආසනය එක් අයුරකිනුත්, බුදු රජාණන් වහන්සේ නිරූපණයේ දී එම ආසනය ඊට උචිත අයුරිනුත්, රාජසිංහ මහරජු විසින් සඟරජ පදවිය පිරිනැමීම අවස්ථාවේ සඟරජ හිමි වැඩ සිටින ආසනය වෙනස් ආකාරයකිනුත් නිරූපිත ය. ඒවායේ සැලසුම් සහ මෝස්තර එකකට එකක් වෙනස් ය. මේ අතර, කැලණි වෙහෙර ප්‍රතිසංස්කරණයට කළ ඇරියුම ඕලන්ද අධිපතීන් නොපිළිගැනීම නිරූපිත සිතුවමේ ආසන මඟින් (රූපය 13) පිළිබිඹු වන්නේ යුරෝපීය ලක්ෂණ ය. මෙනයින් යම් සිද්ධියක් නිරූපණයේ දී එම අවස්ථාවට සම්බන්ධ ද්‍රව්‍යමය සංස්කෘතිය ද හොඳින් විමර්ශනය කර අදාළ අවස්ථාවට වඩාත් උචිත අයුරින් නිර්මාණය කිරීමට මැන්දිස් වෙහෙස වී ඇත.

කැලණි විහාර චිත්‍ර කර්මාන්තය අවසන් කිරීමට මැන්දිස් අවුරුදු විස්සකට ආසන්න කාලයක් වැය කරයි. එම කාල පරාසය තුළ එම නිර්මාණයන්ගේ සිදු වූ ප්‍රගමනය

නිරීක්ෂණයේ දී විද්‍යමාන වන්නේ ඒවායේ ශෛලිය සහ ක්‍රමවේද ක්‍රමිකව රූපාන්තරණය වී ඇති බවකි.



*රූපය. 13 : කැලණි වෙහෙර ප්‍රතිසංස්කරණයට කළ ඇරියුම ඕලන්ද අධිපතීන් නොපිළිගැනීම. නව කැලණි විහාරය.*
*මූලාශ්‍ර : නව කැලණි විහාරය, කැලණිය.*

ඉන් පැහැදිලි වන්නේ මැන්දිස් තම නිර්මාණ සඳහා විවිධ සම්ප්‍රදායන්ගේ ආභාසය මෙන් ම ආලෝකය ලැබ ඒ සියල්ල සංයෝජනය, සංස්කරණය, සංවිධානය සහ සංකලනය මඟින් රූපාන්තරණයට සහ දෙමුහුම්කරණයට ලක් වූ බවකි.

## 3. සමාලෝචනය නිගමනය

නව කැලණි විහාරයේ සිතුවම් නිර්මාණයට බලපෑප්‍රධාන සාධකයක් වන්නේහෙලේනා විජයවර්ධන සහ ඇයගේ පවුලේ සාමාජිකයන් විසින් දැරූ ජාතිකත්වය පිළිබඳ දැඩි ස්ථාවරයි යන්න ලාංකේය සමාජයේ දැඩිව මුල් බැස ගත් මතයකි. වජිර ජයතිලක විසින් පළ කළ *සොයිලියස් මැන්දිස්ගේ කැලණි විහාර සිතුවම්* (2022) නමැති ග්‍රන්ථයේ උක්ත මතය තහවුරු කිරීමට විශාල වෙහෙසක් දරා ඇත.

ජයතිලකට අනුව බුද්ධාගමේ චිරස්ථිතියට වැදගත් වන සහ එහි ප්‍රෞඪත්වය පිළිබිඹු වන ඓතිහාසික සිද්ධි නිරූපණයට කැලණි සිතුවම් කිරීමේ දී මුල් තැනක් හිමි විය. එසේ ම එහි යටත්විජිත නිලධාරීන්ගේ රූප කිසිදු විටක නිරූපණය නොකළ අතර ඔවුන් නිරූපණය කළේ යටත්විජිත බල අධිකාරිය කළ විනාශයන් පිළිබිඹු වන අයුරින් පමණකි. එම අදහස් ජයතිලක මෙසේ එක් ප්‍රකාශයකට ගොනු කර දක්වයි:

*සමස්තයක් වශයෙන් සැලකීමේ දී නව කැලණි විහාර ව්‍යාපෘතියේ ගෘහ නිර්මාණාංග, සිතුවම්, මූර්ති සහ සැරසිලිවල ප්‍රකාශන විලාස සනිටුහන් කරන්නේ යටත්විජිත මොඩලයන්ට ප්‍රතිපක්ෂ ප්‍රවේශයකි... නව කැලණි සිතුවම් ව්‍යාපෘතියේ දී යටත්විජිත කාරකයාට පක්ෂපාතිත්වය හඟවන කිසිදු දෘශ්‍ය සංඥාවක් හෝ සලකුණක් නොයෙදීමට නිර්මාණ අධිකාරිය ප්‍රවේශම් වී තිබේ (ජයතිලක, 2022, පිටු. 15).*

මෙම කරුණු තහවුරු කිරීම උදෙසා ජයතිලක ප්‍රාමාණික මූලාශ්‍රය ඉදිරිපත් නොකරන අතර, විජයවර්ධන පවුලේ සාමාජිකයන් විසින් පළ කරන ලද තොරතුරු ප්‍රමාණයක් විශේෂයෙන් පාදක කර ගනියි. දේශීය කලාව බටහිර කලාව සමඟ සම්මිශ්‍රණය වන්නේ සංස්කෘතික ඝට්ටනයේ ප්‍රතිඵලයක් ලෙස ය. මා මෙතෙක් සාකච්ඡා කළ ආකාරයට මැන්දිස්ට ද ඉන් පරිබාහිර ව සිටිමින් තම නිර්මාණ කිරීමේ සංස්කෘතික පරිසරයක් නො වී ය. ජයතිලක තර්ක කරන ආකාරයට යටත්විජිත කාරකයාට පක්ෂපාතිත්වය හඟවන කිසිවක් නිරූපණය නොකළා යන්න තර්කයට නතු වන්නක් වන්නකි. මන්ද යත්: එසේ නම් කැලණියේ සිතුවම් අතර පෘතුගීසින් කළ විනාශ දැක්වෙන සිතුවම් නිර්මාණය කර තිබුණ ද, බ්‍රිතාන්‍යයන්ගේ දේශපාලන ක්‍රියා දැක්වෙන හෝ ඔවුන් විවේචනය වන අකාරයේ කිසිදු සිදුවීමක් නිරූපණය නොකරන්නේ මන්ද යන පැනය නැඟිය හැකි බැවිනි.

ජයතිලක තම තර්ක මධ්‍යස්ථ විග්‍රහයකට නතු කිරීම උදෙසා වැදගත් වන පශ්චාත්-යටත්විජිත කථිකා පිළිබඳ එතරම් අවධානයක් නොකරයි. නීරා වික්‍රමසිංහ, හර්ෂණ රඹුක්වැල්ල, කුමාරි ජයවර්ධන හෝ නෙලූකා සිල්වා ආදි විද්වතුන් විසින් මෑතක කළ පශ්චාත්-යටත්විජිත කථිකා පිළිබඳ අවධානයක් යොමා නැති තරම් ය. ජයතිලක තම සාකච්ඡාවේ දී ඉතා වැදගත් ඓතිහාසික සමාජ දේශපාලන තොරතුරු ගෙනහැර දැක්වුව ද ඒවායේ සෛද්ධාන්තික සන්දර්භය විග්‍රහ කිරීම මඟහැරීම හේතුවෙන් ආන්තික මුහුණුවරක් ගෙන ඇත. ඔහු විසින් නව කැලණි විහාර ව්‍යාපෘතිය පිළිබඳ ගොඩනඟන සමස්ත විග්‍රහයේ අරමුණ ලෙස කැලණි විහාර ව්‍යාපෘතිය මඟින් යටත්විජිතකරණය ප්‍රතික්ෂේප කිරීම මෙන් ම ජාතිකත්වය සහ දේශීයත්වය උත්කර්ෂයට නැංවීමට කළ දායකත්වය ආදි සංවෘත වාද වෙත ලඝු වී ඇත.

පෙර සාකච්ඡා කළ අයුරින් යටත්විජිතකරණ සමාජ දේශපාලන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස බිහි වන දේශීය ධනේශ්වර පන්තිය යනු යටත්විජිතකරණය අභිමුඛ දීර්ඝ කාලයක් තිස්සේ අන්තර්-සංස්කෘතික සංශ්ලේෂණයට නතු වූ පිරිසකි යන්න ප්‍රතික්සේප කළ නොහැකි ය. විජයවර්ධන පවුල ද එම සමාජ ස්තරයේ ම සාමාජිකයෝ වෙති. ඔවුන්ට දේශීය මෙන් ම විදේශීය කලා නිර්මාණ පිළිබඳ ප්‍රාමාණික අවබෝධයක් නොතිබුණා යැයි තර්ක කළ නොහැකි අතර, මොවුහු බටහිර සංස්කෘතික ජීවිතය තරයේ ප්‍රතික්ෂේප නොකළ දෙමුහුන්කරණය වු සංස්කෘතික අවකාශයක තම ජීවිතය සකස් කරගත් පිරිසක් වූහ. ඔවුහු විවාහ, ආගමික මෙන් ම වාත්තීය ආදි සංස්කෘතික සාධක මත අතිශය මිශ්‍ර වූ පිරිසකි. මා එසේ තර්ක කරන්නේ

විජයවර්ධන පවුලේ සාමාජිකයන් දේශීයත්වය සහ ජාතිකත්වය පමණක් ම අගය කළේ නම් තමන් විසින් අනුග්‍රහය දක්වමින් ඉදි කළ විහාර කර්මාන්තයේ අතිශය වැදගත් ස්ථානයක් සිතුවම් කිරීම සඳහා විදේශීය සිත්තරකුට දෙන්නේ මන්ද යන ගැටලුව මත පාදක ව ය. එම කාර්යයට මූලික වූයේ විජයවර්ධනවරුන් ද නොඑසේ නම් කැලණියේ වැඩවිසූ භික්ෂූන්ගේ අනුදැනුමෙන්ද යන්න පිළිබඳ නිත්‍ය තොරතුරු සඳහන් නැතත්, ඊට ඔවුන් විරුද්ධත්වය ප්‍රකාශ කළ බවක් ද සඳහන් නො වෙයි.

කෙසේ වෙතත් අවසානයේ කැලණි නව විහාරයේ බුද්ධ ප්‍රතිමාව පිටුපසින් වූ බිත්ති තලය සිතුවම් කිරීම සඳහා අවස්ථාව මැන්දිස්ට නොලැබුණු අතර, ඒ සඳහා ආරාධනා කරන ලද්දේ කාර්ල් කස්මන් නමැති රුසියානු චිත්‍ර ශිල්පියකුට ය. විහාර ගෘහයක අතිශය වැදගත් ස්ථානය වන්නේ බුද්ධ ප්‍රතිමාව පිටුපස අවකාශය ය. ඒ මන්ද යත්: එය බැතිමතුන්ගේ ඍජු අවධානයට ලක් වන ස්ථානය වන බැවිනි. මැන්දිස්ගේ නිර්මාණ ක්‍රමවේදයට අත්‍යන්තයෙන් ප්‍රතිවිරුද්ධ මාර්ගයක් ගත් නිල් පැහැ වර්ණ පදාසයන්ගෙන් සැදුම්ලත් හිමාලය කන්ද නිරූපණය (රූපය 14) කස්මන් විසින් සිදු කරන ලද අතර, ඉන් ගම්‍යමාන වන්නේ ආසියාතික අලංකාර විෂයය මෙන් ම ඊට අයත් සංස්කෘතික අනන්‍යතා පිළිබඳ ඔහු සතු වූ අනවබෝධය ය. එහෙත් විජයවර්ධනවරුන් ඒ පිළිබඳ නම්‍යශීලි පිළිවෙතක් අනුගමනය කළ බව පැහැදිලි ය.

පෙර සාකච්ඡා කළ ආකාරයට කැලණියේ අනුග්‍රාහකයන්ට ආසියාතික අලංකාර විෂයය මෙන් ම සංස්කෘතික අනන්‍යතා පිළිබඳ ව ද මනා අවබෝධයක් වූ අතර, එසේ දැනීමක් නොවුණා නම් මැන්දිස් ඉන්දියාවේ අජන්තා ආදි ස්ථානයන්හි නිර්මාණ ගවේෂණයට නොයවන්නේ යැයි තර්ක කළ හැකි ය. ඒ වෙනුවට බටහිර කලා මූලධර්ම මත පදනම් ව නිර්මාණකරණයේ යෙදෙන කලාකරුවකුගේ සේවය ලබා ගත හැකි ව තිබිණි.



*රූපය 14 : කාර්ල් කස්මන් විසින් පින්තාරු කරන ලද බුද්ධ ප්‍රතිමාව පිටුපස අවකාශය. නව කැලණි විහාරය.*

*මූලාශ්‍ර : නව කැලණි විහාරය, කැලණිය.*

එහෙත් මින් ගම්‍යමාන වන වැදගත් කරුණක් නම්, පෙර ද තර්ක කළ ආකාරයට අධ්‍යාපනය සහ සමාජ බල සබඳතා මඟින් යුරෝකේන්ද්‍රීය අලංකාර විෂයය සහ සෞන්දර්යය පිළිබඳ ඔවුන් සතු වූ පාණ්ඩිත්‍යය වරෙක දේශීය අනන්‍යතා පරයා පෙරට ඒම ද විය හැකි ය. ඊට ප්‍රතිපක්ෂ ව මැන්දිස්ගේ නිර්මාණ ක්‍රියාවලියෙන් බිහි වන දෘශ්‍ය ක්‍රමවේදය මඟින් නිරූපණය වන්නේ බහු සංස්කෘතික අංග සම්මිශ්‍රණය කර රූපාන්තරණයට හෝ දෙමුහුන්කරණයට හෝ ලක් වූ නිර්මාණ ක්‍රමයක් ගොඩනැගීමට දැක්වූ නම්‍යතාවයි. බිල් ඇෂ්ක්‍රොෆ්ට් (2001) විග්‍රහ කළ පරිදි මින් ගම්‍ය වන්නේ යටත්විජිත වැසියාට දැඩි යටත්විජිත සංස්කෘතික බල ප්‍රවාහ මධ්‍යයේ

වුව ද තම සංස්කෘතික අනන්‍යතා නොනැසී පවත්වා ගනීමට දැක්වූ ප්‍රතිරෝධයයි.

## 4. ආශ්‍රිත ග්‍රන්ථ


Ashcroft, B. (2001) *Post-Colonial Transformation.* London and New York: Psychology Press.

Bandaranayake, S. and Dharmasiri, A. (2009) *Sri Lanka Paintings in the 20th Century*. Colombo: The National Trust Sri Lanka.

Barkan, L. (1986) *The Gods Made Flesh: Metamorphosis and the Pursuit of Paganism*. New Haven–London.

Bhabha, H. K. (2004) *The Location of Culture.* London . New York: Routledge.

Bodinayakkanur Zamin palace (nd) (Viewed 26 February 2025) Available at: https://southindianpaintings.art/monuments/tamil-nadu-palace-monuments/bodinayakkanur/

Coomaraswamy, Ananda. (1908) *Medieval Sinhalese Art*. Broad Campden: Essex House Press; republished New York: Pantheon Books, 1956.

Dharmadasa, K. N. O. (1974) *A Nativistic reaction to colonialism: the Sinhala - - Buddhist revival in Sri Lanka*: Asian Studies: Journal of Cretical Perspectives on Asia: ASJ 12 (1): PP 159-

Dhanapala, D. B. (1962) *Among Those Present*. Colombo: M. D. Gunasena.

Dharmasiri, A. (1990) *Painting Modern Period (1815-1950).* Wijesekara, N.(ed)Painting – Volume Five.Colombo: Archaeological Department: pp.127–137.

Dewaraja, L. S. (2018) *The Kandyan Kingdom of Sri Lanka (1707–1782). Colombo: Stamford Lake.*

Farebrother, R. (2009) *The Collage Aesthetic in the Harlem Renaissance London:Routledge.*

Guha-Thakurta, T. (1922) *The Making of a New 'Indian' Art: Artist, Aesthetics, and Nationalism in Bengal, c 1850 – 1920.New York:Cambridge University Press.*

Gunarathne, A. (2002) *Identity on the Borderline: Modernity, New Ethnicities, and the Unmaking of Multiculturalism in Sri Lanka*. Silva, N. (ed.) The Hybrid Island–Cultural Crossings and the Invention of Identity in Sri Lanka. London:Zed Books:pp.41-70

Gunasinghe , S (1978) *An Album of Buddhist Paintings from Sri Lanka (Ceylon)(Kandy Period).Colombo:National Museums of Sri Lanka.*

Goonetilleke, D. C. R. A. (1990)*Sri Lankan Poetry in English: Getting Beyond the Colonial Heritage.* ARIEL:A Review of International English Literature,213(3):pp.39-53.

Jayathilaka, J. A. V. N. (2009) *Buddhist Patrons in the Late-colonial Ceylon:Mudaliyars and Their Influence on Temple Construction.*Journal of the Faculty of Humanities (Faculty of Humanities, University of Kelaniya),Vol. 10:pp.281 – 93.

Jayawardena, K. (2019) *Nobodies to Somebodies:The Rise of the Colonial Bourgeoisie in Sri Lanka. London:Zed Books.*

Lakdusighe, S. (1990) *Kandyan Period (1400–1815).*Wijesekara, N. (ed.) Painting – Volume Five. Colombo: Archaeological Department: pp. 109–125.

Mendis, G. J (2009) *The Art of M. Sarlis (1880–1955).*Bandaranayake, S. and dharmasiri, A. (ed.) sri Lankan Painting in the 20th

Century. Colombo: The National Trust Sri Lanka.

Mucznik, S. (2017) *Metamorphoses: Some Mythological Images in Roman Art*. Gerión. Revista de Historia Antigua, 35(1), (Viewed 26 February 2025) Available at: https://doi.org/10.5209/GERI.56961

Rambukwella, H. (2018) *The Politics and Poetics of Authenticity – A Cultural Genealogy of Sinhala Nationalism. London:University College London.*

Samaraweera, A., Herath, P., Kumari, S. D., Ranasinghe, N. and Athukorala, L. (2018) *Urumayaka Arumaya 1*. Colombo: Department of Archaeology.

Sorensen, A. H., Friedrich, W. L. and Soholm, K. M. (2018) *Metamorphoses and Hybridity inthe Wall Paintings at Akrotiri, Thera*. In: Vavouranakis, G., Kopanias, K. and Kanellopoulos, C., (Eds.), Popular Religion and Ritual in Prehistoric and Ancient Greece and the Eastern Mediterranean, Archaeopress Archaeology, Oxford, .pp. 47–54. (Viewed 27 February 2025) https://:doi.org/10.2307/j.ctvndv50x.10

Wickramasinghe, N (2002) *From Hybridity to Authenticity: the Biography of a few KandiyanThinings*, in Silva, N. (ed.) The Hybrid Island: Cultural Crossings and the Invention of Identity in Sri Lanka.London:Zed Books.

Tobin, B. F. (1999) *Picturing Imperial Power: Colonial Subjects in Eighteenth-Century BritishPainting.* Durham: Duke University Press.

Tobin, R. (1975) The Canon of Polykleitos. *American Journal of Archaeology*, Vol. 79, No. 4. pp. 307 – 321.

Udayanga, K. A. S. (2018) *From Deficiency to Affluence: Dynamics of Kandyan Peasantries and the Rise of Rural Caste Elite in Sri Lanka.* Journal of Social Sciences and Humanities Review (JSSHR) Vol. 3, Issue. 2 (pp. 101–123) © Author(s) June 2018.

Wagenaar, L. (2016) *Cinnamon and Elephants Sri Lanka and the Netherlands from 1600*. Netherland: Rijks museum and Vantil.

Wickramasinghe, N. (2002) *From Hybridity to Authenticity: the Biography of a few Kandiyan Thinings*, in Silva, N. (ed.) The Hybrid Island–Cultural Crossings and the Invention of Identity in Sri Lanka. London:Zed Books:pp.71-92.

කලාදීප (1953) *කලාදීප සංස්කාරක ඇම්. සාර්ලිස් මහතා හමු වෙයි.* 1953 මැයි 15.

ගුණසිංහ , සිරි (1962) *මහනුවර යුගයේ බිතු සිතුවම්.* නැවත ප්‍රකාශනයඃ කලා සඟරාව (2016) ශ්‍රී ලංකා කලා මණ්ඩලය.

ජයතිලක, වජිර (2022) *සොයිලියස් මැන්දිස්ගේ කැලණි විහාර සිතුවම්ඃ කලාව, දේශපාලනය, සහ ඥනවිභාත්මක බණ්ඩන.* කොළඹඃ සරසවි.

ධර්මසිරි, මිත්‍රානන්ද සහ වගාච්චි, ඩයස් (2003) *කැලණිය රාජ මහා විහාරය බිතුසිතුවම් සංරක්ෂණය.* කොළඹඃ මධ්‍යම සංසිකෘතික අරමුදල.

ආඛ්‍යාන narrations

*Open Access, Referred Biannual Jornal*

**Volume 10 | Issue 02 | 2025**

**Published By**

Center for Indigenous and Community Studies

Sabaragamuwa University of Sri Lanka

**Akyana (2025), Vol. 10 (02) Pp 162 - 187**

**Journal homepage:** www.sab.ac.lk/cikcs/akyana narratios

# තේ වතු ජනතාවගේ දරිද්‍රතාව (ආඩාරදෙණිය වතු ජනාවාසය ඇසුරින්)

A R T I C L I N F O

Article History:
Received 11 Sep 2025
Revised 30 Nov 2025
Accepted 06 Dec 2025
Published 31 Dec 2025

**දිසානායක ඩී. ඇම් . කේ.[1*]**

[1]**භූගෝල විද්‍යා අධ්‍යනාංශය, කලා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය**

*Corresponding author E-mail address: **karu@geo.cmb.ac.lk***

ISSN2478 - 0642

උපුටා දැක්වීම: *දිසානායක, ඩී. ඇම් . කේ., (2025).තේ වතු ජනතාවගේ දරිද්‍රතාව (ආඩාරදෙණිය වතු ජනාවාසය ඇසුරින්).ආඛ්‍යාන, 10 (02). පි.අ.162 - 187*

## සාරාසංක්ෂේපය

ගෝලීය ගැටලුවක් වන දරිද්‍රතාවය ශ්‍රී ලංකාවේ තේ වතු ප්‍රජාවන්ට බලපාන ආකාරය මෙම අධ්‍යයනයෙන් විශ්ලේෂණය කෙරේ. ඒ සඳහා නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලේල්වල ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටා ඇති ආඩාරදෙණියතේ වතුයායේ වතු ජනාවාසයෙන් දත්ත රැස් කරන ලදි. වතු ජනතාවගේ දැනට පවතින දරිද්‍රතාවය පිළිබඳව කරුණු හඳුනා ගැනීම හා ඔවුන්ගේ දරිද්‍රතාවය සඳහා බලපා ඇති සමාජ හා ආර්ථික සාධක අධ්‍යයනය කිරීම සඳහා ලිකට්ස් පරිමාණය, ANOVA, කල්පිත පරීක්ෂා හා සාපේක්ෂ වැදගත්කම් දර්ශකය යන ක්‍රමවේද භාවිත කර ඇත.දත්ත විශ්ලේෂණය මගින් වතු ජනතාවගේ දරිද්‍රතාවය සඳහා අඩු වැටුප්, වැඩ කරන දිනගණන සීමා වීම, පවුලේ සාමාජික සංඛ්‍යාව වැඩි වීම, අඩු අධ්‍යාපන මට්ටම, දුර්වල යටිතල පහසුකම් යන සාධක බලපා ඇති බව හඳුනාගන්නා ලදි. ස්ත්‍රී පුරුෂ ශ්‍රමිකයන්ගේ විශාල වැටුප් විසමතාවයක් ඇති බවත් ස්ත්‍රී ශ්‍රමිකයන්ගේ සාමාන්‍ය වැටුප විශාල ලෙස අඩු බව ප්‍රධාන සාධකය ලෙසත් හඳුනාගත හැකි විය. පිළිවෙළින් පුරුෂ හා ස්ත්‍රී සාමාන්‍ය වැටුප රුපියල් 1858.06ක් හා 911.34 බවද හඳුනාගත හැකි විය. පර්යේෂණයේ නිගමන වශයෙන් පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව 3 සිට 5 දක්වා ඇති පවුල් 81%ක් හා මුළු පවුල්වලින් 41%ක් රුපියල් 30000ට වඩා අඩු මාසික වැටුපක් ලබන බවද හඳුනාගත හැකි විය. නිර්දේශ වශයෙන් නිල දරිද්‍රතා රේඛාවට වඩා වැඩිවන ලෙස වැටුප් ක්‍රමයක් සකස් කිරීමත් එයට අනුව 97%ක් වන කිසිදා පාසල් නොගිය පවුල් සංඛ්‍යාව අඩුවන ආකාරයට අධ්‍යාපන පහසුකම් වැඩිදියුණු කිරීමත් මාසික වැඩ කරන දින ගණන වැඩි කිරීමත් සෞඛ්‍ය හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමත් සිදුකළ යුතු බව පෙන්වා දිය හැකි අතර එමගින් වතු ජනතාව පරම්පරාගත දරිද්‍රතාවයෙන් මුදවා ගත හැකි බවටත් පෙන්වා දිය හැකිය

**මුඛ්‍ය පද :** ආදායම් අසමානතාවය සහ සමාජ/ආර්ථික සාධකවතු ජනතාව, තේ වතු කම්කරුවන්, දරිද්‍රතාව, පරම්පරාගත දරිද්‍රතාවය, සාපේක්ෂ දරිද්‍රතාව, ස්ත්‍රි-පුරුෂ වැටුප් විසමතාවය

## 1. හැඳින්වීම

දරිද්‍රතාව සඳහා පාරිසරික, නෛතික, සාමාජීය, ආර්ථික හා දේශපාලනික හේතු හා බලපෑම් වැනි විවිධ සාධක තිබිය හැකිය. දරිද්‍රතාව යනු ආහාර නිවාස, ඇඳුම් පැළඳුම්, හා සෞඛ්‍ය සේවා වැනි මූලික ජීවන අවශ්‍යතාවයන් සපුරා ගැනීමට ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොමැති වීම ලෙස අර්ථ දැක්විය හැකිය. එමෙන්ම දරිද්‍රතාව යනු යම් පුද්ගලයෙකුට හෝ පුද්ගල සමූහයකට පවතින සමාජ ආර්ථික තත්වයන් තුළ සාධාරණ හේතු සහිතව හඳුනාගත් අවම ජීවන තත්වයක් සඳහා අවශ්‍ය මූල්‍යමය සම්පත් හා අත්‍යවශ්‍ය දේ නොමැති තත්වයක් ලෙසද අර්ථ දැක්වේ. එනම් නිවාස, සෞඛ්‍ය සහ අධ්‍යාපන පහසුකම් සහ මානුෂීය අවශ්‍යතා මත හඳුනාගෙන ඇති යම් පරිභෝජන මට්ටමක් හෝ අවම මට්ටමකට ළඟා වීමට නොහැකි වීමයි. තිරසර සංවර්ධන අභිමතාර්ථවලින් පළමුවැන්න වන්නේ සෑම තැනකම සෑම ආකාරයකින්ම පවත්නා දිළිඳුකම තුරන් කිරීමයි.එහෙත් 2025 වර්ෂය වන විට ලෝකයේ මිලියන 800ක ජනතාවක් දිනකට ඩොලර් 3කට වඩා අඩු ආදායම් සහිතව නිරපේක්ෂ වශයෙන්ම දිළිඳු (නිරපේක්ෂ දරිද්‍රතාව-Absolute poverty) ජන කොටසක් ලෙස හඳුනාගත හැකිය.

ඒ අනුව අනෙකුත් ජන කණ්ඩායම් සමග සංසන්දනය කරනවිට වතු ජනතාව නිරපේක්ෂ වශයෙන් දරිද්‍රතාවයෙන් පෙළෙන ජන කණ්ඩායමක් ලෙස හඳුනාගත හැකිය. I. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව මැනීම සඳහා නිල දරිද්‍රතා රේඛාව හා බහුමාන දරිද්‍රතා දර්ශකය භාවිත කරනු ලැබේ. නිල දරිද්‍රතා රේඛාව මගින් පුද්ගලයෙකුගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා මසකට අවශ්‍ය අවම පරිභෝජන වියදම දක්වනු ලැබේ (මෙය 2019 දී රුපියල් 6966කි)(ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2022). ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ, ග්‍රාමීය ප්‍රදේශ, හා වතු ප්‍රදේශ වශයෙන් සැලකූවිට සාපේක්ෂ වශයෙන් වතු ජනතාවගේ දරිද්‍රතාවය ඉතා ඉහළ මට්ටමක පවතින බව හඳුනාගත හැකිය (ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණය- 2004/2010).

ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහන දරිද්‍රතා අනුපාතය 14.5%ක් පමණ වන අතර වතු අංශයේ දරිද්‍රතා අනුපාතය 24.3%ක් වැනි ඉහළ අගයක් ගනී (Department of Census and Statistics, 2024).මෙම තත්වය ඇතිවීම සඳහා වතු ජනතාවට පවතින ආදායම් උත්පාදන අවස්ථා සීමිත වීම, වතු ජනතාවගෙන් වැඩි පිරිසක් වතු කම්කරුවන් ලෙස රැකියා කිරීම, ස්වාභාවික හා භෞතික සම්පත් හිඟවීම අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාවල පවතින අවම තත්වය, වතු කම්කරු වැටුප අවම මට්ටමක පැවතීම, වතු හිමියන්ගේ කම්කරු පරිපාලන ක්‍රමවේද යනාදී හේතු ගණනාවක් බලපා ඇත.

ගෝලීය වශයෙන් සෑම රටකම දරිද්‍රතාව විවිධ මට්ටමින් පවතින බව හඳුනාගත හැකි වේ(HemaSrikumar,C.JeevaM.A.,2017). උදාහරණ ලෙස, ජනගහන දරිද්‍රතා අනුපාතය දකුණු සුඩානයේ 82.3%, සෝමාලියාව 76.8%, නයිජීරියාව 70.7, ගිනියා 54.4%ක් හා සියරාලියොන් 53.2%ක් වේ. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල මෙම තත්වය ඉහළ අගයක් ගනී. එයිනුත් වතු අංශයේ දරිද්‍රතාව බරපතල තත්වයක ඇත. ශ්‍රී ලංකාවේ බලයට පත් වූ විවිධ රජයන් වතු අංශයේ පවතින දරිද්‍රතාව අවම කිරීම සඳහා අවස්ථා

ගණනාවකදී ප්‍රතිපත්ති හා වැඩසටහන් රාශියක් ක්‍රියාවට නැඟුවද ස්ථිර විසඳුමක් ලබා දීමට අපොහොසත් වීමෙන් ඒවා නාමමාත්‍රික වැඩසටහන් බවට පත් වී ඇත. එබැවින්, මෙම අධ්‍යයනය ආඩාදෙණිය තේ වත්තේ කම්කරුවන් අතර දරිද්‍රතාවයට බලපාන සමාජ-ආර්ථික සාධක විශ්ලේෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

## 2. සාහිත්‍ය විමර්ශනය

දිළිඳු බවේ මූලික අරුත ගත් කල එය සාපේක්ෂ වුද පුද්ගල නිශ්චිත වුද සංසිද්ධියකි. දිළිඳු බවෙහි ඇති බහුවිධ ස්වභාවය නිසා විවිධ අය දිළිඳු බව හඳුනා ගැනීමට නිර්වචනය කිරීමට විවිධ නිර්ණායක භාවිත කරයි (රත්නායක ආර්. එම්. කේ,1998). එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව දුප්පත්කම විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් හඳුනාගත හැකිය. එනම්,ආදායම් මූලික දරිද්‍රතාවය හා මානව පැවැත්ම මූලික දරිද්‍රතාවය යනුවෙනි. දිළිඳුභාවයෙන් පීඩිත ඕනෑම සමාජයකපොදුවේ හඳුනාගත හැකි ලක්ෂණ කිහිපයකි.අධික ජන සංඛ්‍යාව, අඩු ආදායම, ආදායමේ විසම බව, විරැකියාව, ණයගැතිභාවය, පහළ ඉතිරි කිරීම්, අඩු අධ්‍යාපනය, අඩු සෞඛ්‍යය, පෝෂණ ඌනතාවය, අඩු නිෂ්පාදනය යනාදියයි. මෙම දරිද්‍රතා ලක්ෂණයන්ගේ ක්‍රියාකාරිත්වය තුළ චක්‍රීය රටාවක් රැග්නර් හර්කස් නැමැති විද්‍යාඥයා හඳුනා ගනී. එය දුගී බවේ විසම චක්‍රය හෙවත් "දුගී බවේ දුෂ්ඨ චක්‍රය" ලෙසින් හැඳින්වේ. මෙම චක්‍රයට වතු ජනතාව ගොදුරු වී ඇති බව හඳුනාගත හැකිය. ඒ නිසා අනෙකුත් ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවලට වඩා වතු අංශයේ දරිද්‍රතාව ඉහළ අගයක් ගනී (ජයවර්ධන,2008). මේ සඳහා ශ්‍රම සංක්‍රමණයද බලපා ඇත (Dharmadasa R.A.P.I.S., Weerahewa J. සහ Samarathunga P.A., 2018). එමෙන්ම වතු ජනතාව අධික ලෙස මත්පැන් පානයට යොමු වීමෙන් සෞඛ්‍ය තත්වය දුර්වල වීම නිසා හා අඩු අධ්‍යාපන මට්ටම නිසා දරිද්‍රතාව තීව්‍ර වී ඇති අතර ඔවුන් නාගරික ජනතාවට වඩා දරිද්‍රතාවයෙන් පීඩා විඳිති (Bandara H.G.K.N.,. Karunarathna B.D.N.S, Addikarige Nalinda Nuwan, 2023). ඒ නිසා මොවුන්ගේ දරිද්‍රතාවයට අඩු අධ්‍යාපන මට්ටම ප්‍රබල බලපෑමක් සිදු කර ඇත (Sampath Dharmadasa සහ M.K. Hewavitharana 2023)'බංගලාදේශය හා ඇසෑමය වැනි ප්‍රදේශවලද වතු ජනතාවගේ දරිද්‍රතාවයට අඩු වැටුප්, වාර්ගික බෙදීම්, ස්ත්‍රී පුරුෂ භේදය යන හේතු බලපා ඇත. (Shapan Chandra සහ Sanjaya Chandra,2011), (Tiken Das 2018). නිවාස පානීය ජලය වැනි මූලික පහසුකම් හමුවේද වතු කම්කරුවන් දරිද්‍රතාවයට පත් වී ඇත. එමෙන්ම වෙළෙඳපොල ප්‍රවේශය සීමා වීම හා යටිතල පහසුකම් අවම වීම යන සාධක බලපා ඇත (Sinnathurai Vijayakumar සහ Březinová Olga 2012).

## 3. පර්යේෂණ ගැටලුව

වතු ජනතාවගේ දරිද්‍රතාව, පරම්පරාගත දරිද්‍රතා තත්වයකට පත් වී තිබීම මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වේ. වතු අංශයේ දරිද්‍රතාව ජාතික දරිද්‍රතා රේඛාවට වඩා විශාල වශයෙන් පහළ මට්ටමක ඇති බව හඳුනා ගත හැකිය (Vijesandiran, 2022). වතු සේවකයෙකුගේ මාසික ආදායම රුපියල් 10000 සිට රුපියල් 20000 දක්වා පවතින අතර එය ජාතික සාමාන්‍ය අගයට වඩා සැලකිය යුතු ලෙස පහළ අගයකි. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ බලයට පත් වූ සෑම රජයක්ම විවිධ අවස්ථාවලදී රටේ

සමස්ත දරිද්‍රතාව අවම කිරීම සඳහා ආහාර සලාක ක්‍රමය, ආහාර මුද්දර ක්‍රමය, ජන සවිය, පෝෂණ ව්‍යාපාර, දිවි නැගුම, සමෘධි ව්‍යාපාරය යනාදියේ සිට අස්වැසුම ව්‍යාපාරය දක්වා නොයෙක් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. එහෙත් රටේ දරිද්‍රතාව සැලකිය යුතු තරම් අවම මට්ටමකට පත් වී නොමැත.

වතු ජනතාවගේ දරිද්‍රතාව උග්‍ර වීම සඳහා හේතු ගණනාවක් බලපා ඇත. එයින් වතු ජනතාවගෙන් බහුතරයක් දෙනාට ගුණාත්මක අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා සඳහා සීමිත ප්‍රවේශයක් පැවතීම ප්‍රධාන හේතුව වේ. වතු ජනතාවගේ සාක්ෂරතා අනුපාතය ජාතික සාක්ෂරතා සාමාන්‍ය අනුපාතයට වඩා අඩු වීමෙන් මෙය පැහැදිලි වේ(ජාතික අනුපාතය 92.5යි). ශ්‍රී ලංකාවේ වතු ජනතාවගේ දරුවන් පාසල් හැර යාම ඉහළ මට්ටමක පවතින අතර ප්‍රාථමික අංශයේදීම පාසල් හැර යාම නාගරික අංශයේ 1.2%ක්ද ග්‍රාමීය අංශයේ 0.8%ක්ද වතු අංශයේ 3.8%ක්ද වේ (Vithanage, 2022). ද්විතීයික අංශයේදී වතු දරුවන් පාසල් හැර යාම 19.8%ක් තරම් ඉහළ අගයක් ගනී. පාසල් හැර යාම සඳහා බලපාන සාධක අනුව වයස අවුරුදු 6-16 අතර දරුවන් ආර්ථිකමය කාර්යයක නිරත වීම සඳහා පාසල් හැර යාම 24%ක්ද රැකියාවක නිරත වීම සඳහා 34%ක්ද වේ (household income and expenditure survey,2016). එමෙන්ම වතු ජනතාව රෝගවලට ගොදුරු වීමේ අනුපාතය, ඉහළ මරණ අනුපාතය, ආයු අපේක්ෂාව අඩුවීම යන තත්වයන් අනුව නාගරික ප්‍රදේශවලට සාපේක්ෂව වතු අංශයේ සෞඛ්‍ය සේවාවල ගුණාත්මක හා ප්‍රමාණාත්මකභාවය දුර්වල බව හඳුනාගත හැකිය. 2019 හා 2020 කාලයේදී ඇතිවූ කොවිඩ් වසංගතය හේතුවෙන් ලෝක මට්ටමින් ඇති වූ ආර්ථික අවපාතය ශ්‍රී ලංකාව වැනි රටවලට ඉතා දැඩි වූ අතර වතු අංශයේ ජනතාවට එය ඉතා ප්‍රබල ලෙස බලපාන ලදි. මේ නිසා වර්තමානයේදී වතු අංශයේ ජනතාවගේ දරිද්‍රතාවය කැපී පෙනෙන ලෙස උග්‍ර තත්වයකට පත් වී ඇත (United Nations, 2022; Yapa, 2004).

දුර්වල අධ්‍යාපන සේවා, විරැකියාව, අඩු දෛනික වැටුප්, සුදුසු ජීවන තත්වයක් නොමැති වීම, යටිතල පහසුකම් දුර්වල තත්වයක පැවතීම, හා අත්‍යවශ්‍ය සේවා සඳහා ප්‍රමාණවත් ප්‍රවේශ පහසුකම් නොමැතිවීම යනාදී සාධක නිසා දරිද්‍රතාව කල් පවතින තත්වයකට මෙන්ම පරම්පරාගත දරිද්‍රතා තත්වයකට (Generational proverty) පත් වී ඇත.

පරම්පරාගත දරිද්‍රතාවය සඳහා අධ්‍යාපනයට ඇති ප්‍රවේශ සීමා වීම, දුර්වල සෞඛ්‍ය පහසුකම්, රැකියා අවස්ථා නැති වීම, පාරිසරික සාධක, සංස්කෘතික ආකල්ප හා විශ්වාස හා දුර්වල සමාජ සම්බන්ධතා යන සාධක බලපානු ලැබේ (Richard Anker සහ MarthaAnker, 2017).වතු අංශයේ දරිද්‍රතාව අවම කිරීම සඳහා ක්‍රියාත්මක වූ රාජ්‍ය ව්‍යාපෘති දිගුකාලීනව හා ක්‍රියාකාරී ලෙස නොපැවතීම නිසා වතු අංශයේ දරිද්‍රතාව සඳහා බලපා ඇති සාධකවල වෙනසක් නොවී ඇති බව පැහැදිලි වේ.




*රූපය 01 : පරම්පරාගත දරිද්‍රතාවයට බලපාන සාධක*
*මූලාශ්‍රය : Richard Anker සහ MarthaAnker, 2017*

එබැවින් රටේ ආර්ථික උත්පාදනයට විශාල දායකත්වයක් ඇති වතු අංශයේ ජනතාවගේ දරිද්‍රතාවට බලපාන සාධක පිළිබඳ විශ්ලේෂණය කිරීම ඔවුන්ගේ ජීවන තත්වය නගා සිටුවීමට යම් පමණකට හෝ උපකාරි වේ යැයි පර්යේෂණය මගින් අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිළිබඳව බොහෝ අධ්‍යයනයන් විමර්ශනය කර ඇතත්, ආඬාරදෙණියේ තේ වතු කම්කරුවන් අතර පරම්පරාගත දරිද්‍රතාවයට බලපාන සමාජ-ආර්ථික සාධක කෙරෙහි අවධානය යොමු කර ඇත්තේ ස්වල්පයක් පමණක් වීම නිසා මෙම අධ්‍යයනය විශේෂ වේ. පර්යේෂණයෙන් අනාවරණය වන කරුණුවලින් වතු කම්කරුවන්ගේ ජීවන තත්වය උසස් කිරීමට කටයුතු කිරීමෙන් එය ඍජුවම වතු අංශයේ නිෂ්පාදනය වැඩි කිරීමට හේතු වීමෙන් ජාතික ආදායම ඉහළ නංවා ගැනීමට උපකාරී වන බැවින්මෙම පර්යේෂණය ජාතිකමය වශයෙන්ද වැදගත් වේ.

### *3.1. පර්යේෂණයේ අරමුණු*

ඉහත සඳහන් කළ ආකාරයට ආර්ථික උත්පාදන ශ්‍රම බලකායේ වැදගත් අංශයක් වන වතු අංශයේ ජනතාවගේ දිගුකාලීන දරිද්‍රතාව සඳහා බලපා ඇති සාධක පිළිබඳ විශ්ලේෂණය කිරීම සඳහා සිදු කරන මෙම පර්යේෂණයේදී ප්‍රධාන අරමුණු 3ක් ගොඩනගා ගන්නා ලදි.

1වන අරමුණ - වතු ජනතාවගේ දැනට පවතින ආර්ථික මට්ටම හඳුනා ගැනීම

2වන අරමුණ - වතු ජනතාවගේ දරිද්‍රතාව සඳහා බලපා ඇති ආර්ථික සාධක විශ්ලේෂණය කිරීම

3වන අරමුණ - වතු ජනතාවගේ දරිද්‍රතාව සඳහා බලපා ඇති සාමාජීය සාධක විශ්ලේෂණය කිරීම

## 4. පර්යේෂණ ක්‍රමවේදය

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය,යැපුම් කෘෂිකාර්මික අංශය (වී ගොවිතැන හා හේන් ගොවිතැන) හා බහු වාර්ෂික බෝග වගා ඇතුළත් වතු කෘෂිකාර්මික අංශය (තේ, පොල්, රබර් හා වෙනත් වගා) වශයෙන් ප්‍රධාන අංශ දෙකක් යටතේ හඳුනා ගත හැකියි. මෙයින් වතු අංශයෙන් අපනයන ආදායම් සඳහා ප්‍රධාන වශයෙන් දායක වන තේ වගා අංශය පිළිබඳ මෙම පර්යේෂණයේදී අවධානය යොමු කර ඇත. තේ වගාව, භූවිසමතාව අනුව උඩරට තේ, පහත රට තේ හා මැද රට තේ වගාව ලෙස පවතින අංශ අතරින් පහත රට තේ වගාව ගාල්ල, මාතර, හම්බන්තොට හා රත්නපුර යන දිස්ත්‍රික්කවල සිදු කරනු ලැබේ. ගාල්ල දිස්ත්‍රික්කයේ ඇති ප්‍රාදේශීය ලේකම්

කොට්ඨාස 22 අතරින් නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඊසාන දිග කොටසේ පිහිටිආඩාරදෙනිය තේ වතු යාය ආශ්‍රිත වතු ජනාවාස මෙම පර්යේෂණය සඳහා තොරාගෙන ඇත(රූප සටහන 02).




*රූපය 02 : අධ්‍යයන ප්‍රදේශයේ පිහිටීම*
*මූලාශ්‍රය : භූගෝලීය තොරතුරු පද්ධතියඇසුරෙන් නිර්මාණය කරන ලදි,2025*

ආඩාරදෙණිය වතු යායේ තේ වතු කම්කරුවන් ලෙස සේවය කරන මුළු පවුල් සංඛ්‍යාව 55ක් වන අතර පර්යේෂණය සඳහා මෙම පවුල් 55ම නියැදිය වශයෙන් භාවිත කරන ලදි. පර්යේෂණයට අවශ්‍ය දත්ත ලබා ගැනීමේදී ප්‍රාථමික දත්ත සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ හා සිද්ධි අධ්‍යයන යන ක්‍රමවේද භාවිත කරන ලද අතර ද්විතීයික දත්ත ලබා ගැනීම සඳහා ඉහළ ලේල්වල ග්‍රාම නිලධාරී වසමට අයත් වාර්තා, ආඩාරදෙණිය තේ වතු යායේ වාර්තා, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්තා හා වෙනත් අදාළ මූලාශ්‍රය පරිශීලනය කරන ලදි. දත්ත විශලේෂණය සඳහා ලිකට්ස් පරිමාණය (Likert Scale)(Dong et al., 2024),ANOVA,කල්පිතපරීක්ෂාක්‍රමවේද, සාපේක්ෂ වැදගත්කම් දර්ශකය (Relative Important Index-RII) හා කෛhs වර්ග පරීක්ෂා (Chi-square test) යන ක්‍රමවේද භාවිත කරන ලදි. සිතියම් නිර්මාණය කිරීමට Arc GIS මෘදුකාංගය භාවිත කරන ලදි. ලිකට්ස් පරිමාණයෙන් හා සාපේක්ෂ වැදගත්කම් දර්ශකය මගින් දරිද්‍රතාවයට බලපාන සාධක ඒවායේ ප්‍රමුඛතාව අනුව හඳුනා ගත හැකි වේ. එමෙන්ම ඒවායේ බලපෑම තහවුරු කිරීම සඳහා කල්පිත

පරීක්ෂා ක්‍රමය හා කෛයි වර්ග පරීක්ෂා ක්‍රමය භාවිත කරන ලදි. දරිද්‍රතාවයට බලපාන සාධක කොපමණ ප්‍රමාණයකින් බලපාන්නේද යන්න හඳුනා ගැනීම සඳහා ANOVA ක්‍රමය භාවිත කරන ලදි.

## 5.ප්‍රතිඵල සාකච්ඡාව

වතු ජනතාවගේ දරිද්‍රතාව පිළිබඳව සිදු කර ඇති මෙම පර්යේෂණයේ අරමුණුවලට අනුව ඔවුන්ගේ දැනට පවතින ආර්ථික මට්ටම හඳුනා ගැනීමත් ඔවුන් දරිද්‍රතාවට පත් වීම සඳහා බලපා ඇති ආර්ථික සාධක හා සමාජීය සාධක විශ්ලේෂණය කිරීමත් සිදු කර ඇත. ඒ අනුව පළමු අරමුණට අදාළව පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කරමින් ඔවුන්ගේ පවුල්වල ආර්ථික මට්ටම හඳුනා ගැනීමට උත්සාහ දරා ඇත.

- වතු ජනතාවගේ පවුලේ සිටින සාමාජිකයින් සංඛ්‍යාව
- ගෘහ කුටුම්භයකින් තේ වතු රැකියා සඳහා සම්බන්ධවන පුද්ගලයින් සංඛ්‍යාව
- ගෘහ කුටුම්භයක මාසික ආදායම හඳුනා ගැනීම යන අංශ වේ.

### *5.1. වතු ජනතාවගේ පවුලේ සිටින සාමාජිකයින් සංඛ්‍යාව*

වතු ජනතාවගේ දරිද්‍රතාව වැඩි වීම හෝ නොකඩවා පැවතීම සඳහා ඔවුන්ගේ පවුල සිටින සාමාජිකයින් සංඛ්‍යාව හේතු වේ (රූප සටහන 03). සාපේක්ෂව අඩු ආදායම් ලබන මෙම පවුල්වල සාමාජිකයින් සංඛ්‍යාව ඉහළ යෑම දරිද්‍රතාවය සඳහා ඍණාත්මකව බලපානු ලැබේ.අධ්‍යයන ප්‍රදේශයේ සාමාජිකයින් හතරක් පහක් හෝ පහට වැඩියෙන් සිටින පවුල් සංඛ්‍යාව මුළු පවුල් සංඛ්‍යාවෙන් 81%ක් වේ. ඒ නිසා දරිද්‍රතාව තවත් උග්‍ර වන බව පැහැදිලි වේ. පවුලේ සාමාජිකයින් තුනක් හෝ ඊට අඩුවෙන් සිටින පවුල් ලෙස හඳුනාගත හැක්කේ මුළු පවුල් සංඛ්‍යාවෙන් 19%ක පමණ ප්‍රමාණයකි. සම්මුඛ සාකච්ඡාවලින් පැහැදිලි වූයේ වතු ජනතාව බහුතරයක් කම්කරුවන් ලෙස ආදායම් ලබන බැවින් පවුලේ සාමාජිකයන් වැඩි වූ තරමට ඔවුන්ට කම්කරුවන් ලෙස රැකියා ලබා ගත හැකි නිසා වතු කම්කරු පවුල්වල සාමාජිකයින් සංඛ්‍යාව වැඩි කර ගැනීමට ඔවුන් සිතන බවයි.




*රූපය 03 : තේ වතු කම්කරු ගෘහ කුටුම්භවල මාසික ආදායම*

*මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත ඇසුරින්, 2025*

### *5.2. ගෘහ කුටුම්භයකින් තේ වතු ආශ්‍රිත රැකියා සඳහා සම්බන්ධ වන පුද්ගලයින් සංඛ්‍යාව*

ඉහත සඳහන් කළ පවුලේ සාමාජිකයින් වැඩිකර ගැනීමේ අභිප්‍රාය රැකියා සඳහා සම්බන්ධ වන පුද්ගලයින් සංඛ්‍යාව පිළිබඳ කරුණුවලින් සනාථ වේ. රූප සටහන 04 මගින් තේ වතු ආශ්‍රිත රැකියා සඳහා ගෘහ

කුටුම්භයකින් සම්බන්ධ වන පුද්ගලයින්ගේ සංඛ්‍යාව පිළිබඳ තොරතුරු දක්වා ඇත. එම තොරතුරු අනුව පවුලේ සාමාජිකයන් පස්දෙනකු සිටින පවුල්වලින් වැඩිම පුද්ගලයින් සංඛ්‍යාවක් තේ වතු ආශ්‍රිත රැකියා සඳහා යොමු වී ඇති බව හඳුනාගත හැකි විය. එය 40%කි. පවුලේ සාමාජිකයින් එක් අයකු හෝ දෙදෙනෙකු සිටින පවුල්වල සාමාජිකයන් සියලු දෙනාම වතු ආශ්‍රිත රැකියා සඳහා යොමු වී ඇත. පවුලක විශාල සාමාජිකයින් සංඛ්‍යාවක් සිටියද එයින් වතු රැකියා සඳහා යොමු වී සිටින සාමාජිකයින් සංඛ්‍යාව අඩු වේ නම් එම ගෘහ ඒකකය ලබන ආදායමද අඩු වන නිසා දරිද්‍රතාවය දිගටම පැවතීම සඳහා ගෘහ ඒකකයකින් රැකියාවේ නියුතු සාමාජික සංඛ්‍යාව යන්න ප්‍රබල බලපෑමක් සිදුකරනු ලැබේ.වතු ජනතාවගේ පවුලේ සිටින සාමාජිකයින් සංඛ්‍යාවගෘහ කුටුම්භයකින් තේ වතු රැකියා සඳහා සම්බන්ධවන පුද්ගලයින් සංඛ්‍යාව ගෘහ කුටුම්භයක මාසික ආදායම හඳුනා ගැනීම යන අංශ වේ.




*රූපය 04 : රැකියා සඳහා ගෘහ කුටුම්භයකින් සම්බන්ධ වන පුද්ගලයින් සංඛ්‍යාව*

*මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත ඇසුරින්, 2025*

## *5.3. වතු කුටුම්භවල මාසික ආදායම පිළිබඳ තොරතුරු*

සමස්තයක් ලෙස වතු කුටුම්බවල මාසික ආදායමේ පරාසය රුපියල් 10000-40000ත් අතර අගයක් ගනියි (රූප සටහන 05).එයින් රුපියල් 10000-30000ත් අතර ආදායම් ලබන පවුල් ප්‍රමාණය 41% ක් හා රුපියල් 30000-40000ත් අතර ආදායම් ලබන පවුල් ප්‍රමාණය57%ක් වේ. නමුත් එම ආදායම් තත්වය වැඩි වී ඇත්තේ වතු කම්කරුවන් ලෙස සේවය කරන සාමාජිකයින් සංඛ්‍යාව වැඩි පවුල්වල බව හඳුනාගත හැකි විය. මෙම එක් පවුලක වතු රැකියාවේ නිරත සාමාජිකයින් සංඛ්‍යාව දළ වශයෙන්3ක් හෝ 4ක් වේ.




*රූපය 05 : වතු ගෘහ කුටුම්භවල මාසික ආදායම හා පවුල් සංඛ්‍යාව*

*මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත ඇසුරින්, 2025*

2024 වර්ෂයේ දෙසැම්බර් මාසයේ සඳහා ශ්‍රී ලංකාවේ නිල දරිද්‍රතා රේඛාව රුපියල් 16191 වේ (ශ්‍රී ලංකා ජන ලේඛන හා සංඛ්‍යාලේඛනදෙපාර්තමේන්තුව2024).මෙම අගය එක් පුද්ගලයකුගේ මූලික අවශ්‍යතා සපුරාලීමට අවශ්‍යය අවම මාසික මුදල වේ. මේ අනුව සිව් දෙනෙකුගෙන් යුත් පවුලකට මාසයක් ජීවත්වීමට රුපියල් 64764(16191*4) අවශ්‍ය වේ. නමුත්

පවුලේ සාමාජිකයින් වැඩිම ප්‍රමාණයක් වතු රැකියා සඳහා යොමු වී ඇත්තේ සිව් දෙනකුගෙන් යුත් පවුල්වලින් හා පස්දෙනෙකුගෙන් යුත් පවුල්වලින් වුවත් ඒ එකම පවුලකටවත් රුපියල් 64764ක ආදායමක් නොලැබේ.රුපියල් 40000ට වඩා වැඩි ආදායමක් ලබන පවුල් 2%ක් වුවත් නියැදියෙන් එය එක් පවුලක් පමණක් විය.

එමෙන්ම මාසික ආදායම රුපියල් 30000ක් හෝ ඊට අඩුවෙන් ආදායම් ලබන පවුල් 41%කි. පවුල්වල තේවතු රැකියාවල නිරත වන සාමාජිකයන්ගේ සංඛ්‍යාව 3ක් හෝ 4 දෙනෙක් සිටී. එහෙත් මේ අයට නිල දරිද්‍රතා රේඛාව මගින් දක්වන මූලික අවශ්‍යතා සඳහා අවශ්‍ය වන අවම මාසික ආදායමවත් නොලැබේ. සමස්තයක් ලෙස මුළු පවුල් සංඛ්‍යාවෙන් 50%කටත් වැඩි ප්‍රමාණයක් දරිද්‍රතා රේඛාවට පහළින් සිටින බව හඳුනාගත හැකියි.

වතු කම්කරුවන් සමග සිදු කළ සම්මුඛ සාකච්ඡාවලට අනුව බොහෝ වතුකම්කරු පවුල්වල වතුරැකියාවල නියුතු වීමට හැකි ඉහළ සාමාජිකයන් සංඛ්‍යාවක් සිටියද මාසයේ සියලුම දිනයන්හි ඔවුන්ට සේවයේ නිරත වීමට වතු පරිපාලනය විසින් අවස්ථාව ලබා දී නැත.සාමාන්‍යයෙන් එක් අයකුට මාසයක් තුළදී සේවයේ නිරත වීමට අවස්ථාව ලබාදී ඇත්තේ උපරිම වශයෙන් දින 8ක් හෝ 9ක් පමණි.

එමෙන්ම කාන්තා ශ්‍රමිකයකුට උපරිම වැටුප දිනකට රුපියල් 1000 ලෙසත් පුරුෂ ශ්‍රමිකයකුට උපරිම වැටුප දිනකට රුපියල් 1200ක් ලෙසත් නියම කර ඇත. ඒ හැරෙන්නට එක් පවුලකින් ජල හා විදුලි ගාස්තු සඳහා මාසිකව කිසියම් මුදලක් අයකර ගැනීමත් සිදුකරනු ලැබේ. එම මුදල පවුලේ ගෘහ මූලිකයාගේ වැටුපෙන් අඩු කරගන්නා බවද ප්‍රකාශ කරන ලදී.මේ අනුව වතුකම්කරු ජනතාවගේ වැටුප් ලැබීමේ අවස්ථාව අඩුවන බවත් (මාසික වැඩ කරන දින ගණන සීමා කර ඇති නිසා) මාසික වැටුප අඩු බවත් ජල හා විදුලි ගාස්තු ගෙවීම් නිසා එය තවදුරටත් අඩුවන බවත් හඳුනාගත හැකි විය. මේ නිසා වතු ජනතාව දිගින් දිගටම දරිද්‍රතා රේඛාවට පහළ ආදායම් ලබන ජන කොටසක් බවට පත්වී සිටින බව හඳුනාගත හැකි වේ.

### *5.4. වතු ජනතාවගේ ආර්ථික දරිද්‍රතාවයට බලපා ඇති සාධක විශ්ලේෂණය කිරීම*

මේ යටතේ පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී

- දෛනික වැටුප් විසමතා සඳහා බලපා ඇති හේතු
- වැටුප්වල සාමාන්‍ය අගය
- ස්ත්‍රී පුරුෂභාවය අනුව වැටුප්වල සාමාන්‍ය අගයේ ඇති විසමතාව
- වැටුප අනුව වතු ජනතාව ආර්ථික දරිද්‍රතාවයට පත් වී ඇති ආකාරය

ඉහත සඳහන් තොරතුවලට අනුව වතු ජනතාවගේ ආර්ථික දරිද්‍රතාවය සඳහා බලපා ඇති ප්‍රධාන සාධකය ලෙස ඔවුන්ගේ ආදායම සම්බන්ධ කරුණ තවදුරටත් විශ්ලේෂණය කර ඇත. (වගුව 01)

වගුව 01මගින් වතුකම්කරු ශ්‍රමිකයකු ලෙස වතු ආශ්‍රිත රැකියාවක නිරතවීමේදී පවතින වැටුප් විසමතාව පෙන්වනු ලබයි. මෙම පර්යේෂණයට භාවිත කරන ලද පවුල්වලින්

ස්ත්‍රීශ්‍රමිකයින් 55 දෙනකු හා පුරුෂ ශ්‍රමිකයින් 55 දෙනෙකු වශයෙන් ශ්‍රමිකයන් 110 දෙනෙකුගේ වැටුප් ආශ්‍රිත තොරතුරු මෙහිදී විශ්ලේෂණය කර ඇත. ඒ අනුව ස්ත්‍රී ශ්‍රමිකයෙකුගේ දෛනික මධ්‍යනාය වැටුප රුපියල් 911.34 ක් ලෙසද පුරුෂ ශ්‍රමිකයකුගේ දෛනික මධ්‍යනාය වැටුප රුපියල් 1158.06ක් ලෙසද හඳුනාගත හැකි විය. එමෙන්ම වතු ආශ්‍රිත රැකියාවලදී ස්ත්‍රී ශ්‍රමිකයකුට ලැබෙන අවම වැටුප රුපියල් 800ක් හා උපරිමය 1000ක් ලෙසද පුරුෂ ශ්‍රමිකයෙකුට ලැබෙන අවම වැටුප රුපියල් 1000ක් හා උපරිමය 1200ක් ලෙසද හඳුනාගත හැකි විය.

*වගුව 01 : තේ වතු රැකියාවලින් දෛනිකව ලැබෙන වැටුප*

| | N | Mean | Std. Deviation | Std. Error | 95% Confidence Interval for Mean | | Minimum | Maximum |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | Lower Bound | Upper Bound | | |
| Female | 55 | 911.34 | 101.053 | 15.344 | 892.08 | 947.52 | 800 | 1000 |
| Male | 55 | 1158.06 | 90.764 | 14.562 | 1116.17 | 1171.01 | 1000 | 1200 |
| Total | 110 | 1074.27 | 184.103 | 19.462 | 1009.12 | 1115.85 | 800 | 1200 |

*මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත ඇසුරින්SPSS මෘදුකාංගය මගින්, 2025*

මේ අනුව වතු ආශ්‍රිත රැකියාවලදී ස්ත්‍රී පුරුෂ ශ්‍රමිකයින්ට ලැබෙන දෛනික වැටුප් අතර විසමතාවයක් පවතින බව පැහැදිලිවේ. වතු ආශ්‍රිත රැකියාවලදී ස්ත්‍රීන් හා පුරුෂයින් සමාන කාර්යයන් සමාන කාලයක් තුළ සිදු කරනු ලැබුවත් අතීතයේ සිටම ඔවුන්ගේ වැටුප් අතර වෙනසක් පවත්වාගෙන ඇත. ශ්‍රමිකයෙකු ලෙස වෙහෙස වී සිදු කරන රැකියාවල නිරත වීමේදී ඔවුන්ගේ කාර්යක්ෂමතාවයේ වෙනසක් පවතීයන සමාජීය මතය අනුව ස්ත්‍රී හා පුරුෂ දෙපාර්ශ්වය අතර මෙම වැටුප් විසමතාව පවත්වා ඇත. මේ පදනම අනුව වතු ජනතාව අතර ස්ත්‍රී පුරුෂ දරිද්‍රතාව සලකා බැලූ විට ස්ත්‍රීන්ගේ දරිද්‍රතාවය වඩාත් ඉහළ ගොස් ඇති බව හඳුනාගත හැකිය. ඒ හේතුවෙන් වතු ජනතාව තවදුරටත් දරිද්‍රතාවයට පත්වී ඇත.

වතු කම්කරුවන්ගේ ස්ත්‍රී පුරුෂභාවය අනුව වැටුප් විසමතාවයක් පැවතීම කල්පිත පරීක්ෂාවක් මගින් සනාථ කර ඇත(වගුව 02). මේ සඳහා භාවිත කළ උපකල්පන පහත දැක්වේ.

$H_0$ වතු අශ්‍රිත රැකියාවක නිරතවීමේදී ස්ත්‍රී පුරුෂභාවය අනුව වැටුප් විසමතාවයක් නැත.

$H_1$ වතු ආශ්‍රිත රැකියාවක නිරත වීමේදී ස්ත්‍රී පුරුෂභාවය අනුව වැටුප් විසමතාවයක් ඇත

*වගුව 02 : තේ වතු ආශ්‍රිත රැකියාවලින් දෛනිකව ලැබෙන වැටුප*

| | Sum of Squares | df | Mean Square | F | Sig. |
|---|---|---|---|---|---|
| Between Groups | 3213090.909 | 1 | 3213090.909 | 261.091 | .000 |
| Within Groups | 1329090.909 | 108 | 12306.397 | | |
| Total | 4542181.818 | 109 | | | |

*මූලාශ්‍රය : SPSS මෘදුකාංගය ඔස්සේ සමීක්ෂිත දත්ත මගින්, 2025*

වගුව 02 හි තොරතුරුවලට අනුව වතු ආශ්‍රිත රැකියා සඳහා සම්බන්ධ වීමේදී ස්ත්‍රී පුරුෂභාවය අනුව දෛනිකව ලැබෙන මධ්‍යන්‍ය වැටුපට අදාළ විචලතා විශ්ලේෂණය (ANOVA)අනුව එහි f අගය 261.091ක් හා P අගය 0.000ක් ලෙස ලැබී ඇති නිසා සලකා බලන ලද උපකල්පන අනුව වතු ආශ්‍රිත රැකියාවක නිරතවීමේදී ස්ත්‍රී පුරුෂභාවය අනුව වැටුප් විසමතාවයක් නොපවතී යන $H_0$ කල්පිතය95%ක විශ්වාස මට්ටමකින් ප්‍රතික්ෂේප වන අතර $H_1$ කල්පිතය 95%ක විශ්වාස මට්ටමකින් තහවුරු වේ. ඒ අනුව වතුකම්කරුවන්ගේ ස්ත්‍රී පුරුෂභාවය අනුව ලැබෙන වැටුප් අතර වෙනසක් පවතින බව පැහැදිලි වේ.

## 5.5. වැටුප් විසමතාවයට බලපාන සාධක විශ්ලේෂණය කිරීම

ඉහතදී හඳුනා ගන්නා ලද ස්ත්‍රී පුරුෂභාවය අනුව පවතින වැටුප් විසමතාවය සඳහා බලපා ඇති සාධක සාපේක්ෂ වැදගත්කම් දර්ශකය (Relative Important Index-RII, Rajgor et al.2016) භාවිතයෙන් හඳුනාගෙන ඇත (වගුව 03).

*වගුව 03 : තේ වතු රැකියාවලින් දෛනිකව ලැබෙන වැටුප*

| වැටුප් විසමතාවයට බලපාන සාධක | සාපේක්ෂ වැදගත්කම්දර්ශකය **(RII)** | ඇගයීම් මට්ටම් | **RII**අගයට අදාළ තරා කිරීම |
|---|---|---|---|
| ශාරීරික වශයෙන් පවතින ශක්තිය | 0.90 | 1 | ඉතා වැදගත් මට්ටමකි |
| සමාජීය වශයෙන් පවතින මතවාදය | 0.83 | 2 | ඉතා වැදගත් මට්ටමකි |
| වැඩ නිම කිරීමේ ගුණාත්මකභාවය | 0.72 | 3 | සැලකිය යුතු මට්ටමකි |
| ශ්‍රමික සංඛ්‍යාවේ වෙනසක් පැවතීම | 0.66 | 4 | සැලකිය යුතු මට්ටමකි |
| වැඩ කරන කාලසීමාවේ විසමතාවයක් පැවතීම | 0.21 | 5 | කුඩා වැදගත්කමකි |

*මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත ඇසුරින් සමීක්ෂක විසින්, 2025*

සාපේක්ෂ වැදගත්කම් දර්ශකයට අනුව වැටුප් විසමතාවයට බලපාන සාධක ලෙස ශාරීරික වශයෙන් පවත්නා ශක්තිය, සාමාජීය වශයෙන් පවතින මතය,කාර්යයක්නිම කිරීමේදී පවතින ගුණාත්මකභාවය, ශ්‍රමික සංඛ්‍යාවේ සාපේක්ෂ වැදගත්කම් දර්ශකයට අනුව වැටුප් විසමතාවයට බලපාන සාධක ලෙස ශාරීරික වශයෙන් පවත්නා ශක්තිය, සාමාජීය වශයෙන් පවතින මතය, කාර්යයක් නිම කිරීමේදී පවතින ගුණාත්මකභාවය, ශ්‍රමික සංඛ්‍යාවේ වෙනසක් පැවතීම, වැඩ කරන කාල සීමාවේ වෙනසක් පැවතීම, යන සාධක සලකා බලන ලදි. සාපේක්ෂ වැදගත්කම් දර්ශකයට අනුව වැටුප් විසමතාවය තරා කිරීමට (Ranking) ලක් කර ඇත. එම ඇගයීමේදී පහළම ස්ථානයට පත්ව ඇති සාධකය වන්නේ ශාරීරික වශයෙන් පවතින ශක්තිය මත ස්ත්‍රී පුරුෂභාවය අනුව වැටුප් විසමතාවයක් පවතින බවයි. RII අගයන්ට අනුව එම හේතුවක් "ඉතා වැදගත්" මට්ටමක පවතින බව හඳුනා ගත හැකියි. තේ වතු ආශ්‍රිත රැකියාවලදී දලු නෙළීම පමණක් නොවන අතර

- තේ ගස් කැපීම
- තේ ගස්වලට පොහොර දැමීම
- පරණ තේ ගස් උගුලා ඉවත් කිරීම
- නව වගාවකට බිම් සකස් කිරීම
- නව තේ පැළ සිටුවීම
- වල්පැළ නෙළීම යනාදී කාර්යයන් ඊට අයත් වේ.

එහිදී තේ දලු නෙළීමේ කාර්යයට කාන්තා ශ්‍රමිකයින් වැඩි පිරිසක් සම්බන්ධ වුවද වැඩිපුර වෙහෙස විය යුතු අනෙක් සියලුම කාර්යයන් සඳහා සහභාගී වන්නේ පුරුෂ ශ්‍රමිකයන්ය. එබැවින් ශාරීරික වශයෙන් පවතින ශක්තිය අනුව පුරුෂ පාර්ශ්වයේ ශ්‍රමිකයන්ට වැඩි වැටුපක් ලබාදීම සිදු කරනු ලැබේ.

සමාජයීය වශයෙන් පවතින මතය යන සාධකය සාපේක්ෂ වැදගත්කම් දර්ශකයට අනුව ඇගයීමේදී මධ්‍යම මට්ටමේ දෙවන ස්ථානය ගෙන ඇත. සමාජයීය වශයෙන් ස්ත්‍රී පුරුෂභාවය මත රැකියාවල නිරත වීමේදී කාර්යක්ෂමතාවය වෙනස් වේ යන මතය හේතුවෙන් ඔවුන්ගේ වැටුප්වල විසමතාවයක් තිබීමට හේතු වී ඇත.

කාර්යයක් නිම කිරීමේදී පවතින ගුණාත්මකභාවය යන සාධකය සාපේක්ෂ වැදගත්කම් දර්ශකයට අනුව "සැලකිය යුතු මට්ටමක්" ලෙස හඳුනාගත හැකි වූ අතර එය ඇගයීමේ මට්ටමේ තෙවන ස්ථානයට පත් වී ඇත. එනම් ඉහත සඳහන් කළ අධික ලෙස වෙහෙස වී සිදු කරන තේ වතු ආශ්‍රිත රැකියා සඳහා ස්ත්‍රී පාර්ශ්වයටද සම්බන්ධ වීමේ හැකියාව තිබුණද වැඩ නිම කිරීමේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් පුරුෂ ශ්‍රමිකයින් පෙරමුණ ගෙන ඇත. එබැවින් වැඩ නිම කිරීමේ ගුණාත්මකභාවය යන සාධකයද වැටුප් විසමතාවයට වැඩි බලපෑමක් සිදු කර ඇත.ශ්‍රමික සංඛ්‍යාවේ වෙනසක් පැවතීම හා වැඩ කරන කාල සීමාවයන සාධක සාපේක්ෂ වැදගත්කම් දර්ශකයට අනුව තරා කිරීමේ දී පිළිවෙළින් "සැලකිය යුතු මට්ටමක" හා "පහළ වැදගත්කමක්" සහිත යන මට්ටම්වලදී හඳුනාගත හැකි වේ. එනම් ස්ත්‍රී හා පුරුෂ ලෙස තේ වතු ආශ්‍රිත රැකියාවල නිරතවීමේදී වැඩ කරන කාලසීමාවේ වෙනසක් නොපවතින අතර ඔවුන් දෙපාර්ශ්වයම

සමාන කාල සීමාවක් තුළ ශ්‍රමිකයෙකු ලෙස වැඩ කරනු ලැබේ.

මේ අනුව ශ්‍රමිකයෙක් ලෙස තේ වතු ආශ්‍රිත රැකියාවක නිරත වීමේදී දෛනික වැටුප් පවුලේ ආර්ථික දරිද්‍රතාවයට ප්‍රබල ලෙස බලපෑම් කරන බව හඳුනා ගත හැකිය.

### *5.6. වතු ජනතාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග ආර්ථිකමය වශයෙන් ඔවුන් දරිද්‍රතාවයට පත්වීමට බලපෑම් කර ඇති ආකාරය*

වතු ජනතාව මුහුණ පා සිටින ප්‍රධාන අභියෝග ගණනාවක් පර්යේෂණයේදී හඳුනාගන්නා ලදී. එම අභියෝග සාපේක්ෂ විසමතාවයට බලපාන සාධකවල වැදගත්කම RIIදර්ශකය මගින් හඳුනාගත හැකිය. කෙසේ වුවත් මෙම වැටුප් විසමතාව

වැදගත්කම් දර්ශකයට අනුව තරා කිරීමෙන් ලබාගන්නා ලද තොරතුරු වගුව 04හි දක්වා ඇත.වගුව 04හි සඳහන් වන තොරතුරු අනුව වතු ජනතාව දරිද්‍රතාවයට පත්වීමට බලපා ඇති ප්‍රධානම අභියෝගය ලෙස අඩු වැටුපක් ලැබීම යන සාධකය හඳුනාගත හැකි වේ. එනම් සමාන වේලාවක් තුළ සිදුකරන සමාන කාර්යයන්වලදී ස්ත්‍රී හා පුරුෂ ශ්‍රමිකයින් සඳහා ලබාදෙන වැටුප්වල සැලකිය යුතු වෙනසක් හඳුනාගත හැකිවේ.

*වගුව 04 : සාපේක්ෂ වැදගත්කම් දර්ශකයට අනුව වතු ජනතාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග*

| ප්‍රධාන අභියෝග | සාපේක්ෂ වැදගත්කම් දර්ශකය(RII) | ඇගයීම් මට්ටම් | RII අගයට අදාළ තරා කිරීම |
|---|---|---|---|
| අඩු වැටුප් | 0.932 | 1 | ඉතා වැදගත් මට්ටමකි |
| රැකියා අවස්ථා නොමැතිවීම | 0.782 | 2 | සැලකිය යුතු මට්ටමකි |
| ණයකරුවන් බවට පත් වී සිටීම | 0.76 | 3 | සැලකිය යුතු මට්ටමකි |
| ප්‍රමාණවත් තරම් පොදු පහසුකම් නොමැති වීම | 0.726 | 4 | සැලකිය යුතු මට්ටමකි |
| අඩු අධ්‍යාපනය | 0.566 | 5 | මධ්‍යස්ථ මට්ටමකි |
| රාජ්‍ය ප්‍රතිපත්තිවල පවතින දුර්වලතාවන් | 0.344 | 6 | අඩු වැදගත්කමකි |

*මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත ඇසුරින්, 2025*

සාපේක්ෂ වැදගත්කම් දර්ශකයට අනුව වැටුප් විසමතාවයට බලපාන සාධක ලෙස ශාරීරික වශයෙන් පවත්නා ශක්තිය, සාමාජීය වශයෙන් පවතින මතය, කාර්යයක් නිම කිරීමේදී පවතින ගුණාත්මකභාවය, ශ්‍රමික සංඛ්‍යාවේ

වෙනසක් පැවතීම, වැඩ කරන කාල සීමාවේ වෙනසක් පැවතීම, යන සාධක සලකා බලන ලදි. සාපේක්ෂ වැදගත්කම් දර්ශකයට අනුව වැටුප් විසමතාවය තරා කිරීමට (Ranking) ලක් කර ඇත. එම ඇගයීමේදී පහළම ස්ථානයට පත්ව ඇති සාධකය වන්නේ ශාරීරික වශයෙන් පවතින ශක්තිය මත ස්ත්‍රී පුරුෂභාවය අනුව වැටුප් විසමතාවයක් පවතින බවයි. RII අගයන්ට අනුව එම හේතුවක් "ඉතා වැදගත්" මට්ටමක පවතින බව හඳුනා ගත හැකියි. තේ වතු ආශ්‍රිත රැකියාවලදී දලු නෙළීම පමණක් නොවන අතර

- තේ ගස් කැපීම
- තේ ගස්වලට පොහොර දැමීම
- පරණ තේ ගස් උගුලා ඉවත් කිරීම
- නව වගාවකට බිම් සකස් කිරීම
- නව තේ පැළ සිටුවීම
- වල්පැළ නෙළීම යනාදී කාර්යයන් ඊට අයත් වේ.

එහිදී තේ දලු නෙළීමේ කාර්යයට කාන්තා ශ්‍රමිකයින් වැඩි පිරිසක් සම්බන්ධ වුවද වැඩිපුර වෙහෙස විය යුතු අනෙක් සියලුම කාර්යයන් සඳහා සහභාගි වන්නේ පුරුෂ ශ්‍රමිකයන්ය. එබැවින් ශාරීරික වශයෙන් පවතින ශක්තිය අනුව පුරුෂ පාර්ශ්වයේ ශ්‍රමිකයන්ට වැඩි වැටුපක් ලබාදීම සිදු කරනු ලැබේ.

සමාජයීය වශයෙන් පවතින මතය යන සාධකය සාපේක්ෂ වැදගත්කම් දර්ශකයට අනුව ඇගයීමේදී මධ්‍යම මට්ටමේ දෙවන ස්ථානය ගෙන ඇත. සමාජයීය වශයෙන් ස්ත්‍රී පුරුෂභාවය මත රැකියාවල නිරත වීමේදී කාර්යක්ෂමතාවය වෙනස් වේ යන මතය හේතුවෙන් ඔවුන්ගේ වැටුප්වල විසමතාවයක් තිබීමට හේතු වී ඇත.

කාර්යයක් නිම කිරීමේදී පවතින ගුණාත්මකභාවය යන සාධකය සාපේක්ෂ වැදගත්කම් දර්ශකයට අනුව "සැලකිය යුතු මට්ටමක්" ලෙස හඳුනාගත හැකි වූ අතර එය ඇගයීමේ මට්ටමේ තෙවන ස්ථානයට පත් වී ඇත. එනම් ඉහත සඳහන් කළ අධික ලෙස වෙහෙස වී සිදු කරන තේ වතු ආශ්‍රිත රැකියා සඳහා ස්ත්‍රී පාර්ශ්වයටද සම්බන්ධ වීමේ හැකියාව තිබුණද වැඩ නිම කිරීමේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් පුරුෂ ශ්‍රමිකයින් පෙරමුණ ගෙන ඇත. එබැවින් වැඩ නිම කිරීමේ ගුණාත්මකභාවය යන සාධකයද වැටුප් විසමතාවයට වැඩි බලපෑමක් සිදු කර ඇත.

ශ්‍රමික සංඛ්‍යාවේ වෙනසක් පැවතීම හා වැඩ කරන කාල සීමාවයන සාධක සාපේක්ෂ වැදගත්කම් දර්ශකයට අනුව තරා කිරීමේ දී පිළිවෙළින් "සැලකිය යුතු මට්ටමක" හා "පහළ වැදගත්කමක්" සහිත යන මට්ටම්වලදී හඳුනාගත හැකි වේ. එනම් ස්ත්‍රී හා පුරුෂ ලෙස තේ වතු ආශ්‍රිත රැකියාවල නිරතවීමේදී වැඩ කරන කාලසීමාවේ වෙනසක් නොපවතින අතර ඔවුන් දෙපාර්ශ්වයම සමාන කාල සීමාවක් තුළ ශ්‍රමිකයෙකු ලෙස වැඩ කරනු ලැබේ.

මේ අනුව ශ්‍රමිකයෙක් ලෙස තේ වතු ආශ්‍රිත රැකියාවක නිරත වීමේදී දෛනික වැටුප් විසමතාවයට බලපාන සාධකවල වැදගත්කම RIIදර්ශකය මගින් හඳුනාගත හැකිය. කෙසේ වුවත් මෙම වැටුප් විසමතාවය පවුලේ ආර්ථික දරිද්‍රතාවයට ප්‍රබල ලෙස බලපෑම් කරන බව හඳුනා ගත හැකිය.

### 5.7. වතු ජනතාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග ආර්ථිකමය වශයෙන් ඔවුන් දරිද්‍රතාවයට පත්වීමට බලපෑම් කර ඇති ආකාරය

වතු ජනතාව මුහුණ පා සිටින ප්‍රධාන අභියෝග ගණනාවක් පර්යේෂණයේදී හඳුනාගන්නා ලදී. එම අභියෝග සාපේක්ෂ වැදගත්කම් දර්ශකයට අනුව තරා කිරීමෙන් ලබාගන්නා ලද තොරතුරු වගුව 04හි දක්වා ඇත.

*වගුව 04 : සාපේක්ෂ වැදගත්කම් දර්ශකයට අනුව වතු ජනතාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග*

| ප්‍රධාන අභියෝග | සාපේක්ෂ වැදගත්කම් දර්ශකය(RII) | ඇගයීම් මට්ටම් | RII අගයට අදාළ තරා කිරීම |
|---|---|---|---|
| අඩු වැටුප් | 0.932 | 1 | ඉතා වැදගත් මට්ටමකි |
| රැකියා අවස්ථා නොමැතිවීම | 0.782 | 2 | සැලකිය යුතු මට්ටමකි |
| ණයකරුවන් බවට පත් වී සිටීම | 0.76 | 3 | සැලකිය යුතු මට්ටමකි |
| ප්‍රමාණවත් තරම් පොදු පහසුකම් නොමැති වීම | 0.726 | 4 | සැලකිය යුතු මට්ටමකි |
| අඩු අධ්‍යාපනය | 0.566 | 5 | මධ්‍යස්ථ මට්ටමකි |
| රාජ්‍ය ප්‍රතිපත්තිවල පවතින දුර්වලතාවන් | 0.344 | 6 | අඩු වැදගත්කමකි |

*මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත ඇසුරින්, 2025*

වගුව 04හි සඳහන් වන තොරතුරු අනුව වතු ජනතාව දරිද්‍රතාවයට පත්වීමට බලපා ඇති ප්‍රධානම අභියෝගය ලෙස අඩු වැටුපක් ලැබීම යන සාධකය හඳුනාගත හැකි වේ. එනම් සමාන වේලාවක් තුළ සිදුකරන සමාන කාර්යයන්වලදී ස්ත්‍රී හා පුරුෂ ශ්‍රමිකයින් සඳහා ලබාදෙන වැටුප්වල සැලකිය යුතු වෙනසක් හඳුනාගත හැකිවේ. මෙම තත්වය මත අධ්‍යයන ප්‍රදේශය තුළ වතු ජනතාවෙන් ස්ත්‍රී ශ්‍රමිකයින් දැඩි දරිද්‍රතාවයකට පත්වී සිටිති. සෑම වතු පේළි නිවාසයකම (Line house) සිටින ගෘහ මූලිකයාගේ වැටුපෙන් යම්කිසි කොටසක් ජල හා විදුලි ගාස්තු සඳහා අඩුකර ගැනීම සිදු කරන බව ඉහත සඳහන් කරන ලද අතර (සම්මුඛ සාකච්ඡා මඟින්) එය ඔවුන්ට අවසාන වශයෙන් හිමිවන වේතනය තවදුරටත් අඩු වීමට හේතු වී ඇත.

ඇගයීම් මට්ටමේ දෙවන ස්ථානය හිමි කරගෙන ඇත්තේ තරා කිරීමේදී ඉතා වැදගත්කම් මට්ටමක් ලෙස පවතින අධ්‍යයන ප්‍රදේශයේ වතු ජනතාව මුහුණපා සිටින ප්‍රධාන අභියෝගයක් වන රැකියා

අවස්ථා අහිමිවීමයි. විශේෂයෙන්ම සම්මුඛ සාකච්ඡාවලදී අනාවරණය කර ගැනීමට හැකිවූයේ තේ වතුආශ්‍රිත රැකියාවල නිරත වීමට එක් ශ්‍රමිකයකුට අවස්ථාව ලබාදී ඇත්තේ මසකට දින 8ක් හෝ 9ක් පමණ වන බවයි. ඉතිරි සියලුම දිනවලදී එම ශ්‍රමිකයින් නිවසට වී නිකරුණේ කල්ගත කරන බවත් වෙනත් වතු හිමියන්ගේ වතුවල සේවය කිරීමට යාමේ අවස්ථාවද ඔවුන්ට ලබාදී නොමැති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව අඩු වැටුප් හා මාසයේ සෑම දිනකම සේවය කිරීමට අවස්ථාව නොමැතිවීම යන ප්‍රධාන ආර්ථිකමය අභියෝග ද්විත්වය හමුවේ අධ්‍යයන ප්‍රදේශයේ වතුකම්කරු ජනතාව දැඩි දිළිඳුභාවයකට පත් වී ඇති බව හඳුනා ගන්නා ලදී.

RII තරා කිරීමේදී “සැලකිය යුතු මට්ටමක්” යටතේ හඳුනා ගත හැකි වූ වතු ජනතාව මුහුණ පා සිටින තවත් අභියෝගයක් වන්නේ ඔවුන් ණයකරුවන් බවට පත්වී සිටීමයි. විශේෂයෙන්ම වතු ආශ්‍රිත රැකියාවල නියුතු වීමේදී දෛනික වැටුප දිනපතා අතට නොලැබෙන අතර මාසය අවසානයේදී වැටුප් ගෙවීම සිදුකරනු ලැබේ. එබැවින් ඔවුන් වතු ජනාවාසය අවට පිහිටි සිල්ලරකඩවලින් ණය පොතක් යටතේ නිවසට එදිනෙදා අවශ්‍යය ආහාරපාන මිලදී ගැනීම සිදු කරනු ලැබේ. මෙහිදී බොහෝ විට කඩ හිමියන් විසින් ඔවුන් ලබාගත් භාණ්ඩවලට වඩා වැඩිපුර ණය මුදලක් පොතෙහි සටහන් කර ගැනීම හේතුවෙන්ද මාසය අවසානයේදී රැකියාවෙන් ලැබූ වැටුප ණය ගෙවීම සඳහාවත් ප්‍රමාණවත් නොවන බව හඳුනා ගන්නා ලදී.අඩු අධ්‍යාපන මට්ටම, ප්‍රමාණවත් පොදු පහසුකම් නොමැ-ති වීම, යනාදී අභියෝගයන් RII අගයට තරා කිරීමේදී පිළිවෙළින් “සැලකිය යුතු මට්ටමකින්” සහ “මධ්‍යස්ථ මට්ටමක” හඳුනා ගත හැකි විය. රාජ්‍ය ප්‍රතිපත්තිවල පවතින දුර්වලතා “අඩු වැදගත්කමක්” යටතේ ඇගයීම් මට්ටමේ පහළම ස්ථානයේ හඳුනාගත හැකි විය.

මෙම RII අගයට අනුව තරා කිරීමේදී වතුජනතාව මුහුණපා සිටින ප්‍රධානම අභියෝගයක් ලෙස අඩු වැටුප් හා දිනපතා රැකියා අවස්ථා නොමැති වීම යන ආර්ථික අභියෝග ද්විත්වය ඉහළ වැදගත්කමක්ගෙන ජනතාවගේ දරිද්‍රතාවය තවදුරටත් ඉහළ දැමීමට හේතු වී ඇති බව පැහැදිලි වේ.

## *5.8. වතු ජනතාවගේ දරිද්‍රතාවය සඳහා බලපා ඇති සමාජමය සාධක විශ්ලේෂණය කිරීම*

මේ යටතේ පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ඔවුන්ගේ දරිද්‍රතාවයට සමාජමය සාධකය බලපා ඇති ආකාරය හඳුනා ගැනීමට උත්සාහ දරා ඇත.

- ගෘහ මූලිකයාගේ අධ්‍යාපන මට්ටම
- ගෘහ මූලිකයාගේ අධ්‍යාපන මට්ටම හා විවාහ වූ වයස
- සමාජමය වශයෙන් ඔවුන් දරිද්‍රතාවයට පත්වී ඇති ආකාරය

### *5.8.1. ගෘහ මූලිකයාගේ අධ්‍යාපන මට්ටම දරිද්‍රතාවයට බලපා ඇති ආකාරය*

ගෘහ මූලිකයාගේ අධ්‍යාපන මට්ටම දරිද්‍රතාවයට බලපා ඇති ආකාරය පිළිබඳ තොරතුරු රූපය 10 මගින් දක්වා ඇත.




*රූපය 10 : ගෘහ මූලිකයාගේ අධ්‍යාපන මට්ටම*
*මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත ඇසුරින්, 2025*

මෙහි විශේෂම ලක්ෂණය වන්නේ වතු ජනාවාසය තුළ ජීවත්වන ගෘහ මූලිකයන්ගේ අධ්‍යාපන මට්ටම ඉතා පහළ අගයක් ගෙන තිබීමයි. ගෘහ මූලිකයින්ගෙන 97%ක්ම කිසිදා පාසල් නොගිය අයවන අතර ඉතිරි 3%ක ප්‍රමාණය කිසියම් ශ්‍රේණියකට පමණක් පාසල් ගිය අය බව සඳහන් වී තිබීමෙන් අධ්‍යාපන මට්ටම ඔවුන්ගේ දරිද්‍රතාවයට බලපෑමක් කර ඇති බව හඳුනාගත හැකි වේ. ඔවුන්ට කිසියම් අයුරකින් ඉහළ අධ්‍යාපන මට්ටමක් තිබුණේ නම් වෙනත් රැකියාවක් සඳහා අවස්ථාව ලබා ගැනීමෙන් ඉහළ ආදායමක් ලබාගතහැකි වීමට ඉඩ තිබුණි. ගෘහ මූලිකයාගේ අධ්‍යාපන මට්ටම හා විවාහ වූ වයස අතර පවතින සම්බන්ධතාවයවගුව 05මගින් දක්වා ඇත.

*වගුව 05 : ගෘහ මූලිකයාගේ අධ්‍යාපන මට්ටම හා විවාහ වූ වයස අතර පවතින සම්බන්ධතාවය*

| අධ්‍යාපන මට්ටම / විවාහ වූ වයස | කිසිදා පාසල් නොගිය | 1-3 වසර දක්වා පාසල් ගිය | 4-6 වසර දක්වා පාසල් ගිය | 7 වසර හෝ ඉන් එහා පාසල් ගිය | එකතුව |
|---|---|---|---|---|---|
| 20 ට අඩු | 20 | 7 | 02 | 00 | **27** |
| 21 – 25 | 02 | 11 | 03 | 04 | **20** |
| 26 – 30 | 00 | 03 | 02 | 00 | **04** |
| 31 – 35 | 00 | 01 | 00 | 00 | **01** |
| එකතුව | **22** | **22** | **07** | **04** | **55** |

*මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත ඇසුරින්, 2025*

අධ්‍යාපන මට්ටම හා ගෘහ මූලිකයා විවාහ වූ වයස අතර සම්බන්ධතාවය ඔවුන්ගේ දරිද්‍රතාවයට බලපා ඇති ආකාරය මෙහිදී සලකා බලා ඇත. මෙම විචල්‍යයන් දෙක අතර සම්බන්ධතාවය පරීක්‍ෂා කිරීම සඳහා කෛයි වර්ග පරීක්ෂා ක්‍රමවේදය (Chi squere test) භාවිත කර ඇත. එහිදී පහත සඳහන් උපකල්පන දෙක පරීක්ෂා කරන ලදී.

$H_0$-ගෘහ මූලිකයාගේ අධ්‍යාපන මට්ටම හා විවාහ වූ වයස අතර සම්බන්ධතාවයක් නැත
$H_1$ - ගෘහ මූලිකයාගේ අධ්‍යාපන මට්ටම හා විවාහ වූ වයස අතර සම්බන්ධතාවයක් ඇත
වතුජනාවාසය තුළ සිටින විවාහ වූ පුද්ගලයින් 50 දෙනෙකුගේ දත්ත අනුව සිදු කළ කල්පිත පරීක්ෂාව මගින් 95%ක විශ්වාස මට්ටමකින් අධ්‍යාපන මට්ටම හා විවාහ වූ වයස අතර සම්බන්ධතාවයක් නැත යන කල්පිතය ප්‍රතික්ෂේප විය. ඒ අනුව අධ්‍යාපන මට්ටම වැඩිවන විට විවාහ වූ වයස ඉහළ ගොස් ඇති බව හා අධ්‍යාපන මට්ටම අඩු වන විට විවාහ වූ වයස අඩු වී ඇති බව හඳුනාගත හැකි වේ. එනම් අධ්‍යාපන මට්ටම අඩු ගෘහ මූලිකයින් අඩු වයසින් විවාහ වී ඇත. මෙම තත්ත්වය ඔවුන්ගේ දරිද්‍රතාවය තවත් ඉහළ දැමීමට හේතු වී ඇත.

මේ නිසා ඔවුන්ට තම දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට තරම් මූල්‍යමය හැකියාවක් නොමැති වන බැවින් මව හා පියා පමණක් නොව ඔවුන්ගේ දරුවන්ද කුඩා කාලයේ සිටම වතු ආශ්‍රිත රැකියා කිරීමට යොමු වී

ඇත. එමගින් ඔවුන්ට පැවති දරිද්‍රතාවය ඊළඟ පරම්පරාවටද උරුම වන තත්වයක් උදා වී ඇත. සම්මුඛ සාකච්ඡා මගින් පැහැදිලි වූයේ තම දරුවන් යම් තරමක් පාසල් ගියද ආර්ථික අපහසුකම් හා සමාජයේ වෙනත් පාන්තික දරුවන්ගේ බලපෑම් හා හිංසා කිරීම් නිසා පාසල් යාම නතර කළ බවයි. එනම් සමාජමය වශයෙන් පවතින හේතුද ඔවුන්ගේ දරිද්‍රතාවය තවදුරටත් පැවතීම සඳහා බලපා ඇති බව හඳුනාගත හැකිය. එම සමාජමය බලපෑම් නිසා අධ්‍යාපන අවස්ථා අහිමිවීමෙන් "අඩු අධ්‍යාපනය" යන සමාජමය සාධකය වතු ජනතාවගේ දරිද්‍රතාව සඳහා බලපා ඇති බව හඳුනා ගත හැකිය.

### *5.8.2. වතු ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීමට ගත ඇති ක්‍රියාමාර්ග ඇසුරෙන් සමාජීය වශයෙන් ඔවුන් දරිද්‍රතාවයට පත් වී ඇති ආකාරය හඳුනා ගැනීම*

වතු ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව පර්යේෂණයෙන් ලැබුණ දත්ත සාපේක්ෂ වැදගත්කම් දර්ශකයට (RII) අනුව තරා කිරීමෙන් ලැබුණු තොරතුරු වගුව 06 මගින් දක්වා ඇත.

වගුව 06 : සාපේක්ෂ වැදගත්කම් දර්ශකයට අනුව වතු ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග

| වතු ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග | සාපේක්ෂ වැදගත්කම් දර්ශකය (RII) | ඇගයීම් මට්ටම් | RII අගයට අදාළ තරා කිරීම |
|---|---|---|---|
| වඩා හොඳ වැටුප් අවස්ථාවන් ලබා දීම | 0.888 | 1 | ඉතා වැදගත් මට්ටමකි |
| නව රැකියා අවස්ථා හා විකල්ප ජීවනෝපායන් හඳුන්වා දීම | 0.828 | 2 | ඉතා වැදගත් මට්ටමකි |
| අධ්‍යාපන අවස්ථා ලබා දීම | 0.766 | 3 | සැලකිය යුතු මට්ටමකි |
| වැඩි දියුණු කළ සෞඛ්‍ය සේවා ලබා දීම | 0.624 | 4 | සැලකිය යුතු මට්ටමකි |
| රජයේ මැදිහත්වීම් සිදු කිරීම | 0.608 | 5 | සැලකිය යුතු මට්ටමකි |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර දත්ත ඇසුරින්, 2025

අධ්‍යයන ප්‍රදේශයේ වතු ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීමට ගත හැකි ගත හැකි ක්‍රියාමාර්ග අතරින් පළමු ස්ථානයට RII තරා කිරීම මගින් පෙන්වාදී ඇත්තේ ඔවුන්ට වඩා හොඳ වැටුප් අවස්ථාවන් ලබා දීම කළ යුතු බවයි. එනම් තම ජීවන තත්වය උසස් කර ගැනීමට නම් ස්ථාවර මූල්‍යමය හැකියාවක් තිබිය යුතු බවයි. එහෙත් මොවුන්ගේ වැටුපෙන් මාසිකව ජල හා විදුලි ගාස්තු වෙනුවෙන් කිසියම් කොටසක් අයකර ගැනීම නිසා ජනතාව සමාජයීය වශයෙන් ගැටලු රාශියකට මුහුණ පා සිටී.

නව රැකියා හා විකල්ප ජීවනෝපායන් හඳුන්වාදීම යන ක්‍රියාමාර්ගය RII තරා කිරීමට අනුව ඉතා වැදගත් මට්ටමක් යටතේ හඳුනාගෙන ඇත. එනම් මාසයකට දින 8ක් හෝ 9ක් පමණක් වතු ආශ්‍රිත රැකියාවල නිරතවීමට අවස්ථාව ලබාදීම, ප්‍රදේශයේ පිහිටි වෙනත් වතුවල රැකියා සඳහා යාමට අවස්ථාව ලබා නොදීම යන හේතු නිසා ඔවුන්ට වතු රැකියා කාර්යයන් නොමැති දිනවලදී නිකරුණේ නිවසට වී කල්ගත කිරීමට සිදුවී ඇත. මේ තත්වය නිසා අතිරේක ආදායම් මාර්ගයක් නොමැති වීමෙන් ඔවුන් තවදුරටත් දරිද්‍රතාවයට පත් වී ඇත.

සමාජයෙන් ඔවුන්ට වෙනත් රැකියා අවස්ථාවන් ලබාදීම මගින් අමතර ආදායමක් ලැබෙන අතර ඔවුන්ගේ ශ්‍රමය ජාතික නිෂ්පාදනයට දායක කර ගැනීමටද අවස්ථාව ලැබේ. එමෙන්ම ඒ මගින් ඔවුන්ගේ විරැකියා තත්වයද ඔවුන්ගේ දරිද්‍රතා මට්ටමද අඩුකර ගැනීමට අවස්ථාව ලැබේ.

තෙවන උපාය මාර්ගය ලෙස තම දරුවන්ටද අධ්‍යාපනයක් ලැබිය හැකි වන පරිදි අධ්‍යාපන අවස්ථා ඇති කර දෙන මෙන් ඉල්ලන ලද යෝජනාව RII තරා කිරීමේදී තෙවන ස්ථානයට "සැලකිය යුතු මට්ටමක්" යටතේ හඳුනා ගන්නා ලදි. එම දරුවන් කිසියම් මට්ටමකින් පාසල් යාම සිදු කළත් මධ්‍යම පාන්තික දරුවන්ගේ කායික හා මානසික හිංසාවලට ලක්වන තත්වයක්

පවන නිසා බොහෝ වතු දරුවන් අධ්‍යාපන ගමන නතර කර ඇති බව සම්මුඛ සාකච්ඡාවලින් හෙළි විය.

වතු ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම යන යෝජනාව RII තරා කිරීම යටතේ "සැලකිය යුතු මට්ටමක්" ලෙස අවසන් අදිරයේදී හඳුනාගත හැකි විය. සියලුම වතු ශ්‍රමිකයින් බාහිර පරිසරයට නිරාවරණ වූ රැකියා සිදුකරන නිසා ඔවුන්ට ඇදුම, සෙම්ප්‍රතික්ෂාව, කැස්ස යන රෝගී තත්වයන් වැළදීමට ඇති අවස්ථා වැඩිය. නමුත් මෙම තත්වයන්ට ප්‍රතිකාර ගැනීම සඳහා වතු හිමියන් මොවුන් හට සුදුසු සෞඛ්‍ය පහසුකම් ඇති කරදීම වෙනුවෙන් කිසිඳු අවධානයක් යොමු කර නැත. ඒ අනුව පරිපාලකයින් ශ්‍රමිකයින්ගේ සෞඛ්‍ය පහසුකම් වෙනුවෙන් අඩු අවධානයක් යොමු කරන බව හඳුනාගත හැකි විය. මෙම තත්වය මත ශ්‍රමිකයින්ට වඩා හොඳ සෞඛ්‍ය පහසුකම් ලබාගත හැකි වන පරිදි ඒවා වැඩි දියුණු කර තිබේ නම් ඔවුන්ගේ දරිද්‍රතාවය තරමක් හෝ අඩු කරගත හැකි බව අනාවරණය විය.

## 6. සාකච්ඡාව

දරිද්‍රතාවය යනු මානව සමාජයේ ක්ෂේත්‍රීය වශයෙන් හා කාලීන වශයෙන් මුහුණ දෙන දූර්භාග්‍ය සම්පන්න බහුවිධ ප්‍රපංචයෙකි(Hassan et al., 2022; Yapa, 2004). ඕනෑම රටක සමස්ථ ආර්ථිකයට දායක වන ප්‍රධාන අංශ වන්නේ කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන අංශ තුනයි. කෘෂිකාර්මික අංශය සලකා බැලූ විට එය රටක යැපුම් අවශ්‍යතා හා වෙළෙඳපොළ අවශ්‍යතා වෙනුවෙන් සිදු කරන අංශ දෙකක් දැකිය හැකිය. ශ්‍රී ලංකාව සලකා බැලූ විට යටත් විජිත යුගයේ සිට වෙළෙඳපොළ උදෙසා සිදු කරන වැවිලි වතු වගා අංශය රටේ ජාතික ආර්ථිකයට විශාල දායකත්වයක් සපයයි (United Nations, 2022; Yapa, 2004). එම වතු වගා අංශයෙන්ද තේ වතු වගා අංශය දශක ගණනාවක් තිස්සේ විවිධ සමාජ,ආර්ථික හා පාරිසරික බලපෑම් රාශියකට මුහුණ දෙමින් එම කාර්යය ඉටු කරමින් සිටී. ලෝකයේ තේ නිෂ්පාදනය කරන අනෙකුත් රටවල් සමඟ තරඟ කිරීමට උසස් තත්වයේ තේ නිෂ්පාදනය කිරීම සඳහා තේ වගා අංශයේ, තේ වතු හිමියන්ගෙන්, හා තේ වතුවල සේවය කරන කම්කරුවන්ගෙන්ද සැලකිය යුතු දායකත්වයක් තිබිය යුතුයි(Milbourne, 2024). ඒ සඳහා තේ වතු කම්කරු ජන සමාජය සාධාරණ හා පිළිගත හැකි සමාජමය මට්ටමක සිටිය යුතු වීම අවශ්‍ය කාරණයකි. එහෙත් අනෙකුත් අංශය සමග සංසන්දනාත්මකව බලන විට තේ වතුවගා අංශයේ වතු ජනතාව කැපී පෙනෙන ලෙස ආර්ථිකමය හා සමාජමය වශයෙන් පහළ මට්ටමක සිටින බව හඳුනාගත හැකි වේ. එනම් මෙම තේ වතුවල සේවය කරන ශ්‍රමික කම්කරුවන් ඉතා පහළ දරිද්‍රතා මට්ටමක සිටිමින් සේවය කරන බව අවබෝධ කරගත හැකිය.

එබැවින් තේවතු වගා අංශයේ කම්කරු ශ්‍රමික ජනතාවගේ දරිද්‍රතාවය පිළිබඳ විමර්ශනයක් කිරීම සමාජයීය වශයෙන් මෙන්ම ආර්ථිකමය වශයෙන්ද වැදගත් වේ(Milbourne, 2024; United Nations, 2022). ඒ සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ආඬාරදෙණිය වතු යායට අයත් වතු

ජනතාව පදනම් කරගෙන ඔවුන්ගේ දරිද්‍රතාවය පිළිබඳව විමර්ශනයක් සිදු කරන ලද මෙම පර්යේෂණයේදී එම ජනතාවගේ දෛනික වැටුප හා සේවය කිරීමට ලැබෙන මාසික දින ගණන සීමා වීම යන සාධක අනුව ඔවුන් තවදුරටත් පහළ දරිද්‍රතා මට්ටමක ජීවත් වන බව හඳුනාගත හැකි විය. එමෙන්ම අධ්‍යාපන සෞඛ්‍ය හා වෙනත් පොදු පහසුකම් අතින් ලැබෙන පහළ ගුණාත්මභාවය සමාජයීය වශයෙන්ද ඔවුන් දරිද්‍රතාවයට පත්වීමට බලපාන හේතු ලෙස හඳුනාගත හැකි විය. වර්තමාන ශ්‍රී ලංකාවේ වලංගු මුදල් ඒකකයේ වටිනාකම පහළ බැසීම හා ඒ හේතුවෙන් වෙනත් සේවා සඳහා ඇති මූල්‍යමය වටිනාකම වැඩිවීම නිසා වතු ජනතාව තවදුරටත් පහළ දරිද්‍රතා මට්ටමක සිරවී ඇති බවට පර්යේෂණයෙන් පැහැදිලි විය.

එබැවින් මෙම පර්යේෂණය වතු ජනතාව ආර්ථිකමය වශයෙන් නගා සිටුවීමත්, එමඟින් තේවතුවල නිෂ්පාදනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වැඩි කිරීම මගින් ජාතික ආදායම ඉහළ නැංවීමටත්, තේ සඳහා අන්තර්ජාතිකව පවතින තරඟකාරීත්වය අඩු කිරීමටත් උපකාරී කර ගත හැකිය. එය ඍජුවම තේ වතු වගා අංශයේ සේවය කරන ජනතාවගේ ජීවන මට්ටම උසස් කිරීමෙන් සමස්තයක් වශයෙන් එම ජනතාව සමාජීය වශයෙන් ඉහළ නංවා ගැනීමටත් උපකාරී වේ (රූප සටහන 11).



*රූපය 11 : වතු ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ හා එමගින් නැවත වතු ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීමට හැකි වීම.*
*මූලාශ්‍රය : පර්යේෂණය ඇසුරින්, 2025*

## 7. නිගමන හා යෝජනා

වතු ජනතාවගේ දරිද්‍රතාවය පිළිබඳව සිදු කළ මෙම පර්යේෂණයේදී ඔවුන්ගේ ආර්ථික මට්ටම හඳුනා ගැනීම හා එම දරිද්‍රතා මට්ටමට පත්වීමට බලපා ඇති ආර්ථිකය හා සාමාජීය සාධක විශ්ලේෂණය කරන ලදි. ඒ අනුව පළමුවෙන්ම වතු ආශ්‍රිත රැකියාවල නියුතු පවුල්වල පවතින ආර්ථික මට්ටම හඳුනාගැනීමේදී සාපේක්ෂ වශයෙන් පවුලේ සාමාජික සංඛ්‍යාව 4-5ක් අතර සිටින පවුල් සංඛ්‍යාව මුළු පවුල් සංඛ්‍යාවෙන් 61%ක් වන බවද, සාමාජික සංඛ්‍යාව 3 සිට 5 දක්වා සිටින පවුල් සංඛ්‍යාව 81%ක් වන බවද හඳුනා ගන්නා ලදී.

වතු ජනතාවගේ මාසික ආදායම සලකා බැලූ විට මුළු පවුල් සංඛ්‍යාවෙ 41%ක්ම රුපියල් 30000ට වඩා අඩුවෙන් ආදායම් ලබන බවද මුළු පවුල් සංඛ්‍යාවෙන් 57%ක් රුපියල් 30000-40000ත් අතර ආදායම් ලබන අය බවද හඳුනා ගන්නා ලදි.

වතු ජනතාවගේ ආදායම් අඩුවීමට බලපාන විශේෂ කරුණු දෙකක් හඳුනා ගත හැකි විය.

එයින් පළමුවැන්න නම් ශ්‍රමිකයෙක් ලෙස වතු ක්ෂේත්‍රයේ වැඩ කිරීමට මාසයකට උපරිම ලෙස දින 8-9පමණක් තීරණය කර තිබීමත් දෙවනුව එසේ සේවය කර ලබාගන්නා වැටුපෙන් ජල හා විදුලි ගාස්තු වශයෙන් කිසියම් මුදලක් අයකර ගැනීමත්ය. මේ නිසා ඔවුන් ලබන අවම වැටුප තවදුරටත් අඩුවීමක් සිදු වේ. ශ්‍රමිකයින් ලබන දෛනික වැටුප පුරුෂ ශ්‍රමිකයින් රුපියල් 1200ක් හා ස්ත්‍රී ශ්‍රමිකයින් රුපියල් 1000 වන අතර ඔවුන්ගේ මාසික අවම වැටුප පුරුෂ ශ්‍රමිකයෙක් රුපියල් 1000ක් හා ස්ත්‍රී ශ්‍රමිකයෙක් රුපියල් 800ක් ලෙසද හඳුනාගන්නා ලදි. ඒ අනුව ඔවුන් ලබන දෛනික සාමාන්‍ය වැටුප පුරුෂ ශ්‍රමිකයින් රුපියල් 1058.06ක් හා ස්ත්‍රී ශ්‍රමිකයෙක් රුපියල් 911.34ක් වේ. එම සියලු තොරතුරු අනුව පැහැදිලි වන්නේ වතු ජනතාවගේ දැනට පවතින ආර්ථික මට්ටම ඉතා පහළ තත්වයක පවතින බවයි.

එමෙන්ම ස්ත්‍රී පුරුෂභාවය අනුව ඔවුන් ලබන වැටුප්වල විශාල විසමතාවයක් පවතින බවද කල්පිත පරීක්ෂාව මගින් තහවුරු වී ඇත.මෙම වැටුප් විසමතාවයට බලපාන සාධකවල වැදගත්කම සාපේක්ෂ වැදගත්කම් දර්ශකයට අනුව හඳුනාගැනීමේදී ශරීර ශක්තිය, සාමාජීය මතවාද, කාර්යයන්ගේ ගුණාත්මකභාවය, යන කරුණු ප්‍රධාන ඒවා ලෙස හඳුනාගත හැකි විය.

සාපේක්ෂ වැදගත්කම් දර්ශකයට අනුව වතු ජනතාව දරිද්‍රතාවයට පත් වී ඇති ප්‍රධාන සාධක ලෙස අඩු වැටුප් ලැබීම, රැකියාව සඳහා දින ගණන සීමා කිරීම, ණයකරුවන් බවට පත්වී සිටීම, හා අවම අධ්‍යාපන මට්ටමක් තිබීම යන ඒවා හඳුනාගන්නා ලදි.

පර්යේෂණයේ අවසන් අදියර වශයෙන් වතු ජනතාව දරිද්‍රතාවයට පත්කරවනු ලබන සමාජයීය සාධක විමර්ශනය කරන ලදි. එහිදී කම්කරුවන්ගෙන්97%ක්ම කිසිදා පාසල් නොගිය අය ලෙස හඳුනාගැනීමෙන් අඩු අධ්‍යාපන මට්ටම ඔවුන්ගේ දරිද්‍රතාවයට බලපා ඇති බව පැහැදිලි වේ. මෙහි දෙවන ගැටලුව වන්නේ අඩු අධ්‍යාපන මට්ටම හා ඔවුන්ගේ විවාහ වූ වයස අතර ධන සම්බන්ධතාවයක් පැවතීමයි. මේ නිසා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වැඩිවීමෙන් තවදුරටත් දරිද්‍රතාවය ස්ථාවර වීමට හා දරුවන්ට අධ්‍යාපනය ලබා දීමට නොහැකි තත්වයක් උද්ගත වී තිබේ. එනිසා ඔවුන්ගේ දරිද්‍රතාවය පරම්පරාගතව පවතින තත්වයකට පරිවර්තනය වී තිබේ. අවසාන වශයෙන් වතු ජනතාවගේ දරිද්‍රතාවය, ඔවුන්ගේ ජීවන තත්වය උසස් කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග ඇසුරින් සාපේක්ෂ වැදගත්කම් දර්ශකය භාවිත කර විශ්ලේෂණය කරන ලදි. ඒ අනුව ජීවන තත්වය උසස් කිරීම සඳහා වඩා හොඳ වැටුප් ලබන අවස්ථාවන් ඇති කිරීම, නව රැකියා හා විකල්ප ආදායම් මාර්ග හඳුන්වාදීම, සුදුසු අධ්‍යාපන පහසුකම් ඇති කිරීමට කටයුතු කිරීම, හා දියුණු කළ සෞඛ්‍ය හා යටිතල පහසුකම් පද්ධතියක් ලබාදීමත් රාජ්‍ය මැදිහත්වීම වඩාත් යහපත් කිරීමත් සුදුසු වන බව හඳුනාගන්නා ලදි.

මෙම පර්යේෂණයේ ප්‍රතිඵල අනුව වතු ජනාවාස සම්බන්ධයෙන් පැවතුණු හා දැනටමත් පවතින ආර්ථික හා සමාජ තත්වයන් ගණනාවක් නිසා අවම දරිද්‍රතා රේඛාවෙන් වඩාත් පහළ ආදායම් ලබන ජන

කොටසක් බවට ඔවුන් පත් වී ඇත. මෙම තත්වය සඳහා බලපා ඇති සාධක කීපයක් පවතින බව නිගමනය කළ හැකිවිය. මෙම අධ්‍යයන ප්‍රදේශයේ වතු ශ්‍රමික පවුල් එකක් හැරුණු විට ඉතිරි සියලුම පවුල්වල මාසික ආදායම රුපියල් 40000ට වඩා අඩු වේ. රුපියල් 40000ක් ලබන පවුල්වල සාමාජික සංඛ්‍යාව අනුව ඔවුන්ගේ වැටුප 2024 නිල දරිද්‍රතා සීමාව වන රුපියල් 16191ට වඩා විශාල ලෙස පහළ මට්ටමක පවතින බව හඳුනා ගන්නා ලදි. ඒ අනුව මෙම ජන කණ්ඩායම දැඩි දරිද්‍රතාවයකට පත්වී සිටින බව නිගමනය කළ හැකිය.

අධ්‍යයන ප්‍රදේශයේ දෛනික අවම වැටුප ස්ත්‍රී ශ්‍රමිකයන්ගේ රුපියල් 800ක් හා පුරුෂ ශ්‍රමිකයින්ගේ රුපියල් 1000ක් වන බවත් හඳුනා ගන්නා ලද අතර මෙම තත්වය අනුව සමස්ත වතු ජනතාව දැඩි දරිද්‍රතාවයක් පෙන්නුම් කරයි. එමෙන්ම ඔවුන්ගේ සාමාන්‍ය වැටුපට වඩා ස්ත්‍රී සාමාන්‍ය වැටුප ඉතා පහළ මට්ටමක පවතී.මේ නිසා මෙම ජන සමාජය තුළ ස්ත්‍රීන් වඩාත් ප්‍රබල දරිද්‍රතාවයකට පත් වී ඇති බව නිගමනය කළ හැකිය.

වතු ජනතාව දරිද්‍රතාවයට පත්වීමට බලපාන ලද සමාජයීය සාධක වශයෙන් හඳුනාගත හැකි වූ විශේෂම ලක්ෂණය වූයේ අධ්‍යයනයට ලක් කළ වතු නිවාස 55න් 97%කම ගෘහ මූලිකයන් කිසිදා පාසල් නොගිය අය ලෙස හඳුනාගත හැකි වීමයි. එසේම මෙහි තවත් විශේෂත්වයක් වූයේ මෙම ගෘහ මූලිකයින්ගෙන් වැඩි පිරිසක් විවාහ වී ඇත්තේ වයස අවුරුදු විස්සට පෙරවීමය. මෙම තත්වය ඔවුන් බරපතල ලෙස දරිද්‍රතාවයට පත්වීමට හේතු වී ඇති බව නිගමනය කළ හැකියි.අවසාන වශයෙන් වතු ජනතාව සමාජයීය වශයෙන් ඉහළට පැමිණීමට ඇති මාර්ගය වන අධ්‍යාපනය ලැබීමේදී වෙනත් අයගෙන් වතු ජනතාවගේ දරුවන්ට යම් යම් කායික හා මානසික හිංසාකාරි ක්‍රියා සිදු වන බව හඳුනා ගත හැකි විය. මෙම තත්වය වතු ජනතාව ගේ දරුවන් පාසල් අධ්‍යාපනය වෙත යොමු නොවීමට හේතුවක් ලෙසද හඳුනාගත හැකියි.

වතු ජනතාවගේ දරිද්‍රතාවය සඳහා බලපා ඇති මූලිකම හේතුව වන්නේ ඉතා අඩු දෛනික වැටුපක්(රුපියල් 800-1000) ලැබීම බව පැහැදිලිව හඳුනාගත හැකි නිසා මොවුන්ට සාධාරණ වැටුපක් ලබාදීම අත්‍යවශ්‍ය වේ. එය රටේ වතු නොවන වෙනත් අංශවල සේවය කරන ශ්‍රමිකයෙකුට ලැබෙන වැටුපට ආසන්න වැටුපක් වන්නේ නම් තත්වය තරමක් හෝ අවම කර ගත හැකියි. වර්තමානයේ දී රටේ කෘෂි අංශය, වඩු කර්මාන්ත අංශය, ඉදිකිරීම් අංශය වැනි අනෙකුත් අංශවල දෛනිකව වැඩ කරන ශ්‍රමිකයකුට අවම වශයෙන් රුපියල් 2500ක් හා උපරිමය රුපියල් 4000ක් අතර වැටුපක් ලැබේ. එහෙත් මෙහි පවතින ගැටලුව වන්නේ තේවතු පවතින්නේ සමාගමක් ලෙස ක්‍රියාත්මක වන ව්‍යාපාරයක් වශයෙන්ම වීමයි. එහිදීම සේව්‍ය විපක්ෂයට වතුකම්කරුවන් යනු තම ව්‍යාපාරයට යොදවන එක් යෙදවුමක් වන ශ්‍රමය යන සාධකය පමණක් වේ. මේ නිසා ඔවුන් සෑම විටම ව්‍යාපාරයේ ලාභදායිත්වය වැඩිකර ගැනීම සඳහාඅඩුම මිලකට ශ්‍රමය යෙදවීමට උත්සාහ ගනු ලබයි. එබැවින් වතු සමාගම් හා වතු අයිතිකරුවන් සමග සාමූහික ගිවිසුමකට පැමිණීමෙන් මෙම වැටුප් පිළිබඳව ගැටලුව අවම කර ගත හැකිය.

දෙවනුව වතුකම්කරුවන් ගේ මාසික වැටුප අඩුවීමට බලපාන හේතුවක් වන මසකට සේවය කිරීමට ඇති දින ගණන සීමා කිරීම වැළැක්වීම සිදු කළ යුතුයි. මාසයක් පුරාම සේවය කිරීමට ඔවුන්ට වතු යායේ කාර්යයක් නොමැති නම් ඔවුන් වෙනත් රැකියාවකට යාමට නිදහස් කළ යුතුයි. නීත්‍යානුකූලව ඔවුන්ට වෙනත් රැකියාවකට යාමට අවසර දීමෙන් ඔවුන්ට ඉහළ ආදායමක් ලබාගත හැකි වේ. නමුත් වතු හිමියන් තම වතුවලට දිගු කාලීනව අවශ්‍ය ශ්‍රමිකයින් නොමැතිවේ යැයි යන අවිනිශ්චිතතාව නිසා වතු ශ්‍රමිකයින් කිසියම් ආකාරයකට කොන්දේසි පනවා තමන් වෙතම බැඳ තබාගෙන ඇත. මෙම තත්වය වළක්වා ඔවුන්ට මාසය පුරාම සේවය කිරීමට සුදුසු තත්වයක් නිර්මාණය කළ යුතුයි.

එමෙන්ම වතු ජනතාව ලබන අවම වැටුපෙන්ද වතු නිවාසවලට ජලය හා විදුලිය ලබාදීම වෙනුවෙන් ගාස්තුවක් අය කරගැනීම වතු කම්කරුවන්ට තවත් පීඩනයක් බවට පත් වී ඇත. මේ නිසා වතු සමාගම් විසින් මෙම අයගෙන් සහනදායි ක්‍රමයකට මෙම ගාස්තු අයකර ගැනීම සිදු කළ යුතුයි. එසේම සූර්ය බල පද්ධති වැනි නව තාක්ෂණික ක්‍රමවේද මගින් මෙම ගැටලු තරමක් හෝ අවම කර ගැනීමට කටයුතු කිරීම වැදගත් වේ.

වතු ජනතාව පීඩාවට පත් වී සිටින දරිද්‍රතාවයෙන් ඉහළට ගෙන ඒම සඳහා ඔවුන්ගේ පොදු පහසුකම් වැඩිදියුණු කිරීමද අත්‍යවශ්‍ය වේ. මේ යටතේ පළමුවෙන්ම වතු නිවාස අවට පරිසරය,ජලය බැස යන කාණු, වැසිකිළි පද්ධති, යනාදිය වැඩිදියුණු කිරීමේ වැඩපිළිවෙලක් අවශ්‍ය වේ. එමෙන්ම නිරන්තරයෙන්ම බාහිර පරිසරය සමඟ ගැටෙමින් සේවය කරන වතුකම්කරුවන්ට නිතර අවශ්‍ය වන සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීමට අත්‍යවශ්‍ය කරුණක් වේ. තෙවනුව වතු ජනාවාසය ආශ්‍රිත පාසල්වල පහසුකම් වැඩිදියුණු කිරීමද අවශ්‍ය වේ.

වතු ජනතාව පරම්පරාගතව දරිද්‍රතාවයට පත්වීම වැළැක්වීම සඳහා ඔවුන්ගේ දරුවන් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා යොමු කිරීම අත්‍යවශ්‍ය කරුණක් වේ. මේ සඳහා දරුවන්ගේ අවශ්‍යතා සඳහා සහනදායි ක්‍රමයක් තිබීම වැදගත් වේ. දෙමාපියන්ට අධ්‍යාපනයේ ඇති වැදගත්කම පිළිබඳව දැනුවත්භාවය වැඩිදියුණු කළ යුතුයි.මේ යටතේම වතු දරුවන් අධ්‍යාපනය ලබන පාසල්වලදී ඔවුන් සමාජයේ පහළ පන්තියක් ලෙස පීඩනයට පත්වීම වැළැක්වීම සඳහා සමාජීය වශයෙන් පුළුල් සංවිධානාත්මක දැනුවත් කිරීමක් අවශ්‍ය වේ. එසේ නොමැති වුවහොත් දරුවන් පාසල කෙරෙන් බැහැරවීමෙන් වතු පවුල්වල දරිද්‍රතාවය ඊළඟ පරම්පරාවටද පැවත එනු ඇත.

අවසාන වශයෙන් පර්යේෂණයේදී හෙළි වූ කරුණක් වූයේ අඩු වැටුප හා සේවය කිරීමට ඇති දින ගණන සීමා වීම නිසා එදිනෙදා ආහාර ද්‍රව්‍යය සඳහා වතු කම්කරුවන් කඩ හිමියන්ගේ ණයකරුවන් බවට වී ඇති බවයි. මේ නිසා වතු ශ්‍රමිකයන්ගේ මූල්‍යමය අවශ්‍යතා සඳහා පොදු, පොලි රහිත ණය පහසුකම් ලබා ගැනීමේ වැඩපිළිවෙලක් ඇති කිරීම අවශ්‍ය වේ. එසේ නොමැති වුවහොත් වතුකම්කරුවන් අනාගතයේදීත් පුද්ගලික සිල්ලර කඩ හිමියන්ගේ ණයකරුවන් බවට පත් වී සිටිය හැකිය.

මානව ශ්‍රමය යනු රටක ජාතික සම්පතක් ලෙස වශයෙන් සලකා බැලූ විට වතුකම්කරුවන් මාසයේ දින අටක් නවයක් පමණක් සේවය කිරීම මානව සම්පත අපතේ යාමක් ලෙස හඳුනාගත හැකියි. වතු හිමියන් කම්කරුවෙකුට මාසයකට උපරිම දින කීපයක් පමණක් සේවය කිරීමට සැලැස්වීම නිසා මාසයේ වැඩි දින ගණනක් ඔවුන්ට නිකරුණේ කල් ගත කිරීමට සිදු වී තිබේ. මේ නිසා මෙම විශාල කාලයෙන් ප්‍රයෝජනයක් ගැනීමටත්, වතුකම්කරුවන්ට ආදායමක් ලැබීමටත් හැකිවන වැඩපිළිවෙළක අත්‍යවශ්‍යතාවය වඩාත් කැපී පෙනේ. මේ මගින් අඩු වැටුප් නිසා ඔවුන් ලබා ඇති පීඩනයෙන් යම් තරමකට හෝ නිදහස් කර ගත හැකිය.

මෙම සියලුම කරුණු වූ සලකා බලා වතු ජනතාව වෙත ශක්‍රීය හා සත්‍යය ආදායම් ලබන වැඩපිළිවෙළක් සකස් කළහොත් ඔවුන් ආර්ථිකමය අතින් කිසියම් ශක්තිමත් භාවයක් ලබා ගනු ඇත. මේ තුළින් ඔවුන් පීඩා විඳින දරිද්‍රතාවයෙන් තරමක් හෝ ඉහළට පැමිණෙනු ඇත එහි වක්‍ර ප්‍රතිඵලය ලෙස ශ්‍රී ලංකාවේ ජාතික ආදායමට සෘජුවම දායක වන තේ නිෂ්පාදනය වඩාත් හොඳ මට්ටමකට ගෙන ඒමටත් අවස්ථාව ලැබේ යැයි විශ්වාස කළ හැකිය. එතුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් වීමට මග පෑදෙනු ඇති බැවින් මෙම පර්යේෂණය ජාතිකමය වශයෙන්ද වැදගත් කොට සැලකිය හැකිය.

## 8. ආශ්‍රි- ග්‍රන්ථ


Bandara, H. G. K. N., Karunarathna, B. D. NS., Nalinda Nuwan, A., & Bulankulama, G. K. (2023). Study on estate sector poverty: Special reference to Ganga Ihala Divisional Secretariate Division, 1(1). https://www.researchgate.net/publication/375416376

CN. (2025, April 25). National poverty line for February 2025 set at Rs. 16,318. LNW Lanka News Web. https://lankanewsweb.net/archives/72509/national-poverty-line-for-february-2025-set-at-rs-16318/

Das, T., & Guha, P. (2018, March 30). Inequality and incidence of poverty among labourers in tea plantation sector: A study of Dibrugarh District ofAssam.https://www.researchgate.net/publication/341763659

Dharmadasa, R. A. P. I. S., & HewavitharanaM. K. (2023, March 8). Income diversification of tea estates households in Badulla district. https://www.researchgate.net/publication/369085256

Dharmadasa, R. A. P. I. S., Weerahewa, J., & Samarathunga, P. A. (2018). Impact of remittances on estate sector poverty: A study on the tea estate sector in Badulla District. *Sri Lanka Journal of Economic Research*, 6(1), 31.https://doi.org/10.4038/sljer.v6i1.25

Dong, G., et al., (2024). Geographical match of objective and subjective measures of well-being at an intra-city scale. Applied Geography, 167,103290.

Fernando, P. M. M., Kumara, P. H. T., Dharmadasa, R. A. P. I. S., & Samaraweera, W. G. R. L. (2019, September 9). Multidimensional poverty among the estate population of Badulla District in Sri Lanka. https://www.researchgate.net/publication/335692074

Hassan, N.H. et al., (2022). Making do and staying poor: The poverty context of Urban Brunei. Geoforum, 136, 132-141.

Journal of Competitiveness. (2023). Cjournal.cz.https://www.cjournal.cz/index.php?hid=clanek&cid=84

Koiry, S., Kairi, B., & Pooja, P. (2024). Impact of income diversification on multidimensional poverty: Household level evidence from tea estates in Bangladesh. Heliyon, 10(e26509).https://doi.org/10.1016/j.heliyon.2024.e26509

LIVING WAGE FOR THE TEA ESTATE WORKERS IN SRI LANKA, 2022. Vijesandiran S.,Institute of Social Development

Majumder, S. C., & Roy, S. C. (2011). Socio-economic conditions of tea plantation workers in Bangladesh: A case study on Sreemongal. Indian Journal of Applied Research, 1(10), 37–40 https://doi.org/10.15373/2249555x/jul2012/14

Milbourne, P. (2024). Beyond ’feeding the crisis’: Mobilising ‘more than food aid’ approaches to food poverty in the UK. *Geofurm*, 150, 103976.

Poverty line rises to Rs. 16,191 in Dec. (2025, February 7). The Morning. https://www.themorning.lk/articles/XVZPwXvZuJ3EYQh5f3Ks

Rising School Dropouts: The Plight of Estate Children in Sri Lanka. Avilable fromhttps://www.ips.lk/talkingeconomics/2022/11/17/rising-school-dropouts-the-plight-of-estate-children-in-sri-lanka

United Nations (2015). Sustainable Develo -pment Goalds Avilable from:https:// sdgs.un.org/goals (Accessed:12/02/ 2025).

United Nations (2022). Sri Lanka Poverty and Welfare: Recent Progress and Remaining Challenges 2016. Avilabe from: https://agris.fao.org/search/en/providers/122582/ records/64748 205bf 943c 8c7988a9e8 (Assessed: 19/03/2025).

Vithanage, Himani (2022). Rising School Dropout: The Plight of Estate Children in Sri Lanka, the blog of the Institute of Policy Studies of Sri Lanka (IPS).

Yapa, L. (2004). The Poverty Discourse and the Poor in Sri Lanka. *Transactions of the Institute of British Geographers, 23(1).3 - 144*

ආර්ථික විමසුම,(2001),ජූලි,අගෝස්තු කලාපය, මහජන බැංකුව.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නෙළුව. (2023). සම්පත් පැතිකඩ, නෙළුව: ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නෙළුව.

ග්‍රාම නිලධාරි කාර්යාලය, (2023). ග්‍රාම නිලධාරි දත්ත වාර්තා,ඉ/ගිගුම්මඩුව: ග්‍රාම නිලධාරී ඉ/ගිගුම්මඩුව: ග්‍රාම නිලධාරී කාර්යාලය, ඉ/ගිගුම්මඩුව

ආඛ්‍යාන narrations

*Open Access, Referred Biannual Jornal*

**Volume 10 | Issue 02 | 2025**

**Published By**

Center for Indigenous and Community Studies

Sabaragamuwa University of Sri Lanka

**Akyana (2025), Vol. 10 (02) Pp 188 - 215**

**Journal homepage:**
www.sab.ac.lk/cikcs/akyana narratios

# නාගරික ප්‍රදේශවල ජනගහන සංකේන්ද්‍රණය ජාතික මැතිවරණ ප්‍රතිඵල සඳහා කරන බලපෑම: කොළඹ දිස්ත්‍රික්කය ඇසුරින්

ARTICLINFO

Article History:
Received 06 Oct 2025
Revised 10 Dec 2025
Accepted 17 Dec 2025
Published 31 Dec 2025

CC BY NC ND

ISSN2478 - 0642

**සත්සරණි පී. එල්. එන්.** [1]**, උළුවඩුගේ ප්‍රදීප්** [2*] **සහ ගමගේ සයුරි**[3]

[1,2,3]සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**Corresponding author E-mail address: pradeep@ssl.sab.ac.lk*

**උපුටා දැක්වීම:** ***සත්සරණි, පී. එල්. එන්., උළුවඩුගේ, පී., සහ ගමගේ, ස., (2025).නාගරික ප්‍රදේශවල ජනගහන සංකේන්ද්‍රණය ජාතික මැතිවරණ ප්‍රතිඵල සඳහා කරන බලපෑම: කොළඹ දිස්ත්‍රික්කය ඇසුරින්. ආඛ්‍යාන, 10 (02), පි.අ.188 - 215***

## සාරසංක්ෂේපය

ජන සංකේන්ද්‍රණය විවිධ ගතික සංස්කෘතීන් සහ සමාජ, දේශපාලන සහ ආර්ථික පසුබිම් වල සංකිර්ණ මධ්‍යස්ථානයක් බවට නගරය පත් කරයි. මෙවැනි සංකීර්ණ සමාජ අවකාශයක් නිර්මාණය කරන නගරයක් රට තුළ පාලන ක්‍රමය සංස්ථාපනය කරන මැතිවරණ ක්‍රමයට කෙබඳු බලපෑමක් එල්ල කරන්නේ ද යන්න හඳුනා ගැනීම කළ යුත්තකි. ඒ අනුව ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශයන් තුළට සංකේන්ද්‍රණය වන ජනතාවගේ ඡන්දදායක හැසිරීම, ඊට බලපාන්නා වූ සමාජ, දේශපාලන, ආර්ථික, මනෝ විද්‍යාත්මක පසුබිම ජාතික මැතිවරණ ප්‍රතිඵල සඳහා කරනු ලබන බලපෑම් මොනවාද? යන පර්යේෂණ ගැටලුව පාදක කරගනිමින් මෙම පර්යේෂණය සිදු කළේය. කොළඹ දිස්ත්‍රික්කය ප්‍රධාන වශයෙන් සැලකිය යුතු නාගරිකරණය ව්‍යාප්තියක් පෙන්නුම් කරන බැවින්, එය පර්යේෂණයේ අධ්‍යයන ප්‍රදේශය ලෙස තොරා ගත් අතර, අධ්‍යයනය තවදුරටත් පටු කර ගැනිම උදෙසා 2019 සහ 2024 ජනාධිපතිවරණ ප්‍රතිඵල වෙත පමණක් අවධානය යොමු කිරිමට පියවර ගෙන ඇත. අධ්‍යයනය මිශ්‍ර පර්යේෂණ ක්‍රමය මත පදනම් විය. අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් සහ ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා ඔස්සේ ප්‍රාථමික දත්ත රැස් කරන ලදී. පොත්, පර්යේෂණ වාර්තා, නිල වාර්තා, සඟරා ලිපි, පුවත්පත් වෙබ් අඩවි ඔස්සේ ද්විතියික දත්ත රැස් කරන ලදී. නියැදිය ප්‍රතිචාර දැක්වූවන් 120 දෙනෙකුගෙන් සමන්විත වේ. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය කිරීම සඳහා SPSS භාවිතා කරන ලද අතර, ගුණාත්මක දත්ත විශ්ලේෂණය කිරීම සඳහා තේමාකරණ විශ්ලේෂණ ක්‍රමය භාවිතා කරන ලදී. විශ්ලේෂණ ප්‍රතිඵල වලට අනුව කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාවගේ ඡන්දදායක චර්යාව නිර්මාණය වීම සඳහා ව්‍යුහාත්මක ප්‍රදේශයේ බලපෑම, පවුල, මාධ්‍ය, ගැටුම් සහ දේශපාලන අවිශ්වාසයේ ඓතිහාසික උරුමය, ආර්ථිකය සම්බන්ධව ගොඩනැගී ඇති අතෘප්තිය ඇතුළු සාධක ගණනාවක් බලපා ඇති බව සොයාගත හැකි විය. ඒ අනුව ඉදිරි දේශපාලන වටපිටවකදී නව පක්ෂ සහ නව නායකත්වයකට ඇති ජන ආශාව දිගින් දිගටම වැඩි වනු ඇතැයි නිගමනය කළ හැක. සමස්තයක් වශයෙන් මෙම පර්යේෂණ සොයාගැනීම් අපේක්ෂකයින්ට ඔවුන්ගේ දේශපාලන ව්‍යාපාර අතරතුර නාගරික ඡන්දදායකයින් වෙත ධනාත්මක හැඟීම් ඇති කිරීමට සහ පොදු ජනතාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා බලධාරීන්ට ප්‍රායෝගික ඇඟවුමක් දක්වා ඇත.

**මූඛ්‍ය පද :** කොළඹ දිස්ත්‍රික්කය, ඡන්දදායකයා චර්යාව, ජනාධිපතිවරණ, නාගරිකරණය, ශ්‍රී ලංකාව

# 1. හැඳින්වීම

ජන සංකේන්ද්‍රණය විවිධ ගතික සංස්කෘතීන් සහ දේශපාලන, සමාජ සහ ආර්ථික පසුබිම් වල සංකීර්ණ මධ්‍යස්ථානයක් බවට නගරය (City) පත් කරයි. නගරය මිනිසා ජීවත් වන ප්‍රධාන සමාජ අවකාශයක් වේ. ප්‍රදේශයක සිටින ජන සංඛ්‍යාවත්, පරිපාලන කටයුතු ඒකරාශි වීමත්, නිවාස සංඛ්‍යාවත්, කෘෂි කාර්මික නොවන රැකියාවල නිරතව සිටින පිරිමින් ප්‍රමාණය හෝ ආර්ථික කටයුතු යනාදිය ඇතුළත්ව නාගරික ප්‍රදේශයන් යන්න හඳුනාගනු ලැබේ (ප්‍රේමරත්න, 2011). 21 වැනි සියවසේ පෙර නොවූ විරු මට්ටමේ නාගරීකරණයක් සිදුවී ඇති අතර, ලෝක ජනගහනයෙන් අඩකට වඩා අද වන විට නාගරික ප්‍රදේශවල වාසය කරයි. එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කටයුතු දෙපාර්තමේන්තුවට අනුව 2050 වන විට ගෝලීය ජනගහනයෙන් 68% කට ආසන්න ප්‍රමාණයක් නාගරික ප්‍රදේශවල වාසය කරනු ඇත (වනසුන්දර, 2024). මෙම ජන සංකේන්ද්‍රණය විවිධ ගතික සංස්කෘතීන්, මතවාදයන් සහ සමාජ ආර්ථික පසුබිම්වල මුලස්ථානයක් බවට නගරය පත් කරයි. මෙවැනි සංකීර්ණ සමාජ අවකාශයක් නිර්මාණය කරන නගරයක් රට තුළ පාලන ක්‍රමය සංස්ථාපනය කරන මැතිවරණ ක්‍රමයට කෙබඳු බලපෑමක් එල්ල කරන්නේ ද යන්න හඳුනා ගැනීම කළ යුත්තකි.

නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක මධ්‍ය ලක්ෂය වන්නේ ඡන්ද විමසීම ය. ඒ මන්ද යත් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයකට බලය ලැබෙනුයේ පාලිතයන්ගේ එකඟත්වය මඟින් පමණක් වන හෙයිනි. එම එකඟත්වය රාජ්‍ය බලය බවට පරිවර්තනය කළ හැකි ප්‍රධාන ක්‍රමය වන්නේ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් පැවැත්වීම ය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හිටපු එක්සත් ජනපද තානාපතිවරිය වූ ජීන් කර්ක පැට්‍රික්ට අනුව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක මැතිවරණ යනු,

*"ප්‍රජාතන්ත්‍රවාදී ඡන්ද විමසීම හුදෙක් සංකේතාත්මක නොවේ. ඒවා තරඟකාරී, වාරානුකූල, විශාල ඡන්දදායකයන් සංඛ්‍යාවක් අන්තර්ගත වන නිශ්චයකාරී ඒවා වන අතර, රජය විවේචනය කිරීමටත්, එම විවේචනයන් ප්‍රසිද්ධ කිරීමටත්, විකල්ප ඉදිරිපත් කිරීමටත්, පුළුල් නිදහසක් භුක්ති විඳින පුරවැසියන් විසින් එම ඡන්ද විමසීම මඟින් රජයක ප්‍රධාන තීරණ ගන්නන් තෝරාගනු ලබයි" (චින්තනී, 2015: 3).*

මේ අනුව ශ්‍රී ලංකාවේ ද ජනාධිපතිවරණ, මහාමැතිවරණය, පළාත් සභා මැතිවරණ, පළාත් පාලන මැතිවරණ ආදී ලෙස රටේ සෑම සමාජ තලයක්ම නියෝජනය වන ආකාරයට සකස් කරන ලද මැතිවරණ ක්‍රියාවලියක් පවතී. මැතිවරණයක දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා වන කාලය පැය නවයකට සීමා වුව ද, කුමන පක්ෂයක් සඳහා ඡන්දය පාවිච්චි කරන්නේ ද යන්න තීරණය වන ඡන්දදායක හැසිරීම සැකසීම සිදුවන්නේ දීර්ඝ කාලයක් පුරා දිවෙන ක්‍රියාදාම සමූහයක් මඟිනි.

ඡන්ද චර්යාව යනු ඡන්දදායකයාගේ වරණයෙහි ස්වරූපය සඳහා බලපානු ලබන සාධක සහ පෙළඹවීම් වේ. නැතිනම්, නියෝජිතයන් තෝරා පත්කර ගැනීමේ ක්‍රියාවලියේ දී ඡන්දදායකයාගේ සහභාගීත්වය, ඡන්ද භාවිතය හා ඡන්ද වරණය සඳහා බලපානු ලබන බාහිර හා අභ්‍යන්තර සාධක සමස්තයෙහි එකතුව වේ. සමස්තයක් ලෙස ඡන්දදායකයින්ගේ ඡන්ද භාවිතය සඳහා බලපානු ලබන සාධක

කිහිපයක් දැක්විය හැකිය. එනම්, ඡන්දදායකයාගේ චරිත ලක්ෂණ, ලියාපදිංචි කිරීමේ නීති සහ මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරයි. විශේෂයෙන් ම ඡන්දය භාවිත කිරීමේ දී දේශපාලන පක්ෂය, අපේක්ෂකයාගේ චරිත ලක්‍ෂණ ද ඉහළ වැදගත්කමකින් යුක්ත ය. ඡන්දදායකයාගේ මෙම චරිත ලක්ෂණ සමාජ ආර්ථික ගති ලක්ෂණ, ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණ සහ ශාරීරික සහ මනෝ විද්‍යාත්මක ලක්ෂණ ලෙස වර්ගීකරණය කළ හැක (චින්තනි, 2015).

නාගරික සන්දර්භයක් තුළ ඡන්ද හැසිරීම අවබෝධ කර ගැනීම හේතු කිහිපයක් නිසා ඉතා වැදගත් වේ. පළමුව, ග්‍රාමීය ප්‍රදේශවලට සාපේක්ෂව නාගරික ප්‍රදේශවල සාමාන්‍යයෙන් වැඩි ඡන්ද ප්‍රතිශතයක් ඇත. මෙම ඉහළ සහභාගීත්වය මැතිවරණ ප්‍රතිඵල සැලකිය යුතු ලෙස වෙනස් කළ හැකි අතර, ඒ අනුව නාගරික ඡන්දදායකයින් ඕනෑම දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයෙකු සඳහා තීරණාත්මක ජන විකාශයක් බවට පත් වේ. එපමණක් නොව බොහෝ විට නගරයක් වර්ධනය වන විට එහි අතුරු ඵලයක් වන්නේ සංකේන්ද්‍රිත ඡන්දදායකයන්ගෙන් ඡන්ද ලබා ගැනීමට උත්සාහ කරන දේශපාලන පක්ෂ සඳහා සටන් බිමක් බවට එය පත් වීමයි. මෙම විවිධත්වය ඡන්දය ප්‍රකාශ කිරීමේ හැසිරීම, පක්ෂ සහයෝගය සහ මැතිවරණ ප්‍රකාශනය කෙරෙහි සැලකිය යුතු ලෙස බලපෑ හැකිය. නාගරික ඡන්ද රටාවන් හැඩගැස්වීමේදී දේශපාලන පක්ෂ ද සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. නාගරික ඡන්දදායකයින් සමඟ සම්බන්ධ වීමට ඔවුන් භාවිතා කරන උපාය මාර්ග එනම්, බිම් මට්ටමේ සංවිධානය කිරීම, ඉලක්කගත පණිවිඩ යැවීම සහ ප්‍රමුඛතා නිකුත් කිරීම මැතිවරණ ප්‍රතිඵලවලට බලපෑම් කළ හැකිය. එපමණක් නොව නාගරික ජනගහනය බොහෝ විට ආර්ථික අසමානතාවය, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය, නිවාස සහ පොදු ප්‍රවාහනය සම්බන්ධ ගැටලු වැනි සමාජ-දේශපාලනික අභියෝගවලට මුහුණ දෙයි. මෙම අභියෝග ඡන්දදායකයින්ගේ මනාපයන් සහ ප්‍රමුඛතා කෙරෙහි බලපෑම් කරනු ලබන අතර, එමඟින් මැතිවරණ භූ දර්ශනය හැඩගස්වයි.

නමුත් සමහර අවස්ථාවන්හි දි ඡන්දය භාවිතා කිරිම වැනි සුවිශේෂී දේශපාලන කටයුතු බොහෝ විට ඓතිහාසික හා ව්‍යුහාත්මක සාධක මගින් බලපෑමට ලක් වේ. එයට හේතුව සාමූහික මතය සහ දේශපාලන අනන්‍යතාවය හැඩගස්වාගත හැකි සිවිල් අයිතිවාසිකම් විරෝධතා හෝ කම්කරු වැඩ වර්ජන වැනි දේශපාලන ව්‍යාපාර රටක බහුතරයක් ජනතාවට නිරන්තරයෙන් අත්විඳින්න ලැබිමයි. මෙම ඓතිහාසික සන්දර්භයන් අවබෝධ කර ගැනීමත් වත්මන් ඡන්ද හැසිරීම විකේතනය කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. බොහෝ ඡන්දදායකයින් ලිබරල්, මධ්‍යස්ථ සහ ගතානුගතික වැනි නොගැලපෙන අදහස් දරණ අතර, එවා සමහර අවස්ථාවන්හි දි මිනිසුන්ගේ ආකල්ප සමඟ මිශ්‍ර විමක් ද පෙන්නුම් කරයි. බොහෝ මිනිසුන්ට යම් ආකාරයක වියුක්ත මූලධර්ම තිබිය යුතු ය. ඒ අනුව ඔවුන් ප්‍රශ්න සම්බන්ධයෙන් ඔවුන්ගේ විශ්වාසයන් සහ ආකල්ප හරහා සංවිධානය විමට උත්සාහ කරයි. නිදසුනක් වශයෙන් යම් කෙනෙකු ලිබරල්වාදයේ මූලධර්ම විශ්වාස කළ හැකි අතර, ගැටලු

සම්බන්ධයෙන් ඔවුහු අනුරූප ලිබරල් මත මාලාවක් දරයි. මෙවැනි පසුබිමක් තුළ මෙම අධ්‍යනයේ පදනම වන්නේ ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශයන් තුළට සංකේන්ද්‍රණය වන ජනතාවගේ ඡන්දදායක හැසිරීම, ඊට බලපාන්නාවූ සමාජ, දේශපාලන, ආර්ථික, මනෝ විද්‍යාත්මක පසුබිම සහ එය ජාතික මැතිවරණ ප්‍රතිඵල සඳහා කරනු ලබන බලපෑම පිළිබඳව කොළඹ දිස්ත්‍රික්කය ඇසුරින් විමර්ශනය කිරීමයි.

## 2.සාහිත්‍ය විමර්ශනය

ප්‍රජාතන්ත්‍රවාදී මූල ප්‍රවාහයක නිදහස් පුරවැසියන්ගේ ස්වයං ප්‍රකාශනයක් වන මැතිවරණයකදී ඡන්දය භාවිතා කිරීම ආර්ථික, වාර්ගික, ආගමික, නෛතික සබඳතා සහ සදාචාරමය ව්‍යුහයක් ඔස්සේ ප්‍රසාරණය වනු ලබයි. වෙල්ගම විසින් "ශ්‍රී ලංකාවේ මැතිවරණය" නමින් 1993 දී රචනා කරන ලද කෘතිය තුළ රටේ මැතිවරණ ක්‍රමයේ විකාශනය, දේශපාලන පක්ෂවල භූමිකාව සහ මැතිවරණ ක්‍රියාවලිය සඳහා විවිධ සමාජ දේශපාලන සාධකවල බලපෑම විස්තර කරමින් රටේ මැතිවරණවල ඓතිහාසික සන්දර්භය විමර්ශනය කරයි. එහි දී මැතිවරණ ක්‍රියාවලිය සහ විකාශය පිළිබඳ අදහස් දක්වන කතුවරයා 1947 මහමැතිවරණයේ සිට 1997 පළාත් සභා මැතිවරණය දක්වා මැතිවරණ වල ඡන්ද ප්‍රතිඵලවල ගතිකත්වය විශ්ලේෂණාත්මකව දක්වයි (වෙල්ගම, 1993). ඒ අනුව සමස්තයක් වශයෙන් ශ්‍රී ලංකා දේශපාලනයේ සංකීර්ණතා සහ එහි ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ මැතිවරණ භූමිකාව මෙම කෘතිය ඔස්සේ විශ්ලේෂණය කරයි.

විතානවසම් විසින් "ශ්‍රී ලංකාවේ මැතිවරණ පරිපාලනය සහ 1987–89 මැතිවරණ ප්‍රචණ්ඩත්වය" නමින් 2000 වසරේදී රචනා කරන ලද කෘතිය තුළ ශ්‍රී ලංකාවේ නියෝජ්‍ය ප්‍රජාතන්ත්‍රවාදය පවත්වා ගැනීම අරභයා මෙරට මැතිවරණ පරිපාලන යාන්ත්‍රණය විසින් ක්‍රියාවට නංවන භූමිකාව පරික්ෂා කරයි. මෙහි දී මැතිවරණ විරෝධී ප්‍රචණ්ඩත්වයකට මුහුණ දී තිබෙන අවස්ථාවක සාධාරණ හා නිදහස් ඡන්ද විමසීමක් පැවැත්වීම පිණිස මැතිවරණ පරිපාලන යාන්ත්‍රණය විසින් සාක්ෂාත් කර ගත යුතුව තිබෙන සහ ඊට අතිරේක වශයෙන් දේශපාලන ක්‍රමය තුළ සපුරාගත යුතුව තිබෙන කොන්දේසි හඳුනා ගැනීම ද සිදු කර ඇත. මෙහි දි 1988 - 1989 කාල පරිච්ඡේදය තුළ පවත්වන ලද පළාත් සභා ඡන්ද විමසීම, ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය යන ඡන්ද විමසීම් වලට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ක්‍රියාවට නංවන ලද ප්‍රචණ්ඩත්වය මඟින් මැතිවරණ පරිපාලනයට සිදු වූ බලපෑම පිළිබඳව පුළුල්ව විශ්ලේෂණයක් කතුවරයා සිදු කරයි (විතානවසම්, 2000). ඒ අනුව මෙම ග්‍රන්ථය ඓතිහාසික වාර්තාවක් මෙන්ම ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රම සහ දේශපාලන ප්‍රචණ්ඩත්වය අතර අන්තර් ක්‍රියාකාරිත්වය පිළිබඳ විවේචනාත්මක විශ්ලේෂණයක් ලෙස ද ක්‍රියා කරයි.

එදිරිසිංහ සහ අල්විස් විසින් "The Right to Vote: Its Impact on Election Laws in Sri Lanka" නමින් රචනා කරන ලද පර්යේෂණ ලිපිය මඟින් ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලියේ එකඟතාවය ආරක්ෂා කිරීම, මෑත කාලයේ ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල වූ

ප්‍රධාන අභියෝගයක් ලෙස මතු වී ඇති බව පෙන්වා දෙයි. එහිදී මෙම ලිපිය තුළ පුළුල් කරුණු දෙකක් සම්බන්ධව අවධානය යොමු කර ඇති බව පෙනී යයි.

1. ඡන්ද අයිතිය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණය මෑත කාලීන තීන්දු
2. රටේ මැතිවරණ නීති වලට මෙම තීරණවල බලපෑම

1982 සිට නිදහස් හා සාධාරණ මැතිවරණ නීතිය නීතියකට වඩා ව්‍යාතිරේකයක් බවට පත්ව ඇති බව මොවුන් තවදුරටත් තර්ක කරයි. විශේෂයෙන් ම මැතිවරණ ක්‍රියාවලියේ සාධාරණත්වය සහ වාස්තවිකත්වය පිළිබඳ විශ්වාසය රටේ ප්‍රජාතන්ත්‍රවාදය පවත්වාගෙන යාමට සහ රටේ ස්ථාවරත්වය සඳහා අත්‍යවශ්‍ය වේ. මහජනතාවගෙන් විශාල ප්‍රතිශතයක් මැතිවරණ ක්‍රියාවලියේ අඛණ්ඩතාව ගැන සැක කරන්නේ නම්, එය මූලික ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් සහ ආයතන කෙරෙහි විශ්වාසය හා ගෞරවය බිඳවැටීමට හේතු වේ. ඒ අනුව මැතිවරණ පෙත්සම් සම්බන්ධ ප්‍රදේශයේ නීතිය සහ එහි අර්ථ නිරූපණය සමාලෝචනය කිරිම වැදගත් බව පර්යේෂකයා සඳහන් කරයි. නමුත් දැනට පවතින නීතිය නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා බාධාවක් ලෙස සේවය කරන බව ඔහු පෙන්වා දෙයි (Edirisinghe and Alwis, 2007).

නිශාන්ති විසින් 2016 වර්ෂයේ දී "ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය හා ජාතික ලැයිස්තු ක්‍රමය" නමින් රචනා කරන ලද පර්යේෂණ ලිපිය තුළ ශ්‍රී ලංකාවේ සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ හඳුන්වා දුන් ජාතික ලැයිස්තු ක්‍රමයේ අරමුණ උගත් එසෙත් නැතිනම් තරඟකාරි මැතිවරණ ක්‍රියාවලියකට එළඹීමට අකමැති ලාංකිකයින් දේශපාලනයට සහභාගී කර ගැනීම බව පෙන්වා දී ඇත. නමුත් වර්තමානයේ එම අරමුණු කොළයකට පමණක් සීමා කරමින් ප්‍රායෝගිකව ඔවුන් ජනතා අභිලාෂයන් ඉටු කරනු වෙනුවට පාර්ලිමේන්තුවේ සැසිවාරවල අඛණ්ඩව පැමිණීම සහ ජනතාව වෙනුවෙන් පාර්ලිමේන්තුව තුළ කතා කිරීමද පැහැර හැර ඇති බව ඇය පෙන්වා දෙයි. මෙවැනි පසුබිමක් තුළ පර්යේෂකයා සඳහන් කරන්නේ රාජ්‍ය පාලනයට ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පත්වන නියෝජිතයන් උගත් බුද්ධිමත් පිරිසක් විය යුතු බවත්, මහජන ඡන්දයෙන් පරාජයට පත්වන පුද්ගලයන් නොවිය යුතුය යන්නයි. නමුත් දේශපාලන පක්ෂවල අභ්‍යන්තර අර්බුද ඇති වීමට ද, මෙම ලැයිස්තු ක්‍රමය හේතු වේ. මෙසේ ලැයිස්තු ක්‍රමය මඟින් සාමාජිකයන් බඳවා ගැනීමේදී රටේ සංවර්ධනය උදෙසා දක්ෂ සහ උගත් නියෝජිතයන් ලෙස තරුණ පරපුර ද, ජාතික ලැයිස්තුවට පත් කර ගැනීම තුළින් වඩා යහපත් දේශපාලන ක්‍රමයක් පවත්වා ගැනීමට උපකාරී විය හැකි බව මෙම විමර්ශනය තුළින් හෙළි වේ (නිශාන්ති, 2016).

2016 වර්ෂයේදී ගමගේ විසින් "පෙළපත් පුරාණය" නමින් පර්යේෂණ කෘතියක් රචනා කර ඇත. ජනාධිපතිවරණ ප්‍රචාරණයේදී භාවිත වන උපක්‍රම අතරින් අපේක්ෂකයන්ගේ පෙළපතට හිමිවන ස්ථානය මෙම ග්‍රන්ථයෙන් පැහැදිලි කරන්නට උත්සාහ කර ඇත. එහිදී ශ්‍රී ලංකාවේ 1982 - 2015 දක්වා පැවති

ජනාධිපතිවරණ හතක ප්‍රචාරණ වැඩසටහන් තුළ පෙළපත නැමැති සාධකය ජනතා ආකර්ෂණය දිනා ගැනීමේ මාර්ගයක් ලෙස යොදාගත් ආකාරය පුළුල්ව අධ්‍යයනය කිරීමට යොමු වී ඇත. ඒ අනුව 1982 ජනාධිපතිවරණයේ දි ප්‍රධාන අපේක්ෂකයින් දෙදෙනා තම ප්‍රචාරණ ව්‍යාපාරය සඳහා පෙළපත යන සාධක යොදාගත් අවස්ථා ගණන ඉහළ අගයක් ගන්නා බවත්, එසේ වුවද 2005 වර්ෂයේ දී සහ 2010 වර්ෂයේ දි පිලිවෙලින් සියලුම ජනාධිපතිවරණ වඩා වැඩි ප්‍රමාණයක් මැතිවරණ ප්‍රචාරය සඳහා පෙළපත යන සාධකය භාවිතයට ගෙන ඇති බව පර්යේෂකයා පෙන්වා දෙයි. තවදුරටත් පර්යේෂකයා නිදසුන් ලෙස 1994 – 1999 ජනාධිපතිවරණයේ දි චන්ද්‍රිකා කුමාරතුංග සහ 2005, 2010 සහ 2015 ජනාධිපතිවරණයේදි මහින්ද රාජපක්ෂ මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරය සඳහා මෙම ක්‍රමය යොදා ගත් බව පෙන්වා දෙයි. මෙලෙස ප්‍රධාන අපේක්ෂකයන් පෙළපත් සාධකය තම ප්‍රචාරණ ක්‍රියාවලියට අදාළ කරගැනීම තමන්ගේ පෙළපත් පිළිබඳ සාධනීය ලක්ෂණ මැතිවරණ ප්‍රචාරණයට සම්බන්ධ කිරීමට හෝ සෙසු අපේක්ෂකයාගේ පෙළපත විවේචනය කිරීම යන කරුණු දෙකෙන් එකක් සඳහා යොදා ගන්නා බව එහිදි හඳුනා ගත හැකි බවත්, කීර්තිමත් පෙළපතක සම්බන්ධයක් නොමැති අපේක්ෂකයන් ප්‍රතිවාදී අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ පෙළ පත හෝ එහි පෙළපත් සබඳතාවයන් විවේචනය කිරීමට පෙළඹී ඇති බවත් කතුවරයා එහි දි පෙන්වා දෙයි. මෙවැනි අවස්ථාවකදි ඉහළ පෙළපතකින් පැවත ඒමට වඩා මහජනතාවට වඩාත් සමීප සාමාන්‍ය මිනිසෙකු වීම යන්න වඩාත් හොඳින් ඉස්මතු කරන ආකාරයට ප්‍රචාරණ ව්‍යාපාරය සකස් කිරිමට අපේක්ෂකයන් පියවර ගන්නා බව පර්යේෂණය ඔස්සේ පැහැදිලි වේ. ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතාගේ 1988 මැතිවරණ ව්‍යාපාරය සහ සරත් ෆොන්සේකා මහතාගේ 2010 මැතිවරණ ව්‍යාපාරය මේ කාරණය තහවුරු කරන වඩාත් පැහැදිලි නිදසුන් ලෙස පර්යේෂකයා තර්ක කරයි (ගමගේ, 2016).

දේවසිරි විසින් 2017 වර්ෂයේ දී "සර්වජන ඡන්ද බලය සහ ලංකාවේ පක්ෂ ක්‍රමයේ වෙනස් වන ගතිකථා" නමින් පර්යේෂණ ලිපියක් රචනා කර ඇත. මෙම ලිපිය තුළ 1947 මහ මැතිවරණයේ සිට 2015 මැතිවරණය දක්වා කාලය තුළ මැතිවරණ පක්ෂ ක්‍රමයේ ඇති වු වෙනස්කම් සහ එසේ ඇති වූ වෙනස්කම් මැතිවරණ ක්‍රියාවලිය තුළ ප්‍රකාශයට පත් වූ ආකාරය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් සිදුකිරීමට යොමුව ඇත. එහි දි පර්යේෂකයා පෙන්වා දෙන්නේ ලංකාවේ නවීන දේශපාලනයේ විකාශනය තුළ පක්ෂ ක්‍රමය උතුරු - දකුණු අතර විභේදනය වි ඇති බවයි. එනම්, උතුර සහ දකුණ තුළ අපට දැකගත හැක්කේ මුළුමනින්ම පාහේ එකිනෙකට වෙනස් ගතිකතා මත වර්ධනය වන පක්ෂ සැකසුම් දෙකක් විමයි. නිදසුන් ලෙස ජනවාර්ගික පදනම මත සකස් වූ දේශපාලන ඉල්ලීම් වටා ඡන්ද දායකයින් සංවිධානය කිරීම උතුරු සැකැස්මේ දේශපාලන පක්ෂ විසින් ජනමතය සංවිධානය කිරීම සඳහා අනුගමනය කරන මූලික උපාය මාර්ගය ලෙසත්, සිංහල බෞද්ධ ජනතාව වැඩි වශයෙන් ජීවත් වන දකුණේ දේශපාලනය තුළ මෙම දෙමළ ජාතිකවාදී අභිලාෂ වල ප්‍රතිවාදී ලෙස සිටිම මත සිංහල - බෞද්ධ

බව පක්ෂ වටා ඡන්දදායකයා එකරාශි කර ගැනිමේ මාර්ගයක් ලෙස යොදා ගන්නා බව පර්යේෂකයා පෙන්වා දි ඇත (දේවසිරි, 2017).

මේ අනුව ඡන්දදායක චර්යාව සහ මැතිවරණ ක්‍රමය පිළිබඳව විවිධ අංශ මත පදනම් වෙමින් පර්යේෂණය ලිපි, කෘතීන් සහ ලේඛන රචනා වී ඇති බව පෙනී යයි. නමුත් එම බොහොමයක් පර්යේෂණයන් එක් පැතිකඩකට සීමා වෙමින් මහමැතිවරණ ජනාධිපතිවරණ පිළිබඳවත් කුල සාධකය හෝ පෙළපත සම්බන්ධවත් ශ්‍රී ලංකාවේ මැතිවරණය හා සම්බන්ධ අධිකරණමය තීරණ හා නීති රීති සම්බන්ධවත් විශ්ලේෂණ සිදුකර ඇත. එමගින් ශ්‍රී ලංකාවේ නාගරික ජන සංකේන්ද්‍රණය ජාතික මැතිවරණ ප්‍රතිඵල සඳහා ඇති කරනු ලබන බලපෑම් පිළිබඳව පුළුල් විශ්ලේෂණයක් සිදුකර ඇති බවක් දක්නට නොලැබේ. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශයන් තුළට සංකේන්ද්‍රණය වන ජනතාවගේ ඡන්දදායක හැසිරිම සහ ඊට බලපාන්නාවූ සමාජ, දේශපාලන, ආර්ථික, මනෝ විද්‍යාත්මක පසුබිම ජාතික මැතිවරණ ප්‍රතිඵල සඳහා කරනු ලබන බලපෑම් සම්බන්ධයෙන් අධ්‍යනයක් හෝ පර්යේෂණයක් ඉදිරිපත් වී නොමැති බව සාහිත්‍ය විමර්ශනය සිදුකිරීමේදී පැහැදිලි විය. එබැවින් එම පර්යේෂණ හිඩස පිරවීම සඳහා නාගරික ජන සංකේන්ද්‍රණය ජාතික මැතිවරණ ප්‍රතිඵල සඳහා ඇති කරනු ලබන බලපෑම සම්බන්ධයෙන් සිදු කරනු ලබන නව අධ්‍යයනයක් ලෙස මෙම අධ්‍යයනය පෙන්වා දිය හැක.

## 3.පර්යේෂණ අරමුණු

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශයන් තුළට සංකේන්ද්‍රණය වන ජනතාවගේ ඡන්දදායක හැසිරීම, ඊට බලපාන සමාජ, දේශපාලන, ආර්ථික, මනෝවිද්‍යාත්මක පසුබිම ජාතික මැතිවරණ ප්‍රතිඵල සඳහා කරනු ලබන බලපෑම් හඳුනා ගැනීමයි. මෙම පුළුල් අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් අනු අරමුණු කිහිපයක් ද සළකා බැලේ. පළමුව, ශ්‍රී ලංකාවේ නාගරික ජනතාවගේ දේශපාලන ආකල්ප සහ ඡන්ද තීරණ හැඩගැස්වීමේදී තොරතුරු වෙත ප්‍රවේශවීමේ මාධ්‍ය ඔස්සේ එල්ල කර ඇති බලපෑම විමර්ශනය කිරීම. දෙවනුව, ශ්‍රී ලංකාවේ නාගරික ඡන්දදායකයින් අතර ජනවිකාශන ලක්ෂණ එනම්, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ වාර්ගිකත්වය ජාතික මැතිවරණවලදී ඡන්ද රටාවන් සහ මනාපයන් තුළ වෙනස්කම් ඇතිවීමට සම්බන්ධ වන ආකාරය හඳුනා ගැනීම. තෙවනුව, ශ්‍රී ලංකාවේ නාගරික පදිංචිකරුවන්ගේ දේශපාලන කටයුතුවලට සහ ඡන්දය ප්‍රකාශ කිරීමේ හැසිරීමට ඓතිහාසික හා ව්‍යුහාත්මක සාධක බලපාන ආකාරය අධ්‍යයනය කිරීම.

### *3.1. පර්යේෂණ ක්‍රමවේදය*

මෙම අධ්‍යයනය මිශ්‍ර ක්‍රමවේදය මත පදනම් විය. එහි දී පවතින යථාර්තය පිළිබඳ පුද්ගල බද්ධ සාධක හේතුවෙන් දෘෂ්‍ය නොවූ කරුණු ඉස්මතු කර ගැනීම සඳහා ප්‍රමාණාත්මක දත්ත සම්පාදනයට සහ ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ විධික්‍රම වලට ප්‍රමුඛතාවය ලබා දෙන ලදී. එම ප්‍රමාණාත්මක දත්ත ඇසුරින් ඉස්මතු වන

කරුණු තවදුරටත් ගැඹුරින් විග්‍රාහ කිරීම සඳහා ගුණාත්මක දත්ත සම්පාදනය සිදු විය. මෙම අධ්‍යනය දී දත්ත රැස් කිරීම සඳහා ප්‍රාථමික දත්ත මූලාශ්‍ර සහ ද්විතීයික දත්ත මූලාශ්‍ර යන ක්‍රමවේදයන් ද්විත්වය ම භාවිත කර ඇත. ප්‍රාථමික දත්ත රැස් කිරිමේ දි කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පහක් ඇසුරු කර ගනිමින් පහසු සහ අරමුණු සහගත නියැදුම් ක්‍රම හරහා අධ්‍යයන නියැදිය සකස් කර ගැනුනි. ඒ අනුව කොළඹ, කඩුවෙල, හෝමාගම, කොට්ටේ සහ මහරගම ප්‍රදේශ තුලින් අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් හරහා පුද්ගලයන් 100ක් සහ ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්චා ඔස්සේ පුද්ගලයන් 20ක් සම්බන්ධ කර ගත්හ. අධ්‍යයනය සඳහා අහඹු ලෙස මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තෝරා ගැනීමට හේතු වූයේ එහි අනෙක් ප්‍රදේශවලට සාපේක්ෂව ඉහල ජනගහන ව්‍යාප්තියක් පෙන්නුම් කිරීම, දේශපාලන වශයෙන් ඉහළ දායකත්වය සහ වාර්ගිකත්වය වඩාත් හොඳින් වෙන් කර හඳුනා ගැනීමට පහසු බැවිනි. ද්විතියික දත්ත ලෙස පොත්පත්, සඟරා සහ අන්තර්ජාලය භාවිත කරන ලදි. ගුණාත්මක දත්ත විශ්ලේෂණ සඳහා තේමාකරණ විශ්ලේෂණ ආකෘතියත්, ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය සඳහා SPSS භාවිතයට ගෙන ඇත.

## 4.ප්‍රතිඵල සහ සාකච්ඡා

මෙහි දි මිශ්‍ර ක්‍රමවේදය ඔස්සේ ශ්‍රී ලංකාවේ නාගරික ජනගහනයේ ඡන්දදායක හැසිරීම් සහ එය හැඩගස්වන බහුවිධ සාධක පිළිබඳ ලබාගත් දත්ත මත පදනම්ව සොයා ගැනීම් ඉදිරිපත් කර විශ්ලේෂණය කරයි. මෙම කේන්ද්‍රීය විමසුම ක්‍රමානුකූලව පෙළ ගැස්වීම එසේත් නැතිනම් පර්යේෂණයේ ගැටලුව විසඳීම අරමුණු කර ගනිමින් ගොඩනගන ලද අනුබද්ධ ප්‍රශ්න කිහිපයක් වටා ව්‍යුහගත කරන ඇත.

### *4.1. දත්ත දායකයන් ඇසුරින් 2019 ජනාධිපතිවරණයට පෙර සහ පසු සමස්ත ඡන්ද ප්‍රතිඵල සකස් වීමට බලපෑ ඡන්දදායක හැසිරීම විමර්ශනය*

2019 නොවැම්බර් 16 වන දින පැවති ශ්‍රී ලංකා ජනාධිපතිවරණය රටේ දේශපාලන ගමන් මඟට සැලකිය යුතු බලපෑම් ඇති කළ තීරණාත්මක දේශපාලන සිදුවීමක් විය. මෙම මැතිවරණයේදී ඡන්දදායකයින්ගේ හැසිරීම ජනවාර්ගික, ආගමික, කලාපීය සහ ආරක්ෂක ආශ්‍රිත සාධකවල සංකීර්ණ අන්තර් ක්‍රියාකාරිත්වයකින් හැඩගැසී ඇත. 2019 ජනාධිපතිවරණ දෙස බලන විට මහින්ද රාජපක්ෂ තමන් මේ තාක් කාලයක් සිටි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉවත්ව පොදු ජන පෙරමුණ නමින් නව පක්ෂයක් ආරම්භ කරයි. එහි ජනාධිපති අපේක්ෂකයා වශයෙන් පත් වන්නේ දේශපාලනයට වැඩි හිතවත්කමක් නොදක්වන ලද ඔහුගේ සහෝදරයා වූ ගෝඨාභය රාජපක්ෂයි. නමුත් එම වර්ෂයේ ප්‍රතිඵල දෙස බලන විට මෙම නව අපේක්ෂකයා ඉතා විශිෂ්ට ජයක් ලබා ගනිමින් අටවන ජනාධිපතිවරයා බවට පත් වේ. එසේ වුව ද මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට 2015 වර්ෂයේ පැවති ජනාධිපතිවරණයෙන් ලබාගත හැකි වූයේ ජයග්‍රාහකයාට වඩා අඩු ඡන්ද

ප්‍රතිශතයකි. ඒ බව පහත රූපසටහන් තුළින් පෙන්වා දිය හැක.




*රූපය 01: 2015 සහ 2019 ජනාධිපතිවරණ සමස්ත ප්‍රතිඵල*
*මූලාශ්‍ර: මැතිවරණ කොමිෂන් සභාවේ දත්ත අනුව පර්යේෂකයා විසින් නිර්මාණය කරන ලද්දකි, 2025*

මේ ආකාරයට පක්ෂය වෙනස් වුව ද එකම පුද්ගල කොට්ඨාසයට ජනාධිපතිවරණ දෙකක් තුළ ඔවුන්ගේ ඡන්ද ප්‍රතිඵලවල උච්චාවචනයන් ඇති වීමට මෙන් ම නිදහස් පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂය වැනි පැවති පැරණි පක්ෂ වලින් පරිභාහිරව ජනතා විශ්වාස නව පක්ෂයකට සහ නව අපේක්ෂකයෙක් වෙත හිමි වීමට හේතු වූ කරුණු කාරණා සොයා බැලීම කළ යුත්තකි. ඒ අනුව මෙලෙස 2015 පැවති මෛත්‍රීපාල සිරිසේන ප්‍රමුඛ ආණ්ඩුව පිළිබඳ ජනතා විශ්වාසය අඩු වීමට බලපෑ සාධක මොනවාද යන්න සොයා බැලීමේ දී පර්යේෂණය සම්බන්ධ තොරතුරු රැස් කිරීමට යොමු කරනු ලැබූ ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය තුළ දී දත්ත දායකයන් ප්‍රධාන ප්‍රපංච කිහිපයක් පිළිබඳව අවධානය යොමු කරමින් තම අදහස් දක්වන ලදී.




*රූපය 02: ආණ්ඩුව පිළිබඳ ජනතා විශ්වාෂය අඩුවීමට බලපෑ සාධක*
*මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2025*

ආණ්ඩුව පිළිබඳ ජනතා විශ්වාසය අඩු විමට බලපෑ සාධක සඳහා පදනම් සැකසීම සිදු වනුයේ හුදෙක් දේශපාලන හා ආර්ථික ක්‍රමවේදයේ දුර්වලතා පමණක් නිසා ම නොව ජාතික ආරක්ෂාවේ සිට පක්ෂ ප්‍රතිපත්ති දක්වා ප්‍රසාරණය වන ලද මන්දගාමී හා නිසි කළමනාකාරිත්වයෙන් තොර වූ ආණ්ඩුවේ දේශපාලනික අවතීරණයන් හේතුවෙන් බව දත්ත දායකයන්ගේ අදහස් ඔස්සේ ඉදිරිපත් විය. ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයේ තොරා ගත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස තුළ දත්ත දායකයන් ඉහත ප්‍රස්තාරගත මූල ප්‍රපංචයන් පිළිබඳව දක්වන ලද අදහස් මෙහිදී ඉදිරිපත් කළ හැකිය.

*"ඔවුන් රට වෙනුවෙන් කිසිවක් කරනවා වඩා නිතරම එකිනෙකා අතර රණ්ඩු වෙමින් සිටියා. දූෂණය නතර වෙයි කියලා අපි හිතුවා. නමුත් ඊට පස්සේ බැඳුම්කර වංචාව ගැන අපිට ආරංචි වුණා. ඒක කොහොමද හොඳ දෙයක් වෙන්නේ රටකට?" (S1).*

යහපාලනය ආණ්ඩුව බලයට පත් වන්නේ දූෂණ විරෝධී සහ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ සිදු කිරිම යන පොරොන්දු මතයි. නමුත් ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අතර දෘශ්‍යමාන ගැටුමක් සහ සම්බන්ධීකරණයක් නොමැතිකමක් නිරන්තරයෙන් පැවතිම එක් පැතිකඩකින් දේශපාලන අස්ථාවරත්වයක් ඇති කිරිමට මෙන් ම ආණ්ඩුව කෙරෙහි මහජන විශ්වාසය නැති කර දැමීමට බලපා ඇති බව ඉහත ප්‍රකාශයන් ඔස්සේ අපට පැහැදිලි වේ. එපමණක් නොව ණය වැඩි වීම, ජීවන වියදම ඉහළ යාම සහ බදු වැඩි වීම හේතුවෙන් ආර්ථිකය සම්බන්ධව දුර්වල කාර්ය සාධනයක් ද පෙන්නුම් කිරිම සහ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ මුදල් අමාත්‍යාංශය යටතේ පැවති මහ බැංකුව සම්බන්ධ ප්‍රධාන භාණ්ඩාගාර බැඳුම්කර වංචාව රජයේ ප්‍රතිරූපයට දිගින් දිගට ම හානි කිරිමට සමත් වේ. මෙවැනි කාලසීමාවක් තුළ දී ජනතාවට තම ආරක්ෂාව පිළිබඳ දෙවරක් සිතිමට පරිසරය ගොඩනගන්නේ පාස්කු ඉරු දින ප්‍රහාරයයි. ප්‍රහාර වලට පෙර බුද්ධි අංශ අනතුරු ඇඟවීම් මත ක්‍රියා කිරීමට රජය අපොහොසත් වීම මත ජාතික ආරක්ෂාව සහතික කිරීමේ රජයේ හැකියාව පිළිබඳ මහජන විශ්වාසය දැඩි ලෙස බාදනය වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස ගෝඨාභය රාජපක්ෂගේ මැතිවරණය පොරොන්දු වෙත ජනතා විශ්වාසය වර්ධනය වු අතර, එය ඔහුගේ ජයග්‍රහණයට හේතු වේ. ඒ අනුව සම්මුඛ සාකච්ඡා ඔස්සේ අනාවරණය වූයේ අපේක්ෂකයන් ලබා දෙන මැතිවරණය පොරොන්දු ජනතාවගේ දේශපාලන චර්යාව සඳහා බලපෑම් කරන බවයි.

*" පාස්කු ප්‍රහාරයත් සමග නැවත යුද්ධයක් ඇති වෙයි කියලා බිය අපට තිබුණා. එවැනි අන්තවාදී ක්‍රියා නතර කරන බවට ගෝඨාභය රාජපක්ෂ පොරොන්දු වුන නිසා ඒ දවස්වල අපි එයාට ඡන්දය ලබා දුන්නා. අනිත් එක ඔහු එල්ටීටීඊ යුද්ධ කාලෙත් ආරක්ෂක ලේකම් විදියට කටයුතු කරලා යම් වැඩක් කළා. ඉතින් අපි හිතුවා පොදු ජන පෙරමුණට අපේ රටේ මේ තියෙන ප්‍රශ්න අවසන් කරන්න පුළුවන් වේවි කියල"(S2).*

ගෝඨාභය රාජපක්ෂ යනු යුද්ධය පැවති සමයේ ආරක්ෂක ලේකම් ලෙස කටයුතු කළ පුද්ගලයා වේ. මේ හේතුවෙන් ගෝඨාභය රාජපක්ෂ සිංහල බෞද්ධ බහුතරයක් විසින් රණවිරුවෙකු ලෙස සලකනු ලැබිය. යුද්ධය අවසන් විමත් සමඟ

ලංකාවේ රණවිරුවා වෙත හිමි වුයේ වැදගත් ස්ථානයකි. එසේ තිබිය දී ඇතැම් පිරිසක් ගෝඨාභය රාජපක්ෂ රණවිරුවෙකු ලෙස සැලකීම තුළින් යුද්ධය කෙතරම් දුරකට ඔවුන්ගේ ඡන්දදායක චර්යාව තීරණය වීමට බලපා තිබේ දැයි පැහැදිලි වේ. 2019 පැවති ජනාධිපතිවරණය තුළදී ගෝඨාභය රාජපක්ෂ මහතාගේ තේමා ගීතය තුළත් මෙම යුද්ධය අවසන් කිරීම සියුම් ලෙස යොදාගෙන තිබුණි. එනම් "වැඩ කරන අපේ විරුවා, මව්බිමට පෙමින් සැමදා රට රකින කෙනෙක් වේ නම්, ඒ ඔබයි උතුම් මිනිසා". මේ ආකාරයට 2019 මැතිවරණ ප්‍රචාරණ වැඩසටහන තුළදී යුද්ධය සියුම් ලෙස භාවිතා කර තිබේ. 2019 ජනාධිපතිවරණය තුලදී යුද්ධය ඡන්දය පදනමක් ලෙස භාවිතා කිරීමට තවත් හේතුවක් ලෙස පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාර මාලාව දැක්විය හැකිය. මෙම ප්‍රහාරයත් සමඟ රටෙහි ආරක්ෂාව සඳහා ශක්තිමත් පාලකයකු අවශ්‍ය බවත්, ඒ සඳහා යුද්ධය අවසන් කිරීමට සහයෝගය ලබා දුන් ගෝඨාභය රාජපක්ෂ මහතා වැනි නිර්භීත නායකයෙකු පත්විය යුතු බව බහුතර සිංහල ජනතාවගේ මතය විය. ඔහුගේ දේශපාලනය පොරොන්දු ඒ අනුව ජනතාවගේ ආකර්ෂණයට එකල ලක් විය.

මෙලෙස බලන කල ගෝඨාභය රාජපක්ෂ ප්‍රමුඛ පොදු ජන පෙරමුණ වැඩි ජනතා ප්‍රසාදයක් ඔස්සේ ලංකාවේ බලයට පත් වූ පක්ෂයකි. නමුත් ඔහුගේ ධුර කාලය අවසාන වීමට ප්‍රථමයෙන් ම ඔහුට සිය ධුරය අත්හැරීමට සිදුවන්නේ ජනතා අරගලයක් නිසාවෙනි. මෙලෙස මහත් හරසරින් පිළිගත් ජනාධිපතිවරයාව එම ජනතාව විසින් ම දේශපාලන අරගලයක් ඔස්සේ ප්‍රතික්ෂේප කිරීමට හේතුවන්නට ඇත්තේ කුමක්ද දැයි හඳුනා ගැනීම කළ යුත්තකි. සාමාන්‍යයෙන් දේශපාලන හෝ සමාජ අරගල සාධක ගණනාවක එකතුවෙහි ප්‍රතිඵලයක් වශයෙන් ආරම්භ වේ. මොරිස් ඩුවේජර් පෙන්වා දෙන අන්දමට ජීව විද්‍යාත්මක, මනෝ විද්‍යාත්මක, ජනගහනය, සමාජ, ආර්ථික, සංස්කෘතිකමය හා දේශපාලන සාධකයන් දේශපාලන අරගල බිහි වීම සඳහා උපස්ථම්භක වේ (Samaranayaka, 2008).

මෙහි දී ශ්‍රී ලංකාවේ පැවති අරගලය නිර්මාණය වීම සඳහා කවර ආකාරයේ සාධක බලපෑවේ දැයි පරීක්ෂා කළ යුතු ය. එය සඳහා බලපෑ සාධක මූලික වශයෙන් මනෝ විද්‍යාත්මක සාධක සහ දේශපාලන සාධක වශයෙන් කොටස් දෙකකට වර්ග කළ හැකි ය. ශ්‍රී ලංකාවේ මෑතකාලීන අරගල තත්වය ඇති වීමට පෙර සමාජ පසුබිම විමර්ශනය කිරීමේ දී මේ පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය. කොවිඩ් 19 වෛරසය ව්‍යාප්ත වීම මගින් ලෝක ප්‍රජාව මෙන් ම ලාංකික ප්‍රජාවත් නිවසට කොටු විමට සිදු විය. ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ද ප්‍රබල ගැටලු මෙම වසංගතය තුළින් මතු වූ අතර, නිවසටම කොටු වී සිටීම හේතුවෙන් නව අත්දැකීම් ගොඩනගා ගැනීමට, සමාජය තුළ කැපී පෙනීමට, පෞද්ගලික මිත්‍රත්වය වැඩි දියුණු කර ගැනීමට පුද්ගලයන්ට තිබූ අවස්ථාවන් සීමා විය. ගෝඨාභය රාජපක්ෂ එවකට උද්ගත වනු ලැබූ මෙම කොවිඩ් 19 වසංගත තත්වය යටතේ රටේ සෞඛ්‍යමය පැතිකඩ උදෙසා ගනු ලබන දේශපාලන තීන්දු තිරණ තුළ වූ දේශපාලන අවතීර්ණයක් ප්‍රජාවන් සඳහා සුවිශේෂිත්වයක් ලබා දීමෙන් තොරව ක්‍රියාත්මක කරනු ලැබීය. හුදෙක් එය

ස්වකීය පක්ෂය සමඟ ලැදි පාර්ශවයන් සහ ඥාතීන් සඳහා පක්ෂග්‍රාහීභාවයක් ලබා දෙමින් සිදු කිරීම මූලික දේශපාලන අර්බුදය සඳහා ආරම්භක හේතු සාධක බවට පත් වේ. සම්මුඛ සාකච්ඡා ඔස්සේ ලබා ගත් දත්ත දායකයන්ගේ අදහස් විශ්ලේෂණය කිරීමෙන් මෙය තවදුරටත් තහවුරු වේ.

*"රජයේ හරි දැක්මක් රටේ ප්‍රශ්න වලට නැතිවුන නිසා තමයි ඒ වගේ දෙයක් වුනේ. ඒ නිසා මිනිස්සුන්ට ඕන වුනේ මුළු ක්‍රමයම වෙනස් කරන්න. ජාතික ජන බලවේගයේ ඡන්ද ප්‍රතිශතය වැඩි වෙන්න හේතුවක් වුනේ ඒක මම හිතන විදියට "(S1).*

*"අපේ රටේ පැවති අරගල ක්‍රියාදාමය සඳහා මූලික හේතු සකස් වීම සිදු වුණේ ලංකාවේ මේ තාක් තිබුණු ආණ්ඩු කටයුතු කළ නිසි දැක්මක් නැති ක්‍රියාවලින් හරහායි. අතීතයේ ඉඳලා මේ තාක්කල් රටේ තීරණ ගන්නේ දූර්වල, අකාර්යක්ෂම, නිසි දැක්මක්, දැනුමක් නැති මිනිසුන් විසින්, එම තත්වය රටින් ඉවත් වෙන තුරුම මෙම අර්බුදයත් වෙනස් වේවි කියලා මම සිතන්නේ නැහැ"(S1).*

සාමාන්‍යයෙන් ජනතාව තම රටේ යහපත් දේශපාලන ක්‍රියාදාමයන් හඳුනා ගන්නා ප්‍රධාන කොටස් වන්නේ ආණ්ඩුවේ ස්වභාවය, ඔවුන්ගේ නිසි දැක්ම, ඒ හරහා ඉටු කරන ලබන ක්‍රියාවලින්ගේ කාර්යක්ෂමතාවය සහ නීත්‍යානුකූලභාවය යන සාධක තුළිනි. මෙම කොටස් නිසි පරිදි ඉටු නොවේ නම් ජනතාව නිතැතින් ම අපේක්ෂාභංගත්වයට පත් වන අතර, එය ඔවුන් පවතින දේශපාලන පද්ධතියෙන් සහ ආයතනවලින් ඉවතට තල්ලුවීමක් සිදු කරයි. මේ පිළිබඳ ටෙඩ් රොබට් ගර් (Ted Rober Gurr) විසින් පෙන්වා දෙන සාපේක්ෂ ප්‍රහීණතා න්‍යාය (Theory of Relative Deprivation) අපට කරුණු පහදා දෙයි. එහි දී ඔහු අරගලයන්ට තුඩු දෙන්නේ මිනිසුන් තුළ ඇති වන අපේක්ෂාභංගත්වය බව සඳහන් කරයි (Samaranayaka, 2008). ඒ අනුව බලන විට විශේෂයෙන් ම ශ්‍රී ලංකාව තුළ වැඩි වශයෙන් පොරොන්දු දේශපාලන ක්‍රමයක් දැකගත හැකිය. මැතිවරණ සමය තුළ දී සෑම අපේක්ෂකයෙකු විසින් ම මෙසේ පොරොන්දු ලබා දීම සිදු කරනු ලබයි. නමුත් එම මැතිවරණ පොරොන්දු ගෝඨාභය රාජපක්ෂ පාලන කාලය තුළ නිසි පරිදි ඉටු නොවුණු බව දත්ත දායකයින්ගේ අදහසයි. විශේෂයෙන් ම පවුල් දේශපාලනය ඔස්සේ පාලනයේ නීත්‍යානුකූලභාවයන් කඩවීමට ලක් වීම ජනතා විශ්වාසය ඔහු තුළින් ගිලිහීමට හේතු වූ අතර, කොරෝනා වසංගතය ඒ සමග ඇති වූ ආර්ථික අර්බුදය සහ නිසි දැක්මක් හෝ දැනුමකින් තොරව ක්‍රියාත්මක කරන ලද ගෝඨාභය රාජපක්ෂගේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය රට, එහි ජනතාව පැවති තත්ත්වයෙන් තවත් පහලට ඇද වැටීමක් සනිටුහන් කළහ. මීට අමතරව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මහජන ආකර්ෂණය නැතිවීම 2019 සහ 2020 මැතිවරණ ජයග්‍රහණ වලට සමගාමීව එහි නායකයින්, අමාත්‍යවරුන්, මන්ත්‍රීවරුන් සහ ප්‍රාදේශීය මට්ටමේ පක්ෂ ක්‍රියාකාරීන් විසින් පෙන්නුම් කරන ලද බලයේ අහංකාරය බලපා ඇත. 2020 පසු දරුණු ආර්ථික අර්බුදයක් ඇති වූ අවස්ථාවේ දූෂණය, දේශපාලන බලය අනිසි ලෙස භාවිතා කිරීම සහ අකාර්යක්ෂම පාලනය හේතුවෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ බහුජන ඡන්දදායකයින්ගේ පක්ෂපාතිත්වය ආපසු හැරවිය නොහැකි ලෙස බාදනය විය.

එසේ ම එතෙක් පැවති සාම්ප්‍රදායික දේශපාලන පක්ෂවල බහුජන ඡන්දදායක ඡන්ද කොට්ඨාශවල පක්ෂපාතිත්වය අහිමි වීමේ ප්‍රවණතාවයක් ද මෙකල දක්නට ලැබුණු අතර, ඊට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය අන්තර්ගතයන් බලපායි. ප්‍රාදේශීය වශයෙන් මුල් බැසගත් ඡන්දදායකයාගේ ඡන්ද පදනම පහත වැටීමට සෑම පක්ෂයකටම තමන්ගේ ම ස්වයං-සාදන ලද හේතු තිබේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ 2015 දී හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වෙත පක්ෂ නායකත්වය මාරුවීම, ප්‍රාදේශීය මට්ටමේ ඡන්ද කොට්ඨාශ සඳහා පක්ෂයේ ආයාචනය දුර්වල වීමේ ආරම්භය සනිටුහන් කළේය. මෛත්‍රීපාල සිරිසේනගේ එක්සත් ජාතික පක්ෂය සමඟ පැවති සන්ධානය, මහින්ද රාජපක්ෂ විසින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පිහිටුවීම, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විසින් මැතිවරණ වාසි සඳහා සිංහල බෞද්ධ ජාතිකවාදී දෘෂ්ටිවාදය ආයුධයක් ලෙස භාවිතා කිරීම සහ මෛත්‍රීපාල සිරිසේන, රනිල් වික්‍රමසිංහ විසින් ඔවුන්ගේ අදාළ පක්ෂවල බිම් මට්ටමේ පදනම් නැවත ගොඩනැගීමට කැපවීමක් නොමැතිකම එක්සත් ජාතික පක්ෂයේ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඡන්ද පදනම් වේගයෙන් ඛාදනය වීමට ප්‍රධාන හේතු ලෙස කැපී පෙනේ. ඒ අනුව දේශපාලන ආයතන කෙරෙහි විශ්වාසය පිළිබඳ සිදු කළ සමීක්ෂණ කිහිපයකදී, දේශපාලන පක්ෂ අවම වශයෙන් විශ්වාසදායක මහජන ආයතනවලින් එකක් ලෙස මතු වී තිබේ. නිදසුනක් වශයෙන්, 2017 දී සමාජ විද්‍යාඥයින්ගේ සංගමය විසින් පවත්වන ලද 'දකුණු ආසියාවේ ප්‍රජාතන්ත්‍රවාදී තත්ත්වය' සමීක්ෂණයෙන් හෙළි වූ පරිදි, ශ්‍රී ලාංකිකයන්ට දේශපාලන පක්ෂ රටේ අවම වශයෙන් විශ්වාසදායක ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය ලෙස නම් කර ඇත. එහි දි දේශපාලන පක්ෂ විශ්වාස කරන බව ප්‍රකාශ කොට ඇත්තේ 31% ක් පමණි. 2024 මාර්තු මාසයේදී ප්‍රතිපත්ති විකල්ප මධ්‍යස්ථානය විසින් කරන ලද සමීක්ෂණයකට අනුව, සිංහල ප්‍රජාව අතර දේශපාලන පක්ෂ කෙරෙහි මහජන විශ්වාසය 13.1% දක්වා ශීඝ්‍ර ලෙස පහත වැටීමකට ලක් ව ඇති බව දක්වයි (Uyangoda & Peiris, 2024). මෙලෙස දිගු කලක් තිස්සේ නිර්මාණය වූ ජනතා පීඩනය ඔවුන් පැවැති දේශපාලන සංස්ථා වලින් නව දේශපාලන සන්ධර්භයක් වෙත ඇඳ ගැනිමට එසෙත් නැතිනම් ආකර්ෂණය වීමට ප්‍රධාන පදනම සපයන බව අපට මින් වටහා ගත හැකියි.

මෙහි ප්‍රතිඵලයක් ලෙස 2024 වර්ෂයේදී ජාතික ජන බලවේගයේ සන්ධානය නියෝජනය කරන අනුර කුමාර දිසානායක, පළමු මනාප ඡන්දවලින් 42.31% ක් සහ දෙවන මනාප ගණන් කිරීමෙන් පසු මුළු ඡන්ද 5,740,179ක් ලබා ගනිමින් ජනාධිපති ධුරයට පත් විය. ඔහුගේ ජයග්‍රහණය සාම්ප්‍රදායික දේශපාලන චරිතවල බිඳ වැටිම සනිටුහන් කරයි. සමගි ජන බලවේගයේ සජිත් ප්‍රේමදාස පළමු මනාප ඡන්දවලින් 32.76% ක් ලබා ගත් අතර, දෙවන මනාපය ගණනය කිරීමෙන් පසුව මුළු ඡන්ද සංඛ්‍යාව 4,530,902 කි. රනිල් වික්‍රමසිංහ මහතාට 17.27% ක් පමණ අඩු ඡන්ද ප්‍රතිශතයක් පමණක් හිමි විය. මෙම 2024 ජනාධිපතිවරණයේ ප්‍රතිඵලවලින් පිළිබිඹු වන්නේ, 2022 සිට ශ්‍රී ලංකාව පීඩාවට පත් කළ ආර්ථික අර්බුද හමුවේ, සාම්ප්‍රදායික

දේශපාලන පක්ෂ කෙරෙහි මහජනතාව තුළ ඇති කලකිරීමයි. නව ලිබරල්වාදී පක්ෂයක් ලෙසින් බලයේ සිටි රාජපක්ෂ රජය පුළුල් විරෝධතාවලින් බලයෙන් පහ කිරීමෙන් පසු රනිල් වික්‍රමසිංහ ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. නමුත් රනිල් වික්‍රමසිංහ මහතාට හිමි වූ ඡන්ද ප්‍රමාණය දෙස බලන විට ඔහුගේ අතීත ක්‍රියාදාමයන් පිළිබඳ ජනතා කලකිරීම අඩු වී නැති බව සහ පරිපාලනයේ කප්පාදු පියවර කෙරෙහි ජනතාව තුළ එතරම් කැමැත්තක් නොපැවතුණු බව හඳුනා ගත හැකිය. සම්මුක සාකච්ඡාවන් තුළ දී මෙය තවදුරටත් තහවුරු විය.

*"ගොඩක් මිනිස්සු රනිල් වික්‍රමසිංහට ඡන්දය දුන්නේ නැහැ. ඔහු පිටුපස දොරෙන් ඇවිත් අරගලය යොදාගෙන ඉහළට නැග්ග කෙනෙක් ලෙස තමයි මගේ අදහස. පාස්කු ප්‍රහාරය සිද්ධ උනෙත් එයාලගේ රජයේ නිසි ක්‍රියා පටිපාටියක් තිබුණේ නැති නිසානේ, ඒ වගේම බැඳුම්කර වංචාවටත් ඔහුගේ සම්බන්ධයක් තියෙනවා කියලා ගොඩක් අය කියනවා නේද. මේ නිසා වෙන්නැති ගොඩක් අය එයාට ඡන්දෙ දුන්නේ නැත්තේ " (S2).*

ඉහත අදහස් අනුව ඡන්දදායකයින් අතර විශේෂයෙන් තරුණ පරම්පරාව වෙනසක් ඉල්ලා සිටි කාල පරිච්ඡේදයක් වූ හෙයින් ඔවුහු වැඩි වශයෙන් ජාතික ජන බලවේගයේ ප්‍රගතිශීලී සහ සමාජවාදී ප්‍රතිපත්ති වෙත ආකර්ෂණය වීම සිදු විය. මේ බව තවදුරටත් පහත කාන්තා දත්ත දායකයෙකුගේ අදහස් ඔස්සේ තහවුරු විය.

*"මැතිවරණයක් කියන්නෙම ඒක මිනිස්සු රවට්ටන ක්‍රමයක්. බලයේ ඉන්නකොට මිනිස්සු නොසලකා හරිනවා, බලය නැති වුණාම ආයෙත් මිනිස්සු ළඟට ඇවිත් කියනවා අපි ඔයාලා වෙනුවෙන් අරගල කරනවා කියලා. අපි සටන් කරන්නේ ඔයාට හොඳ අනාගතයක් දෙන්න කියලා. ප්‍රධාන පක්ෂ දෙකම ආයෙත් ආයෙත් මිනිස්සු රවට්ටලා තියෙනවා, එයාලා ඒක දිගටම එක කරගෙන යනවා. බලමු නේද මේ ආණ්ඩුවෙන් හරි දෙයක් කරාවි ද කියලා. මම වගේම ගොඩක් මිනිස්සු ඒක ගැන බලාගෙන ඉන්නේ" (S1).*

ජාතික ජන බලවේගයේ මෙම ජයග්‍රහණයට හේතු වූයේ මහජනතාවගේ ඇස් හමුවේ ශක්‍ය දේශපාලන විකල්පයක් ලෙස තහවුරු කර ගැනීමට ජේ.වි.පි. විසින් අනුගමනය කරන ලද දේශපාලන උපාය මාර්ගයි. ජනතාවාදී ආයාචනය ජේ.වි.පි. කතිකාවේ කේන්ද්‍රස්ථානය ලෙස දක්වමින්, ඔවුන් ප්‍රධාන තේමා කිහිපයක් ජනතාව වෙත හුවා දැක්විය. ඉන් තේමා තුනක් ලෙස, ආර්ථික අර්බුදයෙන් හමුවේ ආණ්ඩුව විසින් නියම කරන ලද කප්පාදු පියවරයන්ගෙන් පීඩාවට පත් වූ දුප්පත් ජනතාවට ක්ෂණික ආර්ථික සහන ලබා දීමට සහතික වීම, තරුණ සහ අලුත් මුහුණු ජාතික දේශපාලන හඳුන්වා දෙමින් කාලයට ගැළපෙන නව ක්‍රමවේදයක් ගොඩනඟන බව සහතික වීම සහ කාන්තාවන්ගේ අඩු නියෝජනය, වැටුප් ගැටලු මෙන් ම වෙනත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ අසාධාරණයන් වෙත අවධානය යොමු කරන බව සහතික වීම ඒ අතර වේ. එසේ නම් මෙවැනි හේතු ගණනාවක ප්‍රතිඵලයක් වශයෙන් 2019 වර්ෂයේ දී පොදු ජන පෙරමුණ යටතේ ගෝඨාභය රාජපක්ෂ වෙත පැවති ශ්‍රී ලංකාවේ සමස්ත ඡන්දදායක ලැදියාව, 2024 වර්ෂයේදී ජනතා විමුක්ති පෙරමුණ යටතේ අනුර කුමාර දිසානායක වෙත කේන්ද්‍රගත විය.

### *4.2. දත්ත දායකයන් ඇසුරින් 2019 සහ 2024 ජනාධිපතිවරණවල කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රතිඵල සකස් වීමට බලපෑ ඡන්දදායක හැසිරීම විමර්ශනය*

2019 වර්ෂයේදි ගෝඨාභය රාජපක්ෂයන්ට සහ 2024 වර්ෂයේදී අනුර කුමාර දිසානායක හට ජනාධිපතිවරණය ජයග්‍රහණය කිරීමට හැකි වුව ද තරඟය වඩාත් සාපේක්ෂව තරඟකාරී කරන ලද නාගරික බහු වාර්ගික දිස්ත්‍රික්කයන්ගෙන් එකක් වූයේ කොළඹයි. දිස්ත්‍රික්ක මට්ටමින් ජනගහන ව්‍යාප්තිය සලකන විට වැඩිම ජනගහනයක් ගම්පහ දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින අතර, එය 2,433,685 කි. ඊළඟට වැඩිම ජනගහනයක් ඇති කොළඹ දිස්ත්‍රික්කයේ ජනගහනය 2,374,461 කි. මේ අනුව මිලියන 2 කට වැඩි ජනගහනයක් පදිංචිව සිටිනුයේ මෙම දිස්ත්‍රික්ක දෙකේ පමණි. පෙර සංගණන වලදී මෙන්ම, 2024 වර්ෂයේදී ද වර්ග කිලෝමීටරයකට පුද්ගලයින් 3,549 ක් වූ වැඩිම ජනගහන ඝනත්වයක් ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයේය. මෙම ජනගහන සංකේන්ද්‍රණය තුළ කොළඹ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි සමස්ත ඡන්ද හිමියන් සංඛ්‍යාව 2019 දත්ත වලට අනුව 1,670,403ක් වන අතර, 2024 දත්ත වලට අනුව 1,765,351 ලෙස ශීඝ්‍රයෙන් වර්ධනයකට ලක්ව ඇත. ඒ අනුව ලංකාවේ වැඩිම ඡන්දදායකයන් සංඛ්‍යාවක් සිටින දිස්ත්‍රික්කයක් වශයෙන් කොළඹ දිස්ත්‍රික්කය අපට හඳුනාගත හැකිය. එය දෙවැනි වන්නේ ගම්පහ දිස්ත්‍රික්කයට පමණි. එසේ නම් මෙපමණ විශාල ඡන්දදායකයන් සංඛ්‍යාවක් වාසය කරන කොළඹ දිස්ත්‍රික්කය යනු මැතිවරණයකදී දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයෙක් ජය ගත යුතු අනිවාර්ය නාගරික මධ්‍යස්ථානයකි. පහත රූපසටහන විශ්ලේෂණාත්මක නිරික්ෂණය කිරීමේ දි අපට ඒ බව හඳුනා ගත හැක.







*රූපය 03: 2019 සහ 2024 ජනාධිපතිවරණයන්හි කොළඹ දිස්ත්‍රික්කයේ සමස්ත ප්‍රතිඵල*
*මූලාශ්‍ර: මැතිවරණ කොමිෂන් සභාවේ දත්ත අනුව පර්යේෂකයා විසින් නිර්මාණය කරන ලද්දකි, 2025*

ඉහත රූපසටහනට අනුව 2019 ජනාධිපතිවරණයේ ජයග්‍රාහකයා වූ

ගෝඨාභය රාජපක්ෂ ප්‍රමුඛ පොදු ජන පෙරමුණ 53.19% ප්‍රතිශතයකින් සහ 2024 ජනාධිපතිවරණයේ ජයග්‍රාහකයා වූ අනුර කුමාර දිසානායක ප්‍රමුඛ ජාතික ජන බලවේගය 47.21% ප්‍රතිශතයකින් කොළඹ දිස්තික්කය ජයග්‍රහණය කර ඇත. කොළඹ දිස්ත්‍රික්කය තුළ සජිත් ප්‍රේමදාස 2019 වර්ෂයේ දී ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය යටතේ 40.92% ප්‍රතිශතයක් සහ 2024 වර්ෂයේ දී සමගි පොදු පෙරමුණ යටතේ 25.64% ප්‍රතිශතයක් ලබා ගනිමින් අවස්ථා ද්විත්වයේ ම දෙවන තැන හිමි කරගෙන ඇත. එක්සත් ජාතික පක්ෂයට අතීතයේ සිටම වඩාත් වාසිදායක වුණු දිස්ත්‍රික්ක අතුරින් කොළඹ දිස්ත්‍රික්කයට සුවිශේෂී ස්ථානයක් හිමි විය. නමුත් ඔවුන් 2019 සහ 2024 ජනාධිපතිවරණයේ දී කොළඹ දිස්ත්‍රික්කය තුළ විශාල පසුබෑමකට ලක් වේ.




*රූපය 04: 2019 සහ 2024 ජනාධිපතිවරණවල කොළඹ දිස්ත්‍රික්කයේ එක් එක් ආසනගත ජයග්‍රාහකයාගේ ප්‍රතිඵල*

*මූලාශ්‍ර: මැතිවරණ කොමිෂන් සභාවේ දත්ත අනුව පර්යේෂකයා විසින් නිර්මාණය කරන ලද්දකි, 2025*

ඉහත රූපසටහනට අනුව 2019 වර්ෂයේදී කොළඹ දිස්තික්කය තුළ පවතින ආසන 15 අතුරින් ආසන 6ක් එක්සත් ජාතික පක්ෂය ජයගත් අතර, 2024 වර්ෂයේදී ආසන 3ක් පමණක් සමගි පෙරමුණට ජයග්‍රහණය කිරීමට හැකි විය. මෙම වාරයන් දෙකෙදි ම පක්ෂ දෙකේ ප්‍රධාන ජනාධිපති අපේක්ෂකයා වූ සජිත් ප්‍රේමදාස ජය ලැබූ ප්‍රදේශ අතරට මැද කොළඹ, උතුරු කොළඹ, බටහිර කොළඹ අයත් විය. මැද කොළඹ සහ උතුරු කොළඹ වැනි නාගරික මධ්‍යස්ථානවල සංකේන්ද්‍රණය වී ඇති සුළුතර ප්‍රජාවන් විශේෂයෙන් මුස්ලිම් සහ දෙමළ ජනතාව සජිත් ප්‍රේමදාස වෙත දැඩි ලෙස සහාය දැක්විම මෙම ආසන ජයග්‍රහණය කිරීමට හේතු වූ අතර, රාජපක්ෂවරුන් යටතේ වාර්ගික බහුතරවාදයට වෙත ප්‍රමුඛතාවය ලබා දිම, ගෝඨාභයගේ යුද කාලීන භූමිකාවන් පිළිබඳ, මානව හිමිකම් කඩකිරිම් සිදුකර ඇති බවට පවතින චෝදනා සම්බන්ධයෙන් සුළුතර ප්‍රජාවගේ පවතින අවිශ්වාසය සහ අනිකුත් ආගම්වාදී පක්ෂ විශේෂයෙන් සජිත් ප්‍රේමදාස වෙත යම් ලැදි භාවයක් දැක්වීම හේතුවෙන් ඔවුන් හරහා එම ජනතාව වෙත එල්ල වන පීඩනය ද ඉන් පෙන්නුම් කරයි. ඒ බව පහත දත්ත දායකයන්ගේ ප්‍රකාශ හරහා තහවුරු වේ.

*“අපේ ගොඩක් පිරිස ඡන්දෙ දුන්නේ සජිත් ප්‍රේමදාසට. යුද්දේ කාලේ වගේම යුද්ධයෙන් පස්සෙත් අපේ සමහර ජනතාව මුහුණ දිපු ප්‍රශ්නත් එක්ක අපි බය වුණා. ගෝඨාභය රාජපක්ෂයන්ට ඡන්දේ දිලා*

*ආයෙ ඒ වගේ සිද්ධිවලට මුහුණ දෙන්න සිද්ධ වේවි කියලා'' (T1).*

*"අපි අපේ ඡන්දය පාවිච්චි කරන කොට වැඩි හරියක් ම අපේ යහළුවන් සහ ඥාතීන් මොන වගේ මතයක් දරනවාද කියලා ඒගොල්ලොත් එක්ක කතා කරලා බලනවා. ඒ කොහොම උනත් අපිට ලැදි කෙනෙක්ට අපිට වැඩක් කරන්න පුළුවන් කියල හිතන කෙනෙක්ට තමයි ඡන්දෙ දෙන්නේ'' (T1).*

ශ්‍රී ලංකාව බහු ආගමික රටක් වන අතර, එහි විවිධ ආගම් අදහන විවිධ ජනවර්ග ජීවත් වේ. ආගම් ලෙස බුද්ධාගම, ක්‍රිස්තියානි, හින්දු සහ ඉස්ලාම් ආගම්ද, ජනවර්ග ලෙස සිංහල, මුස්ලිම්, දෙමළ සහ බර්ගර් යන ජන වර්ග ද දැක ගත හැකි වේ. මෙම ආගමික සාධකය හා වාර්ගිකත්වය ජනතාවගේ ඡන්දදායක චර්යාව තීරණය කිරීම සඳහා බලපානු ලබන තීරණාත්මක සාධකයකි. ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ සමය තුළ සහ ඉන් පසුවත් මේ තත්ත්වය කැපී පෙනෙන සාධකයක් වේ. මැතිවරණ වැඩසටහන්වල දී බොහෝ දේශපාලනඥයන් මැතිවරණ උපකරණයක් ලෙස මෙම ආගමික සහ වාර්ගිකත්වය සංකේත ලෙස භාවිතා කර ඇත.

ඒ අනුව 2019 දි කොළඹ දිස්ත්‍රික්කයට අයත් වූ ඉතිරි ආසන 9 ම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරන ලද ගෝඨාභය රාජපක්ෂට පහසුවෙන් ම ජයග්‍රහණය කිරිමට හැකි විය. එහි දී ගෝඨාභය රාජපක්ෂ කඩුවෙල, හෝමාගම, කැස්බෑව සහ මහරගම යන ආසන 4 ම 65%කට වැඩි ප්‍රතිශතවලින් ජයග්‍රහණය කිරීම විශේෂත්වයකි. මෙය 1994 ජනාධිපතිවරණයට පසුව එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ පෙරමුණ කොළඹ දිස්ත්‍රික්කය තුළ දී ලද දරුණුතම පරාජයයි. මහරගම, හෝමාගම, කඩුවෙල ප්‍රමුඛ ප්‍රදේශවල වැඩි වශයෙන් සිංහල බෞද්ධයන් වාසය කල අතර, ඔවුන් ගෝඨාභය රාජපක්ෂ කෙරෙහි දැඩි නැඹුරුවක් පෙන්නුම් කළ බව අපට මේ හරහා හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින්නේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. මෙහි ජනාධිපතිවරයාගේ බලතල, නිලකාලය, පත්විය යුතු ආකාරය ආදිය දක්වා ඇත. නමුත් එහි ජනාධිපති පත් විය යුතු පදනමක් දක්වා නොමැත. නමුත් සමාජයේ පවතින මතය වන්නේ සිංහල බෞද්ධ පුද්ගලයකු රටෙහි ජනාධිපති විය යුතු බවයි. මෙම පදනමක් ගොඩනැගීමට හේතු වනුයේ ශ්‍රී ලංකාවේ බහුතරයක් සිටින්නේ සිංහල බෞද්ධ පිරිස වීමයි. ඔවුන්ගේ ඡන්දදායක චර්යාවට ආගම හා වාර්ගිකත්වය එල්ල කරන බලපෑම් හේතුවෙන් මෙසේ සමාජය තුළ මතයක් ගොඩනැගී ඇත. මීට නිදසුන් ලෙස 2019 ජනාධිපතිවරණයේ දී ජයග්‍රහණය කළ ගෝඨාභය රාජපක්ෂ මහතාට වැඩි වශයෙන් ඡන්ද ලැබුණේ සිංහල බෞද්ධ පුද්ගලයන්ගෙන්ය. එයට හේතුවක් ලෙස පෙන්වා දිය හැක්කේ ගෝඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂක ලේකම් ධුරය දැරූ කාලය තුළ සිදු කළ වැඩ කටයුතු, බෞද්ධාගමිකයෙකු වීම හා ස්වාමීන් වහන්සේලා සමඟ කටයුතු කරන ආකාරය වැනි ක්‍රියාකලාපයන් හේතුවෙනි. 2019 මැතිවරණයෙන් ජයග්‍රහණය කළ ගෝඨාභය රාජපක්ෂ මහතා ඔහුගේ දිවුරුම් දීමේ උත්සවය තුළදී ජාතිය අමතා කළ ප්‍රකාශයෙහි සඳහන් එක් කරුණක් වනුයේ මේ ජයග්‍රහණයේ ප්‍රධානතම සාධකය වන්නේ මේ රටේ බහුතර සිංහල බෞද්ධ

ජනතාව බවයි. මෙම ප්‍රකාශය සමඟ ඡන්ද දායක චර්යාවට කොයි තරම් දුරකට ආගම හා වාර්ගිකත්වය බලපා ඇතැයි අපට දැකගත හැකි වේ. මෙලෙස ශ්‍රී ලංකාවේ ජාතිය ගොඩ නැගීම තුළ විවිධ අර්බුදකාරී ප්‍රශ්න රාශියක් පවතී. අපගේ ජාතිය ශ්‍රී ලාංකික වුවත් සිංහල, දෙමළ, මුස්ලිම් ලෙස ජන වර්ග අනුව බෙදෙමින් විවිධ වර්ගවාදී ගැටුම් ඇති කර ගනු ලබයි. ඒ සඳහා ප්‍රධානම පදනමක් සපයන්නන් ලෙස ලංකාවේ ක්‍රියාත්මක වන විවිධ ජාතිවාදී පක්ෂ පෙන්වා දිය හැක. එසේ නම් ලංකාවේ ප්‍රධාන නාගරික මධ්‍යස්ථානයක් වන කොළඹ ඡන්ද දායකයා වෙත ද මෙහි ආභාෂය ප්‍රබලව ලැබී ඇති බව ඉහත ඡන්ද ප්‍රතිඵල අනුව නිර්ණය කළ හැක.

එසේ ම ඉහත රූපසටහනට අනුව 2019 සහ 2024 ජනාධිපතිවරණ තුළදී සජිත් ප්‍රේමදාසගේ ජයගත් ආසන සංඛ්‍යාව දෙස බලන විට එය 6 සිට 3 දක්වා සීඝ්‍ර පහත වැටීමක් හඳුනාගත හැක. මෙයට ප්‍රධාන හේතුවක් වන්නේ එක්සත් ජාතික පක්ෂය දෙකට බෙදීමයි. එනම්, සජිත් ප්‍රේමදාස සමගි ජන බලවේගය නමින් නව පක්ෂයක් ආරම්භ කිරීමට මේ කාලසීමාව තුළදී පියවර ගනී. එහි ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයන් සාධක කිහිපයක් මත පදනම්ව රනිල් වික්‍රමසිංහ සහ සජිත් ප්‍රේමදාස ලෙස පිල් බෙදීමකට ලක් වේ. මෙහි දී පක්ෂ පක්ෂපාතිත්වය සහ අපේක්ෂකත්වය යන සාධක දෙක මත පදනම්ව ඡන්දදායක හැසිරීම නිර්මාණය වීමට පදනම සකසන බව හඳුනාගත හැක. 2020 මුල් භාගයේදී සජිත් ප්‍රේමදාස යටතේ සමගි ජන බලවේගය පිහිටුවීමෙන් පසු එක්සත් ජාතික පක්ෂයේ සංවිධානාත්මක ව්‍යුහයෙන් සහ බිම් මට්ටමේ සහයෝගයෙන් සැලකිය යුතු කොටසක් නව පක්ෂය වෙත මාරු වේ. 2024 දී, බොහෝ සාම්ප්‍රදායික එක්සත් ජාතික පක්ෂ ඡන්දදායකයින් මුල් එක්සත් ජාතික පක්ෂයට වඩා සජබයට සහාය දැක්වූයේ පහත සඳහන් හේතු මතය.

2019 දී එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා වූ සජිත් ප්‍රේමදාස වෙත ගොඩනැගුණු නායකත්ව පක්ෂපාතිත්වය, ඔහු දේශපාලන පවුලකින් පැවත එන අතර, ඔහුගේ පියා වූයේ ජනතාවට ඉතා ලැදිව කටයුතු කළ රණසිංහ ප්‍රේමදාසය. එපමණක් නොව සජිත් ප්‍රේමදාස ඔහුගේ මැතිවරණ ව්‍යාපාරය කේන්ද්‍රගත කළේ සමාජීය හා ආර්ථික ගැටළු කෙරෙහි ය. එහි මූලාරම්භයක් ලෙස හඳුන්වා දුන් ඔහුගේ "නිවාස 10,000 වැඩසටහන්" ජනතාවගේ ආකර්ෂණය දිනා ගැනීමට සමත් විය. ඊට අමතරව රනිල් වික්‍රමසිංහ යටතේ එක්සත් ජාතික පක්ෂයේ පැවැත්ම අඩුවීම සහ සංවිධානාත්මක ලෙස නැවත ගොඩනැගීම ප්‍රමාදවීම් එයට හේතු සාධක ලෙස බලපායි. මෙම බෙදීම එක්සත් ජාතික පක්ෂය කලින් ආධිපත්‍යය දැරූ ප්‍රදේශවල ඡන්ද ප්‍රතිශතය පවා දුර්වල වීමට හේතු වේ. ඒ අනුව 2024 දී රනිල් වික්‍රමසිංහ ජනාධිපති අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත් වුවද ඔහුට නාගරික බල ප්‍රදේශවල පවා ඉතා අඩු ඡන්ද ප්‍රතිශතයක් එනම් 5% ට අඩු ප්‍රතිශතයක් හිමිවිය. විශේෂයෙන් කොළඹ නාගරික ඡන්දදායකයින් (වික්‍රමසිංහ නියෝජනය කරන පරිදි) ප්‍රතිසංස්කරණවාදී අඛණ්ඩතාව සහ (ප්‍රේමදාස නියෝජනය කරන පරිදි) ජනතාවාදී විපක්ෂය අතර උභතෝකෝටිකයකට මුහුණ දුන්හ.

එක්සත් ජාතික පක්ෂයේ හිටපු සමහර ඡන්දදායකයින් ඡන්දය දීමෙන් වැළකී සිටීම හෝ විකල්ප තෙවන පාර්ශවීය අපේක්ෂකයින්ට ඡන්දය දීමට පෙළඹීම හරහා සාම්ප්‍රදායික එක්සත් ජාතික පක්ෂ ඡන්දදායකයින් අතර දේශපාලන අනන්‍යතාවයේ අර්බුදයක් පෙන්නුම් කරයි. එය පහත දත්ත දායකයන්ගේ අදහස් අනුව තහවුරු වේ.

*"මම හැම මැතිවරණයකදී ම එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දුන්න කෙනෙක්. ඒත් ඔවුන්ට ඔවුන්ගේ පක්ෂය පිළිබඳ හරි පක්ෂ ප්‍රතිපත්තියක් නැතුව ගියා. ඒ නිසා මම සජිත් ප්‍රේමදාසට සහාය දෙන්න තීරණය කළා. ඔහු නියෝජනය කරන්නේ එක්සත් ජාතික පක්ෂයේ පරණ අනන්‍යතාවය" (S2).*

මෙසේ එක්සත් ජාතික පක්ෂය දෙකඩ වීම සජිත් ප්‍රේමදාසට 2024 ජනාධිපතිවරණයේදී කොළඹ දිස්ත්‍රික්කයේ ලබා ගත හැකිව තිබූ ඡන්ද අඩු වීමට හේතුවේ. කෙසේ නමුත් ඉහත උපයුක්ත අදහස අනුව නූතන ඡන්දදායකයා පක්ෂ පක්ෂපාතීත්වය තුලින් තරමක් දුරට ඈත් වී අපේක්ෂකත්වයේ ප්‍රතිරූපය යන සාධකය පෙරදැරි කරගෙන තම ඡන්දදායක හැසිරීම ගොඩනගා ගැනීමට 2024 ජනාධිපතිවරණයේදී පෙළඹී ඇති බව හඳුනාගත හැක.

පෙර ජනාධිපතිවරණයේදී 3.93% ඡන්ද ප්‍රතිශතයක් හිමිකර ගත් ජනතා විමුක්ති පෙරමුණ 2024 ජනාධිපතිවරණයේදී කොළඹ දිස්ත්‍රික්කයේ ආසන 15න් දොළහකම ජය ලබා ගැනීමට සමත් වේ. 2019 වර්ෂයට සාපේක්ෂව ජයග්‍රාහකයා ජයග්‍රහණය කරන ලද ආසන සංඛ්‍යාවේ වර්ධනයක් පෙන්නුම් කළ ද ප්‍රස්ථාරය දෙස විශ්ලේෂණාත්මකව බැලීමේදී හඳුනාගත හැකි වන්නේ ජනාධිපතිවරණය සඳහා ඡන්දදායකයින්ගේ සහභාගීත්වයේ අඩු මට්ටමක් සහ ඔවුන් ඡන්ද ලබා දීම සාපේක්ෂව යම් පරිවර්තනයක් සිදුව ඇති බවයි. එනම්, කොළඹ දිස්ත්‍රික්කය තුළින් ඡන්දය ලබාදීම සඳහා සුදුසුකම් ලැබූ සමස්ත ඡන්දදායකයින් සංඛ්‍යාව වන 1,765,351 අතරින් 2024 වර්ෂයේදී ඡන්දය ලබා දී ඇත්තේ 1,366,186 පමණි. මීට පෙර 2019 වර්ෂයේ දී එම ආසන වලට හිමිකම් පෑවේ පොදු ජන පෙරමුණයි. ගෝඨාභය රාජපක්ෂ කාලසීමාව තුලදී රට තුළ ඇතිවූ ගැටලු සහගත තත්වයන් හමුවේ නාගරික බල ප්‍රදේශ වෙත එල්ල වූ බලපෑම් එහි ඡන්දදායකයින් ඡන්දය ලබා දීමේ වෙනස්කම් නිර්මාණය කිරීමට හෝ ඡන්දය ලබා නොදී සිටීමට හේතු වේ. ඒ අනුව පාවෙන ඡන්දදායකයින්ගේ සංඛ්‍යාවේ ප්‍රසාරණය සිදු වූ අතර, මැතිවරණ ප්‍රතිඵල හැඩගැස්වීමේදී ඔවුන් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. විශේෂයෙන් ම දේශපාලන පක්ෂවල බිම් මට්ටමේ ජනප්‍රිය සමාජ මූලයන් දුර්වල වීම සහ පක්ෂ නොවන ඡන්දදායකයින්ගේ ප්‍රසාරණය අතර සහජීවන සම්බන්ධතාවයක් පවතී. සිත්ගන්නා කරුණ නම්, පක්ෂ නොවන ඡන්දදායකයින්ගේ සංඛ්‍යාවේ වැඩිවීම ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ඡන්දදායක උදාසීනත්වයක් පෙන්නුම් නොකරයි. ඒ වෙනුවට, එය ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේ යම් ආකාරයක පශ්චාත්-නූතන ප්‍රවණතාවක් නියෝජනය කරයි. එනම්, දේශපාලන පක්ෂ සහ මතවාද කෙරෙහි ඡන්දදායකයින්ගේ අවිශ්වාසය ඔවුන් යම් සෝදිසි භාවයකින් දේශපාලන පක්ෂ දෙස බැලීමට හුරු විමයි. 2019 මැතිවරණය

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව සිදු වූ අතර, ගෝඨාභය රාජපක්ෂ වෙත ආකර්ෂණය වීමට වාසිදායක තත්වයක් වූ එය ආරක්ෂාව කේන්ද්‍ර කරගත් දේශපාලන වාතාවරණයක් නිර්මාණය කරයි. එමඟින් ශක්තිමත් ඡන්ද ප්‍රතිශතයක් සහ එක් අපේක්ෂකයෙකුට පක්ෂව ඡන්ද ඒකාබද්ධ වීමක් සිදු වේ. ඊට වෙනස්ව, 2024 වර්ෂය තුළ එවැනි විශේෂයෙන් ඒකාබද්ධ අර්බුද ආඛ්‍යානයක් නොතිබූ අතර, දේශපාලන ක්ෂේත්‍රය වඩාත් තරඟකාරී වෙමින් පක්ෂ කිහිපයක් වටා බලමුලු ගැන්වීය. ඒ අනුව කොළඹ නාගරික ඡන්දදායකයින් ද වඩාත් විවිධාකාරව සහ විවේචනාත්මක එයට නැඹුරුවක් පෙන්නුම් කරයි.

### *4.4. තල්ලු කිරීමේ සහ ඇද ගැනීමේ න්‍යාය සමඟ සම්බන්ධ කිරීම*

සංක්‍රමණ අධ්‍යයනයන්හි මූලිකව භාවිතා කරන ලද තල්ලු කිරීමේ සහ ඇද ගැනීමේ න්‍යාය (Push and Pull Theory) ඡන්දදායකයින් විශේෂිත දේශපාලන තේරීම්, පක්ෂ සහ අපේක්ෂකයින් දෙසට ආකර්ෂණය කරන (අදින්න) හෝ ඔවුන්ගෙන් ඈත් කරන (තල්ලු කරන) සාධක සංකල්පනය කිරීමෙන් ඡන්ද හැසිරීම විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රයෝජනවත් රාමුවක් ලෙස අනුවර්තනය කළ හැකිය. කොළඹ නාගරික ඡන්දදායක හැසිරීම් සන්දර්භය තුළ, තල්ලු කිරීමේ සාධක අතරට දේශපාලන පක්ෂ කෙරෙහි අතෘප්තිය, පාලනය පිළිබඳ කලකිරීම, ආර්ථික දුෂ්කරතා හෝ දේශපාලන කතිකාවෙන් බැහැර වීමේ හැඟීම් ඇතුළත් විය හැකිය. මෙම සෘණාත්මක අත්දැකීම් හෝ සංජානන ඡන්දදායකයින්ට පවතින දේශපාලන විකල්ප ප්‍රතික්ෂේප කිරීමට පසුබිම සකසයි. මීට ප්‍රතිවිරුද්ධව ආකර්ශනීය නායකත්වය, ඒත්තු ගැන්විය හැකි දේශපාලන ව්‍යාපාර, හිතකර දේශපාලන සහ ආර්ථික ප්‍රතිපත්ති, පක්ෂ අනන්‍යතා වැනි ඇදීමේ සාධක ඡන්දදායකයින් නිශ්චිත නව අපේක්ෂකයින් හෝ පක්ෂ වෙත ආකර්ෂණය කර ගත හැකිය. මෙහි දි මාධ්‍ය වෙත ප්‍රවේශය, විවිධ දේශපාලන මතවාදයන්ට නිරාවරණය වීම සහ වේගවත් සමාජ සහ ආර්ථික වෙනස්කම්, තල්ලු කිරීමේ සහ ඇදීමේ සාධක ද්විත්වයේ බලපෑම පුළුල් කළ හැක. පර්යේෂණයේ පර්යේෂණ ප්‍රශ්න මත පදනම්ව පහත ලෙස එම කොටස් විශ්ලේෂණය භාජනය කර ඇත.

### *4.5. මාධ්‍ය ප්‍රවේශය සහ දේශපාලන ආකල්ප*

ශ්‍රී ලංකාවේ නාගරික ඡන්දදායකයින්ගේ දේශපාලන ආකල්ප සහ ඡන්දදායක හැසිරීම හැඩගැස්වීමේදී මාධ්‍ය භාවිතය සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන බව විශ්ලේෂණයෙන් හෙළි විය. ජනතාවගේ දේශපාලන හැසිරීම් වල ස්වභාවය සහ දේශපාලන සංස්කෘතිය අවබෝධ කර ගැනීමේදී මිනිසුන්ගේ දේශපාලන දැනුමේ මට්ටම ඉතා වැදගත් වේ. නියැදියේ සමස්ත දත්ත දායකයන්ගෙන් ඉහළ ප්‍රතිශතයක් ලෙස 96.7% (116 දෙනෙකුට) දේශපාලනය සහ රටේ ප්‍රජාතන්ත්‍රවාදී භාවිතයන් පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් ඇත.




***රූපසටහන 05:* දත්ත දායකයින්ගේ මාධ්‍ය භාවිතය**

*මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2025*

අධ්‍යයන සොයා ගැනීම්වලින් පෙනී යන්නේ දත්ත දායකයන් බොහොමයක් වැඩි වශයෙන් පුවත්පත් හෝ රූපවාහිනි නැරඹීමට වඩා විද්‍යුත් මාධ්‍යවලට ප්‍රතිචාර දක්වන බවයි. ඒ අනුව පර්යේෂණ දත්ත ඔස්සේ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 78.3% ක් සමාජ මාධ්‍ය වේදිකා එනම්, ප්‍රධාන වශයෙන් ෆේස්බුක් (Facebook), යූටියුබ් (YouTube), ටික්ටොක් (Tiktok) සහ ඉන්ස්ටර්ගැම් (Instagram) ඔවුන්ගේ ප්‍රධාන දේශපාලන තොරතුරු මූලාශ්‍රය ලෙස සඳහන් කර ඇත. රූපවාහිනිය සහ පුවත්පත් වැනි සාම්ප්‍රදායික මාධ්‍ය පොදුවේ 21.7%ක් අනුගමනය කරන අතර, විශේෂයෙන් බොහෝ ප්‍රතිචාර දැක්වූවන් මූලාශ්‍ර අතර අතිච්ඡාදනයක් පෙන්නුම් කරයි.

ප්‍රමාණාත්මක දත්ත ඔස්සේ සිදු කරන ලද විශ්ලේෂණයන්ගෙන් හඳුනා ගැනුනේ සමාජ මාධ්‍ය මත යැපීම සහ සාම්ප්‍රදායික නොවන හෝ නැගී එන දේශපාලන පක්ෂ සඳහා ඇති කැමැත්ත අතර සංඛ්‍යානමය වශයෙන් වැදගත් සම්බන්ධතාවයක් පෙන්නුම් කරන බවයි. මෙයින් ඇඟවෙන්නේ ඩිජිටල් මාධ්‍ය සමඟ නිතර සම්බන්ධ වන ඡන්දදායකයින් ප්‍රතිසංස්කරණවාදීන් ලෙස නැගී එන අපේක්ෂකයන්ට හෝ ප්‍රධාන ධාරාවේ දේශපාලන සංස්ථාපිතයෙන් පිටත සිටින අපේක්ෂකයින්ට සහාය දැක්වීමට වැඩි කැමැත්තක් දක්වන බවයි. ඒ අනුව සම්මුඛ සාකච්ඡා දත්ත මගින් සමාජ මාධ්‍ය කෙරෙහි වැඩිහිටි ඡන්දදායකයින් අතර යම් තරමක සැකයක් ඇති බව හෙළි විය. නිදසුනක් වශයෙන් හෝමාගම ප්‍රදේශයේ 54 හැවිරිදි ප්‍රතිචාර දක්වන්නෙකු පහත ලෙස තම අදහස් දැක්වීය.

*"මම අන්තර්ජාලයෙන් දකින දේවල් විශ්වාස කරන්නේ නැහැ. ඒවායින් බොහොමයක් නිර්මාණය කර ඇත්තේ එක එක අයගේ විශ්වාසයන් මතිමතාන්තර අනුවනේ. අඩුම තරමින් යම් වගකීමක් තිබෙන නිසා මම සිරස හෝ දෙරණ නාලිකාවල ප්‍රවෘත්ති නැරඹීමට කැමතියි" (S1).*

මෙම පරම්පරා බෙදීම හරහා තොරතුරු වෙත ප්‍රවේශ විවිධ මාධ්‍යය ඡන්ද තේරීම් කෙරෙහි බලපානවා පමණක් නොව, දේශපාලන සන්නිවේදනයේ විශ්වසනීයත්වය සහ විශ්වාසය කෙරෙහි ගැඹුරු ආකල්ප පිළිබිඹු කරන ආකාරය ඉස්මතු කරයි. 2010 වර්ෂයෙන් පසු ශ්‍රී ලංකාවේ මාධ්‍ය සහ මාධ්‍ය හැසිරීම මෙන්ම මාධ්‍ය සදාචාරයන්ද වෙනස්ම වූ මාවතකට යොමු වන්නේ සමාජ මාධ්‍ය ජාලාවන් හරහා නිරන්තරයෙන් රටේ ජනතාව සාමාජීය සහ දේශපාලනික වශයෙන් තම මතයන් හුවමාරු කිරීමත් සමගය. මෙමගින් සිදු වූයේ පවතින රජයන් හට තමාට රිසිසේ ප්‍රධාන ජාලාවේ සාම්ප්‍රදායික මාධ්‍යන් හැසිරවීම තුළින් පමණක් ම තම පක්ෂපාති මතයන් මෙන්ම දේශපාලන ජයග්‍රහනයන් වෙනුවෙන් මාධ්‍යය හැසිර වීම ප්‍රමාණවත් නොවීමයි. මෙම සොයාගැනීම් සමාජ මාධ්‍ය හරහා දේශපාලනය පුද්ගලීකරණය කිරීම

පිළිබඳ අදහස සමග ද සමපාත වේ. එයින් පෙන්නුම් කරන්නේ තරුණ නාගරික ඡන්දදායකයින් අන්තර්ජාලය හරහා චිත්තවේගීය ලෙස ආරෝපණය වූ, වේගයෙන් චලනය වන දේශපාලන අන්තර්ගතයන්ට වඩාත් ගොදුරු විය හැකි බවයි. විශේෂයෙන් සමාජ මාධ්‍ය ජාල බොහෝ දේශපාලන අදහස් ඒ හරහා සාකච්ඡා කරන අතර, ඇතැමුන් දේශපාලනය හා දේශපාලඥයන් විවේචනය කිරීමට ද මෙය වේදිකාවක් කර ගනියි. මෙම සමාජ මාධ්‍ය හරහා සත්‍ය කරුණක් හෝ අසත්‍ය කරුණු ඉතා ඉක්මනින් ප්‍රචාරණය කිරීමට හැකි අතර මෙසේ සමාජ මාධ්‍ය වල භාවිතය පාලනය කිරීමට අපහසු වූ අවස්ථා තුළදී සමාජ මාධ්‍ය ජාලා අවහිර කිරීමට මෛත්‍රීපාල සිරිසේන මහතාගේ පාලන සමය තුළ ඔහුට සිදු විය. ඔහුගේ මෙම ක්‍රියා කලාපය තරුණ ප්‍රජාව දැඩි ලෙස විවේචනය කළ අතර ඔහුට ජනතා අප්‍රසාදයක් එල්ල වීමට මෙයද එක් හේතුවක් ලෙස හඳුනාගත හැක.

මෙරට දේශපාලන ක්‍රියාවලිය තුළ ඡන්දදායක චර්යාව වෙනස්වීම කෙරෙහි තීරණාත්මක සාධකයක් ලෙස මැතිවරණ ප්‍රචාරක කටයුතු බලපාන බව දැක්විය හැකිය. ජනතා ගැටලු විසඳීමට ක්ෂණික සුබසාධන වැඩසටහන් කිරීමටත්, සුබසාධනය කරන තුරු ජනතාව බලා සිටින ආකාරයේ ඡන්දදායකයා එකිනෙකා මත රඳා පවතින තත්ත්වයකට මෙරට මැතිවරණ ක්‍රියාවලිය පත් ව ඇත. මෙවැනි තත්ත්වයක් තුළ ඡන්දදායකගේ පරමාධිපත්‍ය බලය දේශපාලන ප්‍රතිපත්තිවලට නොව පක්ෂයක් හෝ අපේක්ෂකයින්ගේ ප්‍රචාරණ කටයුතු මගින් ආමන්ත්‍රණය කරනු ලබන දෘෂ්ටිවාදී කරුණු කෙරෙහි වැඩි නැඹුරුවක් දැකිය හැකි විය. මෙම ප්‍රචාරක වැඩපිළිවෙළ තුළ දී සිංහල බහුතරයක් සිටින ප්‍රදේශවල සුළු ජන අපේක්ෂකයන් බහුතර ජනතාව කෙරෙහි බලපාන ප්‍රතිපත්තිමය කරුණු ද මැතිවරණයට ඉදිරිපත් කරන අතර, සිංහල අපේක්ෂකයෝ කුලය, පන්තිය, ආගම යන සාධකත් අනුග්‍රාහක සේවා සබඳතාවත් මැතිවරණ ක්‍රියාවලිය කෙරෙහි යොදා ගනිති. එහිදී පක්ෂයට හෝ අපේක්ෂකයාට තිබෙන ප්‍රධානතම ප්‍රතිවිරෝධි තත්ත්වයන් අවම කර ගැනීමට මැතිවරණ ප්‍රචාරක කටයුතු මෙහෙයවීම කෙරෙහි වැඩි නැඹුරුවක් දැකිය හැකිය. මෙහිදී මැතිවරණ ප්‍රචාරණය සඳහා බහුලව භාවිතා වන සන්දර්භයක් ලෙස සමාජ මාධ්‍ය අද වන විට පත්ව ඇත. නිදසුනක් වශයෙන් 2019 ජනාධිපතිවරණයේදී එහි අපේක්ෂකයින් මුහුණු පොත සමාජ මාධ්‍ය භාවිතා කිරීම පහත වගුව ඔස්සේ පෙන්වා දිය හැක.

පහත වගුව දෙස බැලීමේ දි ගෝඨාභය රාජපක්ෂ සහ සජිත් ප්‍රේමදාස සමාජ මාධ්‍ය ඔස්සේ සිදු කරන තම බිම මට්ටමේ මැතිවරණ ව්‍යාපාර වලදි වැඩි අනුගාමිකයින් සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීමට ඔවුන්ගේ මුහුණ පොතේ සටහන් හරහා හැකි වී ඇත. මේ සම්බන්ධව දත්ත දායකයින්ගෙන් සම්මුඛ සාකච්ඡාව තුළ දී ප්‍රශ්නයක් ආකාරයෙන් කරුණු විමසූ අතර, එහි දි සැලකිය යුතු පිරිසක් තමා නියෝජනය කළ අපේක්ෂකයාගේ නිල ෆේස්බුක් පිටුවේ අනුගාමිකයෙකු ලෙස හෝ අපේක්ෂකයාගේ ෆේස්බුක් පිටුවේ සටහන් සඳහා අදහස් ඉදිරිපත් කිරීමට කටයුතු කළ බව තහවුරු කරන ලදී.

*වගුව 02 : නිල ෆේස්බුක් පිටු සහ ඒවායේ අන්තර්ක්‍රියා ( 2019 ජනාධිපතිවරණය)*

| අපේක්ෂකයා | පක්ෂය | නිල ෆේස්බුක් පිටුව | පළකළ පණිවිඩ සංඛ්‍යාව | සමස්ත අනුගමකයන් (Followers) | අන්තර්ක්‍රියා (Average Interactions) |
|---|---|---|---|---|---|
| ගෝටාභය රාජපක්ෂ | ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ (SLPP) | https://www.facebook.com/PodujanaParty/ | 464 | 52713 | 441 |
| සජිත් ප්‍රේමදාස | නව ප්‍රජාතන්ත්‍රවාදි පෙරමුණ (NDF) | https://www.facebook.com/UNPofficialpage/?_rdc=1&_rdr# | 495 | 320567 | 391 |
| අනුර කුමාර දිසානායක | ජාතික ජනබල වේගය (NPP) | https://www.facebook.com/nppsrilanka/?_rdc=1&_rdr# | 2018 | 46872 | 267 |
| මහේෂ් සේනානායක | ජාතික ජනතා පක්ෂය (NPP) | https://web.facebook.com/nationalpeoplesmovement/ | 209 | 41233 | 208 |

*මූලාශ්‍ර: Sri Lanka Politics And Social Media Participation A Case Study Of The Presidential Election, 2020*

මෙලෙස ඉලක්කගත දේශපාලන වෙළඳ දැන්වීම් සහ විවිධ ප්‍රචාරක ද්‍රව්‍ය වලට නිරාවරණය වීම පවතින පක්ෂග්‍රාහීත්වයන් තවදුරටත් ශක්තිමත් කරන අතර, මේ තත්වය පරිසර් (Pariser) 2011 වසරේදී රචනා කරන ලද පෙරහන් බුබුලු (The Filter Bubble) නම් කෘතිය තුළ සඳහන් අදහසට සමාන වෙයි. එහි දී ඔහු විස්තර කරන්නේ පෙරහන් බුබුලක් එසෙත් නැතිනම් දෘෂ්ටිවාදාත්මක රාමුවක් යනු පුද්ගලාරෝපිත සෙවීම්, නිර්දේශ පද්ධති සහ සැකසීම් හේතුවෙන් ඇති විය හැකි බුද්ධිමය හුදකලා තත්ත්වයක් බවයි. සෙවුම් ප්‍රතිඵල පදනම් වී ඇත්තේ පරිශීලකයා පිළිබඳ තොරතුරු මතය. එනම්, ඔවුන්ගේ ස්ථානය, අතීත හැසිරීම සහ සෙවුම් ඉතිහාසය අනුවයි. මේ තුළින් පරිශීලකයින් ඔවුන්ගේ දෘෂ්ටිකෝණයන්ට එකඟ නොවන තොරතුරු වලින් වෙන් වී ඔහුගේ හෝ ඇයගේ සංස්කෘතික හෝ දෘෂ්ටිවාදාත්මක බුබුලු තුළ ඵලදායී ලෙස හුදකලා වේ. එහි ප්‍රතිඵලයක් ලෙස ලෝකය පිළිබඳ සීමිත සහ අභිරුචිකරණය කළ දැක්මක් පුද්ගලයා තුළ ගොඩනැගේ. ප්‍රතිචාර දැක්වූවන් *“මම දැනටමත් සහාය දක්වන පක්ෂවල අන්තර්ගතයන් සහ තොරතුරු නිතර සමාජ මාධ්‍ය ඔස්සේ නරඹන”* බව වාර්තා කළ අවස්ථා කිහිපයක දී මෙම බලපෑම පැහැදිලි විය.

දත්ත මගින් තහවුරු වන්නේ මාධ්‍ය වෙත ප්‍රවේශය විශේෂයෙන් සමාජ මාධ්‍ය නාගරික ශ්‍රී ලාංකික ඡන්දදායකයින් දේශපාලන

අපේක්ෂකයින් වටහා ගන්නා ආකාරය සහ ඡන්ද තීරණ ගන්නා ආකාරය සම්බන්ධයෙන් සැලකිය යුතු ලෙස බලපාන බවයි. ඒ අනුව එය ඔවුන් අපේක්ෂකයා වෙත ඇද ගැනීමේ හෝ ප්‍රතිවාදී අපේක්ෂකයන් තමා වෙතින් ඈතට තල්ලු කිරීමේ සාධකයක් ලෙස ක්‍රියා කරයි. කෙසේ වෙතත්, මෙම බලපෑම වයස, මාධ්‍ය සාක්ෂරතාවය සහ මූලාශ්‍ර විශ්වසනීයත්වය පිළිබඳ විශ්වාසය මගින් සමහර අවස්ථාවන්හි විවිධ මට්ටම් ගත අවතීර්ණයන්ට පුද්ගලයා ගෙන යා හැක.

## *4.6. ජනවිකාස සාධක සහ ඡන්ද රටා*

ශ්‍රී ලංකාවේ නාගරික ඡන්ද කොට්ඨාශවල ඡන්ද රටාවන් හැඩගැස්වීමේදී වයස, ස්ත්‍රී පුරුෂ භාවය සහ ජනවාර්ගිකත්වය වැනි ජන විකාශන විචල්‍යයන් ද බලපා ඇති බව සොයා ගන්නා ලදී. කොළඹ දිස්ත්‍රික්කය පුරා නාගරික ප්‍රතිචාර දැක්වූවන් 120 දෙනෙකුගෙන් එකතු කරන ලද පර්යේෂණ දත්ත මෙම ලක්ෂණ සහ දේශපාලන මනාපයන් අතර කැපී පෙනෙන සහසම්බන්ධතාව හෙළි කරයි.

අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලී ක්‍රමවේදය හරහා නැවත ජනාධිපතිවරණයක් පැවැත්වුවහොත් ඡන්දය දෙනවාද යන්න දත්ත දායකයන්ගෙන් විමසන ලදී. එහි දී දත්ත දායකයන් 86 දෙනෙක් "බොහෝ දුරට" ලෙස ද, 9 දෙනෙක් "අනපේක්ෂිතයි" යැයි පැවසූ අතර, 5 දෙනෙක් "තීරණය කර නැත" යැයි පවසන ලදී. මේ ඔස්සේ පෙනී යන්නේ ඡන්දය ප්‍රකාශ කිරීමේ හැසිරීම තුළින් තම අවශ්‍යතා සන්නිවේදනය කිරීම වැඩි පිරිසක් තවමත් විශ්වාස කරන බවයි. කෝට්ටේ තරුණයෙක් මැතිවරණ පිළිබඳ තම ස්ථාවරය මෙලෙස පැහැදිලි කරයි:

*"මම 2019 සහ 2024 ජනාධිපතිවරණ ද්විත්වය තුළ දීම ඡන්දය භාවිතා කරා. සමහර අපේක්ෂකයන්ට මම ප්‍රායෝගිකව පවා සහාය ලබා දුන්නා. නමුත් අපි හිතපු දේවල් ඒ විදියට තවම ඉටු වුණේ නෑ රට පැත්තෙන් බැලුවොත්. ඒ ගැන මිතුරන් සහ මම දැඩි කලකිරීමෙන් ඉන්නේ. ක්‍රියාකාරී දේශපාලනය සම්පූර්ණයෙන් ම අපි ඈත් වුනා. නමුත් හෙට මැතිවරණයක් තිබුණත් මම ඡන්දය දෙනවා, මොකද අපි ඡන්දය නොදුනහොත් කොහොමද අපේ අවශ්‍යතා පාලකයන්ට කියන්නේ" (S2).*

ඡන්දදායක හැසිරීම් තුළ පරම්පරා අතර බෙදීමක් පෙන්නුම් කරයි. වයස අවුරුදු 20 – 30, 30 – 40 වයස් බාණ්ඩ දෙකේ පිරිස සහ 40 – 50 වයස් කාණ්ඩයේ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 11 දෙනෙක් දූෂණ විරෝධී, තරුණ බලගැන්වීම් සහ ඩිජිටල් පාලනය, අධ්‍යාපනය, විරැකියාව, දරිද්‍රතාවය ආදිය පිළිබඳ පක්ෂයේ ප්‍රතිපත්තිය, පක්ෂ නායකයින්ගේ ගුණාංග, ජනතාවගේ ගැටළු කෙරෙහි පක්ෂයේ සංවේදීතාව, රටේ ආර්ථික ගැටලු වලට පිලියම් යෙදීම, රට ආරක්ෂා කළ යුතු සහ ආදරය කළ යුතු, රට සංවර්ධනය කිරීමේ හැකියාව, ජනවාර්ගික ගැටලු වලට පිළියම්, මානව හිමිකම් ආරක්ෂා කිරීම, ආගම, ජනවාර්ගිකත්වය, සංස්කෘතිය පිළිබඳ ආකල්පය, ජාතික ආරක්ෂාව යන තේමාවන් අවධාරණය කරමින් නව දේශපාලන ව්‍යාපාර හෝ ස්වාධීන අපේක්ෂකයින් සඳහා සහයෝගය පළ කළහ. ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡාව තුළදී ද මෙය තවදුරටත් තහවුරු විය.

*"පක්ෂ ඉතිහාසය ගැන මට වැඩක් නැහැ. අපේ ප්‍රශ්න ගැන කතා කරන අයට අධ්‍යාපනය, රැකියා සහ අපේ මේ ප්‍රදේශයේ ප්‍රශ්න ගැන වගකීමක් ගන්න කෙනෙක්ට මම ඡන්දය දෙනවා" (S1).*

මීට වෙනස්ව වයස අවුරුදු 40 -50 අතර 7 දෙනෙක් සහ 50 ට වැඩි ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සියලුම පිරිස පාහේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂය වැනි සාම්ප්‍රදායිකව ස්ථාපිත පක්ෂවලට කැමැත්තක් දැක්වූහ. තරුණ සහභාගිවන්නන් සමාජ ගැටලු සහ ආර්ථික අස්ථාවරත්වය ඔවුන්ගේ ඡන්දයට ප්‍රධාන බලපෑම් සහගතය ලෙස දැක් වූ අතර, වැඩිහිටි සහභාගිවන්නන් තම අතීත ස්ථාවරත්වය, අපේක්‍ෂක ප්‍රතිරූපය සහ පක්ෂ පක්ෂපාතිත්වය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වන බව ඔවුන්ගේ අදහස් තුළින් අනාවරණය කර ගත හැකි විය.

මෙහි දි ප්‍රතිචාර දැක්වූවන් හොඳ දේශපාලනඥයෙකුගෙන් අපේක්ෂා කරන ගුණාංග ද සඳහන් කළහ. සෑම ප්‍රතිචාර දක්වන්නෙකුටම තමා/ඇය වඩාත්ම කැමති ගුණාංග තුනක් පෙන්වා දෙන ලෙස ඉල්ලා සිටියේය. ඒ අනුව පිළිතුරු අතර, වගකීම සහ කැපවීම, අධ්‍යාපන මට්ටම, මැරයෙකු නොවිය යුතුය, පොරොන්දු ඉටු කිරීම, අවංකභාවය, අව්‍යාජභාවය, විශ්වාසවන්තභාවය, නිර්භීතව නිසි තීරණ ගැනීමේ හැකියාව, අපේක්ෂකයින්ගේ සහ පක්ෂයේ ප්‍රතිපත්ති, ඔහුගේ දැක්ම/සැලැස්ම/හැකියාවන්, ආර්ථික ගැටලුවට හොඳ විසඳුම් ගන්න පුළුවන් වීම, රට, ආගම, ජනවාර්ගික කණ්ඩායම කෙරෙහි ආදරය, ආර්ථික වශයෙන් රට සංවර්ධනය කිරීමට හැකියාවන් ඇති කෙනෙක් වීම, ඔහු හෝ ඇය මෙතෙක් කර ඇති සේවය වැනි අදහස් ගම්‍ය විය. අතීතයේ ශ්‍රී ලංකාවේ පැවති ජනාධිපතිවරණවල ඡන්දදායක චර්යාව නිරීක්ෂණය කරන විට බිම් මට්ටමේ සිට පැමිණෙන පුද්ගලයෙකුට දේශපාලන ක්ෂේත්‍රය තුළ දේශපාලනිකව බැබළීමට ඇති අවස්ථා ඉතා දුර්ලභ ය. සාමාන්‍යයෙන් ජනතාවගේ දේශපාලන චින්තනයෙන් අපේක්ෂා කරන්නේ ඔවුන්ගේ අපේක්ෂකයා ඉහළ පන්තියේ හෝ කුලයක ස්ථාපිත කීර්තිමත් පවුලකින් පැමිණෙන පුද්ගලයෙකු වීමයි. ජාතික ගැටළු සම්බන්ධයෙන් ඉතා ශක්තිමත් අදහස් ඇති පුද්ගලයින් සිටියද, ඔවුන්ට මැතිවරණවලදී සැලකිය යුතු ඡන්ද ප්‍රතිශතයක් ලබා ගැනීමට එකල අසීරු විය. නමුත් නූතන නාගරික සමාජය තුළ නව ප්‍රවණතාවයක් ලෙස හඳුනාගත හැක්කේ කුලය හෝ පවුල යන සාධක ඔස්සේ මැතිවරණ වලට සම්බන්ධ වන අපේක්ෂකයාගේ හැකියාව සලකා නොබැලීමයි. වර්තමානයේ දී වැඩි වශයෙන් ඡන්දදායකයින් බලාපොරොත්තු වන්නේ ඉහත ගුණාංග වලින් සැදුම්ලත් දේශපාලනඥයන්ය.

ඡන්දදායකයාගේ ඡන්ද හැසිරීමේ පදනම දැන ගැනීම ඉතා වැදගත් වන්නේ එයට නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී ආයතන සමඟ ඍජු සම්බන්ධතා ඇති බැවිනි. එහි දි අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලිය හරහා ඔවුන්ගේ දේශපාලන දිශානතිය පිළිබඳව කරුණු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ලදී. මෙම පිළිතුරු අතර බහුතරයක් "මධ්‍යස්ථ" හෝ "විශ්වාස නැත" යන පිළිතුරු වලට පිවිසි ඇති අතර, ඒ අනුව "වාමාංශික" (15%), "දක්ෂිණාංශික" (13%), "මධ්‍යස්ථ"

(23%), සහ "විශ්වාස නැත" (49%) යනුවෙන් ප්‍රතිශතාත්මක ලෙස ඉදිරිපත් කර හැක. එසේ නම් දත්ත දායකයන්ගෙන් වැඩි පිරිසක් මධ්‍යස්ථ මතධාරියෙකු ලෙස හෝ කිසිදු දේශපාලන දිශානතියකට ලඟු වි නැති අතර, ඔවුන් නූතන දේශපාලන පද්ධතියේ නිර්මාණය වන ගතිකත්වයන් මත පදනම්ව ඡන්දදායක චර්යාව නිර්මාණය කරගෙන ඇති බව පෙනී යයි.

ඡන්ද දායක හැසිරීම සම්බන්ධව දත්ත රැස් කිරීමේදී ඒ සම්බන්ධව ස්ත්‍රී පුරුෂ වෙනස්කම් අඩුවෙන් ප්‍රකාශ වූ නමුත් එය තවමත් නිරීක්ෂණය කළ හැකි විය. ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ වෙනස්කම් අතරින් වඩාත්ම ස්ථාවර එකක් වන්නේ දේශපාලනික කරුණු ප්‍රමුඛත්වය දීමයි. ශ්‍රී ලංකාවේ කොළඹ දිස්ත්‍රික්කයේ තෝරා ගැනුණු ප්‍රදේශ තුළ සම්බන්ධ කර ගත් කාන්තා දත්ත දායකයින් සමගින් සිදු කළ සම්මුඛ සාකච්ඡා ඔස්සේ මෙය තහවුරු විය. එහි දී කාන්තා ඡන්දදායකයින් බොහෝ විට සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය, ජීවන වියදම, ළමා ආරක්ෂාව සහ නිවාස වැනි සමාජ සුභසාධන ගැටළු අවධාරණය කරයි. මෙම ගැටළු අවිනිශ්චිත ගෘහ පරිසරයන්හි රැකබලා ගන්නන් සහ ආර්ථික සහභාගිවන්නන් ලෙස ඔවුන්ගේ භූමිකාවන් සමඟ සමීපව සමපාත වේ. අනෙක් අතට, පිරිමි ඡන්දදායකයින් ආර්ථික සංවර්ධනය, යටිතල පහසුකම්, ජාතික ආරක්ෂාව සහ දේශපාලන ස්ථාවරත්වය වැනි සාර්ව මට්ටමේ ගැටළු වලට ප්‍රමුඛත්වය දීමට වැඩි අවධානයක් ලබා දෙන බව ඔවුන්ගේ අදහස් අනුව තහවුරු විය. දේශපාලනික කටයුතු සඳහා ප්‍රධාන පෙළඹවීම් ලෙස කාන්තාවන් නිතරම ඉහළ ජීවන වියදම සහ දැරිය හැකි මහජන සේවාවන් නොමැතිකම සඳහන් කළ සම්මුඛ සාකච්ඡා වලදී මෙම ප්‍රවණතාවය තවදුරටත් පිළිබිඹු වූ අතර, පුරුෂයන් රැකියා අවස්ථා සහ ආර්ථික ප්‍රතිසංස්කරණ කෙරෙහි වැඩි අවධානයක් යොමු කළහ. එසේ ම ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡාව තුළදී ඡන්දදායකයින්ගෙන් විමසනු ලැබුවේ ඔවුන් තම දෙමාපියන් ඡන්දය දුන් එකම දේශපාලන පක්ෂයට ඡන්දය දෙනවාද යන්නයි. එහි දි සැලකිය යුතු පිරිසක් (65%) තම දෙමාපියන් ඡන්දය දෙන සහ දුන් එකම පක්ෂයට ඡන්දය ලබා නොදෙයි. දේශපාලන පක්ෂවල හෝ අපේක්ෂකයෙකුගේ කුසලතා සහ අවාසි සලකා බැලීමෙන් පසු දෙමාපියන් සහාය දක්වන පක්ෂයට ඡන්දය දීමට ඔවුන්ට අවශ්‍ය නම්, එය සම්පූර්ණයෙන්ම නිවැරදිව වේ. තම දෙමාපියන් හෝ පවුලේ පිරිස සහාය දුන් හෝ දක්වන දේශපාලන පක්ෂයකට සහාය දැක්වීම සම්බන්ධව පුරුෂයන් සහ ගැහැණු ඡන්දදායකයින් අතර යම් අවස්ථාවන් වලදි වෙනසක් දිස්වේ. සම්මුඛ සාකච්ඡාව තුළදී වයස අවුරුදු 31 කාන්තාවක් දක්වනු ලැබූ අදහස් අනුව මේ බව තහවුරු විය.

*''මා විවාහ වීමට පෙර ඡන්දය ලබා දුන්නේ එක්සත් ජාතික පක්ෂයටයි. මාගේ දෙමව්පියන් ඡන්දය ලබා දුන්නේ එම පක්ෂයට. නමුත් මා විවාහ වී මෙම ප්‍රදේශයට පැමිණීමෙන් පසුව මගේ සැමියාගේ පවුලේ සාමාජිකයන් ජනතා විමුක්ති පෙරමුණට ඡන්දය ලබා දීමත් සමග මම ද ඡන්දය ලබා දුන්නා එම පක්ෂයට." (S1).*

ඉහත නිදසුන තුළින් පැහැදිලි වනුයේ කාන්තාවකගේ ඡන්දදායක චර්යාව සඳහා පවුල එසේත් නැතිනම් දෙමව්පියන් හෝ

සැමියා සමහර අවස්ථා වලදී බලපෑම් සිදු කල හැකි බවයි. නමුත් පිරිමි පාර්ශවයෙන් ලබා ගත් අදහස් අනුව ඔවුන්ට පවුල තුළින් එල්ල වන බලපෑම සීමා සහිත බව තහවුරු කර ගත්හ.

ශ්‍රී ලංකාවේ ඡන්ද ක්‍රමය දිගු කලක් තිස්සේ ස්ථිතිකව පවතී. පුද්ගලයෙක් දේශපාලන පක්ෂ ගැන සහ ඒවායේ හොඳ සහ නරක ගැන ඉගෙන ගැනීමට නැඹුරු වන්නේ කුඩාකල දී දෙමව්පියන්ගෙන් සහ දේශපාලන සමාජකරණ ක්‍රියාවලියෙනි. ඔවුන් තම දෙමාපියන් සහ පවුලේ සාමාජිකයන් සහාය දක්වන පක්ෂ සහ දේශපාලනඥයන් ගැන ඉගෙන ගනී. එය නව යුගයේ කණ්ඩායමේ සංස්කෘතියක් බවට පත්ව ඇත. එහෙත් විවිධ ඡන්ද විමසීම්වල දී විවිධ පක්ෂවලට ඡන්දය දීමෙන් අධ්‍යයනයේ දත්ත දායකයින් මෙම දේශපාලන හැසිරීම් රටාවෙන් බැහැර වන අවස්ථා තිබේ. විශේෂයෙන් ම අධ්‍යාපන මට්ටම ඉහළ යන විට ඡන්දදායකයා තම දෙමාපියන් හෝ පවුල සහාය දුන් පක්ෂයට සහාය දැක්වීමට නැඹුරු නොවීය. තමන් සහාය දෙන බව පැවසූ ප්‍රතිචාර දැක්වූවන් සීමිත පිරිස අතර සහ ඔවුන්ගේ දෙමාපියන් සහාය දුන් පක්ෂයට සහාය නොදක්වන අය අතර ඔවුන් එවැනි ස්ථාවරයක් දැරීමට හේතු රාශියක් පෙන්වා දුන්හ. එහි දී දෙමාපියන්ගේ පක්ෂයට සහාය දුන් අය, ඒ පක්ෂය රටේ සංවර්ධනය ගැන ඇත්තටම සැලකිලිමත්, අපට හොඳ සම්බන්ධතා තියෙනවා/ අපට උදව් කරනවා, දෙමව්පියන්ට වඩා හොඳ දේශපාලන අවබෝධයක් තියෙනවා, දෙමව්පියන්ට මගේ දේශපාලන දැක්ම තියෙනවා. බොහෝ පිරිසක් තම දෙමාපියන් අයත් දේශපාලන පක්ෂයට සහාය නොදැක්වූයේ, රටේ සංවර්ධනය සඳහා වෙහෙස මහන්සි වී වැඩ කරන ඕනෑම පක්ෂයකට ඡන්දය දෙන්න, ඒක මගේ තේරීම, මගේ අභිමතය නිසා, ප්‍රතිපත්ති සහ කාර්යය වැදගත්, කාලයත් සමඟ ප්‍රතිපත්ති වෙනස් විය යුතුයි වැනි හේතු ඔවුන් පෙන්වා දුනි.

එසේ ම සමස්ත නියැදියේ පිරිසගෙන් අඩකට වඩා ප්‍රමාණයක් 74.2% (89 දෙනෙක්) ඔවුන්ගේ පළමු මැතිවරණවලදී ඡන්දය දුන් එකම පක්ෂයට ඡන්දය දී නැත. නමුත් තවමත් සැලකිය යුතු ප්‍රතිශතයක් එනම් 25.8% (31 දෙනෙක්) එක් පක්ෂයක ජීවිත කාලය පුරාම සාමාජිකයන් බවට පත්ව ඇත. එය වගකිව යුතු පුරවැසියෙකුගේ ඵලදායී හැසිරීමක් නොවේ. එකම පක්ෂය සැමවිටම යහපත් වනු ඇතැයි කිසිවෙකුට අපේක්ෂා කළ නොහැක. එබැවින් ඡන්දදායකයින් නම්‍යශීලී විය යුතු අතර, පක්ෂයක වාසි සහ අවාසි යන දෙකම ඔවුන්ට දැකගත හැකි විය යුතුය. සිංහල දත්ත දායකයන් හා සසඳන විට සැලකිය යුතු දෙමළ සහ මුස්ලිම් දත්ත දායකයින් පිරිස අඛණ්ඩව එකම පක්ෂයට ඡන්දය දී ඇත. දෙමළ සහ මුස්ලිම් පිරිසට වඩා සිංහල දත්ත දායකයන්ට දේශපාලන පක්ෂය වෙනස් කිරීමට ඇති හැකියාව වැඩිය. ජනවාර්ගික කණ්ඩායම් අතර ඡන්දය ප්‍රකාශ කිරීමේ මෙම අසමානතාවය සුළු සමාජ නිරාවරණය, පවුල හෝ තම ජනවර්ගය තුළින් එල්ල වන පීඩනය, ආගම්වාදී සහ වර්ගවාදී පක්ෂ තුළින් ජනතාවට පෙන්වා දෙන සමාජ ප්‍රතිරූපයන් සහ සුළුතර කණ්ඩායම් නිසි ලෙස මාධ්‍යවලට නිරාවරණය නොවීම ප්‍රතිඵල විය හැකිය. සිංහලයන් අතර දේශපාලන

පක්ෂ විශාල සංඛ්‍යාවක් ඇති බැවින්, සිංහල ඡන්ද දායකයින්ගේ දේශපාලන අදහස් සහ චින්තනය නිතර වෙනස්කම් වලට ලක්වේ. නමුත් සුළු ජාතීන් අතර එවැනි සමාන ප්‍රවණතාවක් නිරීක්ෂණය කළ නොහැකි විය.

විශේෂයෙන් බහු වාර්ගික නාගරික මධ්‍යස්ථානවල ඡන්ද මනාපයන්හි සැලකිය යුතු සාධකයක් ලෙස ජනවාර්ගිකත්වය මතු වේ. දෙමළ සහ මුස්ලිම් ප්‍රතිචාර දැක්වූවන් සුළුතර අයිතිවාසිකම් සහ පශ්චාත් යුධ සංහිඳියා උත්සාහයන් පැහැදිලිවම ආමන්ත්‍රණය කරන පක්ෂවලට සහාය දැක්වීමට වැඩි නැඹුරුවක් දැක්වූහ. නිදසුනක් වශයෙන් දෙමළ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් දෙමළ ජාතික සන්ධානය හෝ සමගි ජන බලවේගය වැනි පක්ෂවලට කැමැත්තක් දැක්වූ අතර, ඊට සාපේක්ෂව සිංහල ඡන්දදායකයින් වඩාත් පවතින පක්ෂ අතර, බෙදී යමින් බහු ප්‍රධාන ධාරාවේ පක්ෂ වෙත තම සහයෝගය ලබා දී ඇත. එසේ ම ඡන්දදායකයින් තම ඡන්දයේ ඵලදායීතාවය පිළිබඳව විවිධ අදහස් දක්වා ඇත. දත්ත දායකයින්ගෙන් 36.7% (44 දෙනෙක්) තම ඡන්දය ප්‍රයෝජනවත් එකක් බව පැවසූහ. තව පිරිසක් 45% (54 දෙනෙක්) විශ්වාස කරන්නේ එය "යම් දුරකට" ප්‍රයෝජනවත් වී ඇති බවයි. නමුත් ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 18.3% (22 දෙනෙක්) පැහැදිලිවම පවසන්නේ තම ඡන්දයෙන් ප්‍රතිඵලයක් නොමැති බවයි. මෙම පිළිතුර ස්ත්‍රී පුරුෂ භාවය සමඟ සලකා බලන විට කාන්තාවන්ට වඩා පිරිමින් වැඩි පිරිසක් පිළිගන්නේ තම ඡන්දය තුළින් සමාජය වෙනස් කළ හැකි බවයි. කාන්තාවන්ගෙන් 35.7% (15 දෙනෙක්) විශ්වාස කරන්නේ තම ඡන්දය පිරිමින්ගේ තරම් ප්‍රයෝජනවත් නොවන බවයි. මෙම අවිශ්වාසය සමහර අවස්ථාවන්හි දී කාන්තා ඡන්දදායකයන් තම ඡන්දය භාවිතා කිරීම අධෛර්යමත් කිරීමට පසුබිම සැකසිය හැක. මෙලෙස සිංහල දත්ත දායකයින් බහුතරයක් තම ඡන්දය ප්‍රයෝජනවත් යැයි පැවසුවද දෙමළ සහ මුස්ලිම් දත්ත දායකයින් එය එතරම් විශ්වාස නොකරයි. එය සුළුතර මානසිකත්වයක් නිසා විය හැකි අතර, අනෙක් අතට නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය යටතේ බහුතර ජාතිය ස්මතු වෙමින් තමන් වෙත හිමිවන වරප්‍රසාද වල දුර්වලතා පවතින බව ඔවුන් විශ්වාස කිරීම ද ඊට බලපායි. අධ්‍යයනයේ ජනවාර්ගික කණ්ඩායම් නියෝජනය තුළ, ක්‍රියාත්මක වූ 2019 සහ 2024 ජනාධිපතිවරණ වල සාධාරණත්වය තක්සේරු ගත කිරීමේ දී "සාධාරණයි" ලෙස 16% (6 දෙනෙක්), "සාධාරණ නොවේ" ලෙස 49% (18 දෙනෙක්) සහ "යම් දුරකට" ලෙස 35% (13 දෙනෙක්) දෙමළ සහ මුස්ලිම් ඡන්දදායකයන් අදහස් දක්වා ඇත. යුද්ධය සහ එය පදනම් කරගත් ආතතීන් සහ පාස්කු ප්‍රහාරයෙන් පසු මුහුණ දීමට සිදු වූ තත්වයන් නිසා දෙමළ සහ මුස්ලිම් ඡන්දදායකයන් එකල සිට ඔවුන් සමාජ තුළ අනාරක්ෂිත ජීවත් වන බව විශ්වාස කරන බව මේ තුළින් තහවුරු කර ගත හැක. සුළු ප්‍රජාවන්ගෙන් බහුතරයක් හට රටේ ඡන්දය පිළිබඳ අවිනිශ්චිතභාවයක් පවතින බැවින් මෙම තත්වය ඉතා සෞඛ්‍ය සම්පන්න එකක් ලෙස සැලකිය නොහැකිය. නමුත් සාපේක්ෂ වශයෙන් දත්ත දායකයින්ගෙන් බහුතරයක් අධ්‍යාපනයේ දියුණුවත් සමඟ විශ්වාස කරන්නේ තම ඡන්දය ඵලදායී බවත් ඡන්දය හරහා සමාජය වෙනස් කළ

හැකි බවත්ය. මෙයින් ඇඟවෙන්නේ ජනවාර්ගිකත්වය සහ සංස්කෘතික අනන්‍යතාවන් සලකුණක් පමණක් නොව කොළඹ නාගරික ජනගහනය අතර ද දේශපාලන තීරණ ගැනීමේදී ප්‍රායෝගිකව පක්ෂය හෝ අපේක්ෂකයා වෙත ඇද ගැනීමේ හෝ තල්ලු කිරීමේ සාධකයක් ලෙස ක්‍රියාත්මක වන බවයි.

ශ්‍රී ලංකාවේ නාගරික ඡන්දදායකයින් අතර ජනවිකාස ලක්ෂණ දේශපාලන මනාපයන් මත ස්ථරවාදී ලෙස ඡේදනය වන බලපෑමක් ගොඩනැගෙමින් පවතින බව මින් හෙළි කරයි. වයස ප්‍රතිසංස්කරණවාදී හෝ තත්ව-ප්‍රවනතා සමඟ සමපාත වේ. ස්ත්‍රී පුරුෂ භාවයේ ඡන්ද හැසිරීම සඳහා පවුල, පුරුෂ මූලිකත්වය, සුභසාධනය යන සාධක බලපෑම් කිරීමේ ප්‍රමුඛතාවය ලබා දෙයි. ජනවාර්ගිකත්වය දිගුකාලීනව තම අවශ්‍යතා සොයා බලන සහ තම සංස්කෘතීන් පිළිගන්නා දේශපාලන අනුබද්ධතා සහ නියෝජනයන් කෙරෙහි විශ්වාසය තබමින් ආකර්ෂණය වී ඇත. නාගරික ඡන්දදායකයින් ඵලදායීව සහ සාධාරණව සම්බන්ධ කර ගැනීමට ඉලක්ක කරන දේශපාලන පක්ෂ සඳහා මෙම ගතිකතාවයන් අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වේ.

## 4.7. නාගරික ඡන්ද හැසිරීම පිළිබඳ ඓතිහාසික හා ව්‍යුහාත්මක සීමාවන්

ශ්‍රී ලංකාවේ නාගරික ඡන්දදායකයින්ගේ දේශපාලන හැසිරීම හැඩගැසී ඇත්තේ මාධ්‍ය සහ ජනවිකාස වැනි සාධක මගින් පමණක් නොව, දේශපාලන සහභාගීත්වය සහ මැතිවරණ තේරීම් සීමා කරන හෝ බලපෑම් කරන ගැඹුරු ඓතිහාසික හා ව්‍යුහාත්මක ගතිකත්වයන් ද ඒ සඳහා බලපෑම් කරයි.

## 4.8. ආදාළ ව්‍යුහාත්මක ප්‍රදේශයේ බලපෑම

පුද්ගලයෙකුගේ ඔවුන් ජීවත්වන ප්‍රදේශයට අනුගත වීම සමාජානුයෝජන ක්‍රියාවලියට සාපේක්ෂව සිදු වන්නකි. මේ අනුව ප්‍රදේශයට අනුගත වීම යන සාධකය ජාතික මැතිවරණයකදී නාගරික ඡන්දදායක හැසිරීම නිර්මාණය වීම සඳහාත් අදාල වන්නේද? සහ ඒ අනුව යම් ප්‍රදේශයක් තුළ දීර්ඝ කාලීනව අනුගමනය කරන දේශපාලන මතයන් වේ නම් එම ප්‍රදේශයේ ඡන්දදායකයින්ට ඒ තුළින් බලපෑමක් වේද? යන්න විමසීම සිදු කරන ලදී. සාමාන්‍යයෙන් ස්ත්‍රී පුරුෂභාවය අනුව යම් පුද්ගලයෙකුට ප්‍රාදේශීය වශයෙන් සිදුවන දේශපාලන බලපෑම වෙනස් විය හැකිය. එනම්, ප්‍රාදේශීය බලපෑමට ලක්වන ස්වරූපය, ප්‍රමාණය හා ප්‍රදේශයට ආවේණික අදහස් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම වෙනස් විය හැකිය. තල්ලු කිරීමේ සහ ඇදීමේ න්‍යායට අනුව පුද්ගල හැසිරීම අභ්‍යන්තර සහ බාහිර සාධකවල එකතුවකින් හැඩගැසී ඇත. එහි දි ප්‍රදේශයකට විශේෂිත වූ දේශපාලන තත්වයන් සහ ගතිකත්වයන් ඇදීමේ සාධකයක් ලෙස තේරුම් ගත හැකිය. විශේෂයෙන් යම් පුද්ගලයෙක් ප්‍රදේශයක් තුළ වැඩි කාලයක් ජීවත් වීම ද ඔවුන්ගේ අදහස් හා චර්යා කෙරෙහි ප්‍රදේශයේ දේශපාලන, ආර්ථික හා සමාජ තත්ත්වයන් බලපෑම් කිරීමට හේතු සාධක වේ. මෙම සම්බන්ධතාවය තක්සේරු කිරීම සඳහා ප්‍රතිචාර දැක්වූවන් ඔවුන් පදිංචි කාල සීමාව මත පදනම්ව කාණ්ඩගත කරන ලද අතර, ප්‍රදේශයේ දේශපාලන මතිමතාන්තර

මගින් ඔවුන්ගේ සංජානනීය බලපෑමේ මට්ටම එහි දි සටහන් කරන ලදී. පහත වගුවේ එම ප්‍රතිඵල ඉදිරිපත් කර ඇත.

*වගුව 03: දත්ත දායකයින් වෙත එල්ල වූ ව්‍යුහාත්මක ප්‍රදේශයේ බලපෑම*

| ප්‍රදේශයේ පදිංචි කාලය | ප්‍රතිචාර දැක්වූවන් සංඛ්‍යාව | ප්‍රදේශයේ දේශපාලනය හරහා බලපෑමට ලක් වූ බව සදහන් කරන ලද සංඛ්‍යාව | මධ්‍යස්ථ බලපෑමක් තිබු බව සඳහන් කළ සංඛ්‍යාව | එවැනි බලපෑමකට ලක් නොවූ බව සඳහන් කළ සංඛ්‍යාව | දැඩි ලෙස බලපෑමට ලක්වූ පුද්ගලයින් ප්‍රතිශතය ලෙස (%) |
|---|---|---|---|---|---|
| **අවුරුදු 5කට අඩු** | 9 | 0 | 2 | 7 | 0 |
| **අවුරුදු 5-10** | 18 | 5 | 4 | 9 | 9% |
| **අවුරුදු 11-20** | 49 | 22 | 19 | 8 | 42% |
| **අවුරුදු 20කට වැඩි කාලයක්** | 44 | 26 | 14 | 4 | 49% |
| සමස්ත | **120** | **53** | **39** | **28** | **100%** |

*මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2025*

ඉහත වගුවේ දක්වා ඇති පරිදි ප්‍රදේශයේ දේශපාලන තත්වයන්ගෙන් දැඩි ලෙස බලපෑමට ලක් වූ බවට වාර්තා කළ ප්‍රතිචාර දැක්වූවන්ගේ ප්‍රතිශතය පදිංචි කාලය සමඟ වැඩි වන පැහැදිලි ප්‍රවණතාවක් මතු වේ. වසර 20 කට වැඩි කාලයක් ප්‍රදේශයේ ජීවත් වූ අය අතර, 49% ක ප්‍රබල බලපෑමක් වාර්තා කළ අතර, වසර 5 කට අඩු කාලයක් පදිංචිව සිටි අයගෙන් සීමිත පිරිසක් පමණක් මධ්‍යස්ථ බලපෑමක් තිබූ බව සඳහන් කර ඇත. මෙයින් ඇඟවෙන්නේ දිගු කාලීන පදිංචිකරුවන් තම ප්‍රදේශයේ දේශපාලන ගතිකත්වයන් සහ සම්ප්‍රදායන්ට නිරාවරණය වීමට සහ ඒවාට අනුගත වීමට වැඩි ඉඩක් පවතින බවයි. මෙම සොයාගැනීම් දේශපාලන සමාජකරණය සහ කාලයත් සමඟ නිරාවරණය වීම ප්‍රාදේශීය මට්ටමින් දේශපාලන සංජානන සහ හැසිරීම් හැඩගැස්වීමට සැලකිය යුතු ලෙස දායක වන බවට උපකල්පනයට සහාය වේ. එසේම එහි දී අධ්‍යයනය සඳහා සම්බන්ධ වූ දත්ත දායකයෙක් දක්වන ලද අදහස් වලට අනුව;

*"තමා තරුණ වියේදී ප්‍රදේශයේ බහුතරයක් පිරිස අනුගමනය කළ දේශපාලන මතවාදයන්ගෙන් වියුක්තව රැඩිකල් දේශපාලන මතයක් අනුගමනය කළ ද කාලානුරූපීව තමා ද ප්‍රදේශයේ වැඩි වශයෙන් පිළිගැනීමට ලක්වූ දේශපාලන මතයක් කෙරෙහි යොමු වී තිබේ."*

මෙහිදී තව දුරටත් එම දත්ත දායකයා දැක්වූයේ එයට සුවිශේෂිතම හේතුව තමාට වැඩි කාලයක් ප්‍රදේශයට ආවේණික දේශපාලන මතය දරණ පුද්ගලයන් සමඟ ජීවත් වීමට සිදු වීම බවයි. එහි දී එම පුද්ගලයන් දේශපාලනය සම්බන්ධව

ඉදිරිපත් කළ තර්ක විතර්ක සහ මතිමතාන්තර ඔහුගේ දේශපාලනය සම්බන්ධ අදහස්වල වෙනස්කම් ඇති විමට සහ නව ආකාරයෙන් සිතන්නට පදනම සකසා ඇත. ඒ අනුව මේ තුළින් පැහැදිලි වන්නේ ප්‍රදේශයක වැඩි කාලයක් ජීවත් වීම සහ එම ප්‍රදේශයේ දේශපාලන මතය සමඟ ගැටීමෙන් ඡන්දදායකයෙකුගේ මතයට යම් බලපෑමක් එසේ නැතිනම් යම් තල්ලුවක් හෝ ඇදිමක් සිදු කිරීමට හැකියාවක් පවතින බවයි.

## *4.9. ගැටුම් සහ දේශපාලන අවිශ්වාසයේ ඓතිහාසික උරුමය*

බොහෝ නාගරික ඡන්දදායකයින්, විශේෂයෙන් සුළුතර ප්‍රජාවන්ට අයත් අය, ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ උරුමය සහ ඉන් පසුව ඇති වූ දේශපාලන වර්ධනයන් මගින් තවමත් බලපෑමට ලක්ව සිටිති. අධ්‍යයන ප්‍රදේශය වන කොළඹ දිස්ත්‍රික්කය තුළ සම්බන්ධ කරගත් දත්ත දායකයින් අතරින් සුළුතර ප්‍රජාවන්ගේ අදහස් අනුව මෙහි ප්‍රවණතාවයක් එම ප්‍රදේශ තුළ සැලකිය යුතු වශයෙන් දක්නට ලැබෙන බව හඳුනා ගත හැකි විය. මෙහි දි ජනවාර්ගික කණ්ඩායම් නියෝජනය තුළ, ක්‍රියාත්මක වු 2019 සහ 2024 ජනාධිපතිවරණ වල සාධාරණත්වය තක්සේරු ගත කිරිමේ දි "සාධාරණයි" ලෙස 16% (6 දෙනෙක්), "සාධාරණ නොවේ" ලෙස 49% (18 දෙනෙක්) සහ "යම් දුරකට" ලෙස 35% (13 දෙනෙක්) දෙමළ සහ මුස්ලිම් ඡන්දදායකයන් අදහස් දක්වා ඇත. පශ්චාත් යුධ සංහිඳියාව, යුක්තිය සහ පාලනයේ නැවත නැවතත් අසාර්ථකත්වයන් හේතුවෙන් ප්‍රධාන ධාරාවේ දේශපාලන ආයතන කෙරෙහි පවතින කලකිරීමේ හැඟීමක් සම්මුඛ සාකච්ජා ප්‍රතිචාරවලින් පෙන්නුම් කෙරිණි. එය පහත අදහස් හරහා පෙන්වා දිය හැක.

*"මා ඡන්දය දුන්නේ සජිත් ප්‍රේමදාසට. ඔහු අපේ අනෙක් පක්ෂ සමගත් සහයෝගයෙන් කටයුතු කරනවා. අපිට ඇහුම්කන් දෙන කෙනෙක් ලෙස අපි හඳුනා ගන්නවා. බලය බෙදා ගැනීම, යුද්ධයෙන් විපතට පත් වූවන්ට යුක්තිය ඉටු කිරීම වැනි පොරොන්දු අපි මීට පෙර දැක තියෙනවා, නමුත් කිසිවක් වෙනස් වෙලා නැහැ. සැබෑ ප්‍රගතිය කෙරෙහි විශ්වාස කිරීමට වඩා අපේ ජාතීන්ට සහාය දක්වන, අපේ ප්‍රශ්නවලට ඇහුම්කන් දෙන පක්ෂයට මම ඡන්දය දෙනවා." (T1).*

*"ලංකාවේ ජීවත් වෙන මුස්ලිම්වරයෙකු කවුරුන් වුවත් අපේ රටේ සමහර සිංහල මිනිස්සු අපිව කාණ්ඩගත කරලා තියෙන්නේ මෙයා ජාතිවාදියෙක් නැත්තන් ත්‍රස්තවාදීයෙක් කියලා පාස්කු ප්‍රහාරයත් එක්ක. මම මගේ දරු පසූතියට රෝහල්ගත වුණු අවස්ථාවක පාස්කු ප්‍රහාරය සිදුවෙලා අලුත වගේ ඒ රෝහලේ සිටිය සමහර පිරිස් ඩොක්ටර්ස්ලා නර්ස්ලා පවා කටයුතු කරපු විදිහක එක්ක මම ඒ කාලේ ලොකු මානසික පීඩාවකට පත් වුණා. සමහර වේලාවට මුස්ලිම්වරුන් අපකීර්තියන්ට පත් වෙනවා. මේවා අපි කා එක්කවත් වැඩිය කියන්න යන්නේ නැහැ. එත් එක අපිට හරි පීඩනයක්. මේ විධියට බලන කොට අපි කෙහොමද රාජපක්ෂවරු ගැන විශ්වාස කරන්නේ. එයාලා කොහොමත් සිංහල පිරිසට තමා වැඩි අවධානයක් දෙන්නේ" (M1).*

විශේෂයෙන් 2019 පාස්කු ප්‍රහාරයෙන් සහ ඉන් පසුව ඇති වූ සුරැකුම්කරණ ප්‍රතිපත්තිවලින් පසුව, වර්ධනය වන අනාරක්ෂිතභාවය සහ දේශපාලනික ආන්තිකකරණය උපුටා දක්වමින් මුස්ලිම් ප්‍රතිචාර දැක්වූවන් ද මෙම හැඟීම ප්‍රතිරාවය කළහ. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව

ලාංකේය දේශපාලනය පිළිබඳ සාකච්ඡා කිරීම වැදගත් වන්නේ කාරණා කිහිපයක් නිසාවෙනි. මෙරට බල දේශපාලනයේ ඡන්දදායක හැසිරීමේ දී මූලිකව ම මානවවාංශික විභේදනයන්ගේ (කුලය/ආගම/පන්ති ව්‍යූහය) බලපෑම නොවැලැක්විය හැකි සාධකයක් බවට පත් විමයි. මෙකී විභේදනයන් කළමනාකරණය කිරීමේ හැකියාව මත බහුතර බලය රඳවා ගැනීමට පක්ෂවලට හැකියාවක් හිමිවිය. එපමණක් නොව, මෙම විභේදනයන් අතුරින් ආගම ලාංකික දේශපාලනය තුළ හෙජමොනි (Hegemony) තත්වයක් අත් කර ගත් අතර, කුලය හා පන්ති ව්‍යූහය පෙනෙන නොපෙනෙන ලෙස මැතිවරණ ක්‍රියාවලිය තුළ ක්‍රියාකාරී වන බව දැකිය හැක. විශේෂයෙන් මෙත් සමඟ මුස්ලිම් ජනතාව මුහුණ දුන් අම්හිරි සිදුවීම් ඔවුන් බහුතර ජනතාව පිළිබඳව පවතින විශ්වාසය පළුදු කිරීමට යම් තරමකට හේතු විය. මෙවැනි පසුබිමක් තුළ 2019 වසරේ දී මෙරට සිදු වූ ආණ්ඩු මාරුවීමත් සමඟ දේශපාලන ක්‍රියාවලිය වෙනත් දිශාවක් කරා යොමු වීමක් සිදු විය. පාස්කු ප්‍රහාරය සිදු වීමත් සමඟ මෙකී දේශපාලන වෙනස අපේක්ෂා කළ මෙරට පහළ හා ඉහළ පන්තිය විශේෂයෙන් ම සිංහල ජනතාව පැවති ආණ්ඩුව මත තැබූ විශ්වාසයෙහි පළුදුවීමක් එසෙත් නැතිනම් කලකිරීමක් මේ හරහා පෙන්නුම් කෙරිණි. නමුත් නාගරික ඡන්දදායකයින්ගේ බහුතර ඡන්දදායක හැසිරීම නොතකමින් සුළු ජාතින්ගේ මෙම ඓතිහාසික අත්දැකීම් ජාතික දේශපාලන ක්‍රියාවලිය සමඟ ප්‍රවේශම් සහගත, සමහර විට සැක සහිත සම්බන්ධතාවයක් බවට පරිවර්තනය වී තිබේ.

## *4.10. ආර්ථික අතෘප්තියේ බලපෑම සහ නිරූපණයේ ව්‍යුහාත්මක අසමානතා*

මැතිවරණ ක්‍රමයේ භූගෝලීය හා ජනගහන පදනම් කරගත් විෂමතා හේතුවෙන් නාගරික ජනගහනය බොහෝ විට ඌන නියෝජනයකට මුහුණ දෙයි. කොළඹ වැනි නගර ජනාකීර්ණ හා දේශපාලනික වශයෙන් ක්‍රියාකාරී වුවද, සමානුපාතික නියෝජන ක්‍රමය ග්‍රාමීය දිස්ත්‍රික්ක හා සසඳන විට ඒවායේ බලපෑම දියාරු කරයි. ග්‍රාමීය සංවර්ධනය හෝ ජාතිකවාදී තේමාවන් කෙරෙහි අවධානය යොමු කරන ජාතික ව්‍යාපාරවල දී මහාමාර්ග තදබදය සහ ඒ ඔස්සේ නිර්මාණය වන පාරිසරික ගැටලු, ජලය සහ විදුලි පහසුකම් හිඟය, තම නගරයන් තුළ එක් රැස්වන අධික කුණුකසල ඉවත් කිරීම සම්බන්ධ ගැටළු සහ පොදු ප්‍රවාහනය ආශ්‍රිත ගැටලු, නිවාස හිඟය සහ ප්‍රදේශය තුළ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය පිළිබඳ නාගරික ගැටලු සම්බන්ධව බලයට පත්වන ආණ්ඩුවල අවධානය යොමු වීම ඉතාම සීමිත බව සහභාගී වූවන් කිහිප දෙනෙකු සඳහන් කළහ. අධ්‍යයනය තුළ සම්මුඛ සාකච්ඡාවකට භාජනය වූ ගුරුවරයෙකුගේ අදහස් පහත පරිදි වේ.

*“මම වගේ ම මේ ප්‍රදේශයේ ගොඩක් ඡන්දදායකයින් දේශපාලනය ගැන යම් දැනුමක් තියෙන උගත් පිරිසක්, ඒ නිසා අපේ අවශ්‍යතා ජාතික වශයෙන් පිළිබිඹු නොවන බව අපට හැඟෙන දෙයක්. මොකද ප්‍රතිපත්ති වශයෙන් ගත්තත් නාගරික සංවර්ධනයට හෝ ගැටලු වලට ප්‍රතිපත්ති සකස් කිරීම ඉතාම සීමිතයි. කොහොම හරි අරගෙන තියෙන ප්‍රතිපත්තිත් අපේ නගරය තුළ හරියට ක්‍රියාත්මක වෙන්නෙත් නෑ. මේ වගේ තත්ත්වයක් තියෙනකොට මොන දෙයක් ලබා ගන්නද මේ ප්‍රදේශවල ජනතාව ඡන්දේ දෙන්නේ.*

*පොරොන්දු වෙලා තියෙන දෙයක්වත් හරියට වෙලා නැත්තං" (S2).*

නාගරික ඡන්දය ප්‍රකාශ කිරීමට බලපාන තවත් ව්‍යුහාත්මක ගැටලුවක් වන්නේ ආර්ථික අවදානමයි. අඩු ආදායම්ලාභී නාගරික පදිංචිකරුවන් බොහෝ විට මූලික සේවාවන් සඳහා අනුග්‍රාහක ජාල මත යැපෙන අතර, එමගින් ඔවුන්ගේ දේශපාලන ස්වාධීනත්වය අඩපණ වේ. පර්යේෂණයෙන් හෙළි වූයේ අඩු ආදායම්ලාභී කාණ්ඩවල ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 38% ක් මැතිවරණ චක්‍රය තුළ නිවාස වෙන් කිරීම් හෝ රැකියාවන් සඳහා යොමු කිරීම් වැනි දෑ සම්බන්ධව යම් ආකාරයක වැඩි දේශපාලන අනුග්‍රහයක් ලබා ගැනීමට අපේක්ෂා කර ඇති බවයි. මෙම ආකාරයේ ගනුදෙනුකාරවාදය දෘෂ්ටිවාදාත්මක කැපවීම් බොඳ කරන අතර ගනුදෙනුකාර ඡන්ද හැසිරීමට එය මග පාදයි.

එසේ ම ප්‍රමාණාත්මක සමීක්ෂණ ප්‍රතිඵලවලින් පෙනී යන්නේ 2019 ජනාධිපතිවරණයේ දී කොළඹ ඡන්දදායකයා ගෝඨාභය රාජපක්ෂ ප්‍රමුඛ පොදු ජන පෙරමුණට ඡන්දය ලබා දීමට හේතු වූ කරුණු වලට වඩා සැලකිය යුතු වෙනසක් 2024 ජනාධිපතිවරණයේදී නියෝජනය කරන බවයි. එනම්, එහි දී දත්ත දායකයන් අතරින් 38% ක් පමණක් 2019 වර්ෂයේ දී ගෝඨාභය රාජපක්ෂ වෙත ඡන්දය ලබා දීමට ආර්ථික තත්ත්වයන් මූලික සාධකයක් ලෙස දක්වා ඇතිමුත්, ඊට අමතරව අනෙක් පිරිස දූෂණය, ආරක්ෂාව සහ කඩ කළ පොරොන්දු හේතුවෙන් දේශපාලන නායකත්වය කෙරෙහි විශ්වාසය අඩුවීමට හේතු වූ බව සඳහන් කර ඇත. නමුත් 2024 ජනාධිපතිවරණයේදී ජාතික ජන බලවේගය වෙත ඡන්දය ලබා දීමට හේතුව ලෙසින් ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 72% ක් ම ආර්ථික අතෘප්තිය රජයට එරෙහිව ඡන්දය දීමට පෙළඹවූ බවට එකඟ හෝ දැඩි ලෙස එකඟ වූ බව සඳහන් කරයි. විශේෂයෙන් කොළඹ නගරයේ නාගරික ඡන්දදායකයින් එකල මුහුණ දුන් දැඩි දුෂ්කරතාවන් (ඉන්ධන හිඟය, විදුලි කප්පාදුව, උද්ධමනයත් සමඟ බඩු මිල ඉහල යාම) මීට හේතු සාධක ලෙස පෙන්වා දී ඇත. සම්මුඛ සාකච්ඡා මගින් මෙම සොයාගැනීම් තවදුරටත් සනාථ විය. බොහෝ ප්‍රතිචාර දැක්වූවන් විශේෂයෙන් තරුණ පිරිස සහ පළමු වරට ඡන්දය දුන් අය ජීවන වියදම ඉහළ යාම, රැකියා අනාරක්ෂිත බව සහ පාලනයේ ප්‍රභූ පැලැන්තිය පිළිබඳ හැඟීම පිළිබඳව කලකිරීමට හේතු වූ බව තහවුරු කරයි. මෙය තවදුරටත් සම්මුඛ සාකච්ඡාවන්හි දී අනාවරණය විය.

*"අපි ඔවුන්ට 2019 දී අවස්ථාවක් ලබා දුන්නා. නමුත් ඔවුන් එයින් ජනතාවට දෙයක් කලේ නැහැ. තවත් අපි ඉන් පීඩාවට පත්වුණා විතරයි. ඒ නිසා අපේ අවශ්‍යතා ඉටු කරයි කියලා හිතලා අලුත් නායකයෙක්ට ඡන්දය දෙන්න මම හිතුවා" (S2).*

*"මැතිවරණයක් කියන්නෙම ඒක මිනිස්සු රවට්ටන ක්‍රමයක්. බලයේ ඉන්නකොට මිනිස්සු නොසලකා හරිනවා, බලය නැති වුණාම ආයෙත් මිනිස්සු ළඟට ඇවිත් කියනවා අපි ඔයාලා වෙනුවෙන් අරගල කරනවා කියලා. අපි සටන් කරන්නේ ඔයාට හොඳ අනාගතයක් දෙන්න කියලා. ප්‍රධාන පක්ෂ දෙකම ආයෙත් ආයෙත් මිනිස්සු රවට්ටලා තියෙනවා, එයාලා ඒක දිගටම එක කරගෙන යනවා. බලමු නේද මේ ආණ්ඩුවෙන් හරි දෙයක් කරාවි ද කියලා.*

*මම වගේම ගොඩක් මිනිස්සු ඒක ගැන බලාගෙන ඉන්නේ" (S1).*

මෙම තල්ලු කිරීමේ සාධක විශේෂයෙන් මධ්‍යම ආදායම්ලාභී ඡන්දදායකයින් සහ විශ්ව විද්‍යාල උපාධිධාරීන් අතර ප්‍රබල වූ අතර, විශේෂයෙන් ම ඔවුන් රජයේ ආර්ථික දුර්වල කළමනාකරණයෙන් වැඩිපුරම බලපෑමට ලක් වුවන් ලෙස, ඒ ඔස්සේ දේශපාලනික වශයෙන් මේ සම්බන්ධව වඩාත් විවේචනාත්මක ආකාරයෙන් අදහස් දක්වන ලදි.

ඊට වෙනස්ව, 2024 ජනාධිපතිවරණයේදී ධනාත්මක ඡන්දදායක පෙළගැස්මක් හැඩගැස්වීමේදී ඇඳ ගැනීමේ සාධක ද වඩාත් කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කළේය. පර්යේෂණයේ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 33% ක් පමණ ජාතික ජන බලවේගයේ යෝජිත ආර්ථික හා නාගරික සංවර්ධන ප්‍රතිපත්ති වෙත ආකර්ෂණය වූ බව පෙන්වා දුන් අතර, 67% ක් තම ඡන්දය සඳහා ප්‍රධාන හේතුවක් ලෙස නව නායකත්වයක් සඳහා ආකර්ෂණීය වූ බව උපුටා දැක්විය. සම්මුඛ සාකච්ඡා ඔස්සේ ලබා ගත් දත්ත මඟින් ද තරුණ හා උගත් නාගරික ඡන්දදායකයින් අතර මෙලෙස අලුත් බලාපොරොත්තුවක් ඇති බව හෙළි විය. ප්‍රතිචාර දැක්වූවන් කිහිප දෙනෙකු ජාතික ජන බලවේගයේ පැහැදිලි සන්නිවේදනය, තරුණ නිලධාරීන් සහ නව නායකත්වය, දූෂණ විරෝධී අවධානය පෙළඹවීමේ සාධක තම ආකර්ෂණය සඳහා හේතු වූ බව සඳහන් කෙරිණි. සම්මුඛ සාකච්ඡා සඳහා සම්බන්ධ වූ වයස අවුරුදු 26 ක විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙක් මේ සම්බන්ධව පහත ආකාරයෙන් අදහස් දක්වන ලදී.

*"තරුණ හා උගත් පුද්ගලයින් ප්‍රධාන තනතුරු වල සිටිනු දැකීම මට බලාපොරොත්තුවක් ඇති කළා. එය සැබවින්ම ප්‍රගතියක් ගෙන දිය හැකි ව්‍යාපාරයක් ලෙස දැනුණා. ජේ.වී.පී. එක දූෂණයට එරෙහිව සහ ආර්ථිකයේ ගොඩනගන්න සැබෑ සැලසුම් එක්ක දැඩි ස්ථාවරයක් ගන්නවා කියලා සඳහන් කිරීම ඒ පක්ෂයටත් අවස්ථාවක් දීලා බලන්න ඕන කියලා මාව පෙළඹුණා" (S1).*

නාගරික ඡන්දදායකයින් විශේෂයෙන් තරුණයින් තොරතුරු වලට නිරාවරණය වීමට වැඩි නැඹුරුවක් දක්වන සහ දේශපාලනිකව නිතර දැනුවත් වන පිරිසක් වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අනන්‍යතා පාදක දේශපාලනයට වඩා ගැටලු පාදක කරගත් දේශපාලනය වෙත ඔවුන් ප්‍රිය කරයි. මෙය ඔවුන් තල්ලු (තත්වය සමඟ සෘණාත්මක අත්දැකීම්) සහ ඇදීමේ (විශ්වසනීය විකල්ප කෙරෙහි බලාපොරොත්තුව) බලවේග දෙකටම විශේෂයෙන් සංවේදී කරයි. සිත්ගන්නා කරුණ නම්, මෙම ඇදීමේ සාධක වයස අවුරුදු 20 – 30 අතර ඡන්දදායකයින් අතර වඩාත් බලගතු වූ අතර, එය දේශපාලන අභිප්‍රේරණයේ පරම්පරා බෙදීමක් පෙන්නුම් කරයි. විශේෂයෙන් මේ සම්බන්ධව අදහස් දැක් වූ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් වයස 20 – 30 සහ 30 – 40 අතර පිරිස 33% ක් පමණ මිශ්‍ර අභිප්‍රේරණ හැසිරීම් පෙන්නුම් කරමින් තල්ලු කිරීමේ සහ ඇදීමේ සාධක දෙකෙන්ම ඔවුන්ව බලපෑමට ලක් වූ බව තහවුරු කරන ලදි. එනම්, මෙම ඡන්දදායකයින් පසුගිය පාලනය පිළිබඳ කලකිරීම ප්‍රකාශ කරන අතරම නව විකල්ප පිළිබඳව ප්‍රවේශම් සහගත ශුභවාදී අදහස් ප්‍රකාශ කළහ. මෙම කණ්ඩායම බොහෝ විට ශක්තිමත් දෘෂ්ටිවාදාත්මක කැපවීමට

වඩා "අඩු බලපෑම්" හෝ "වෙනසක් සඳහා බලාපොරොත්තුව" යන වාක්‍ය කාණ්ඩය මෙහි දි භාවිතා කෙරිණි. මෙම සොයාගැනීම් මගින් නාගරික දේශපාලන හැසිරීම් හැඩගැස්වීම සඳහා ඓතිහාසික දුක්ගැනවිලි සහ පද්ධතිමය අසමානතාවයන් කොතරම් දුරට දායක වේද යන්න ඉස්මතු කරයි. ගැටුම් සහ දේශපාලන අවිශ්වාසය, ආර්ථික යැපීම අතර අන්තර් ක්‍රියාකාරිත්වය ඡන්දදායක තේරීම තනිකරම ගනුදෙනුකාරවාදී හෝ ගැටළු මත පදනම් නොවන නමුත් ව්‍යුහාත්මක යථාර්ථයන් විසින් සීමා කරන ලද භූ දර්ශනයක් නිර්මාණය කරයි.

## 5. නිගමනය

දේශපාලන සහභාගීත්වයේ ප්‍රධාන ආකාරය වන්නේ ඡන්දය ප්‍රකාශ කිරීමයි. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක මැතිවරණයකදී ඡන්දය ප්‍රකාශ කිරීම වැනි මානව ක්‍රියා අතිශය සංකීර්ණ සංසිද්ධියක් වන අතර, විවිධ සමාජ, ආර්ථික සහ මානසික සාධක මත එය රඳා පවතී. එහි දි කොළඹ දිස්ත්‍රික්කය ආශ්‍රයෙන් සිදු කළ මෙම අධ්‍යයනයේ විශ්ලේෂණයන් තුළින් තහවුරු කර ගනු ලැබූ ප්‍රධානතම කරුණ වන්නේ නාගරික ජනතාවගේ ඡන්ද තීරණවලට බලපාන සාධක බහු අංශයන්ගෙන් සමන්විත වන බවයි. 2019 සහ 2024 ජනාධිපතිවරණවල ප්‍රතිඵලවල වෙනස්කම් විශ්ලේෂණය කිරීමේදී පෙනී ගියේ, ජනතාවගේ පක්ෂපාතිත්වය හා දේශපාලන විශ්වාසයන් දැඩිව විපරිවර්තනය ලක්ව ඇති බවයි. එකල පැවැති දේශපාලන සන්දර්භයන් මත ගෝඨාභය රාජපක්ෂ මහතා 2019 ජනාධිපතිවරණයේදී ජයග්‍රහණය කළද, ඉතා කෙටි කාලයකින් ඔහුට විරුද්ධ ජනතා අරගලය ක්‍රියාත්මක වීම සහ එමගින් ඔහුගේ බලය අහිමි වීම හරහා ජනතාවගේ සජීවී දේශපාලන ඇගයීම්වල වෙනස්කම් ප්‍රභලව දක්වයි. එමෙන්ම 2024 ජනාධිපතිවරණයේදී අනුර කුමාර දිසානායක මහතාගේ ජයග්‍රහණය, සාම්ප්‍රදායික පක්ෂ වලින් ජනතාව ඉවත් වී නව දේශපාලන සන්දර්භයකට ආකර්ෂණය වී ඇති බව තහවුරු කරයි. ඒ අනුව දත්ත විශ්ලේෂණය මගින් පෙන්නුම් කළේ කොළඹ තරුණ සහ වැඩිහිටි ඡන්ද දායකයින් දෙපාර්ශ්වය තුළ ම දේශපාලනය සම්බන්ධව යම් ආකාරයක අතෘප්තියක් පවතින බවයි. එසේම කොළඹ දිස්ත්‍රික්කය තුළ පදිංචිව සිටින ආගමික හා වාර්ගික අනන්‍යතාවයන්ගෙන් හෙබි ජනතාව අතීත සිවිල් යුද්ධයේ අමිහිරි මතකයන් සහ පාස්කු ප්‍රහාරය වැනි ගැටලු මත සමාජයේ පීඩනයට ලක්ව ඇති බව සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් බහුතර සිංහල දේශපාලන පක්ෂ පිළිබඳ විශ්වාසයක් ඇති කර ගැනීමට පැකිලීමක් දක්වයි. මේ මගින් පෙනී යන්නේ සිංහල බෞද්ධ බහුතරය සේ ම සුළු ජාතීන් පවා තම ඡන්දය ලබා දීම සම්බන්ධව මේ කාල සීමාවන් ද්විත්වය තුළදී ව්‍යාකූලත්වයකට පත්ව ඇති බවයි. සාමාන්‍යයෙන් පුද්ගලයා යනු නිතර වෙනස්වීම වලට ලක් වන දේශපාලන සත්වයෙකි. ඡන්දදායක චර්යාව ගනුදෙනු කරනුයේ පුද්ගල මනස සමඟයි. එබැවින් කාලයෙන් කාලයට සිදුවන විවිධ ක්‍රියාවන් හේතුවෙන් ඡන්ද දායක චර්යාව වෙනස් විය හැකිය. මෙම පර්යේෂණයේ සොයාගැනීම් මගින් දේශපාලන පක්ෂ සහ ප්‍රතිපත්ති සම්පාදකයින් සාම්ප්‍රදායික සහ බොහෝ විට යල් පැන ගිය මැතිවරණ උපාය මාර්ග ඉක්මවා යාමේ හදිසි අවශ්‍යතාවයක් අවධාරණය කෙරේ. ශ්‍රී ලංකාවේ නාගරික

ප්‍රදේශ තුළ ශක්තිමත් සහ ප්‍රතිචාරාත්මක ප්‍රජාතන්ත්‍රවාදයක් ඇති කිරීම සඳහා, විනිවිද පෙනෙන, වගවීමේ සහ සදාචාරාත්මක පාලනයක් තුළින් මහජන විශ්වාසය ක්‍රමානුකූලව නැවත ගොඩනැගීම අතිශයින් වැදගත් වේ. ඒ සමගම, නාගරික පදිංචිකරුවන්ගේ ජීවන තත්ත්වය සැබවින්ම වැඩිදියුණු කරන ඉලක්කගත නාගරික සංවර්ධන ප්‍රතිපත්ති සමඟ සමාජ-ආර්ථික විෂමතා ආමන්ත්‍රණය කිරීම ද ඉතා වැදගත් වේ. තවද දේශපාලන ක්‍රමය තුළ සියලුම ප්‍රජාවන් සඳහා සාධාරණ නියෝජනයක් සහතික කිරීම බලධාරීන්ගේ වගකීමකි. මෙම බහුවිධ ගතිකතාවයන් ගැඹුරින් අවබෝධ කර ගැනීමෙන් සහ ඒවාට ක්‍රියාකාරීව ප්‍රතිචාර දැක්වීමෙන්, සියලුම පාර්ශවකරුවන්ට පරිණාමය වන නාගරික ඡන්දදායකයින් සමඟ වඩාත් ඵලදායී ලෙස සම්බන්ධ විය හැකි අතර, එය ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට සහ නාගරික ජනගහනයේ විවිධ අභිලාෂයන් ජාතික ප්‍රතිපත්ති ඔස්සේ සැබවින්ම පිළිබිඹු වන බව ඡන්දදායකයා තුළ විශ්වාසය ගොඩනැගීමට ද පදනම සපයයි.

## 6. ආශ්‍රිත ග්‍රන්ථ


Alwis, De. S. & Edirisinghe, R. (2007). The right to vote: Its Impact on Election Laws in Sri Lanka. Centre For Policy Alternatives. Avalable at: https://www.cpalanka.org/wp-content/uploads/2007/8/the_right_to_vote.doc.

Election Commision of Sri Lanka. (2015). Presidential Election 2015 Districts Results by Pollings Division and All Island Results. Avalable at:https://elections.gov.lk/web/wp-content/uploads/electionresults/presidentialelections/PresidentialElections2015.pdf.

Election Commision of Sri Lanka. (2019). Presidential Election 2019 Districts Results by Pollings Division and All Island Results. Avalable at: https://elections.gov.lk/enelections/results_pre_E.html.

Kaluarachchi C. et al. (2020). Sri Lankan Politics and Social Media Participation: A Case Study of the Presidential Election 2019. 18th International Conference on the Ethical and Social Impacts of ICTAt: Logroño. La Rioja. Spain. Available at:file:///C:/Users/Administrator/Downloads/DialnetSriLankanPoliticsAndSocialMediaParticipationACaseS7867235%20(3).pdf.

Samaranayake, G. (2008). Political Violence in Sri Lanka. New Delhi: Gyan Publishing House.

Uyangoda, J & peiris, P. (2024). Political Parties in the Mirror of the 2024 Presidential Election in Sri Lanka. Social scientist Association. Available at: https://polity.lk/political-parties-in-the mirror-of-the-2024-presidentialelection-in-sri-lanka-jayadeva-uyangoda-and-pradeep-peiris/

චින්තනී, අයි. ඒ. එච්. (2015). ශ්‍රී ලංකාවේ ඡන්දදායක චර්යාව සහ රූපවාහිනී මාධ්‍යය. Availableat:https://www.researchgate.net/profile/Hasitha_Gunasinghe/publication/299827028_Origin_and_Development_of_Sikh_Religion/links/5705f5ff08ae44d70ee34a78/Origin-and-Development-of-Sikh-Religion.pdf.

ගමගේ, දි. (2016). පෙළපත් පුරාණය. Availableat:https://www.researchgate.net/publication/308873861_-_1982-2016_Pelapath_Puranaya_History_of_Pedigree_of_Presidential_Candidates_in_Sri_Lanka.

දේවසිරි, ර. නි. (2017). සර්වජන ඡන්ද බලය සහ ලංකාවේ පක්ෂ ක්‍රමයේ වෙනස්වන ගතිකතා. Available at: https://www.researchgate.net/profile/Nirmal-Ranjith-Dewasiri-2/publication/351515456_3523_3515_3530

_3520_3490_3505_3514_-3520-3545-3505.pdf

නිශාන්ති, ජී. එච්. කේ. (2016). ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය හා ජාතික ලැයිස්තු ක්‍රමය. දේශපාලන විද්‍යා ශාස්ත්‍රිය ලිපි සංග්‍රහය. Available at: https://repository.kln.ac.lk/bitstream/handle/123456789/16826/8187.pdf?sequence=1&isAllowed=y.

ප්‍රේමරත්න, එම්. එල්. ජී. එම්. (2011). නගර පිළිබඳ ඉදිරිපත් වී ඇති විවිධ න්‍යායන් විවේචනයන් සාකච්ඡා කිරීම. Available at:https://socioscope.wordpress.com/wpcontent/uploads/2011/07/e0b6b1e0b69ceb6bbe0b6bae0b6b4e0b792e0b785e0b792e0b6b6e0b6be0b689e0b6afe0b792e0b6bbe0b792e0b6b4e0b6ade0b78ae0b780e0b793-e0b6871.pdf.

වනසුන්දර, ති. කෝ. (2024). නාගරිකරණය ලෝකයට ගැටලුවක් ද?. Available https://wachana.lk/education/edu/21//.

විතානවසම්, අ. (2000). ශ්‍රී ලංකාවේ මැතිවරණ පරිපාලනය සහ 1987–89 මැතිවරණ ප්‍රචණ්ඩත්වය. කොළඹ: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

වෙල්ගම, ජ. (1993). ශ්‍රී ලංකාවේ මැතිවරණ. කොළඹ: ලසන්ත ප්‍රකාශකයෝ.

ආඛ්‍යාන narrations

*Open Access, Referred Biannual Jornal*

**Volume 10 | Issue 02 | 2025**

**Published By**

Center for Indigenous and Community Studies

Sabaragamuwa University of Sri Lanka

**Akyana (2025), Vol. 10 (02) Pp 216 - 249**

**Journal homepage:**
www.sab.ac.lk/cikcs/akyana narratios

# අලි-ඇතුන්ගේ වාසස්ථාන යෝග්‍යතා තක්සේරුව සහ සිතියම්කරණය (තෝරාගත් ග්‍රාම නිලධාරි වසම් හතරක් ඇසුරෙන්)

***ජයසුන්දර එච්.එම්.වී. පි .[1] සහ කරුණාරත්න ඒ. වයි. [1*]***

[1]*භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය.*

**Corresponding author E-mail address: ananda@geo.cmb.ac.lk*

A R T I C L I N F O

Article History:
Received 23 Oct 2025
Revised 23 Dec 2025
Accepted 29 Dec 2025
Published 31 Dec 2025

CC BY NC ND

ISSN2478 - 0642

**උපුටා දැක්වීම:** ***ජයසුන්දර, එච්.එම්. වී. පි., සහ කරුණාරත්න, ඒ. වයි., (2025).අලි-ඇතුන්ගේ වාසස්ථාන යෝග්‍යතා තක්සේරුව සහ සිතියම්කරණය (තෝරාගත් ග්‍රාම නිලධාරි වසම් හතරක් ඇසුරෙන්) ආඛ්‍යාන, 10 (02). පි.අ.216 - 249***

## සාරසංක්ෂේපය

අලි මිනිස් ගැටුම, ශ්‍රී ලංකාව ඇතුළු ආසියාතික රටවල් ගණනාවක ප්‍රධාන මානව-පාරිසරික ගැටලුවක් ලෙස ප්‍රචලිතය. ඉඩම් පරිහරණය හා භූමි ආවරණය වෙනස් වීම, වාසස්ථාන අහිමි වීම, අලි මාර්ග ඛණ්ඩනය වීම සහ අලි කොරිඩෝ විනාශ වීම ආදී ඍජු හා වක්‍ර මානවවිද්‍යාත්මක තර්ජන රාශියකට අලි ඇතුන්, ඔවුන්ගේ භූගෝලීය ව්‍යාප්ති පරාසය පුරා මුහුණ දෙනු ලබයි. වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් හඳුනා ගනු ලැබ තිබෙන, විල්පත්තුව - නාච්චාදුව ප්‍රධාන අලි කොරිඩෝව තුළ පිහිටා ඇති විල්පත්තුව - මහවිලච්චිය වැව අලිකොරිඩෝව, ශ්‍රී ලංකාවෙහි අලි - මිනිස් ගැටුම් පවතින ප්‍රදේශවලින් එක් ප්‍රසිද්ධ ප්‍රදේශයකි. අධ්‍යයන ප්‍රදේශය තුළ ක්‍රමයෙන් අලි මරණ, මිනිස් මරණ, දේපළ හානි සහ වගා හානි නිරන්තරයෙන් වැඩිවෙමින් පවතී. එමෙන්ම අතීතයට සාපේක්ෂව වර්තමානය වන විට වන ආවරණය ද අඩුවෙමින් පවතින බව මොනවට අවබෝධ වේ. මෙම කරුණු අනාවරණය කර ගැනීම සඳහා ආයතනගත දත්ත, ප්‍රශ්නාවලි සමීක්ෂණ දත්ත, සම්මුඛ සාකච්ඡා, සහභාගිත්ව නිරීක්ෂණ, ඡයාරූප ලබා ගැනීම සහ Google Earth දත්ත ආදිය භාවිත කර ඇත. අධ්‍යයනයේ අරමුණ වූයේ බහු නිර්ණායක ඇගයීම් ප්‍රවේශය භාවිතයෙන් අලි - ඇතුන්ගේ වාසස්ථාන යෝග්‍යතා තක්සේරුව සහ සිතියම්ගත කිරීම වේ. බහු නිර්ණායක තීරණ විශ්ලේෂණය (MCDA), GIS භාවිත කරමින් වාසස්ථාන යෝග්‍යතාවය අවකාශීය පරිමාණය මත හඳුනා ගන්නා ලදී. මෙහි සිතියම් නිර්මාණය සඳහා ප්‍රධාන වශයෙන් ArcMap10.8 මෘදුකාංගය භාවිත කර ඇත. වාසස්ථාන යෝග්‍යතාවය හඳුනාගෙන තක්සේරු කිරීමේ ක්‍රියාවලිය තුළ ආහාර හා ආවරණය, වර්ෂාපතනය, වනාන්තර හා භෞතික භූ දර්ශනය මෙන්ම මානව ක්‍රියාකාරකම් යන සාධක සැලකිල්ලට ගෙන ඇත. ප්‍රතිඵල විශ්ලේෂණයන්ට අනුව අධ්‍යයන ප්‍රදේශය තුළ වාසස්ථාන සඳහා යෝග්‍ය ප්‍රදේශ වර්ග තුනක් ඇසුරෙන් හඳුනාගෙන ඇත. ඒ අනුව සමස්ත භූමියෙන් 21.01%ක (1688.10ha) ප්‍රමාණයක් අලි ඇතුන්ගේ වාසස්ථාන සඳහා යෝග්‍ය ප්‍රදේශ වේ. ප්‍රදේශය තුළ වැඩි වශයෙන් පවතින 45.80% ක (3864.40ha) ප්‍රමාණයක් අවම යෝග්‍ය ප්‍රදේශ වේ. එමෙන්ම අධ්‍යයන ප්‍රදේශයෙන් 34.19%ක, එනම් හෙක්ටයාර් 2884.25ක භූමි ප්‍රදේශයක් අලි-ඇතුන්ගේ වාසස්ථාන සඳහා මධ්‍යස්ථව යෝග්‍යබව ප්‍රතිඵලවලින් අනාවරණය විය. ග්‍රාම නිලධාරි කොට්ඨාස අනුව දක්වන විට කුඩාවිලච්චිය ප්‍රදේශය තුළ ඉහළ වාසස්ථාන යෝග්‍යතා ප්‍රදේශ වැඩි අතර දුනුමඬලාව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අවම වාසස්ථන යෝග්‍යතා ප්‍රදේශ වැඩි වේ.

***මුඛ්‍ය පද :*** *අලි කොරිඩෝව, අලි - මිනිස් ගැටුම, අලි වාසස්ථාන ක්ෂය වීම, බහු නිර්ණායක තීරණ විශ්ලේෂණය, වාසස්ථාන යෝග්‍යතාවය මුඛ්‍ය පද*

## 1. හැඳින්වීම

දකුණු ආසියාතික අලියා, දැනට ජීවත් වන ලොව විශාලතම භෞමික සත්ත්වයා වේ (Barman et al., 2022: Alamgir et al.,2015). පසුගිය පරම්පරා තුන තුළ අලි ගහනය අඩු වීම සහ වාසස්ථාන පරාසය වේගයෙන් හැකිළීම හේතුවෙන් Elephas Maximus නම් ආසියානු අලියා IUCN රතු ලැයිස්තුවේ වඳ වීමේ තර්ජනයට ලක් වූ සත්ත්වයෙකු ලෙස හඳුනාගෙන ඇත (Silva and Srinivasan, 2019). වන ජීවි සංරක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් 2011 වසරේ සිදු කරන ලද අවසන් අලි සංගහණයේ දී ශ්‍රී ලංකාවෙහි අලි - ඇතුන් 5879ක් ජීවත් වූ බව දක්වා ඇත (Rathnayake et al., 2022).

ලෝකයේ අලි - මිනිස් ගැටුම තුළ ඉහළින්ම සිටින රට ශ්‍රී ලංකාවයි (Anuradha et al, 2019). ඒක පුද්ගල අලි මරණ වැඩිම සංඛ්‍යාව ශ්‍රී ලංකාවෙන් වාර්තා වන අතර ඉන්දියාවට පසු දෙවන වැඩිම මිනිස් මරණ සංඛ්‍යාව වාර්තා කරයි. අලි මිනිස් ගැටුම නිසා ශ්‍රී ලංකාවේ දළ වශයෙන් සෑම වසරකම අලි - ඇතුන් 250ක් සහ මිනිසුන්70ක් පමණ මරණයට පත් වේ (වගුව 1, වගුව 2). අලි මරණ සඳහා වාර්තාගත ඉතිහාසයේ විශාලතම සංඛ්‍යාව 2019 සහ 2020 වර්ෂවල වූ අතර එනම් පිළිවෙළින් 405 සහ 407 සටහන් වී ඇත (Rathnayake et al., 2022). විශේෂයෙන්ම අද්‍යතන ගෝලීය දේශගුණික විපර්යාස අර්බුදය (Global Climate Change Crisis), හමුවේ වනාන්තර විනාශය ද ඉතා තීව්‍ර වී ඇත. මෙම තත්ත්වය නිවර්තන වැසි වනාන්තර පවතින රටවල ජීවත් වන අලි ප්‍රමුඛ සත්ත්ව වාසස්ථාන අහිමි වීම කෙරෙහි සෘජුව බලපා ඇත (Karunarathne, 2023).

*වගුව 1 : අලි මරණ කලාපීය ව්‍යාප්තිය*

| **අලි මරණ කලාපීය ව්‍යාප්තිය (2013 – 2023)** | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වන ජීවී කලාප | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
| වයඹ | 18 | 15 | 15 | 16 | 15 | 18 | 23 | 26 | 23 | 49 | 30 |
| පොළොන්නරුව | 63 | 57 | 37 | 54 | 47 | 76 | 97 | 50 | 75 | 82 | 105 |
| නැගෙනහිර | 29 | 49 | 52 | 55 | 56 | 64 | 68 | 64 | 64 | 79 | 92 |
| දකුණ | 14 | 28 | 12 | 26 | 17 | 20 | 29 | 32 | 31 | 33 | 36 |
| මධ්‍යම | 7 | 8 | 5 | 5 | 4 | 11 | 11 | 15 | 16 | 17 | 19 |
| ඌව | 22 | 16 | 13 | 14 | 25 | 22 | 30 | 37 | 28 | 28 | 38 |
| අනුරාධපුර | 49 | 32 | 27 | 42 | 30 | 53 | 59 | 43 | 74 | 79 | 89 |
| ඇත් අතුරු සෙවන | 4 | 12 | 6 | 8 | 7 | 6 | 9 | 6 | 6 | 5 | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| හොරොව්පොතාන | | | | | | | | | 3 | 3 | |
| කිලිනොච්චිය | | 5 | 4 | 2 | 4 | 5 | 8 | 4 | 4 | 5 | 8 |
| වව්නියාව | | 9 | 12 | 16 | 13 | 12 | 22 | 21 | 17 | 17 | 20 |
| ත්‍රිකුණාමලය | | | 22 | 30 | 22 | 25 | 39 | 16 | 20 | 28 | 37 |
| පුත්තලම | | | | 11 | 16 | 7 | 12 | 14 | 14 | 14 | 14 |
| එකතුව | 206 | 231 | 205 | 279 | 256 | 319 | 407 | 328 | 375 | 439 | 488 |

*මූලාශ්‍රය : වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව, 2024.*

*වගුව 2 : මිනිස් මරණ කලාපීය ව්‍යාප්තිය*

| මිනිස් මරණ කලාපීය ව්‍යාප්තිය (2013 – 2023) | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වන ජීවී කලාප | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
| වයඹ | 25 | 7 | 12 | 6 | 5 | 11 | 11 | 13 | 13 | 15 | 17 |
| පොළොන්නරුව | 12 | 16 | 10 | 26 | 16 | 21 | 27 | 18 | 18 | 26 | 39 |
| නැගෙනහිර | 18 | 22 | 15 | 20 | 23 | 17 | 19 | 24 | 34 | 32 | 37 |
| දකුණ | 3 | 9 | 7 | 10 | 10 | 5 | 8 | 7 | 8 | 12 | 14 |
| මධ්‍යම | 3 | 2 | 4 | 0 | 3 | 5 | 5 | 3 | 8 | 7 | 6 |
| ඌව | 2 | 4 | 2 | 4 | 7 | 8 | 6 | 12 | 11 | 6 | 11 |
| අනුරාධපුර | 7 | 5 | 8 | 13 | 11 | 17 | 28 | 19 | 28 | 37 | 42 |
| කිලිනොච්චිය | | 1 | 0 | 1 | 1 | 0 | 2 | 3 | 3 | 1 | |
| වව්නියාව | | 1 | 1 | 2 | 3 | 2 | 2 | 2 | 2 | 3 | 1 |
| ත්‍රිකුණාමලය | | | 4 | 4 | 5 | 5 | 10 | 4 | 8 | 3 | 11 |
| පුත්තලම | | | | 2 | 3 | 5 | 4 | 7 | 9 | 4 | 7 |
| එකතුව | 70 | 67 | 63 | 88 | 87 | 96 | 122 | 112 | 142 | 146 | 185 |

*මූලාශ්‍රය : වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව, 2024.*

ආසියාවේ පෙර නොවූ විරූ මානව ජනගහනයක් වර්ධනය වීම හේතුවෙන් ස්වභාවික වාසස්ථාන මානව ආධිපත්‍ය සහිත භූ දර්ශන බවට පරිවර්තනය වීම නිසා ඇති වූ අලි මිනිස් ගැටුම ශ්‍රී ලංකාව ඇතුළු ආසියාවේ බොහෝ ප්‍රදේශවලට ඇතුන්ට විශාල තර්ජනයක් වී ඇත (Silva and Srinivasan" 2019; Fernando et al'" 2004). වැදගත් කරුණක් වනුයේ, මිනිසුන් සහ අලි ඇතුන් අතර ගැටුම් වැඩිවෙමින් පවතින ආසියාතික රටවල් 13න් එකක් ශ්‍රී ලංකාව වීමයි. අලි මිනිස් ගැටුම, ශ්‍රී ලංකාව තුළ පුළුල් ලෙස පැතිර ඇති අතර දිවයිනේ දිස්ත්‍රික්ක 25න් 16කම වාර්තා වේ. බොහෝ විට ගැටුම් ඇති වන්නේ භෝග පෝෂණය කරන, දේපළවලට හානි කරන හෝ වගාව විනාශ කරන අලි- ඇතුන් හා මිනිසා අතරය (Rathnayake et al., 2022).

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය ප්‍රා.ලේ. කොට්ඨාසය තුළ ජීවත් වන මිනිසුන්ට අලි කොරිඩෝ ප්‍රදේශය පිළිබඳ අවබෝධයක් නොමැති වීමත්, අලි-ඇතුන් මානව ක්‍රියාකරකම් සිදු කරන ප්‍රදේශවලට පැමිණීමත් නිසා අලි-මිනිස් ගැටුම් ඇති වේ. වර්තමානයේ අධ්‍යයන ප්‍රදේශය තුළ අලි-මිනිස් ගැටුමේ ස්වභාවය පහත වගු තුළින් අවබෝධ කර ගත හැකිවේ ( වගුව 3, වගුව 4).

*වගුව 3 : අලි මරණ කලාපීය ව්‍යාප්තිය*

| වන අලි මරණ සංඛ්‍යාව (දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනම අනුව) | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ.කො. | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
| අනුරාධපුර | මහවිලච්චිය | 2 | 3 | 2 | 5 | 2 | 0 | 2 | 1 | 5 | 5 | 6 |

*මූලාශ්‍රය : වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව, 2024.*

*වගුව 4 : මිනිස් මරණ කලාපීය ව්‍යාප්තිය*

| මිනිස් මරණ සංඛ්‍යාව (දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනම අනුව) | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ.කො. | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
| අනුරාධපුර | මහවිලච්චිය | 1 | 0 | 2 | 0 | 0 | 4 | 4 | 1 | 1 | 5 | 8 |

*මූලාශ්‍රය : වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව, 2024.*

අලි-ඇතුන්ගේ වාසස්ථාන අහිමි වීම, අලි-මිනිස් ගැටුම තිව්‍ර වීමට හේතු වී ඇත. මෙලෙස ස්වභාවික වෘක්ෂලතා ආවරණය අහිමි වීමේ ප්‍රතිඵලයක් ලෙස මානව-වන ජීවි ගැටුම ජාතීන් ගණනාවක බරපතල තත්ත්වයක් වී ඇත (Rathnayake et al., 2022). අලි වාසස්ථාන සැලකිය යුතු කොටසක් දශකයට අඩු කාලයක දී කෘෂිකාර්මික ඉඩම් බවට පරිවර්තනය විය (Fernando et al., 2004). මේ අනුව බැලීමේ දී, ආසියාතික අලි - ඇතුන්ගේ නිජබිම් පුරාවාසස්ථාන අහිමි වීමට ප්‍රධානතම හේතුව ස්වභාවික වාසස්ථාන, වාණිජ කෘෂිකාර්මික ස්ථාන බවට පරිවර්තනය වීම වේ (Maria, 2014). ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කෘෂිකාර්මික ව්‍යාප්තියට සහ අලි වාසස්ථාන අහිමි වීමට ජනගහනය සහ කෘෂිකාර්මික ඉඩම් පරිහරණ රටාව යන දෙකම දායක වී ඇත (Anuradha et al., (2019). මෑතක දී සිදු කළ අධ්‍යයනයකට අනුව තවදුරටත් පැහැදිලි වන්නේ, පසුගිය දශක කිහිපය තුළ මිනිස් ගහනය වැඩි වීම නිසා අලි වාසස්ථාන මිනිස් වාසස්ථානවලට පරිවර්තනය හේතුවෙන් ශ්‍රී ලංකාවේ අලි ගහනය අඩු වී ඇති බවයි (Madhushanka and Ranawana, 2021). මේ අනුව ප්‍රා.ලේ. කොට්ඨාසයක් වන, "මහවිලච්චිය ප්‍රා.ලේ. කොට්ඨාසය තුළ අලි ඇතුන්ට යෝග්‍යය පාරිසරික සාධක පිළිබඳ තක්සේරු කර වාසයට යෝග්‍ය ප්‍රදේශ සිතියම්ගත කරන්නේ කෙසේ ද?" යන පර්යේෂණ ගැටලුව ආමන්ත්‍රණය කිරීම අධ්‍යයනය තුළ සිදු වේ.

## 2.සාහිත්‍ය විශ්ලේෂණය

### *2.1. හැඳින්වීම*

ලොව පුරා රටවල් 50කට වැඩි ප්‍රමාණයක වාසය කරන අතර, ප්‍රධාන වශයෙන් අප්‍රිකාවේ සහ ආසියාවේ ජීවත් වේ ( රූප සටහන 1), (Gunawansa et al., 2023).




*රූපය 1 : අලි, වර්ගීකරණය අනුව බෙදා දැක්වීම*

*මූලාශ්‍රය : Silva and Srinivasan, 2019.*

ලෝකයේ හැම අලියෙක්ම එක හා සමාන වන්නේ ද නැත. විශේෂයෙන් අප්‍රිකානු අලියාගේ සහ ආසියානු අලියාගේ වෙනස්කම් පවතියි (වගුව 5,වගුව 6), (විතාන, දි. නැ.).

*වගුව 5 : ආසියානු අලි සහ අප්‍රිකානු අලි අතර වෙනස්කම්*

| ආසියානු අලියා | අප්‍රිකානු අලියා |
|---|---|
| ආසියානු රටවල පමණි. (රටවල් 13ක පමණ ජීවත් වේ.) | අප්‍රිකානු අලියා අප්‍රිකානු මහද්වීපයේ ජීවත් වේ. |
| ශරීර ප්‍රමාණයෙන් සාපේක්ෂව කුඩාය. | ශරීර ප්‍රමාණයෙන් සාපේක්ෂව විශාලය. |
| දළ දක්නට ඇත්තේ පිරිමි සතුන්ගෙන් කොටසකට පමණි. (දළ දකින්නට ලැබෙන පිරිමි සතා ඇතා යනුවෙන් හැඳින්වේ.) | සියලු සතුන්ට දළ ඇත. |
| ගහනය 35 000 - 55 000 ත් අතර වේ. | ගහනය 500 000 වේ. |
| ආසියානු අලියාගේ පෙනුම අප්‍රිකානු අලියාගේ පෙනුමට වඩා ගාම්භීරය. | කන් දෙක ලොකුය. |

*මූලාශ්‍රය : විතාන, (දි. නැ.)*

*වගුව 6 : ආසියානු අලි සහ අප්‍රිකානු අලි අතර කායික වෙනස්කම්*

| ආසියානු අලියා | අප්‍රිකානු අලියා |
|---|---|
| කන ඉදිරියට නැමී ඇත. | ත්‍රිකෝණාකාර විශාල කනේ උඩ දාරය පිටුපසට නැමී ඇත. |
| හිස නෙරුම් සහිතය. | කන හිසෙන් ඉහළට විහිදේ. |
| පිටේ හැඩය - උත්තල | පිටේ හැඩය - අවතල |
| දළ පිහිටීම - පිරිමින්ට පමණි.<br><br>නැමී ගිය සිහින්ය.<br><br>බර කිලෝග්‍රෑම් 30ක් පමණ වේ. | දළ පිහිටීම - සියල්ලටම<br><br>ඍජු සනැති<br><br>බර කිලෝග්‍රෑම් 70 |
| සාමාන්‍ය උස - මී. 2.75 | සාමාන්‍ය උස - මී. 3.5 |
| උසම තැන - හිස | උසම තැන - උරහිස |
| කබර ඇත | කබර නැත |
| දත්වල වැටි - 28 | දත්වල වැටි - උපරිම 13 |
| ගැබ් කාලය මාස - 21 - 22 | ගැබ් කාලය - 23 |

*මූලාශ්‍රය : වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව (2024).*

### *ආසියානු අලියා*

ආසියානු අලියා නිවර්තන කලාපයට පමණක් සීමා වූ ගෝලීය සංරක්ෂණ වැදගත්කමක් ඇති විශේෂයකි (Alamgir, Mukul and Turton, 2015). ලෝක වන ජීවී අරමුදල, ආසියාවේ අලි ඇතුන් 51 000 - 66 000ක් පමණ සිටින බව දක්වයි. නමුත් ඔවුන්ගෙන් ස්වභාවික වාසස්ථානවල ජීවත් වන්නේ 35 000 - 50 000ක් දක්වා පමණි (Gunawansa et al., 2023). බංගලාදේශය, ඉන්දියාව, ශ්‍රී ලංකාව, ඉන්දුනීසියාව, මලයාසියාව, වියට්නාමය, කාම්බෝජය, ලාඕසය, චීනය, භූතානය, සුමාත්‍රාව සහ නේපාලයේ කොටසක ආසියාවේ අලි - ඇතුන් වාසය කරයි (Gunawansa et al., 2023; විතාන, දි.නැ.). තවත් වැදගත් කරුණක් වන්නේ, අලි - ඇතුන් වඳ වීමේ තර්ජනයට ලක් වී ඇති විශේෂයක් ලෙස සැලකීමයි (Gunawansa et al., 2023; Maria, 2014; Kumara et al., 2023; Kumar Ram et al., 2021). ශ්‍රී ලංකා අලියා ද වඳ වීමේ තර්ජනයට ලක් වී ඇති උප විශේෂයකි (Silva and Srinivasan, 2019).

### *ශ්‍රී ලංකාවේ අලි - ඇතුන්*

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයෙන් වට වූ දකුණු ආසියාවේ පිහිටි නිවර්තනික රටකි (Hettiarachchi et al., 2021). දකුණු ආසියාවේ දෙවන විශාලතම අලි ජනගහනය ශ්‍රී ලංකාව සතු වේ. ශ්‍රී ලංකාව යනු අලින්ගේ ගෝලීය පරාසයෙන් 2%ක් පමණ වන සිටින හා ගෝලීය ආසියානු අලි ගහනයෙන් 10%ක් පමණ සිටින දූපත් රාජ්‍යයකි (Silva and Srinivasan, 2019; Gunawansa et al., 2023). අප රටට ආසියානු අලි පැමිණියේ වසර මිලියන 3කට පමණ පෙර කාල සීමාවකය. එවක ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයම ඔවුන්ගේ නිජ බිම විය. දැනට වසර 3000කට පමණ පෙර ශ්‍රී ලංකාවට මිනිසුන්ගේ පැමිණීමත් සමග ජනාවාස බිහි වීමට පටන් ගැනිණ (ප්‍රකාශ්, 2017). ඓතිහාසික වශයෙන් මෙම සතුන් මුළු ශ්‍රී ලංකා දිවයිනේම වාසය කළ නමුත් දැන් ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන්නේ රටේ වියළි කලාපවල, ජාතික වනෝද්‍යාන වැනි ආරක්ෂිත ප්‍රදේශ තුළ සහ පිටත වේ (Silva and Srinivasan, 2019). ප්‍රධාන වශයෙන් වන අලි පහත රට වියළි කලාපයේ පැතිර ඇති අතර අතරමැදි කලාපයේ ද විශාල ලෙස ව්‍යාප්ත විය. කඳුකර කලාපයේ ශේෂ වූ කුඩා රංචු දක්නට ඇත. දළ වශයෙන් හඳුනාගත හැකි ප්‍රදේශවාස භූමි කරගත් කණ්ඩායම් වශයෙන් දක්නට ලැබේ (රූප සටහන 2).




*රූපය 2 : දළ වශයෙන් හඳුනාගත හැකි අලි වාස භූමි ප්‍රදේශ*

*මූලාශ්‍රය : වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව (2024)*

ආසියානු අලි විශේෂ අතුරින්, ශ්‍රී ලාංකික අලි, භෞතික වශයෙන් විශාලතම වන අතර අඳුරුතම වර්ණයෙන් ද යුතු වේ. ශ්‍රී ලංකාවේ අලි ඇතුන් දිග මීටර් 4.4ක් සහ උරහිසේ උස මීටර් 2-3.5 ක් විය හැකි අතර බර කිලෝ ග්‍රෑම් 3000-5000ක් වේ. අනෙකුත් භෞතික ලක්ෂණ දක්වන කලාප අතර, යාල, බුන්දල, ලුණුගම්වෙහෙර ආශ්‍රිත ප්‍රදේශය මින්නේරිය, කවුඩුල්ල, ජල ගැලුම් නිම්නය, සෝමාවතිය, වස්ගමුව, මාදුරුඔය, ගල් ඔය, ලාහුගල, විල්පත්තු උතුරු ප්‍රදේශය, මන්නාරම, කලා වැව, රිටිගල, නාච්චාදූව, කුරුණෑගල දිස්ත්‍රික්කයේ උතුරු කොටස් ප්‍රධාන වේ. ඔවුන්ගේ කන් කුඩා වන අතර, උරහිස් ආවරණය නොවන අතර, නළලෙහි humps දෙකක් ඇත. කඳේ කෙළවරේ එක් පෙත්තක් ඇත. ඉදිරිපස පාදවල ඇඟිලි පහක් සහ පසුපස පාදවල ඇඟිලි හතරක් ඇත. ඇත් දළ ඇත්තේ පිරිමි අලින්ට පමණක් වේ ( Gunawansa et al., 2023). අලි-ඇතුන් යනු ශක්තිමත්, බුද්ධිමත් හා සංවේදී සත්ත්ව විශේෂයකි. වඳ වීමේ තර්ජනයට ලක්ව සිටින අලි - ඇතුන් ශ්‍රී ලංකාවේ නීතිය යටතේ දැඩිව ආරක්ෂාව ලබා දී ඇති සත්ත්ව විශේෂයක් ද වේ (ප්‍රකාශ්, 2017).

## *2.2. අලි-ඇතුන්ගේ ආහාර ගැනීම*

අලි ඇතුන්ගේ ප්‍රධාන අවශ්‍යතා ලෙස ආහාර හා ජලය දැක්විය හැකිය (Olanipekun, 2014). පවතින දැනුම් සම්භාරය තුළ අලි-ඇතුන්ගේ ආහාර රටාව පිළිබඳ විවිධ අදහස් දක්වා තිබේ. දවසේ විවිධ කාලවල වනාන්තරය පුරා ඇවිදිමින් ආහාර ගනු ලබන අලි-ඇතුන් දිනකට කිලෝ 170ක පමණ කොළ වර්ග ආහාරයට ගනු ලබයි. එම ප්‍රමාණය ඔවුන්ගේ ශරීර බරින් 8-10% ක් පමණ වේ (ජ්‍රස්, 2019). එක් අදහසක් වනුයේ, අලි-ඇතුන් සිරුරේ බරින් 10% ක් පමණ එනම් බොහෝ අලි ඇතුන් දිනකට ආහාර කිලෝග්‍රෑම් 100-150ක් පරිභෝජනය කරයි. තවදුරටත් පැහැදිලි කිරීමේ දී, අලියා ආසන්න වශයෙන් දිනකට පැය 19ක් පමණ ආහාර ගනිමින් අඛණ්ඩ සහ බහුල ආහාර සහ ජල සැපයුමක් සොයමින් සිටියි. වඩා වැදගත් කරුණක් වනුයේ, පරිණත වැඩිහිටි පිරිමින්ට ගැහැනු සතුන්ට වඩා වැඩි ආහාර අවශ්‍ය වේ (Gunawansa et al., 2023).

අලි - ඇතුන්ට විශාල ආහාර තොගයක් අවශ්‍ය වන මුත්, ඔවුන්ගේ ජීවන පද්ධතිය ක්‍රියා කරන්නේ මන්දගාමී වය (විතාන, 2004). එමෙන්ම අලියාගේ ආහාර ජීර්ණ පද්ධතිය අකාර්යක්ෂම වන අතර, ආහාර 40-50ක් දිරවා නොගත් ද්‍රව්‍ය ලෙස ගමන් කරයි. (Gunawansa et al., 2023). අලි - ඇතුන්ට තම ආහාර ගැනීමේ හැසිරීම, ආහාරවල පෝෂණ ගුණයේ වෙනස්කම්වලට ගැළපීමේ හැකියාව ඇත. පිරිමි සතුන් ගුණාත්මක ආහාර සහ පෝෂ්‍ය පදාර්ථ සොයන අතර එහි ප්‍රතිඵලයක් ලෙස පිරිමි අලි, ගැහැනු සතුන්ට සාපේක්ෂව භෝග වැටලීම්වලට වැඩි අවධානයක් යොමු කරනු ලබයි. එමෙන්ම පිරිමි අලි පෝෂ්‍යදායි, ශක්තිමත් ආහාර ගැනීමට පෙළඹෙනු ලබයි (Madhushanka and Ranawana, 2021).

අලි පැටවුන්ගේ ආහාර රටාව දෙස බලන කල, ඉපදී පැය කිහිපයක් තුළ තම මවගේ තන බුරුල්ලෙන් කිරි උරන පැටවා මාස 04ක් පමණ කාලයක් සම්පූර්ණ ලෙසම යැපෙන්නේ මව් කිරිවලිනි. ඉන් අනතුරුව තණ ගස් එකක් දෙකක් රස බලමින් ආරම්භ කරන ඝන ආහාර ගෙන අවුරුදු 05 දී කිරි බීම නවත්වන තෙක්ම දිගින් දිගටම එම චර්යාව පවත්වයි. බොහෝ පැටවුන් අවුරුදු 05 වන විට විවිධාකාර ශාකමය ආහාර ගැනීමට පුරුදු වී සිටී. සමහර අවස්ථාවල දී

කුඩා පැටවුන් වැඩිහිටියන්ගේ මළ පහ ආහාරයට ගනිති. ඝන ආහාර දිරවීම සඳහා අලින්ට ක්ෂුද්‍ර ජීවීන්ගේ සහය අත්‍යවශ්‍යය. මේ නිසා පැටවුන්ට තම ආහාර මාර්ගයේ විසිය යුතු ක්ෂුද්‍ර ජීවීන් ලබා ගැනීමට මළපහ ආහාරයට ගැනීම සිදු වේ (පෙරේරා, 2008).

අලි ඇතුන්ගේ වාසස්ථාන සඳහා සුදුසු ස්ථාන බහුල ජල හා ආහාර ප්‍රභවයන්ගෙන් සමන්විත විය යුතු අතර, එමඟින් මෙම විශාල ශරීර ක්ෂීරපායින් සඳහා තිරසාර නිවහනක් ගොඩනැගෙනු ඇත (Areendran et al., 2011). පවතින සාහිත්‍ය තුළ අලි-ඇතුන්ගේ ජල අවශ්‍යතාව විවිධ ලෙසින් දක්වා ඇත. අලියෙකු වතුර ලීටර් 80-200 අතර ප්‍රමාණයක් දෛනික පානයට ගනියි. එසේම දිය නෑමට බොහෝ ප්‍රිය කරන අලියා ඇතැම් විට ඛණිජ අවශ්‍යතාව පිරිමසා ගැනීමට පස් ද ගිලියි (විතාන, දි. නැ.). ඇතැම් මූලාශ්‍රයවලට අනුව එක් අලියෙකුගේ දෛනික ජල අවශ්‍යතාව ලීටර් 150 ක් වන අතර, ඇතැම් මූලාශ්‍රවලට අනුව අලි ඇතුන්ට දිනකට ජලය ලීටර් 225 ක ජල ප්‍රමාණයක් අවශ්‍ය වේ (Thant, 2023). අලි ජල ක්‍රීඩාවට බොහෝ කැමති අතර වතුර බොන්නට ගඟකට වැවකට පැමිණි පසුව ඒ වතුරට වී ජල ක්‍රීඩාවේ යෙදෙමින් සතුටු වීම මේ යෝධයාගේ පුරුද්දයි (විතාන, දි.නැ.). අලි ඇතුන් තම පැවැත්ම උදෙසා විශාල සම්පත් ප්‍රමාණයක් මත යැපෙන බැවින්, ඔවුන් ආහාර සහ ජලය සොයා ගැනීමට විශාල වපසරයකින් යුත් ප්‍රදේශ භාවිත කරනු ලබයි (Madhushanka and Ranawana, 2021). අලින්ගේ ආහාර හා ජලය සඳහා වන ප්‍රවේශය වෙනස් වීමටත්, අලින්ගේ වාසස්ථාන අඩු වී අවුල් වීමටත්, උන්ගේ සංචලන රටා වෙනස් වීමටත් මෙය හේතු විය (පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය, 2002). මෑතක දී කරන ලද සමීක්ෂණයකින් දැක්වෙන්නේ අලි වාස භූමිවලින් සමහරක් සම්පූර්ණයෙන්ම වනෝද්‍යාන ඇතුළත පිහිටි අතර, කොටසක් වනෝද්‍යාන සීමාවෙන් බැහැරව තිබෙන බවය (පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය, 2002). අලියාගේ නිවහනෙන් 70%ක් පමණ ජාතික වනෝද්‍යාන සහ ස්වභාවිකරක්ෂිත ජාලයෙන් පිටත පවතින බව වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව පමණ දක්වයි (Samaraweera et al., 2023; Anuradha et al., 2019). අලි පරාසයේ උච්චතම වෘක්ෂලතාදිය පරිණත වනාන්තර වන අතර, අස්වැන්නෙන් වැඩි ප්‍රමාණයක් අලි ඇතුන්ට ළඟා විය නොහැකි වියන් තුළ පවතියි (Withanage et al., 2023).

## 2.3. අලි - ඇතුන්ගේ වාසස්ථාන

වාසස්ථාන බොහෝ විට වැඩි වශයෙන් ජීවත් වෙන සහ නිතර ගැවසෙන ස්ථාන ලෙස සලකනු ලැබේ. භෞතිකව හෝ විචල්‍ය අවකාශයේ, ජීව විද්‍යාත්මක සහ අජීවි විස්තර කට්ටලයක් ලෙස අර්ථ දක්වා ඇත (Keller and Smith, 2014). වාසභූමිය යනු කිසියම් විශේෂයක ප්‍රදේශයක් වන අතර එහි සිට අවට පරිසරය සමඟ සෑම සබඳතාවක්ම පවත්වයි (Mandal and Chatterjee, 2020). වාසස්ථාන තෝරා ගැනීම යනු ඔවුන්ගේ පරිසරයේ සිටින සතුන් පෝෂණය සහ වාසස්ථාන සඳහා විශේෂිත ඉඩක් තෝරාගෙන මනාප පෙන්වීමේ මාධ්‍යයකි (Olanipekun, 2014). විශාල ශරීර ප්‍රමාණය සහ ආහාර අවශ්‍යතා නිසා අලි - ඇතුන්ට විශාල නිවාස පරාසයක් ඇත. ඔවුන් සම්පත් ලබා ගැනීමට විශාල දුරක් ගමන් කරනු ලබයි (Carr, 2023). අලි ඇතුන්ගේ පරාසය පුරුදු ඔවුන් නැවත ස්ථානගත කළ පමණින් වෙනස් නොවේ. බොහෝ අලි පැය 24 සිට මාස කිහිපයක් අතර කාලයක් නව ප්‍රදේශවල රැඳී සිටියි (Silva and Srinivasan, 2019).

සතුන්ගේ හැසිරීම්වලට බලපාන ආහාර ජලය සහ සමාජ පද්ධතිහි ප්‍රවේශ්‍යතාව සම්පත් සහ වාසස්ථාන තෝරා ගැනීමට බලපායි (Kumara et al., 2023). ආසියානු අලි වනාන්තර සතුන් වේ (Fernando, n.d.). ජනාවාස මායිමේ සිට කිලෝ මීටර් 5 සිට 1 දක්වා අලින්ට නුසුදු යැයි දක්වයි (Baral et al.,2014).

අලි ඇතුන් නිතරම ආරක්ෂිත ප්‍රදේශවලින් පිටත වාසභූමිවලට අයාලේ යයි (Chen et al., 2021; Chen et al.,2023). ගැහැනු කණ්ඩායම් වර්ග කි.මී. 30-140 අතර කුඩා නිවාස පරාසයන් තුළ ජීවත් වේ. දකුණු ඉන්දියාවේ මෙන් නොව කාන්තා කණ්ඩායම්වලට කිලෝමීටර් 500 ඉක්මවන පරාසයක් තිබිය හැකිය. වර්ග කි.මී. 100ට අඩු කුඩා පරාසයක පිරිමි සතුන් වාසය කරන බව සොයා ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ අලි ඇතුන්ට වෙනම තෙත් සහ වියළි කාල පරාසයන් නොමැති අතර ඔවුන් ඍතුමය වශයෙන් දිගු දුර සංක්‍රමණ නොකරයි (Fernando,n.d.&) වාසස්ථාන අහිමි වීම සහ හායනය ලොව පුරා භෞමික ජෛව විවිධත්වය අහිමි වීමට බලපායි. පෘථිවි පෘෂ්ඨයෙන් හතරෙන් තුනක් මානව ක්‍රියාකාරකම් මගින් සැලකිය යුතු ලෙස වෙනස් වී ඇති අතර ඓතිහාසික හේතු අතර. ඉඩම් පරිහරණයේ සහ භූමි ආවරණයේ දේශීය හා ගෝලීය සමාජ ධාවකයන් පිළිබිඹු කරමින් වගා සඳහා ජනාවාස සඳහා පරිවර්තනය ඇතුළත් වේ (De Silva et al., n.d.). මෙම තත්ත්වය අලි-ඇතුන්ගේ වාසස්ථාන කෙරෙහි බලපානු ලබයි.

අලි වාසස්ථාන ශ්‍රී ලංකාවේ බොහෝ කුඹුරු සහ වාරි වැව් මෙන්ම ස්වභාවික වනාන්තර සහ ආරක්ෂිත ප්‍රදේශ සමඟ සම්බන්ධ වේ. අලි ඇතුන්ගේ වාසස්ථාන වැඩි ප්‍රමාණයක් ඉහළ ජන ඝනත්වයක් ඇති ප්‍රදේශ හා යටිතල පහසුකම් (මාර්ග සහ දුම්රිය මාර්ග ජාල) සමඟ ද සම්බන්ධ වේ (Rathnayake et al., 2022). ස්වභාවික බාධා, නාගරීකරණය, කෘෂිකර්මය සහ යටිතල පහසුකම් සියල්ල සැලකිය යුතු ලෙස ඍණාත්මකව වාසස්ථාන කෙරෙහි බලපෑම් සහ ගැටුම් ඇති කරයි (Kumara et al., 2023). වර්තමානයේ අලි පරාසයෙන් අඩකට වඩා වැඩි ප්‍රමාණයකට ප්‍රමාණවත් වාසස්ථාන නොමැත (De Silva et al., n.d.). වාසස්ථාන ඛණ්ඩනය වීමට තුඩු දෙන මානව ක්‍රියාකාරකම්, ලොව පුරා අලි - ඇතුන් වඳ වී යාමට ප්‍රධාන සාධකයක් ලෙස සැලකේ. අලි-ඇතුන් වැනි මහ ශාක භක්ෂකයන්ට ඔවුන්ගේ සමාජ පාරිසරික සහ ප්‍රජනන අවශ්‍යතා සපුරාලීම සඳහා විශාල වාසස්ථාන අවශ්‍ය වේ (Talukdar et al., 2020). අලියන්ගේ දෛනික අවශ්‍යතා සඳහා සැරිසැරීමට සැලකිය යුතු විශාල ප්‍රදේශයක් අවශ්‍ය වේ (Rathnayake et al 2022). නමුත් අලි වාසස්ථාන රට තුළ (පුළුල් ලෙස ආසියාවේ) හැකිළෙමින් පවතී. අලි ඇතුන්ගේ පරාසය පුරුදු ඔවුන් නැවත ස්ථානගත කළ පමණින් වෙනස් නොවේ (Silva and Srinivasan, 2019). විශාල වශයෙන් මධ්‍යය කඳුකරයේ වනාන්තර එළි වීම සමඟ අලින්ට වාසස්ථාන අහිමි වීමක් සිදු විය. ඒ සමඟම අලින් ප්‍රධාන වශයෙන් වියළි තැනිතලා ප්‍රදේශයට සීමා වීමක් සිදු විය (වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව, 2024). අලි වාසස්ථානවලට මිනිස් ආක්‍රමණ ගැටුම සඳහා හේතු වී ඇත. වනගත ප්‍රදේශවල අලි වාසස්ථාන ප්‍රතිසංස්කරණය කර නැවත පිරවිය යුතු අතර, වඩාත් දරුණු ලෙස හායනය වී ඇති වාසස්ථාන සඳහා ජල සිදුරු සහ සුදුසු ශාක ලබා දිය යුතු වේ. වන විනාශය සහ වනාන්තර හායනය අලි වාසස්ථාන පිරිහීමට, ඛණ්ඩනය වීමට සහ

නැති වීමට හේතු වේ. වන අලින් භූ දර්ශනය තුළ ව්‍යාප්ත වී ඇති ආකාරය සහ වඩාත් සුදුසු වාසස්ථාන මොනවා ද යන්න තේරුම් ගැනීම ඉතා වැදගත් වේ. ප්‍රධාන වශයෙන් කෙටි ගස්, පඳුරු සහ පඳුරුවලින් සමන්විත වනාන්තර මෙන්ම විවෘත වනාන්තර ද, අලි ඇතුන් විසින් භාවිත කරනු ලැබේ (Thant, 2023).

ශ්‍රී ලංකාවේ අලි ඇතුන්ට ඇති ප්‍රධානම තර්ජනය වන්නේ වාසස්ථාන අහිමි වීම සහ ජනාවාස බවට පත් කිරීම සහ ස්ථිර වගා කිරීම හරහා ඛණ්ඩනය වීමයි (Rajapaksha et al., 2014). හුදෙකලා වූ සහ ඛණ්ඩනය වූ අලි, දඩයම් කිරීම සහ වාසස්ථාන ආක්‍රමණයට හා හායනයට අතිශයෙන්ම ලක් වී ඇත (Withanage et al., 2023). ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කෘෂිකාර්මික ව්‍යාප්තියට සහ අලි වාසස්ථාන අහිමි වීමට ජනගහනය සහ කෘෂිකාර්මික ඉඩම් පරිහරණ රටාව යන දෙකම දායක වී ඇත (Anuradha et al., 2019). ප්‍රධාන වශයෙන් මිනිස් ගහනය ප්‍රසාරණය වීම නිසා ඇති වන වාසස්ථාන අහිමි වීම සහ ඛණ්ඩනය වීම සහ ඒ ආශ්‍රිත සම්පත් ඉල්ලුම හේතුවෙන් ආසියාතික අලි ඇතුන්ගේ ගහනය අඩු වෙමින් පවතී (Withanage et al., 2023).

## *2.4. අලි කොරිඩෝ*

වන ජීවී කොරිඩෝ, වාසස්ථාන කොරිඩෝ සහ හරිත මාර්ග ජීව විද්‍යාත්මක කොරිඩෝ නම් කිරීමට වෙනත් යෙදුම් ලෙස භාවිතවේ (Bandara, 2020). කොරිඩෝ යනු විශාල වනාන්තර පටු දෙකක් යා කරන පටු වනාන්තර තීරූ වන අතර එමඟින් මෙම ප්‍රදේශ අතර සතුන්ගේ සංචලනය සහ විසුරවා හැරීම පහසු කරයි (Areendran et al., 2011). අලි ගහනය සහිත විශාල වාසස්ථාන අතර සම්බන්ධයක් ලෙස ක්‍රියා කරන එවැනි ඕනෑම ප්‍රදේශයක් අලි කොරිඩෝවක් ලෙස හැඳින්වේ ( Maria, 2014). අලි කොරිඩෝව යනු මිනිසා විසින් සාධන ලද හෝ ස්වාභාවික මාර්ගයක් වන අතර, අලි ඇතුන් ඔවුන්ගේ අවශ්‍යතා මිනිස් ජනාවාස හෝ මාර්ග, වගා බිම්, වැව් වැනි මිනිසා විසින් සාධන ලද ව්‍යුහයන් හරහා එක් වාසස්ථානයකින් තවත් වාසස්ථානයකට ගමන් කිරීමේ දී/ සංක්‍රමණය වීමේ දී අනතුරුවලින් ආරක්ෂා කරයි. එබැවින් අලි මංකඩ යනු අලි ගමන් කිරීම හෝ සංක්‍රමණය කිරීම සඳහා වන ආරක්ෂිත මාර්ග වේ (Bandara, 2020).

අලි කොරිඩෝ වර්ග දෙකක් ලෙස ගත හැකි වේ. ඒ ස්වභාවික කොරිඩෝ සහ මිනිසා විසින් සාදන ලද කොරිඩෝ වේ. ජීවවිද්‍යාත්මක කොරිඩෝවක් යනු භූ දර්ශන අතර සම්බන්ධතාව සපයන භූගෝලීය වශයෙන් නිර්වචනය කරන ලද ප්‍රදේශයක් ලෙස අර්ථ දැක්විය හැකි වේ (ඒරස්, 2014). ජීව විද්‍යාත්මක කොරිඩෝ යනු සතුන්ට එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට ඔවුන්ගේ දෛනික හෝ ඍතුමය චලනයන් සඳහා පහසුකම් සපයන මාර්ග වේ. අලිමංකඩ යනු වන අලි නිතර එහෙට මෙහෙට ගමන් කරන ස්ථාන වේ. අලිමංකඩවල වටිනාකම දෘෂ්ටිකෝණ වර්ග දෙකකි. එනම් අලි සංරක්ෂණ දෘෂ්ටි කෝණය මිනිස් ජීවිතය සහ දේපළ ආරක්ෂණ දෘෂ්ටිකෝණය (Bandara, 2020). කොරිඩෝවේ දිග, පළල, ගුණාත්මකභාවය සහ අවට අනුකෘතිය විශේෂවලින් විශේෂවලට වෙනස් වේ. විවිධ විශේෂයන්ට වෙනත් වාසස්ථාන වෙත ගමන් කිරීමට, සංක්‍රමණය වීමට හැකි සම්බන්ධකයක් ලෙස කොරිඩෝ ක්‍රියා කරයි (Talukdar et al., 2020). වෘක්ෂලතා ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳ තොරතුරු වන ජීවී වාසස්ථාන තක්සේරු කිරීමට සහ

විසුරුම් කොරිඩෝ හඳුනා ගැනීමට උපකාරි වේ (Areendran et al., 2011). ඔවුන් සමහර විට වනාන්තරය තුළ හෝ වෙනත් ආසන්න ස්ථානයක ආහාර සෙවීම සඳහා වනාන්තර කොරිඩෝ භාවිත කරයි (Barman et al., 2022). ඛණ්ඩනය වූ වනාන්තර කැබලි හුදකලා ජනගහනය සඳහා සම්බන්ධතා මාධ්‍යයක් ලෙස කොරිඩෝ ක්‍රියා කරයි (Maria,2014). මෙම වාසස්ථාන බොහෝ විට මිනිසුන් විසින් ආධිපත්‍යය දරන භූ දර්ශන හරහා සැරසීමට අවශ්‍ය වේ. අලි ඇතුන්ට සහ අනෙකුත් විශේෂයන්ට දේශීය වාසස්ථාන අතර සංක්‍රමණය වීමට, ඔවුන්ගේ පැවැත්ම සහතික කිරීමට සහ ජනගහනය තුළ ජාන විවිධත්වය ප්‍රවර්ධනය කිරීමට මෙම නාවික මාර්ග හෝ කොරිඩෝ සුරක්ෂිත කිරීම අත්‍යවශ්‍ය වේ (Tiwari, 2023) යථෝක්ත ආකාරයට අලි, ඔවුන්ගේ ජීවවිද්‍යාත්මක ලක්ෂණ මෙන්ම හැසිරීම් රටාවන් සහ ඔවුන්ගේ වාසස්ථාන පිළිබඳ පවත්නා දැනුම් සම්භාරය විශ්ලේෂණය කළ හැකියි.

# 3. පර්යේෂණ ක්‍රමවේදය

## *3.1. අධ්‍යයන ක්ෂේත්‍රය*

අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයේ ග්‍රාම නිලධාරි වසම්17ක් පවතින අතර මෙම අධ්‍යයනය සඳහා වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුවෙන් හඳුනාගෙන තිබෙන මහවිලච්චිය අලි කොරිඩෝව සමඟ සම්බන්ධතා පවත්වන ග්‍රාම නිලධාරි වසම් (දුනුමඬලාව, හැළඹවැව, කිරල්පැටියාව, කුඩාවිලච්චිය) පමණක් තෝරාගෙන ඇත (සිතියම : 1). අධ්‍යයන ප්‍රදේශය උතුරු අක්ෂාංශ $8^{0}23'$ -$8^{0}30'$ ත් හා නැගෙනහිර දේශාංශ $80^{0}7'$ - $80^{0}15'$ ත් අතර පිහිටා ඇත.




*සිතියම 1 : අධ්‍යයන ප්‍රදේශයේ සාපේක්ෂ පිහිටීම*

*මූලාශ්‍රය : වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුවේ දත්ත මත පදනම්ව භූගෝල විද්‍යා තොරතුරු පද්ධතිය ආශ්‍රයෙන් (ArcGIS 10.8 මෘදුකාංගය භාවිතයෙන්) සකසන ලදී (2024).*

ජාතික වනෝද්‍යාන යටතට වැටෙන විල්පත්තු ජාතික වනෝද්‍යානයට මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වර්ග කිලෝමීටර් (397.02) කොටසක් අයත් වේ. අධ්‍යයන ප්‍රදේශයේ ප්‍රධාන වශයෙන්ම පවතින වන සම්පත ද මෙය වේ. තවදුරටත් සම්පත ගැන දැක්වීමේ දී, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තුමේන්තුවේ දත්තවල දක්වන පරිදි මෙම ප්‍රදේශය තුළ වනාන්තර වර්ග දැක්වීමේ දී, විවෘත වනාන්තර, වියළි මෝසම් වනාන්තර, වන වගා මෙන්ම පඳුරු ද පවතින බව දැක්විය හැකිය. ප්‍රදේශයේ භූමි පරිභෝග ව්‍යාප්තිය සිතියම් අංක 2 මගින් නිරූපණය කෙරේ. මෙහි දී වනාන්තර කාණ්ඩ ලෙස ගත් විට විවෘත වනාන්තර, ඝන වනාන්තර, වන වගා සහ පඳුරු වගා පවතින බව දැක්විය හැකි වේ. අධ්‍යයන ප්‍රදේශයේ ප්‍රධානම ආදායම් මාර්ගය ගොවිතැන වේ. මෙහි දී ප්‍රධාන වශයෙන්ම වී වගාව හා හේන් වගාව කැපී පෙනෙනු ලබයි. යල මහකන්න මාරු ක්‍රමය යටතේ විවිධ වූ ගැළපෙන භෝග වර්ග වගා කරනු ලබයි. ඊට අමතරව ගව පාලනය (මී ගවයන් හා එළගවයන්), එළු පාලනය, කුකුල් පාලනය, ධීවර කර්මාන්තය ආදිය ආදායම් ලබා ගැනීම උදෙසා සිදු කරනු ලබයි.




*සිතියම 2 : අධ්‍යයන ප්‍රදේශයේ භූමි පරිභෝග ව්‍යාප්තිය*

*මූලාශ්‍රය : ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තුමේන්තුවේ දත්ත ඇසුරෙන් සකස් කරන ලදී, 2024. (Google Earth Pro දත්ත /2023) භාවිතයෙන් යාවත්කාලීන කරන ලදී)*

අධ්‍යයන ප්‍රදේශයේ ජන සංඛ්‍යා ව්‍යාප්තිය ප්‍රස්තාරය අංක 1 මගින් මොනවට නිරූපණය කෙරේ.




*ප්‍රස්තාරය 1 : අධ්‍යයන ප්‍රදේශයේ ජන සංඛ්‍යා ව්‍යාප්තිය*
*මූලාශ්‍රය : සම්පත් පැතිකඩ, 2022*

## 3.2. දත්ත එක් රැස් කිරීම

මෙම අධ්‍යයනය මූලික වශයෙන් ප්‍රාථමික හා ද්විතීයික යන දත්ත වර්ග දෙක මත පදනම් වී ඇත (රූප සටහන 3). ප්‍රාථමික දත්ත එක් රැස් කිරීම ප්‍රශ්නාවලි සමීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, ක්ෂේත්‍ර නිරීක්ෂණ, සහභාගිත්ව සිතියම්කරණය මගින් සිදු කරන ලදී. ප්‍රාථමික දත්ත ලබා ගැනීමේ ක්‍රමවේදය විධිමත් කිරීම සඳහා ද්විතීයික දත්ත ද උපයෝගි කරගෙන ඇත. අධ්‍යයනයේ මාතෘකාවට අනුව ද්විතීයික දත්ත රැස් කිරීම සඳහා Google Earth Pro චන්ද්‍රිකා ඡායාරූප සහ ArcGIS 10.8 මෘදුකාංග භාවිතය මෙන්ම අධ්‍යයන මාතෘකාවට සමගාමීව සිදු කර ඇති පර්යේෂණ වාර්තා පොත් පත්, සඟරා අන්තර්ජාලය භාවිත කර ඇත. විශේෂයෙන් Google Earth Pro චන්ද්‍රිකා ඡායාරූප (2023) භාවිතයෙන් අධ්‍යයන ප්‍රදේශයේ භූමි පරිභෝග ව්‍යාප්ති සිතියම යාවත්කාලීන කරන ලදි. දත්ත රැස් කිරීමේ ක්‍රම අනුව, ප්‍රශ්නාවලි සමීක්ෂණය මෙම අධ්‍යයනය තුළ කණ්ඩායම් දෙකක් ඇසුරෙන් සිදු කර ඇත. එනම් ගෘහාශ්‍රිත ප්‍රශ්නාවලි සමීක්ෂණය, ආයතනගත ප්‍රශ්නාවලි සමීක්ෂණය වේ. ගෘහාශ්‍රිත ප්‍රශ්නාවලි සමීක්ෂණය භාවිතයෙන් අධ්‍යයන ප්‍රදේශයට අයත් ගැසට් කිරීමට කටයුතු සම්පාදනය කර ඇති අලිකොරිඩෝව හා සම්බන්ධ ග්‍රාම නිලධාරි වසම් හතරෙහි තොරතුරු භූමි පරිභෝගය, ආර්ථික තොරතුරු සහ අලි මිනිස් ගැටුම පිළිබඳ ඓතිහාසික තොරතුරු රැස්කරන ලදී. එහි දී භූමියේ පිහිටීම, ඉඩම්, ආර්ථික කටයුතු, අලි වැට පිළිබඳ තොරතුරු, භෝග වගාවන්, භෝග හානි, ජීවිත හානි, දේපළ හානි සහ ගැටුමට සම්බන්ධ සාමාන්‍ය තොරතුරු ලබා ගන්නා ලදී. මෙහි දී දත්ත රැස් කිරීම සඳහා ස්ථානීය පිහිටීම(locational information)

සහ විස්තරාත්මක දත්ත රැස් කිරීම සඳහා නොමිලේ භාවිත කළ හැකි විවෘත මූලාශ්‍රය මෘදුකාංග පැකේජයක් වන Cobocollect toolbox මෘදුකාංගය භාවිත කර දුරකථනය භාවිතයෙන් තොරතුරු එකතු කරන ලදී.




*රූපය 3 : දත්ත රැස් කිරීමේ ක්‍රම පිළිබඳ සාරාංශය*
*මූලාශ්‍රය : පර්යේෂකයින් විසින් සකස් කරන ලදී (2024)*

වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුවෙන් හඳුනා ගෙන තිබෙන විල්පත්තුව සිට මහ විලච්චිය වැව දක්වා හඳුනා ගෙන තිබෙන අලි කොරිඩෝව සමඟ සම්බන්ධතා පවත්වන ග්‍රාම නිලධාරි වසම් 04 ක (දුනුමඩලාව, හැළඹවැව, කිරල්පැටියාව, කුඩාවිලච්චිය) අයත් පවුල් සංඛ්‍යාව 1506 (සම්පත් පැතිකඩ, 2022) වූ අතර, සමස්ත සංගහනයම අධ්‍යනය කළ නොහැකි නිසා ප්‍රාථමික දත්ත සකස් කිරීමේ දී නියැදි සංඛ්‍යාව ලෙස පවුල් 150ක් තෝරා ගන්නා ලදී. මෙහි දී අලි මිනිස් ගැටුමේ බලපෑම එක් එක් ග්‍රාමවලට විවිධ ලෙස බලපාන බැවින්, 10% වන ලෙස නියැදි ප්‍රමාණය, සසම්භාවී ස්තර නියැදි ක්‍රමය යටතේ එක් එක් ග්‍රාමයට අදාළ මුළු පවුල්වලින්, නියැදියට අවශ්‍ය පවුල් සංඛ්‍යාව තෝරා ගෙන ඇත. ආයතනගත ප්‍රශ්නාවලි සමීක්ෂණය භාවිතයෙන් මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අලි වාසස්ථාන යෝග්‍යතාව තක්සේරු කිරීම සහ සිතියම්කරණය සම්බන්ධයෙන් තොරතුරු එක් රැස් කරන ලදී. මෙම ප්‍රශ්නාවලිය අනුරාධපුර වන ජීවී කලාප කාර්යාලයේ සහ මහවිලච්චිය අඩවි ආරක්ෂක කාර්යාලයේ නිලධාරි මහතුන්ගෙන් තොරතුරු රැස්කරන ලදී.

සම්මුඛ සාකච්ඡා මඟින් වැදගත් තොරතුරු රාශියක් ලබාගෙන ඇත. එහි දී අනුරාධපුර වන ජීවී අඩවි ආරක්ෂක නිලධාරිතුමා, මහවිලච්චිය වන ජීවී නිලධාරිතුමා, මහවිලච්චිය භූමි පරිහරණ නිලධාරිතුමා, දිසාවන නිලධාරිතුමා, ග්‍රාම සේවා නිලධාරින් සමඟ සම්මුඛ සාකච්ඡා පැවත්වීය. එමඟින් ප්‍රදේශයේ අලි - මිනිස් ගැටුම පවතින ප්‍රදේශ පිළිබඳ, අලි කොරිඩෝ පිළිබඳ, අලියන්ගේ සංක්‍රමණ රටාවන් හා චර්යා රටාවන්, අලි වාසස්ථාන සඳහා යෝග්‍ය සාධක, සුදුසු ප්‍රදේශ, භූමි පරිහරණය ආදිය පිළිබඳ තොරතුරු රැස් කරන ලදී. විශේෂයෙන්ම මහවිලච්චිය වන ජීවී අඩවි ආරක්ෂකතුමා සමඟ සිදු කරන

ලද සම්මුඛ සාකච්ඡාවේ දී අධ්‍යයන ප්‍රදේශයේ අලි - ඇතුන්ගේ වාසස්ථාන යෝග්‍යතා තක්සේරු කිරීම සහ සිතියම්කරණය පිළිබඳ තොරතුරු රාශියක් අනාවරණය කර ගත හැකි විය.

අධ්‍යයනය තුළ අලි - ඇතුන්ගේ වාසස්ථාන යෝග්‍යතා සිතියම්කරණය උදෙසා ගම්වාසීන්ගේ සහභාගිත්වයෙන් සිතියම් සකස් කිරීම ද සිදු කර ඇත. මේ සඳහා මුල් ගම්වාසීන් 22 ක් සහභාගි වූ අතර, සිතියම්කරණය සඳහා 'සහභාගිත්ව සිතියම්කරණ ශිල්ප ක්‍රමය (participatory mapping approach)' භාවිත කරන ලදී. එනම් මෙහි දී අලි ගමන් ගන්නා මාර්ග ලකුණු කිරීම, අලි ප්‍රදේශයට පැමිණෙන දිශාව ආදිය සිතියම් ගත කිරීම උදෙසා සහභාගිත්ව සිතියම්කරණය භාවිත කර ඇත. වන වැස්ම, අලියන්ගේ චර්යා රටාව, අලි පැමිණෙන මාර්ග, දිශාව, සංක්‍රමණ රටා, අලි කොරිඩෝව ප්‍රදේශයේ මානව ක්‍රියාකාරකම්, මාර්ග රටා, වගා හානි, දේපළ හානි, අලි මිනිස් ගැටුම වැළැක්වීම සඳහා මිනිසුන් ගෙන ඇති ප්‍රායෝගික ක්‍රියා මාර්ග සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මඟින් ගෙන ඇති ක්‍රියාමාර්ග (විදුලි වැටවල්) ආදිය පිළිබඳ ක්ෂේත්‍ර නිරීක්ෂණවල දී අධ්‍යයනය කරන ලදී. එසේම මිනිස් ජීවිත හානි, අලි මරණ, දේපළ හානි, භෝග හානි පිළිබඳ නිරීක්ෂණය කිරීමටත් භූමි පරිභෝගය පිළිබඳ අවබෝධ කර ගැනීමටත් පහසු විය. අලි - ඇතුන් විසින් සිදු කර ඇති වගා හානි, දේපළ හානි, ජීවිත හානි මෙන්ම මිනිසුන් විසින් සිදු කරනු ලැබ ඇති අලි මරණ, අලි වැටවල්, අලි කොරිඩෝවේ වර්තමාන තත්ත්වය ආදී ක්ෂේත්‍ර නිරීක්ෂණවල දී දැකිය හැකි වූ විශේෂ අවස්ථාවන් සාක්ෂි ලෙස ඉදිරිපත් කිරීම සඳහා ඡයාරූපගත කරන ලදී.

ද්විතීයික දත්ත රැස්කිරීමේ දී ආයතන මඟින් හා ලිපිලේඛනගත තොරතුරු මඟින් දත්ත රැස් කිරීම සිදු විය. මෙහි දී මෙතෙක් අලි - ඇතුන් පිළිබඳ හා අලි මිනිස් ගැටුම පිළිබඳ ලියවුණු පොත් පත්, සඟරා, ආයතනික පර්යේෂණ, පුද්ගලයන්ගේ පර්යේෂණ නිබන්ධන, දෙපාර්තමේන්තු අත් පත්‍රිකා ආදිය මෙන්ම අධ්‍යයන ප්‍රදේශය පිළිබඳ ලියවුණු පොත්පත්, සඟරා හා වාර්තා නිබන්ධනය ලිවීමේ දී පරිශීලනය කළ අතර ඒ තුළින් ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි විය. ආයතන මඟින් තොරතුරු ලබා ගැනීමේ දී ආයතන කිහිපයකින් තොරතුරු ලබා ගන්නා ලදී. වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව හා මහවිලච්චිය අඩවි ආරක්ෂක කාර්යාලය තුළින් අලි මිනිස් ජීවිත පිළිබඳ තොරතුරු, අලි-ඇතුන් පිළිබඳ වාර්තාගත තොරතුරු ද, බත්තරමුල්ල වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව තුළින් අලි-මිනිස් මරණ පිළිබඳ තොරතුරු හා 2013 – 2023 තුළ අලිකොරිඩෝ පිළිබඳ තොරතුරු ද, බත්තරමුල්ල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව තුළින් ශ්‍රී ලංකාවේ වනාන්තර ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු හා 1992 – 2015 තුළ මහවිලච්චිය ප්‍රා.ලේ. කොට්ඨාසයේ වනාන්තර පිළිබඳ තොරතුරු ද, මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළින් අධ්‍යයන ප්‍රදේශයේ ජනගහනය පිළිබඳ තොරතුරු ද, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තුමේන්තුව ඉඩම් පරිහරණය පිළිබඳ 2018 වර්ෂයේ දත්ත ද ලබා ගෙන ඇත.

### *3.3. දත්ත සැකසීම හා විශ්ලේෂණය*

අලි-ඇතුන්ගේ වාසස්ථාන යෝග්‍යතාව සිතියම්ගත කිරීම සඳහා එක් එක් විචල්‍ය, පවතින දැනුම් සම්භාරය මත පදනම්ව අධ්‍යයනය සඳහා නිර්ණායක තෝරාගෙන

ඇත. එනම් ඒ අනුව සාධක කාණ්ඩ කිහිපයක් සඳහා අලි වාසස්ථාන යෝග්‍යතාව සඳහා ලකුණු (7 වගුව) ලබා දෙන ලදී.

*වගුව 7 : වාසස්ථාන යෝග්‍යතාව සඳහා භාවිත කරන සාධක සහ විචල්‍ය විස්තර කිරීම (පර්යේෂකයින් විසින් පවතින දැනුම් සම්භාරය ඇසුරෙන් සකස් කරන ලදී, 2024)*

| **වාසස්ථාන යෝග්‍යතාව සඳහා බලපාන සාධක** | **විචල්‍යය** | **කොටස්වලට බෙදීම** | **බර තැබීම** | **සලකා බැලූ මූලාශ්‍රය** |
|---|---|---|---|---|
| ආහාර හා ආවරණ (රැඳී සිටින ස්ථාන) | ජල මූලාශ්‍රයවලටඇති දුර | 0 m – 299m | 10 | Mandal and Chatterjee, 2020<br>Areendran et al., 2011 |
| | | 300 m – 599m | 7 | |
| | | 600 m – 899 m | 5 | |
| | | 900 m – 1199 m | 2 | |
| | වනාන්තර | ඝන වනාන්තර | 7 | Thant,2023 |
| | | විවෘත වනාන්තර | 10 | |
| | | පඳුරුඉඩම් | 7 | |
| භෞතික භූ දර්ශනය | භූ විෂමතාව | තැනිතලා ප්‍රදේශ | 7 | withanage et al., 2023<br>Areendran et al., 2011<br>Chen et al., 2023 |
| | පාෂාණ සහිත ප්‍රදේශ | නිරාවරණය වූ පාෂාණ සහිත ප්‍රදේශ | 2 | |
| දේශගුණික සාධක | වර්ෂාපතනය | 1351.800001 – 1363.400000 mm | 10 | Withanage et al., 2023<br>Thant, 2023 |
| | | 1334.400001 - 1351.800000 mm | 8 | |
| | | 1326.500001 - 1334.400000 mm | 6 | |
| | | 1313.600001 - 1326.500000 mm | 4 | |

| | | | | |
|---|---|---|---|---|
| | | 1313.600000 | 2 | |
| මානව ක්‍රියාකාරකම් | ඉදි කළ ප්‍රදේශ | ගෙවතු | 0 | Maria, 2014<br><br>Kumara et al., 2023 |
| | | පිට්ටනි | 2 | |
| | කෘෂි ආර්ථික කටයුතු | හේන/ භෝග ඉඩම් | 3 | Withanage et al., 2023<br><br>Fernando, n.d<br><br>Samaraweera et al., 2023 |
| | | ඍතුමය බෝග | 3 | |
| | | වී | 0 | |
| | | මිශ්‍ර ශාක සහ අනෙකුත් බහු වාර්ෂික පළතුරු | 0 | |
| | | පොල් | 0 | |
| | මාර්ග | 0 m – 299m | 0 | Maria, 2014<br><br>Chen et al., 2021 |
| | | 300 m – 599m | 3 | |
| | | 600 m – 899 m | 5 | |
| | | 900 m – 1199 m | 7 | |
| | විදුලි වැට | 0 m – 299m | 0 | විතාන, දි.නැ. |
| | | 300 m – 599m | 3 | |
| | | 600 m – 899 m | 5 | |
| | | 900 m – 1100 m | 7 | |

සිතියම් නිර්මාණය සඳහා Arc GIS 10.8 හරහා අවකාශීය දත්ත විශ්ලේෂණය කරන ලදී. අධ්‍යයන ප්‍රදේශයේ අලි වාසස්ථාන යෝග්‍යයතා ප්‍රදේශ නිර්ණය කිරිම, ප්‍රමුඛතාකරණය හා සිතියම්ගත කිරීම සඳහා බහු නිර්ණායක තීරණ විශ්ලේෂණය (Multi Criteria Decision Analysis [MCDA]) සහ Buffer Analysis යොදා ගෙන ඇත. මෙම ක්‍රමවේදය යටතේ ඉතා යෝග්‍ය නිර්ණායක ගණනාවක් සහ ඒ ඒ විචල්‍යයේ බලපෑම/වැදගත්කම ප්‍රශස්ත ලෙස සලකා බැලිය හැකියි. සලකා බැලූ විචල්‍ය බර තැබීම සඳහා ඉහත වගුවේ දක්වා ඇති මූලාශ්‍රය පදනම් කොට ගෙන ඇත (e.g. Mandal, and Chatterjee, 2020; Areendran et al., 2011). අවසානයේ වාසස්ථාන යෝග්‍යතා සිතියම Weighted Overlay ක්‍රමවේදය හරහා සකසා ඇත. එමෙන්ම අධ්‍යයන ප්‍රදේශය තුළ ආහාර ආවරණය, භෞතික භූ දර්ශනය සහ මානව ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සඳහා Excel මෘදුකාංගය හරහා අවකාශීය නොවන දත්ත විස්තරාත්මක සංඛ්‍යාන විද්‍යාත්මක

විශ්ලේෂණ ක්‍රම භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී.

Arc GIS 10.8 මෘදුකාංගය යටතේ, බහු නිර්ණායක තීරණ විශ්ලේෂණය ක්‍රමය (MCA) සඳහා attribute table එක විවෘත කර එක් එක් විචල්‍ය සඳහා නව ක්ෂේත්‍රයක් මෙයට ඇතුළත් කළයුතුය. 6.1 වගුව තුළ දක්වා ඇති පරිදි විචල්‍ය සඳහා බර තබා ඇත. අනතුරුව එම අලුතෙන් එකතු කළ සියලු ක්ෂේත්‍ර සහිත තල 'Union' තුළින් එකතු කර ඇත. අනතුරුව එම ලැබෙන දෛශික අගයන් සිව්රැසි අගයන් බවට පරිවර්තනය කර ඇත. මෙහි දී 'Feature to Raster' ඇසුරෙන් සිව්රැසි ක්‍රමවේදය හරහා වාසස්ථාන යෝග්‍යතා සිතියම සකස් කර ඇත.

## 4. ප්‍රතිඵල හා සාකච්ඡාව

අලි-ඇතුන් ප්‍රියතාවයක් දක්වන ආහාර හඳුනා ගැනීමේ දී අලි-ඇතුන් සඳහා ප්‍රධාන වශයෙන්ම අවශ්‍ය වන ආහාර යන සාධකය පිළිබඳ මෙලෙස අවබෝධයක් ලබා ගත හැකිය. අලි ඇතුන් පැවත්ම සඳහා විශාල සම්පත් ප්‍රමාණයක් මත යැපෙන බැවින්, ඔවුන් ආහාර සහ ජලය සොයා ගැනීමට විශාල ප්‍රදේශ භාවිත කරයි(Madhushanka and Ranawana, 2021). අලි-ඇතුන්ගේ ආහාර රටාව ඉතා වැදගත් අතර අධ්‍යයන ප්‍රදේශය තුළ අලි-ඇතුන් විවිධ ආහාර ගනු ලබයි. ප්‍රතිචාර දැක්වූන්ගේ අදහස්වලට අනුව ප්‍රධාන වශයෙන්ම ආහාර සඳහා වනාන්තර භාවිත කරයි. ගස්වල අතු රිකිලි, පඳුරු, කුඩා ශාකවල පත්‍ර, නෙළුම් අල, පස් සමඟ ලවණ සහිත තෘණවර්ග ආදියට අලි-ඇතුන් විශේෂ කැමැත්තක් දක්වනු ලබයි.

### 4.1. මූලික සොයාගැනීම්

අධ්‍යයන ප්‍රදේශය තුළ ප්‍රධාන වගාව ප්‍රධාන වගාව වී වගාව බැවින් (හෙක්ටයාර් 1023.415744), වී වගාවටසිදු වී ඇති හානිය වැඩි වේ. ප්‍රශ්නාවලි 150 සඳහා පිළිතුරු ලබා දුන් ප්‍රතිචාරකයන්ගේ අදහස්වලට අනුව (ප්‍රතිචාර ප්‍රමාණය: 85%) අලි-ඇතුන් වැඩි වශයෙන් නොමේරූ වී ආහාරයට ගැනීමට ප්‍රියතාවක් දක්වයි. එසේම පැසුණු ගොයම්වලට ද අලියන්ගෙන් සිදු වන හානිය අධිකය. මෙම ධාන්‍ය පවතින සුවඳ ඔස්සේ ද අලියන් පැමිණ ගබඩා කර ඇති ධාන්‍යවලට ද හානි කරනු ලබයි (ප්‍රතිචාර ප්‍රමාණය: 95%), එමෙන්ම අලියන් නිසා සිදු වන හානිය ආහාරයට ගැනීම නිසාම නොව වගා ප්‍රදේශ හරහා ගමන් කිරීමෙන් යාන්ත්‍රික ස්වරූපයෙන් අලියන්ට පෑගීමෙන් ද විශාල වශයෙන් හානි සිදු වේ (ප්‍රතිචාර ප්‍රමාණය: 91%), තව ද අධ්‍යයන ප්‍රදේශය තුළ උඳු වගාව ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබයි. මෙම වගා බහුල වශයෙන්ම අලි කොරිඩෝව තුළ සිදු කර ඇති බැවින් හානිය වැඩි වී ඇත. එමෙන්ම ප්‍රතිචාරකයන් දක්වනු ලැබුයේ අතීතයේ දී මෙම උඳු වගා කළ භූමිවල ද බඩ ඉරිඟු වැඩි වශයෙන් වගා කළ අතර, බඩ ඉරිඟුවලට වඩා උඳුවලට අලි-ඇතුන්ගේ හානිය අඩු බැවින් උඳු වගාව වැඩි වශයෙන් සිදු කරන බවයි (ප්‍රතිචාර ප්‍රමාණය: 81%), එනම් වර්තමානය වන විට අධ්‍යයන ප්‍රදේශයේ වගා කරනු ලබන භෝගය තෝරා ගැනීම කෙරෙහි ද අලි-ඇතුන් ඍජු ලෙස බලපෑමක් කර ඇති බව වැටහේ. වර්තමානයේ බඩඉරිඟු වගා භූමි ප්‍රමාණය අඩු වීමට අලි-ඇතුන් එම ආහාර සඳහා දක්වනු ලබන ප්‍රියතාව බලපානු ලබයි. මේවාට අමතරව වට්ටක්කා, පුහුල්,

මඤ්ඤොක්කා ආදී විවිධ වගා කෙරෙහි ද වැඩි කැමැත්තක් දක්වනු ලබයි.

එමෙන්ම ප්‍රතිචාරකයන් 100%ක්ම පවසනු ලැබුවේ අධ්‍යයන ප්‍රදේශය තුළ හේන් හා කුඹුරු අස්වනු නෙළු පසු කාලපරිච්ඡේදය තුළ හේන් හා කුඹුරු වගා පවතින කාලපරිච්ඡේදයට වඩා අලි-ඇතුන් ගම්මානවලට පැමිණීම වැඩි බවයි. ඒ සඳහා වනාන්තරය තුළ දී ප්‍රමාණවත් ආහාර නොලැබීම, හේන් හා කුඹුරු අස්වනු භූමි හිස්වීම හා වගා භූමි ආහාරවලට හුරු වී සිටීම ආදී හේතු නිසා ගෙවතුවල තිබෙන ශාක ආහාරයට ගැනීම සිදු වේ.

ගෙවතු තුළ ඇති ශාකවලින් වැඩි බලපෑමක් අලි-ඇතුන්ගෙන් පොල්, අඹ, කෙසෙල් හා කොස් ආදී ශාකවලට පවතින බැවින් මෙම ආහාර සඳහා අලි-ඇතුන් ප්‍රියතාවක් දක්වන බව අවබෝධ වේ (ප්‍රතිචාර ප්‍රමාණය: 91%). ප්‍රතිචාරකයින් දැක්වූ පරිදි අලි-ඇතුන් වනාන්තරයේ ආහාර හිඟ කාලපරිච්ඡේදවල දී ගම්මානවලට පැමිණීමට ඔවුන්ගේ ආහාර අවශ්‍යතාව දැඩි ලෙස බලපාන බවයි.

එමෙන්ම අධ්‍යයන ප්‍රදේශය තුළ මෙම කෘෂිකාර්මික භූමිවල ව්‍යාප්තිය මෙසේ අපට අවබෝධකර ගත හැකිය. ප්‍රශ්නාවලි 150 සඳහා පිළිතුරු ලබා දුන් ප්‍රතිචාරකයන්ට අනුව, ප්‍රධාන ආදායම් මාර්ගය ගොවිතැන වේ. එනම් පවුල් 56%ක් වන අතර දෙවැනිව පවතින ආදායම් මාර්ගය 18%ක් වන සිවිල් ආරක්ෂක රැකියා වේ. මෙම සිවිල් ආරක්ෂක රැකියාවේ නියැළෙන සියලු දෙනාම ප්‍රධාන ආදායම් මාර්ගයට අමතරව ගොවිතැන් කටයුතු සිදු කරනු ලබයි. එනම් විශාල ප්‍රමාණයක් අධ්‍යයන ප්‍රදේශය තුළ ගොවිතැන් කටයුතු සිදු කිරීම තුළින් අධ්‍යයන ප්‍රදේශයේ භූමි කෘෂිකාර්මික භූමි වීම නිසා ද ( වගුව 8) අලි-ඇතුන්ගේ වාසස්ථාන හායනය වීම කෙරෙහි මෙම තත්ත්වය දැඩි ලෙස බලපා ඇති බව දැක්විය හැකිය. අතීතය තුළ අලි-ඇතුන් නිදහසේ සංචරණය කළ ආහාර සොයා ගත් භූමි මෙසේ ඔවුන්ට අහිමිවීම නිසා ඔවුන් වගා හානි සිදු කරමින් ඔවුන්ගේ ආහාර අවශ්‍යතා සපුරා ගනු ලබයි.

*වගුව 8 : කෘෂිකාර්මික භූමිප්‍රමාණය*

| වර්ගය | හෙක්ටයාර් |
|---|---|
| හේන/ හෝග ඉඩම් | 10.035429 |
| ඍතුමය හෝග | 2175.513344 |
| වී | 1023.415744 |
| මිශ්‍ර ශාක සහ අනෙකුත් බහු වාර්ෂික පළතුරු | 18.620815 |
| පොල් | 40.361275 |
| එකතුව | 3267.946636 |

*මූලාශ්‍රය : ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තුමේන්තුව, 2024*

පර්යේෂණ සාහිත්‍යය වෙත අවධානය යොමු කිරීමේ දී, Anuradhaet.al. (2019) විසින් පසුගිය දශක කිහිපය තුළ සාම්ප්‍රදායික වියළි ගම්මානවල කෘෂිකාර්මික ඉඩම් පරිහරණ රටාවන් ප්‍රධාන වශයෙන් වෙනස් වී ඇති අතර එනම්, ගොවිතැන් මාරු -වගා කිරීමේ මාදිලියේ සිට ස්ථාවර අනුක්‍රමික ගොවිතැන් ක්‍රමයකට සංක්‍රමණය වීම, ඒකපුද්ගල හෝග ව්‍යාප්ත වී, කෘෂිකාර්මික ඉඩම් පරිහරණ රටාවන්හි වාර්ගිකත්වය අතුරුදහන්වීම ආදියෙහි සැලකිය යුතු බලපෑමක් මිනිස්- අලි අන්තර් ක්‍රියා සඳහා බලපාන බව සොයාගෙන ඇත. ඒ බව ප්‍රශ්නාවලි සමීක්ෂණයේ දී ප්‍රතිචාරකයන් ලබා දුන් අදහස්වලින් සනාථ විය. අධ්‍යයන ප්‍රදේශය තුළ, වැඩිම භූමි ප්‍රමාණයක් පවතිනු ලබනුයේ ඍතුමය හෝග වේ. දෙවනුව වී වගාව වන අතර

මෙම ප්‍රමාණය සමස්ත භූමි ප්‍රමාණයෙන් විශාල ප්‍රමාණයක් වන අතර වගා හානි වැඩි වීමට ද එය බලපානු ලබයි (වගුව 9).

ජලයට සමීප වීම වාසස්ථාන තෝරා ගැනීමේ එක් නිර්ණායක ලක්ෂණයකි (Ahmd, Goparaju and Qayum, 2018) අධ්‍යයන ප්‍රදේශය තුළ විහිදුණු ජල මූලාශ්‍රය ව්‍යාප්තියක් පවතියි.

*වගුව 9 : ජල මූලාශ්‍රයවල ප්‍රමාණය*

| වර්ගය | හෙක්ටයාර් |
|---|---|
| අත්හරින ලද වැව් | 1.770815 |
| ඇළ | 7.618647 |
| වාරි ඇළ | 0. 611733 |
| විල් | 2.055952 |
| මහ වැව් | 579.258711 |
| සුළු වැව් | 393.932868 |
| ස්වභාවික පොකුණු | 1.17929 |
| ඔය | 14.158031 |
| එකතුව | 1000.586048 |

*මූලාශ්‍රය : ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තුමේන්තුව, 2024*

වැඩිවශයෙන්ම අධ්‍යයන ප්‍රදේශයේ ජල අවශ්‍යතාව සපයනු ලබනුයේ මහවිලච්චිය වැව මහ වැව තුළින් වේ (around 80%). මෙය අලි-ඇතුන්ගේ ජල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ද ප්‍රධාන වේ. එමෙන්ම අධ්‍යයන ප්‍රදේශය තුළ පැතිරුණු සුළු වාරි ව්‍යාප්තියක් ද පවතියි (රනෝරාවනික වැව, හැළඹ වැව). ප්‍රතිචාරකයින් දැක්වූ පරිදි අලි-ඇතුන්, ජලය ලබා ගැනීම සඳහා භාවිත කරනු ලබන වැව් පවතියි. වැඩි වශයෙන්ම අලි-ඇතුන් වියළි කාලවලදී ගම්මානවලට පැවතීමට හේතුවක් ලෙස ද ජල අවශ්‍යතා දැක්විය හැකිය. මෙහි දී ජල පහසුකම් හා ජල ප්‍රමාණය වැඩි හෙයින් අනෙක් වැව්වලට සාපේක්ෂව විලච්චිය වැවට පැමිණෙන අලි-ඇතුන්ගේ ප්‍රමාණය වැඩි බව දක්වයි. අලි-ඇතුන්ගේ පැවත්ම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයක් ලෙස ජලය දැක්විය හැකි වේ. එනම් සාමාන්‍ය වශයෙන් ගත් විට අධ්‍යයන ප්‍රදේශයට අලි-ඇතුන්ගේ පැමිණීමට වර්ෂාපතනය අඩු කාලයට වැඩි ස්වරූපයක් පෙන්නුම් කරයි. ප්‍රශ්නාවලි සමීක්ෂණයේ දී ප්‍රතිචාරකයින් 96% ක් දක්වා ඇත්තේ සැප්තැම්බර් මාසයට ද, 92%ක් අගෝස්තු මාසයට ද අලි-ඇතුන්ගේ පැමිණීම වැඩි බවයි. තව ද ප්‍රතිචාරකයින් 85% දක්වා ඇත්තේ පෙබරවාරි හා මාර්තු කාලවල දී අලි-ඇතුන්ගේ පැමිණීම වැඩි බවයි. මෙම කාලපරිච්ඡේදය තුළ ද අධ්‍යයන ප්‍රදේශයට වර්ෂාපතනය අඩුබව අවබෝධ වේ. එමෙන්ම අධ්‍යයන ප්‍රදේශය තුළ ද ජුනි, ජූලි මාසවල දී වර්ෂාපතනය විශාල වශයෙන් අඩු වීම නිසා ජල මූලාශ්‍රයවල ජලය අඩු අතර එම කාලවල දී අනෙක් ජල මූලාශ්‍රයවල ජලය රැඳි පවතින කාලවලට වඩා අලි-ඇතුන්ගේ පැමිණීම අඩු ප්‍රතිචාරකයින් 75%ගෙන් අනාවරණය විය. තව ද ප්‍රතිචාරකයින්ගෙන් 100%ක් ම දැක්වූයේ අධ්‍යයන ප්‍රදේශයට වර්ෂාපතනය ඔක්තෝම්බර්, නොවැම්බර් වැනි මාසවල ලැබෙන බවයි. එනම් මෙහි දී අවබෝධ වන කරුණක් වනුයේ අධ්‍යයන ප්‍රදේශයට දෙවන අන්තර්මෝසම් කාල පරිච්ඡේදය තුළ වැඩි වර්ෂාපතනයක් ලැබෙන බවයි. එමෙන්ම එතරම් නොවුණ ද ඊසාන දිග මෝසම තුළින් ද සාමාන්‍ය වර්ෂාපතනයක් අධ්‍යයන ප්‍රදේශයට ලැබීම නිසා ජල අවශ්‍යතාව සඳහා ගම්මානවල ජල මූලාශ්‍රයවලට අලි-ඇතුන් පැමිණීම ක්‍රමයෙන් අඩු වේ. ප්‍රතිචාරකයින් 100%ක්ම දැක්වූයේ මෙම කාලවල දී ලැබෙන

වර්ෂාපතනය නිසා වනාන්තරවල තිබෙන වළවල් ආදිය ජලයෙන් පිරී යෑම නිසා අලි-ඇතුන් ජලය සොයා ගම්මානවල ජල මූලාශ්‍රයවලට නොපැමිණෙන බවයි. එනම් වර්ෂාපතනය නිසා අඩු දුරකින් අලි-ඇතුන්ගේ ජල අවශ්‍යතා සපුරා ගැනීමට හැකි වේ. එනම් මෙම තොරතුරු තුළින් අධ්‍යයන ප්‍රදේශය තුළ වර්ෂාපතනය, අලි-ඇතුන්ට බලපාන ආකාරය අවබෝධ වේ.

දේශගුණය, වනාන්තර ව්‍යාප්තිය හා භෞතික භූ දර්ශනය දැක්වීමේ දී, ශ්‍රී ලංකාවේ වැව් බැඳි රාජ්‍යයට අයත් ප්‍රදේශය තුළ වියළි කලාපීය ලක්ෂණවලින් හෙබි දේශගුණයක් පවතියි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ සාමාන්‍ය උෂ්ණත්වය අවුරුද්ද පුරා (26C° - 33C°) පමණ වේ. මෙම උෂ්ණත්වය පරාසය යටතේ, මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉහළ උෂ්ණත්ව පරාසයක් අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට සාපේක්ෂකව පවතී (සම්පත් පැතිකඩ, 2011).

වර්ෂාපතනය පිළිබඳ දැක්වීමේ දී, වියළි කලාපයට අයත් වන මෙම කොට්ඨාසයයේ ප්‍රධාන දේශගුණික ලක්ෂණ ලෙස අධික සූර්ය තාපය, සාමාන්‍ය වර්ෂාපතනය ආදිය දැක්විය හැකිය. එමෙන්ම සැප්තැම්බර් මැද භාගයේ සිට දෙසැම්බර් දක්වා වන කාලය ප්‍රධාන වර්ෂා කාලය වන අතර මැයි මාසයෙන් පසුව තද සුළං ඇති වේ. මේ සුළඟත් සමඟ වියළි දේශගුණික තත්ත්වයක් අවුරුද්දේ අනෙකුත් මාස 09 තුළ ඇති වන අතර, කාලගුණික රටාව නොවෙනස්ව පැවතියහොත් අප්‍රේල් මාසයේ දී කඩින් කඩ තරමක වර්ෂාපතනයක් දැකිය හැකිය. අධ්‍යයන ප්‍රදේශයේ 1992-2022 කාල පරිච්ඡේදය තුළ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය, 1335.63mm පමණ වන අතර අවම වර්ෂාපතනය 1313.6mm ලෙස ද, උපරිම වර්ෂාපතනය 1363.4 mmලෙස ද වාර්තා වී ඇත (Chirps, n.d.).

ජාතික වනෝද්‍යාන යටතට වැටෙන විල්පත්තු ජාතික වනෝද්‍යානයට මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වර්ග කිලෝමීටර් (397.02) කොටසක් අයත් වේ. අධ්‍යයන ප්‍රදේශයේ ප්‍රධාන වශයෙන්ම පවතින වන සම්පත ද මෙය වේ (වගුව 10). දිසා වන නිලධාරි ඩබ්.එම්.එච්, විජේරත්න මහතා දැක්වූ පරිදි (2023.12.22) මහවිලච්චිය තුළ වනාන්තර කිහිපයක් පමණක් පවතින අතර විලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුවේ යෝජිත රක්ෂිත වනාන්තර පමණක් පවතී. සංරක්ෂිත, වන රක්ෂිත, ගම්බද ලෙස ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරන ලද වනාන්තර කිසිවක් නොමැත. ගැසට් කිරීමට යෝජනා කළ වනාන්තර පමණක් පවතියි. එමෙන්ම මහවිලච්චියෙහි උද්‍යාන හැරුණු විට ගැසට් කර නොමැත. එනමුදු විල්පත්තුව තුළ වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුවේ කොටසක් ගැසට් කර ඇත.

*වගුව 10 : වනාන්තරවල ප්‍රමාණය*

| වර්ගය | හෙක්ටයාර් |
|---|---|
| ඝන වනාන්තර | 2334.886355 |
| වන වගාව | 15.426313 |
| විවෘත වනාන්තර | 12.906464 |
| පඳුරුඉඩම් | 1245.230173 |
| එකතුව | 3608.449006 |

*මූලාශ්‍රය : ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තුමේන්තුව , 2024*

මේ තුළින් අපට අවබෝධ වනුයේ අධ්‍යයන ප්‍රදේශය තුළ වැඩි වශයෙන් (උදා 64.7%) ඝන වනාන්තර පවතින බවයි. එමෙන්ම

අනතුරුව පිළිවෙළින් පඳුරු ඉඩම්, විවෘත වනාන්තර හා වන වගාව අධ්‍යයන ප්‍රදේශය තුළ පවතියි. මෙම ප්‍රදේශ අලි-ඇතුන් ඔවුන්ගේ ආහාර සඳහා භාවිත කරනු ලබයි. සමස්ත අධ්‍යයන ප්‍රදේශයෙන් (43%) පමණ ප්‍රමාණයක වනාන්තර ව්‍යාප්ත වී පවතියි. මෙම ප්‍රදේශය තුළ වනාන්තර වර්ග දැක්වීමේ දී, විවෘත වනාන්තර, වියළි මෝසම් වනාන්තර, වන වගා මෙන්ම පඳුරු ද පවතින බව දැක්විය හැකිය. එනම් වනාන්තර කාණ්ඩ ලෙස ගත් විට විවෘත වනාන්තර, ඝන වනාන්තර පවතී.

දිසා වන නිලධාරි ඩබ්.එම්.එච්. විජේරත්න මහතා දැක්වූ පරිදි මහවිලච්චිය ප්‍රා.ලේ.කොට්ඨාසය තුළ විල්පත්තු ජාතික වනෝද්‍යානයට වැඩි භූමි ප්‍රමාණයක් (83%) අයත් වන බැවින් අලි-ඇතුන් සඳහා ආවරණයක් ලෙස භාවිත කළ හැකි වේ. මහවිලච්චිය ප්‍රදේශය අලි-ඇතුන්ට හොඳ වාසස්ථාන පවතින පරිසරයක් වේ. ඝන වනාන්තර, අලි-ඇතුන්ට විශාල වශයෙන් සුදුසු නොවුණ ද, කටුපඳුරු සහ ලඳු කැළෑ ආදි කුඩා වනාන්තර වර්ගවල බහුලව පවතින බැවින් අලි-ඇතුන් මෙම ප්‍රදේශවල වැඩි වශයෙන් සංක්‍රමණය කරයි. විල්පත්තුව ද ආවරණයක් ලෙස භාවිත කරන අතර සමස්තයක් වශයෙන් ඉහත තොරතුරු දෙස බලන කල අලි-ඇතුන්ට වාසස්ථාන සඳහා සුදුසු ප්‍රදේශයක් ලෙස අධ්‍යයන ප්‍රදේශය තෝරා ගත හැකිය.

භූ විසමතාව හඳුනා ගැනීමේ දී, වර්ග කි.මී. 634.88ක විශාලත්වයෙන් යුත් මහවිලච්චිය ප්‍රදේශයේ තන්තිරිමලේ හුදකලා කන්ද හැරුණු විට සමස්ත භූමියම තැනිතලා සහිතය (සම්පත් පැතිකඩ, 2022). අධ්‍යයන ප්‍රදේශය ද තැනිතලා භූමියක් වේ. අනුරාධපුර දිස්ත්‍රික්කය වියළි කලාපයට ගැනෙන නිසා භූමියේ වැඩි කොටසක් රතු පොඩ්සෝලික්පස් ගණයට වැටේ (Panabokke, 1967). මේ තත්ත්වය අධ්‍යයන ප්‍රදේශය තුළ ද දැක ගත හැකි වේ. අධ්‍යයන ප්‍රදේශය තුළ ඉතා කුඩා නිරාවරණය වූ පාෂාණ සහිත ප්‍රදේශයක් පමණක් පවතී. එය 9.2002197ha භූමියක් ආවරණය කරනු ලබයි. ඉඩම් භාවිත කර ඇති ආකාරය හඳුනා ගැනීමේ දී, අලි-මිනිස් ගැටුම් පවතින අධ්‍යයන ප්‍රදේශය තුළ නිවාස ආදි ඉදි කිරීම්, භූමියෙහි තරමක් ඒකරාශී වී පවතින බව අවබෝධ වේ. එනම් වනාන්තර ආදි ප්‍රදේශ හැරුණු විට මිනිසාට ජීවත් වීමට සුදුසු පරිසරයක් පවතින ප්‍රදේශවල ජනාවාස ව්‍යාප්ත වී පවතින බව අවබෝධ වේ (වගුව 11). අධ්‍යයන ප්‍රදේශයේ මානව භූ දර්ශනය දක්වන කල ප්‍රධාන වශයෙන්ම ගෙවතුවල ව්‍යාප්තිය දැක්විය හැකිය. තව ද ක්‍රීඩා පිට්ටනි වැනි ඉදිකළ ප්‍රදේශ දැක්විය හැකි වේ (සිතියම 2).

*වගුව 11 : ඉදිකළ ප්‍රදේශවල ප්‍රමාණය*

| වර්ගය | හෙක්ටයාර් |
|---|---|
| ගෙවතු | 535.239024 |
| ක්‍රීඩා පිට්ටනිය | 3.179605 |
| එකතුව | 538.418629 |

*මූලාශ්‍රය : ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව, 2024*

යථෝක්ත ප්‍රමාණයන් තුළින් අධ්‍යයන ප්‍රදේශයේ වනාන්තර හා කෘෂිකාර්මික භූමි පරිභෝගවලට සාපේක්ෂව අඩු ඉතා අඩු භූමි ප්‍රමාණයක් ඉදිකළ ප්‍රදේශවලට හිමි වේ ඉදි කළ ප්‍රදේශවලට හිමි වේ. ගෙවතු හා ක්‍රීඩා පිට්ටනි ද්විත්වය ගැනීමේ දී ගෙවතු යන සාධකයට අලි-ඇතුන් වැඩි කැමත්තක් දක්වනු ලබයි. එනම් මෙම ගෙවතු තුළ අලි-ඇතුන්ට ආහාර සඳහා ගත හැකි විවිධ වූ භෝග වර්ග (වට්ටක්කා, කැකිරි, පිපිඤ්ඤා යනාදිය) පවතින බැවින් අලි-ඇතුන්ට ගෙවතු යන සාධකය වාසස්ථාන නිර්මාණය

කිරීම සඳහා වඩා උචිත වේ. ක්‍රීඩා පිට්ටනි ගත් විට මේවා හිස් මතුපිටක් සහිත වීමේ දී අලි ඇතුන්ට බාධාකාරි වේ. එනම් ඔවුන්ට අවශ්‍ය ආහාර සපයා ගැනීමට හා අනෙකුත් අවශ්‍යතා සඳහා ක්‍රීඩා පිට්ටනි යන සාධකය උචිත නොවේ. අධ්‍යයන ප්‍රදේශයේ මානව ක්‍රියාකාරකම් පිළිබඳ දැක්වීමේ දී මාර්ග ව්‍යාප්තිය පිළිබඳ දැක්විය යුතු වේ. එනම් මෙම අධ්‍යයන ප්‍රදේශය තුළ පැතිරුණු මාර්ග ව්‍යාප්තියක් පවතියි. මාර්ග දක්නට නොලැබෙන ස්ථානවල මිනිසුන් සංචලනය නොවන ඝන වනාන්තර ආදි ප්‍රදේශ වේ. මෙම ප්‍රදේශ කුඩාවිලච්චිය තුලාන තුළ දක්නට ලැබෙන අතර අනෙක් තුලාන තුනෙහි සාමාන්‍යයෙන් පැතිරුණු ව්‍යාප්තියක් පවතියි.

අලි වැට හඳුනා ගැනීමේ දී, අලියන්ගෙන් සිදු වන හානි වැළැක්වීමට වර්තමානයේ තිබෙන ප්‍රධානතම ක්‍රමය විදුලි වැට වේ. මෙම විදුලි වැටවල් 4500km පමණ ඉදි කර ඇති අතර මෙම විදුලි වැටවලින් 90% පමණ අලි පැමිණෙන අතර 60% පමණ වන ජීවී රක්ෂණ කලාපවල පවති (මනුවරණ, 2022). අධ්‍යයනය ප්‍රදේශය තුළ රජය විසින් වර්තමානයේ අලිවැටවල් ඉදිකර ඇති අතර විල්පත්තු ජාතික වනෝද්‍යානයේ සිට මහවිලච්චිය වැව දෙසට අලි වැටක් ඉදි කර නොමැති ප්‍රදේශය කොරිඩෝවක් ලෙස හඳුනා ගෙන ඇති ප්‍රදේශයේ වේ. ප්‍රතිචාරකයින් දැක් වූ පරිදි මෙම අලි-වැටවල් සියල්ල අසාර්ථක වී ඇත (ප්‍රතිචාර ප්‍රමාණය: 87%). එනම් ඒවා නිසි ලෙස නඩත්තු කිරීමක් නොවීම සහ සුදුසු ප්‍රදේශවල නොවීම හේතු වන බව දක්වයි. එනම් ප්‍රතිචාරකයින් දැක්වූ පරිදි අලි වැටක් ඉදි කළ යුතු වනුයේ ගම ආසන්නයේ වේ. එනම් ඒවා නිසි ලෙස නඩත්තු කිරීමක් නොවීම සහ සුදුසු ප්‍රදේශවල නොවීම හේතු වන බව දක්වයි. විදුලි වැට භාවිත කළ හැකි සාර්ථක ක්‍රම දෙකක් පවතියි.

1.ගම්මාන ආරක්ෂා කරන ප්‍රාදේශීය විදුලි වැට

2.කුඹුරු ආරක්ෂා කරන කාලීන විදුලි වැට (මනුවරණ, 2022).

කුඹුරු ආදියට සැමදා විදුලි වැටක් අවශ්‍ය නොවන අතර අස්වනු පවතින කාලයට තාවකාලික විදුලි වැටක් සවි කිරීම සිදු වේ. මෙවැනි ක්‍රමවලින් අලි මිනිස් ගැටුම මැඬපැවත්වීමට අලි මිනිස් සහජීවනය ඇති කිරීමට සංරක්ෂණය හා සංවර්ධනය දෙකම කිරීම සඳහා පහසු වේ. මෙලෙස විදුලි වැට භාවිත කරන ප්‍රදේශයක් ලෙස හැළඹවැව ගම්මානය දැක්විය හැකිය. මෙම අලි වැට ප්‍රතිලාභීන් විසින් නඩත්තු කිරීම නිසා වර්තමානය වන විටත් ගම්මානය ආරක්ෂා කර ගැනීමට හැකි වී ඇත. තවදුරටත් ප්‍රදේශයේ අලිවැටවල් පිළිබඳ දැක්වීමේ දී එනම් විල්පත්තුවේ සිට මහවිලච්චිය වැව දක්වා පැමිණෙන අලි වැව් බැම්මේ සිට ගම්මානවලට ඇතුළු වීම වැළක්වීම සඳහා විදුලි වැටක් ඉදි කර ඇත. ඒ තුළින් අලි-ඇතුන්ට ගම්මානවලට පැමිණීමට බාධා ඇති කරනු ලබයි.

අලි-ඇතුන්ගේ වාසස්ථාන යෝග්‍යතාව තීරණය කිරීමේ දී විවිධ වූ නිර්ණායක භාවිත කළ හැකිය. වාසස්ථාන යෝග්‍යතාව කෙරෙහි ඍජු ලෙස බලපානු ලබන කරුණක් ලෙස ජන ඝනත්වය දැක්විය හැකි වේ. අධ්‍යයන ප්‍රදේශයේ ජන ඝනත්වය පිළිබඳ පහත වගුව (වගු අංක 12) තුළින් අවබෝධයක් ලබා ගත හැකි වේ. එනම් මෙම වගුව තුළින් අපට අවබෝධ වනුයේ අධ්‍යයන ප්‍රදේශය තුළ ඉහළ ජන ඝනත්වයක් පවතිනු ලබනුයේ කුඩාවිලච්චිය ග්‍රාම නිලධාරි වසම තුළ වේ.

*වගුව 12 : ජන ඝනත්වය*

| ජන සංඛ්‍යාව | ජන ඝනත්වය ( වර්ග කිලෝ මීටරයක ජීවත් වන ජන සංඛ්‍යාව) |
|---|---|
| කුඩාවිලච්චිය | 162.05 |
| කිරල්පැටියාව | 99.67 |
| හැළඹවැව | 56.17 |
| දූනුමඩලාව | 55.90 |

*මූලාශ්‍රය : සම්පත් පැතිකඩ, 2024*

අනතුරුව කිරල්පැටියාව, හැළඹ වැව, දූනුමඩලාව පිළිවෙළින් ජන ඝනත්වය ඉහළ වසම් වේ. මෙහි දී අවබෝධ වන කරුණක් වනුයේ අධ්‍යයන ප්‍රදේශය තුළ භූමි ප්‍රමාණය වැඩි වීම සහ ජනගහනය අඩු වීම මත අඩු ජන ඝනත්වයක් නිර්මාණය වන අතර භූමි ප්‍රමාණය වැඩිවන විට ජන සංඛ්‍යාව ද ඉහළ වේ නම් ජන ඝනත්වය ඉහළ ජන ඝනත්වයක් නිර්මාණය වේ. මෙහි දී අලි-ඇතුන්ගේ වාසස්ථාන යෝග්‍යතාව තක්සේරු කිරීමේ දී ජන ඝනත්වය ඉහළ වන විට වාසස්ථාන ඉදි කිරීම සඳහා සුදුසු නොවන අතර අඩු ජන ඝනත්වයන් අලි වාසස්ථාන තක්සේරු කිරීමේ දී වැදගත් වේ.

Rathnayake et.al (2022) වයඹ, පොළොන්නරුව සහ අම්පාර, වනජීවී කලාපවල මිනිස් මරණ සහ තුවාල වැඩි වශයෙන් සංකේන්ද්‍රණය වී ඇති බව හා අලි මරණ අලිමිනිස් ගැටුම කලාපය පුරා ව්‍යාප්ත වන අතර මධ්‍යම, පොළොන්නරුව, අනුරාධපුරය, වයඹ සහ දකුණු වනජීවී කලාපවල දේපළ හානි ඉහළ මට්ටමක පවතින බවත් අලි මිනිස් ගැටුම සහ ඉඩම් භාවිතය සහ ඉඩම් ආවරණ වෙනස් කිරීම සිදුවීම් අතර ප්‍රබල ඍණාත්මක සම්බන්ධයක් පවතින බවත් අනාවරණය කරගෙන ඇත. ප්‍රදේශයේ සිදු වී ඇති මිනිස් හා දේපළ හානි පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේ දී ප්‍රශ්නාවලි දත්ත අනුව වැටහී ගිය කරුණ වනුයේ විශාල වශයෙන් වගා හානි ද, අනතුරුව දේපළ හානි ද, අඩුවැඩි වශයෙන් අලි හා මිනිස් මරණ ද සිදු වන බවයි. එක් එක් විචල්‍යය එක්ව ගත් කල අධ්‍යයන ප්‍රදේශයේ අලි-වාසස්ථාන යෝග්‍යතාව පහත සිතියම තුළින් අවබෝධ කරගත හැකි වේ. Rathnayake et.al (2022) වයඹ, පොළොන්නරුව සහ අම්පාර, වනජීවී කලාපවල මිනිස් මරණ සහ තුවාල වැඩි වශයෙන් සංකේන්ද්‍රණය වී ඇති බව හා අලි මරණ අලි මිනිස් ගැටුම කලාපය පුරා ව්‍යාප්ත වන අතර මධ්‍යම, පොළොන්නරුව, අනුරාධපුරය, වයඹ සහ දකුණු වන ජීවී කලාපවල දේපළ හානි ඉහළ මට්ටමක පවතින බවත් අලි මිනිස් ගැටුම සහ ඉඩම් භාවිතය සහ ඉඩම් ආවරණ වෙනස් කිරීම සිදුවීම්වලට ප්‍රබල ඍණාත්මක සම්බන්ධයක් පවතින බවත් අනාවරණය කරගෙන ඇත. ප්‍රදේශයේ සිදු වී ඇති මිනිස් හා දේපළ හානි පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේ දී ප්‍රශ්නාවලි දත්ත අනුව වැටහී ගිය කරුණ වනුයේ විශාල වශයෙන් වගා හානි ද, අනතුරුව දේපළ හානි ද, අඩුවැඩි වශයෙන් අලි හා මිනිස් මරණ ද සිදු වන බවයි.

## *4.2. අලි-වාසස්ථාන යෝග්‍යතාවය*

විචල්‍යල වෙන් වෙන් වශයෙන් වාසස්ථාන යෝග්‍යතාවය කෙරෙහි දක්වන දායකත්වය ඉහත දැක්වූ සිතියම් තුළින් අවබෝධ වේ. සමස්තයක් වශයෙන් ගත් කළ අධ්‍යයන ප්‍රදේශය තුළ වර්තමානය වන විට වාසස්ථාන යෝග්‍යතාවය අඩු වේ. සමස්ත ප්‍රදේශය සාමාන්‍යයෙන් තැනිතලා ප්‍රදේශයක් වන අතර විවිධ ප්‍රමාණයේ වැව් පද්ධතිවලින්

පොහොසත් වේ. වර්ෂාපතනය වැඩි වශයෙන් පවතින ප්‍රදේශවලින් බහුතරයක් හොඳ අලි වාසස්ථාන යෝග්‍යතාවයක් නිරීක්ෂණය කළ හැකි අතර මධ්‍යයම යෝග්‍යතා ප්‍රදේශ ද පවති. අධ්‍යයන ප්‍රදේශ වටා පිහිටි විශාල භූමි ප්‍රමාණයක් අලි සඳහා අවම වාසස්ථාන යෝග්‍යතාවයක් පෙන්නුම් කරයි. ඉහළ කොටස හා ව්‍යාප්ත වුණු කුඩා ප්‍රදේශ කිහිපයක් පමණක් ඉහළ යෝග්‍යතාවයක් පෙන්නුම් කළ අතර, ඉතිරි ඉඩම් අවම සුදුසු බව නිරීක්ෂණය විය. අධ්‍යයන ප්‍රදේශයෙන් බහුතරයක් කුඹුරු, ගෙවතු, පොල්, හේන් සහ අනෙකුත් වතුවලින් සමන්විත වන අතර වී වගාව පවතින ප්‍රදේශ බොහෝමයක් මධ්‍යස්ථ සුදුසු ප්‍රදේශ ලෙස හඳුනා ගත හැකි ය. හේන් වගාව අධ්‍යයන ප්‍රදේශ පුරා පැතිර ඇති අතර මෙම ප්‍රදේශවලින් බොහෝමයක් වාසස්ථාන සඳහා මධ්‍යස්ථ වන අතර ඉහළ සුදුසු මෙන් ම අවම සුදුසු ප්‍රදේශ ද අධ්‍යයන ප්‍රදේශය තුළ පවති. පාරිසරික් සාධක බර බැලීමේ දී වනන්තර ඉඩම් ඉඩම්වලින් බහුතරයක් පහත් සහ අවම සුදුසු පන්තියට වැටුණි




*සිතියම 3 : කෘෂිකාර්මික ප්‍රදේශ හා වාසස්ථාන යෝග්‍යතාවය*

*මූලාශ්‍රය : ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තුමේන්තුවෙන් ලබාගත් දත්ත මත පදනම්ව භූගෝල විද්‍යා තොරතුරු පද්ධතිය ආශ්‍රයෙන් (ArcGIS 10.8 මෘදුකාංගය භාවිතයෙන්) සකසන ලදී (2024)*

එක් එක් විචල්‍යය එක්ව ගත් කල අධ්‍යයන ප්‍රදේශයේ අලි-වාසස්ථාන යෝග්‍යතාවය පහත සිතියම (සිතියම 3) තුළින් අවබෝධ කර ගත හැකි වේ.

බහු නිර්ණායක තීරණ ක්‍රමය භාවිතයෙන් වාසස්ථාන යෝග්‍යතාව හඳුනා ගැනීමේ දී, සමස්තයක් වශයෙන් ගත් කල අධ්‍යයන ප්‍රදේශය තුළ වර්තමානය වන විට වාසස්ථාන යෝග්‍යතාව අඩු වේ. සමස්ත ප්‍රදේශය සාමාන්‍යයෙන් තැනිතලා ප්‍රදේශයක් වන අතර විවිධ ප්‍රමාණයේ වැව් පද්ධතිවලින් පොහොසත් වේ. වර්ෂාපතනය වැඩි වශයෙන් පවතින ප්‍රදේශවලින් බහුතරයක් හොඳ අලි වාසස්ථාන යෝග්‍යතාවක් නිරීක්ෂණය කළ හැකි අතර මධ්‍යම යෝග්‍යතා ප්‍රදේශ ද පවතියි. අධ්‍යයන ප්‍රදේශ වටා පිහිටි විශාල භූමි ප්‍රමාණයක් අලි සඳහා අවම වාසස්ථාන යෝග්‍යතාවක් පෙන්නුම් කරයි. ඉහළ කොටස හා ව්‍යාප්ත වුණු කුඩා ප්‍රදේශ කිහිපයක් පමණක් ඉහළ යෝග්‍යතාවක් පෙන්නුම් කළ අතර, ඉතිරි ඉඩම් අවම සුදුසුබව නිරීක්ෂණය විය. අධ්‍යයන ප්‍රදේශයෙන් බහුතරයක් කුඹුරු, ගෙවතු, පොල්, හේන් සහ අනෙකුත් වතුවලින් සමන්විත වන අතර වී වගාව පවතින ප්‍රදේශ බොහෝමයක් මධ්‍යස්ථ සුදුසු ප්‍රදේශ ලෙස හඳුනා ගත හැකිය. හේන් වගාව අධ්‍යයන ප්‍රදේශ පුරා පැතිර ඇති අතර මෙම ප්‍රදේශවලින් බොහෝමයක් වාසස්ථාන සඳහා මධ්‍යස්ථ වන අතර ඉහළ සුදුසු මෙන්ම අවම සුදුසු ප්‍රදේශ ද අධ්‍යයන ප්‍රදේශය තුළ පවතියි. පාරිසරික සාධක බර බැලීමේ දී වනාන්තර ඉඩම්වලින් බහුතරයක් පහත් සහ අවම සුදුසු පන්තියට වැටුණි. අධ්‍යයන ප්‍රදේශයෙහි වර්තමාන තත්ත්වය දෙස බලන කල, විදුලි වැටවල් පිහිටීම මත

පදනම්ව සමස්ත ප්‍රදේශයෙහිම ඉහළ අවධානමක් ඇත. ඉහළ අවදානමක් ඇත. සියලුම සමීප සාධක සැලකිල්ලට ගත් විට වයඹ ප්‍රදේශයෙහි පැහැදිලිවම අලිවාසස්ථාන යෝග්‍යතාව සඳහා අවම සුදුසු වේ. මෙම ප්‍රදේශය තුළ ඝන වනාන්තර පවතින අතර අලි ඇතුන් වඩාත් ප්‍රියතාවක් දක්වනු ලබනුයේ පවතින දැනුම් සම්භාරයට අනුව විවෘත වනාන්තරවලට වීම මේ කෙරෙහි බලපානු ලබයි. ඝන වනාන්තර, විවෘත වනාන්තර හා පඳුරු සහිත ප්‍රදේශ ප්‍රමාණයේ සාධකය සලකා බැලීමේ දී ඉතා ඉහළ සහ සුදුසු පන්ති යටතට වැටේ. ඉතා උස් සහ උස් ප්‍රදේශ බහුතරයක් වනාන්තර, ස්වභාවිකාරක්ෂිත සහ ලඳු කැළෑ ආශ්‍රිත ප්‍රදේශවල දක්නට ලැබෙන අතර, භූගෝලීය විශ්ලේෂණයේ දී මධ්‍යස්ථ සුදුසු ප්‍රදේශ උද්‍යානවල දක්නට ලැබේ. අඩු අවකාශීය ආවරණයක් සහිත මිශ්‍ර ශාක සහ අනෙකුත් බහුවාර්ෂික පලතුරු සහ පොල් ආදිය මධ්‍යස්ථව වැදගත් බව අවබෝධ වේ. සමස්තයක් වශයෙන් තැනිතලා බව අලි වාසස්ථාන නිර්ණය කිරීමේදී මේ ප්‍රදේශය තුළටම වැදගත් වේ.

අධ්‍යයන ප්‍රදේශය විල්පත්තු ජාතික වනෝද්‍යානයට ආසන්නව පිහිටා ඇති බැවින්, ආශ්‍රිත ප්‍රදේශය තුළ ඉහළ හා මධ්‍යස්ථ යෝග්‍යතා ප්‍රදේශ පවතියි. අධ්‍යයන ප්‍රදේශය තුළ යෝග්‍යතා කලාප සිතියමට සමස්ත යෝග්‍යතා සොයා ගැනීම්වලින් පෙනී ගියේ පර්යේෂණ ප්‍රදේශයෙන් බහුතරයක් අලි වාසස්ථාන සඳහා අවම සුදුසු ප්‍රදේශවලට අයත් වන බවයි. එනම් සිතියම තුළින් අධ්‍යයන ප්‍රදේශයේ 21.01%ක ප්‍රමාණයක් අලි වාසස්ථාන සඳහා ඉතා සුදුසු බව සටහන් විය. එමෙන්ම 34.19% ප්‍රමාණයක් අලිවාසස්ථාන යෝග්‍යතාවය සඳහා මධ්‍යයස්ථ සුදුසු ප්‍රදේශ වන අතර 45.80% ක් පමණ ප්‍රමාණයක් අලි වාසස්ථාන සඳහා අවම සුදුසු ප්‍රදේශ ලෙස හඳුනා ගත හැකි විය. Withanage et al. 2023 පර්යේෂණය තුළ අධ්‍යයන ප්‍රදේශයේ සමස්ත භූමි ප්‍රමාණයෙන් 15.3% ප්‍රදේශයේ අලි වාසස්ථාන සඳහා ඉතා උචිත බවත්, අවම සුදුසු ප්‍රදේශ 4%ක් අලි ඇතුන්ගේ උදෙසා මධ්‍යස්ථ ප්‍රදේශ 33.8% ක් බවත් සමස්ත සිතියම තුළ 23.7% ඉහළ අවධානම් අවම අවදානම් ප්‍රදේශ 5.4% හා මධ්‍යස්ථ 26.27% ලෙස හඳුනා ගෙන ඇත. එනම් මේ අනුව අධ්‍යයනයේ අවශ්‍යතාවය මත වාසස්ථාන සඳහා යෝග්‍යතාව හඳුනා ගත හැකි වේ.

තවදුරටත් මෙම අධ්‍යයන ප්‍රදේශයෙහි වාසස්ථාන යෝග්‍යතාව ග්‍රාම නිලධාරි කොට්ඨාස ඇසුරෙන් (13වගුව) ප්‍රදේශ අනුව අලි-ඇතුන් සඳහා යෝග්‍ය වාසස්ථාන පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි වේ.

*වගුව 13 : ග්‍රාම නිලධාරි කොට්ඨාසය අනුව වාසස්ථාන යෝග්‍යතාවය (පර්යේෂකයා විසින් සකස් කරන ලදී, 2024)*

| **ග්‍රාම නිලධාරි කොට්ඨාසය** | **වාසස්ථාන යෝග්‍යතාවය** | | |
|---|---|---|---|
| | **ඉහළ යෝග්‍ය ප්‍රදේශ** | **මධ්‍යස්ථ යෝග්‍ය ප්‍රදේශ** | **අවම යෝග්‍ය ප්‍රදේශ** |

| | % | ha | % | Ha | % | Ha |
|---|---|---|---|---|---|---|
| 356 - දුනුමඬලාව (2029.88ha) | 24.67 | 500.68 | 20.91 | 424.48 | 54.42 | 1104.72 |
| 357 - හැළඹ වැව (2608.25ha) | 23.86 | 622.24 | 25.56 | 666.64 | 50.58 | 1319.37 |
| 358 - කුඩාවිලච්චිය (2174.17ha) | 26.79 | 582.38 | 35.3 | 767.43 | 37.92 | 824.35 |
| 359 - කිරල්පැටියාව (1600.21ha) | 25.53 | 408.52 | 36.15 | 578.46 | 38.32 | 613.22 |

*මූලාශ්‍රය : අධ්‍යයනයේ ගණනය කිරීම් ඇසුරින් (2024)*

එනම් ග්‍රාම නිලධාරි වසම් අනුව බෙදා දැක්වීමේ දී, වැඩි වශයෙන් ඉහළ යෝග්‍යතාවක් පවතිනුයේ කුඩාවිලච්චිය කොට්ඨාසය තුළ වන අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම මෙම ප්‍රදේශය තුළ විල්පත්තු ජාතික වනෝද්‍යානයට අයත් භූමි භාගයක් පැවතීමත් එම ප්‍රදේශය තුළ ජන ඝනත්වයක් නොවීමත් මේ සඳහා බලපානු ලබයි. වනාන්තර ප්‍රදේශය අලි වාසස්ථාන සඳහා සුදුසුම ප්‍රදේශය බව දක්වා ඇත (Barman, 2022). දුනුමඬලාව හා කිරිල්පැටියාව කොට්ඨාසවල එක සමාන පැතිරීමක් දැක ගැනීමට ලැබේ. මෙම කොට්ඨාස ද්විත්වය ආසන්නයෙහි අලි-ඇතුන් ප්‍රිය කරන විවෘත වනාන්තර හා අනෙකුත් ජල පහසුකම් පැවතීම ද මේ සඳහා බලපානු ලබයි. Pla -ard,Sukmasuang,Srinopawan, (2019) දක්වන පරිදි ලුණු ලෙව කන ස්ථාන, විනෝදාත්මක ප්‍රදේශ සහ ස්ථිර ජල මූලාශ්‍රය ප්‍රදේශයේ අලි-ඇතුන් සඳහා වඩාත් යෝග්‍ය බව සොයාගෙන ඇත. එනම් අලි ඇතුන්ට ජීවන තත්ත්වය පවත්වා ගැනීමට අවශ්‍ය සාධක මෙම ප්‍රදේශය තුළ පැවතීම හේතුවයි. අලි ඇතුන්ගේ වාසස්ථාන සඳහා අවම යෝග්‍ය ප්‍රදේශ වැඩිම දුනුමඬලාව කොට්ඨාසය තුළ වේ. එනම් කුඩා කැළෑ ප්‍රදේශයකට ආසන්නව පවතින ප්‍රදේශ පමණක් මෙම ප්‍රදේශය තුළ යෝග්‍ය වන අතර, සාමාන්‍යයෙන් 50%කටත් වඩා වැඩි සඳහා යෝග්‍ය භූමි ප්‍රදේශයක් පවතියි. අවම යෝග්‍ය ප්‍රදේශ කිරල්පැටියාව හා කුඩාවිලච්චිය ග්‍රාම නිලධාරි කොට්ඨාසවල වේ.

දුනුමඬලාව කොට්ඨාසය, මධ්‍යස්ථ යෝග්‍ය ප්‍රදේශ අවම කොට්ඨාසය වන අතර මධ්‍යස්ථ යෝග්‍ය ප්‍රදේශ වැඩිම කිරල්පැටියාව කොට්ඨාසය වේ. මෙම ප්‍රදේශය වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් හඳුනාගෙන තිබෙන විල්පත්තු - මහවිලච්චිය වැව අලි කොරිඩෝව තුළ පිහිටන අතර එබැවින් ඉහළ යෝග්‍ය හා මධ්‍යස්ථ යෝග්‍ය ප්‍රදේශ වැඩිවේ. මේ තුළින් තවදුරටත් අලි-

වාසස්ථාන යෝග්‍යතාව අධ්‍යයන ප්‍රදේශය තුළ ව්‍යාප්ත වී ඇති ආකාරය පැහැදිලි කරනු ලබයි.

විදේශීය සාහිත්‍යය සන්දර්භය තුළ Multi Critiria Analysis (MCA) භාවිත කරමින් අලිවාසස්ථාන යෝග්‍යතා සිතියමක් නිර්මාණය කර තිබුණ ද, දේශීය සාහිත්‍යය තුළ පවතින අලි වාසස්ථාන යෝග්‍යතාවය තක්සේරු කර MCA භාවිත කර වාසස්ථාන සිතියමක් නිර්මාණය කිරීම යන හිඩැස මේ තුළින් සම්පූර්ණ කිරීමට හැකි වී ඇත. මෙහි දී මේ සඳහා තවත් විවිධ වූ විචල්‍ය භාවිත කරමින් අධ්‍යයන ප්‍රදේශයෙහි අලි-ඇතුන්ගේ වාසස්ථාන යෝග්‍යතාව සොයා බැලිය හැකි වේ.

## 5. නිගමනය හා නිර්දේශ

ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාත තුළ අලි මිනිස් ගැටුම වැඩි වශයෙන් පවතින දිස්ත්‍රික්කයක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කය හඳුනා ගත හැකි වේ. අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතුරෙන් මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අලි-මිනිස් ගැටුම පාරිසරික වශයෙන් අලි-ඇතුන් කෙරෙහි බලපාන ගැටලුවක් බවට පත් වී ඇත. ඒ අනුව අලි-ඇතුන්ගේ වාසස්ථාන යෝග්‍යතා තක්සේරුව සහ සිතියම්කරණය, මෙම අධ්‍යයනයට තෝරා ගත් ප්‍රදේශය (හැළඹවැව, දූනුමඬලාව, කුඩාවිලච්චිය හා කිරල්පැටියාව තුලාන) තුළ සිදු කර ඇත. අධ්‍යයනය තුළින් ලබා ගත් දත්ත පුළුල් ලෙස විශ්ලේෂණයකට ලක් කර එම විශ්ලේෂණ පදනම් කර ගනිමින් එළඹිය හැකි නිගමන කිහිපයකි.

අධ්‍යයනයේ දී ප්‍රථමයෙන් ආහාර ආවරණය, භෞතික භූ දර්ශනය මානව ක්‍රියාකාරකම් හඳුනාගත හැකි හැකි වූ අතර එහි දී අලි වාසස්ථාන සඳහා බලපාන ධනාත්මක සාධක හා ඍණාත්මක සාධක අවබෝධ කර ගත හැකි විය. එමෙන්ම වර්තමානය වන විට ගොවියන්ට දැනුම නොමැතිකම, කාලය පිළිබඳ පවතින ගැටලුව ආදිය මත අලි-ඇතුන්ගේ වාසස්ථාන ඇගයීමකට ලක් නොකරන බව අවබෝධ විය. අලි ගම්මානවලට පැමිණීමට, ප්‍රධාන වශයෙන්ම බලපානු ලබනුයේ මිනිස් ක්‍රියාකාරකම් වේ. මෙහි දී ඉඩම් අල්ලාගෙන වැටවල් ආදිය තුළින් මිනිසා තම අයිතිවාසිකම් තහවුරු කළ ද, මෙම තත්ත්වයන් තුළ අලි-ඇතුන් ඔවුන්ගේ වාසභූමි ලබා ගැනීමට සටන් කිරීමේ දී අලි-මිනිස් ගැටුම් ඇති වේ.

අලි කොරිඩෝවෙහි වනාන්තර ව්‍යාප්තිය හා උපනති අධ්‍යයනය කිරීම තුළින් 1999-2024 කාල පරිච්ඡේදයෙහි වනාන්තර ප්‍රමාණයෙහි විශාල අඩුවීමක් දැකගන්නට ලැබේ. මෙම තත්ත්වය අලි-ඇතුන්ගේ වාසස්ථාන යෝග්‍යතාව කෙරෙහි බලපා ඇති අතර වර්තමානයට සාපේක්ෂව අතීතය තුළ ඉහළ අලි වාසස්ථාන යෝග්‍යතාවක් පවතින්නට ඇත. ක්‍රමයෙන් අධ්‍යයන ප්‍රදේශය තුළ අලි කොරිඩෝවෙහි මිනිස් ක්‍රියාකාරකම් වැඩි වීමක් දැකගන්නට ලැබෙන අතර වර්තමානයට සාපේක්ෂව අනාගතය වන විට අලි-ඇතුන්ගේ වාසස්ථාන සඳහා යෝග්‍යතා ප්‍රදේශ අඩු වීම කෙරෙහි මෙම තත්ත්වය බලපානු ඇත.

හඳුනා ගත් සාධක මත අධ්‍යයන ප්‍රදේශය තුළ අලි-ඇතුන්ට යෝග්‍ය වාසස්ථාන තක්සේරු කිරීමට හැකි විය. එනම් ප්‍රධාන වශයෙන්ම අලි-ඇතුන්ගේ වාසස්ථාන කෙරෙහි බලපානු ලබන ආහාර, ජලය, වාසස්ථාන ආදිය අධ්‍යයන ප්‍රදේශය තුළ විවිධ අයුරින් පැවතීම අලි-ඇතුන් අධ්‍යයන ප්‍රදේශයෙහි ගැවසීමට හේතු වේ. එමෙන්ම පවතින සම්පත් සඳහා අලි සහ මිනිසා අතර

විවිධ ලෙස ගැටුම් ඇති වීම ද වර්තමානය වන විට දැක ගැනීමට ලැබේ. නමුදු අලි-ඇතුන්ගේ වාසස්ථාන සඳහා බලපානු ලබන සාධක බොහෝමයක් මෙම ප්‍රදේශය තුළ පවතින බව තක්සේරු කළ හැකි වේ. සමස්ත අධ්‍යයනය මඟින් එළඹිය හැකි නිගමනය වනුයේ අධ්‍යයන ප්‍රදේශය තුළ අලි-ඇතුන්ට ඉහළ යෝග්‍යතාවක් පවතින වාසස්ථාන අඩු බවයි. එමෙන්ම මධ්‍යස්ථ යෝග්‍යතාවක් පවතින ස්ථාන ද බොහෝ පවතින නමුදු ප්‍රදේශය තුළ විශාල වශයෙන් පවතිනුයේ අවම යෝග්‍යතාවක් පවතින ස්ථාන වේ. වර්තමානය වන විට අලි-මිනිස් ගැටුම ඇති වීමට ප්‍රධානම හේතුව වන්නේ අලින්ට හිමි භූමිවල මිනිසුන් විසින් අනවසර ඉදි කිරීම් සිදු කිරීම හා වගා කටයුතු සිදු කිරීමයි. එවිට අලින්, මිනිස් වාස භූමි ප්‍රදේශයන්ට පැමිණීම වැළක්විය නොහැකිය. වාසස්ථාන යෝග්‍යතාව සිතියම්ගත කිරීමේ දී විශාල භූමි ප්‍රමාණයක් අලි වාසස්ථාන යෝග්‍යතාව සඳහා නුසුදුසු වූ අතර මෙම නුසුදුසු ප්‍රදේශවලින් විශාල ප්‍රමාණයක් නිත්‍යානුකූල අයිතියක් නොමැති හේන් වගා ඉඩම් වේ. මේ සඳහා බලධාරීන් විසින් වනාන්තර එළි කිරීම ආදි ගැටලු සඳහා නීත්‍යානුකූල පියවර ගැනීමට කටයුතු කළ යුතුය.

තව ද සිතියම තුළින් හඳුනාගත් මධ්‍යස්ථ සුදුසු වාස භූමි අලි-වාසස්ථාන සඳහා අවම සුදුසු ස්ථාන බවට පත් වීම වැළක්වීමට ජනතාවගෙන් එල්ල වන අහිතකර බලපෑම් අවම කළ යුතු වේ. ඒ සඳහා ජනතාව දැනුවත් කිරීම හා ජනතාව මෙම ප්‍රදේශ සමඟ පවත්වන සම්බන්ධතා අවම කිරීම සඳහා වෙනත් ආර්ථික ක්‍රියාමාර්ගවලට යොමු කිරීම උදෙසා සැලසුම් සකස් කිරීම තුළින් ග්‍රාමීය ජනතාවගේ ආර්ථික තත්ත්වය නංවාලීමට මෙන්ම වනජීවී වාසස්ථාන ආරක්ෂා කරමින් වන ජීවීන්ගේ පැවත්ම සහතික කිරීමට හැකි වේ. එමෙන්ම අලි මිනිස් ගැටුම අවමකර ගැනීම සඳහා ප්‍රජාවගේ සක්‍රීය දායකත්වය අවශ්‍ය වේ. අලි-මිනිස් ගැටුම පාලනය කිරීම සඳහා විදුලි වැට ඉදිකිරීම සාර්ථක විසඳුමක් ලෙස අධ්‍යයනයේ දී පැහැදිලි විය. එහි දී විදුලි වැට ඉදිකළ යුතු වනුයේ රක්ෂිත ප්‍රදේශ වටා නොව ගම්මාන වටා වන අතර කුඹුරු ආදිය ආරක්ෂා කිරීමේ දී ද කුඹුරු වටා පමණක් ඉදි කර අස්වනු නෙළු පසු ඉවත් කරදැමීම තුළින් අලි-ඇතුන්ට වන බාධාව අවම කර ගත හැකි වේ. එමෙන්ම පවතින විදුලි වැට සාමාන්‍යය වැටක් වීම නිසා නිසි පරිදි පවත්වාගෙන යාමට බලධාරින් මෙන්ම ප්‍රජාව ද උනන්දු නොවීම නිසා එය අසාර්ථක වී තිබේ. හැළඹවැව ගම්මානයට මෙන් සාර්ථක විදුලි වැටක් සමස්ත ප්‍රදේශය ආවරණය වන ලෙස නිර්මාණය කළ යුතු වන අතර වන ජීවී නිලධාරීන් හා ප්‍රජාව අතර මනා සහයෝගයක් හා රාජ්‍ය අංශයේ මැදිහත් වීම ද නොඅඩුව පැවතිය යුතුය.

ප්‍රජා සහභාගිත්වය උපරිම අයුරින් ලබා ගැනීමෙන් ද අලි-මිනිස් ගැටුම් අවම කරගත හැකි වේ. එහි දී ජනතාව විසින් ඇති කරන ලද ගවයන් තණකොළ කැවීම සඳහා රක්ෂිත ප්‍රදේශවලට මුදා හැරීමත් සමඟ අලියන්ට ආහාර හිඟවීමෙන් අලියන් ආහාර සොයා ගම් වදියි. එමෙන්ම ගවයන් රක්ෂිතයට ඇතුළු කිරීම නිසා විදුලි වැට යම් යම් ස්ථානවලින් කැඩීම නිසා ද අලියන්ට ගම්මානයට ඒමට පහසු වී ඇත. එබැවින් විදුලි වැට නඩත්තු කිරීම සඳහා ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීම ඉතා වැදගත් මෙන්ම අත්‍යවශ්‍ය සාධකයක් වේ. අලි වාසස්ථාන යෝග්‍යතා සිතියම, සංචාරක කර්මාන්තය උදෙසා භාවිත කර රටෙහි ආර්ථික සංවර්ධනයක් ඇති කළ හැකි වේ. එනම් ප්‍රධාන වශයෙන්ම ආදායම් උත්පාදනය කළ හැකි මාර්ගයක් වන සංචාරක කර්මාන්තය වැඩි දියුණු කරමින් අලි-ඇතුන් ප්‍රදර්ශනය කිරීම හරහා විදේශ

ආයෝජන ආදිය ශ්‍රී ලංකාවට ලබා ගැනීමට හැකි වේ. වාසස්ථාන යෝග්‍යතා සිතියම හොඳින් අධීක්ෂණය තුළින් එය සිදු කිරීම පහසු වේ. මෙම අධ්‍යයනය තුළින් ඉතා කුඩා ප්‍රදේශයක අලි-ඇතුන්ගේ වාසස්ථාන යෝග්‍යතාව සලකා බලා ඇති අතර, ඒ සඳහා ආහාර හා ආවරණය, භෞතික භූ දර්ශනය සහමානව කටයුතු සලකා බලා ඇති අතර වාසස්ථාන යෝග්‍යතාව අධ්‍යයනයේ දී MCA සඳහා භාවිත කර ඇති සාධක (5වගුව) වේ. මෙහි දී වාසස්ථාන යෝග්‍යතාව අධ්‍යයනය උදෙසා තවත් වෙනත් සාධක සමඟ විශ්ලේෂණය සිදුකළහොත් මෙම ප්‍රතිඵල වෙනස් විය හැකිය. එහි දී එනම් භාවිත කරන විචල්‍ය මත අලි-ඇතුන්ගේ වාසස්ථාන යෝග්‍යතාව පවතින අවම, සුදුසු, මධ්‍යස්ථ හා ඉහළ, සුදුසු ප්‍රදේශ වෙනස් විය හැකි වේ.

## 6. ආශ්‍රිත ග්‍රන්ථ


Alamgir, M., Mukul, S.A. and Turton, S.M. (2015). Modelling spatial distribution of critically endangered Asian elephant and Hoolock gibbon in Bangladesh forest ecosystems under a changing climate. *Applied Geography*, [online] 60, pp.10–19. doi:https://doi.org/10.1016/j.apgeog.2015.03.001[Accessed 29 Nov. 2023].

Anuradha, J.M.P.N., Fujimura, M., Inaoka, T. and Sakai, N. (2019). The Role of Agricultural Land Use Pattern Dynamics on Elephant Habitat Depletion and Human-Elephant Conflict in Sri Lanka. *Sustainability*, [online] 11(10), pp.1–14. Available at: https://ideas.repec.org/a/gam/jsusta/v11y2019i10p2818-d231980.html[Accessed 29 Nov. 2023].

Areendran, G., Raj, K., Mazumdar, S., Munsi, M., Govil, H. and Sen, P.K. (2011). Geospatial modeling to assess elephant habitat suitability in northzzamnmern Chhattisgarh. *Tropical Ecology,* [online] 52(3): 275-283. Available at: https://www.academia.edu/4909069/Geospatial_modeling_to_assess_elephant_habitat_suitability_in_northern_Chhattisgarh.

Barman, J., Narjinary, S., Biswas, S., Biswas, B. and Jadhav, R. (2022). Elephant Habitat Suitability Analysis of Alipurduar District, West Bengal Using Geospatial Technology. *Nature Environment and Pollution Technology*, [online] 21(4), p.1705. Available at: https://www.academia.edu/92170459/Elephant_Habitat_Suitability_Analysis_of_Alipurduar_District_West_Bengal_Using_Geospatial_Technology [Accessed 29 Nov. 2023].

climatedataguide.ucar.edu. (n.d.). *CHIRPS: Climate Hazards InfraRed Precipitation with Station data (version 2) | Climate Data Guide*. [online] Available at: https://climatedataguide.ucar.edu/climate-data/chirps-climate-hazards-infrared-precipitation-station-data-version-2 [Accessed 25 Jun. 2024].

Chen, Y., Atzeni, L., Gibson, L., Sun, Y., Yang, Z., Shi, K. and Dudgeon, D. (2022). Urban expansion and infrastructure development reduce habitat

suitability for Asian elephants in southwestern China. *The Journal of Wildlife Management*, [online] 86(4). doi:https://doi.org/10.1002/jwmg.22204[Accessed 29 Nov. 2023].

Chen, Y., Ding, N., Sun, Y., Xiao, C., Shi, K. and Dudgeon, D. (2023). Is there scope for growth? Mapping habitat suitability for Asian elephant (Elephas maximus) across its range in China. *Global Ecology and Conservation*, [online] 47, p.e02665. doi:https://doi.org/10.1016/j.gecco.2023.e02665[Accessed 29 Nov. 2023].

De Silva, S. and Srinivasan, K. (2019). Revisiting social natures: People-elephant conflict and coexistence in Sri Lanka. *Geoforum*, [online] 102, pp.182–190. doi:https://doi.org/10.1016/j.geoforum.2019.04.004[Accessed 29 Nov. 2023].

Fernando, P., Wikramanayake, E., Weerakoon, D., Jayasinghe, L.K.A., Gunawardene, M. and Janaka, H.K. (2005). Perceptions and Patterns of Human–elephant Conflict in Old and New Settlements in Sri Lanka: Insights for Mitigation and Management. *Biodiversity and Conservation*, [online] 14(10), pp.2465–2481. doi:https://doi.org/10.1007/s10531-004-0216-z[Accessed 29 Nov. 2023].

Fernando, P. (2004). [online] 22(2). Available at:http://www.ccrsl.org/userobjects/2602_683_Fernando-00ElephantsSriLanka.pdf

Gunawansa, T., Perera, K., Apan, A. and Hettiarachchi, N. (2023). The human-elephant conflict in Sri Lanka: history and present status. [online] doi:https://doi.org/10.1007/s10531-023-02650-7 [Accessed 29 Nov. 2023].

Hettiarachchi, C.J., Priyankara, P., Morimoto, T. and Murayama, Y. (2021). Participatory GIS-Based Approach for the Demarcation of Village Boundaries and Their Utility: A Case Study of the Eastern Boundary of Wilpattu National Park, Sri Lanka. ISPRS International Journal of Geo-Information, [online] 11(1), p.17. doi:https://doi.org/10.3390/ijgi11010017 [Accessed 29 Nov. 2023].

Kumar, V., Raghevendra, S., Devagiri, G.M. and Rani, V. (2023). Assessing Asian Elephant Habitat Preferences in the Central Western Ghats Using GIS, Remote Sensing, and Analytical Hierarchy Process (AHP). *International Journal of Environment and Climate Change*, [online] 13(10), pp.3355–3365. doi:https://doi.org/10.9734/ijecc/2023/v13i103004[Accessed 29 Nov. 2023].

Karunarathne, A. Y. (2023). Geographies of Global Climate Tipping Points (CTPs) and Their Implications for the Planet Earth: A Bibliometric Review. *Colombo Geographer*, 1 (1), 1-25.

Madhushanka, S., Ranawana, K.B. (2021). Human Elephant Conflict (HEC) in Sri

Lanka: a Review. *WILDLANKA*, [online] Vol.9, No.3, pp. 361 – 370. Available at: https://www.academia.edu/97608953/Human_Elephant_Conflict_HEC_in_Sri_Lanka_a_Review [Accessed 20 Dec. 2023].

Madhushanka, S., Ranawana, K.B. (2021). Human Elephant Conflict (HEC) in Sri Lanka: a Review. *WILDLANKA*, [online] Vol.9, No.3, pp. 361 – 370. Available at: https://www.academia.edu/97608953/Human_Elephant_Conflict_HEC_in_Sri_Lanka_a_Review [Accessed 20 Dec. 2023].

Mahees, M.T.M. and Rajapaksha, R.D.S. (2020). *The Impact of Human Elephant Conflicts on the Family Life of Dry Zone People and the Role of Social Work – M.T.M. Mahees*. [online] Available at: https://www.res.cmb.ac.lk/soc/mtm.mahees/index.php/pubs/the-impact-of-human-elephant-conflicts-on-the-family-life-of-dry-zone-people-and-the-role-of-social-work/[Accessed 29 Nov. 2023].

Mandal, M. and Chatterjee, N.D. (2020) 'Elephant's habitat suitability assessment through geo spatial quantification in Panchet forest division, West Bengal,' *Ecofeminism and Climate Change*, [online] 1(3), pp. 127–140. https://doi.org/10.1108/efcc-05-2020-0012[Accessed 29 Nov. 2023].

Maria, A . (2014). Effect of change in land use and land cover on elephant habitat and corridor in Lower Shivaliks area of Uttarakhand | *Official website of Indian Institute of Remote Sensing, Indian Space Research Organisation, Government of India*. [online] Available at: https://www.iirs.gov.in/content/effect-change-land-use-and-land-cover-elephant-habitat-and-corridor-lower-shivaliks-area [Accessed 29 Nov. 2023].

Mongkolsawat C. and Chanket U. (n.d.). *Predicting Asian Elephant Habitat Suitability with Satellite Data and GIS*. [online] Available at: https://gecnet.kku.ac.th/research/i_proceed/2550/5_Predicting_Asian.pdf?shem=sswnst[Accessed 29 Nov. 2023].

Panabokke, C.R. (1967). *The Soils of Ceylon and Use of Fertilizers*. Metro Printers, Madison.

Pla-ard, M., Sukmasuang, R. and Srinopawan, K. (2019). Population characteristics and habitat suitability of Asian elephants (Elephas maximus Linnaeus, 1758) in the Khao Yai National Park, Thailand. *European Journal of Ecology*, [online] 5(2), pp.62–71. doi:https://doi.org/10.2478/eje-2019-0012[Accessed 29 Feb. 2023].

Rathnayake, C.W.M., Jones, S., Soto-Berelov, M. and Wallace, L. (2022). Human–elephant conflict and land cover n Sri Lanka. *Applied Geography*, [online] 143, p.102685. doi:https://doi.org/10.1016/j.apgeo

g.2022.102685[Accessed 29 Nov. 2023].

Samaraweera, S., Perera, T.A., Galagoda, U., Senadilankara, A. and Udawatthe, C. (2023). *Landscape Based Mitigation Design for Addressing the Human Elephant Conflict in Katupotha Area in Puttalam District.* [online] Available at: https://www.researchgate.net/publication/374228048[Accessed 29 Mar. 2023].

Silva, S. D., and Srinivasan, K. (2019). Revisiting social natures: People-elephant conflict and coexistence in Sri Lanka. *Geoforum*, 102, 182-190.

Thant, Z.M., Leimgruber, P., Williams, A.C., Oo, Z.M., Røskaft, E. and May, R. (2023). Factors influencing the habitat suitability of wild Asian elephants and their implications for human–elephant conflict in Myanmar. *Global Ecology and Conservation*, [online] 43, p.e02468. doi:https://doi.org/10.1016/j.gecco.2023.e02468[Accessed 29 Nov. 2023].

Withanage, W.K.N.C., Gunathilaka, M.D.K.L., Mishra, P.K., Wijesinghe, W.M.D.C. and Tripathi, S. (2023). Indexing habitat suitability and human-elephant conflicts using GIS-MCDA in a human-dominated landscape. *Geography and Sustainability*, [online] 4(4), pp.343–355. doi:https://doi.org/10.1016/j.geosus.2023.08.004[Accessed: 29 Nov.2023].මනුවරණවැඩසටහන. (2022/7/22) . zoom.

වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තු වාර්තා. දි.නැ.(Department of Wildlife Conservation (Sri Lanka): Avialble at: https://www.dwc.gov.lk/[Accessed: 26-11-2023].

සම්පත් පැතිකඩ (2022). මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

ආඛ්‍යාන narrations
*Open Access, Referred Biannual Jornal*
**Volume 10 | Issue 02 | 2025**

**Published By**
Center for Indigenous and Community Studies
Sabaragamuwa University of Sri Lanka

**Akyana (2025), Vol. 10 (02) Pp 250 - 271**

**Journal homepage:**
[www.sab.ac.lk/cikcs/akyana narratios](www.sab.ac.lk/cikcs/akyana narratios)

# ශ්‍රී ලංකාවේ උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීම සඳහා බලපාන සාධක

A R T I C L I N F O

Article History :
Received 25 Oct 2025
Revised 21 Dec 2025
Accepted 28 Dec 2025
Published 31 Dec 2025

CC BY NC ND

ISSN2478 - 0642

**නිමන්ත ආර්. එම්. කේ. [1*] සහ සමරවීර ජී. ආර්. එස්. ආර්. සී.[2]**

[1,2] ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**Corresponding author E-mail address: rmknimantha@std.ssl.sab.ac.lk*

**උපුටා දැක්වීම:** *නිමන්ත, ආර්. එම්. කේ., සහ සමරවීර, ජී. ආර්. එස්. ආර්. සී., (2025).ශ්‍රී ලංකාවේ උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීම සඳහා බලපාන සාධක.ආඛ්‍යාන, 10 (02). පි.අ.250 - 271*

## සාරසංක්ෂේපය

මෙම පර්යේෂණය බහුවිධ සුදුසුකම් සඳහා ආයෝජනය කිරීමට ශ්‍රී ලංකාවේ උපාධිධාරීන්ගේ තීරණ කෙරෙහි බලපාන සාධක විමර්ශනය කරයි. 2022 ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණයෙහි ද්විතීක දත්ත මත පදනම් ව උපාධිධාරීන් 2520ක නියැදියක් හරහා, ද්විමය ලොජිස්ටික් ප්‍රතිපායන ආකෘතියක් භාවිතා කරමින් මෙම පර්යේෂණයට අදාළ විශ්ලේෂණය සිදු කරන ලදී. විශ්ලේෂණයේ දී වයස, ආදායම, ජන වාර්ගිකත්වය, රැකියාව, සාක්ෂරතාව සහ උපාධි අධ්‍යයන ක්ෂේත්‍රය ඇතුළත් සාධක උපාධිධාරීන්ගේ ආයෝජන තීරණ කෙරෙහි වෙසෙසියාත්මක බලපෑමක් ඇති කරන සාධක ලෙස අනාවරණය විය. ඒ අනුව උපාධිධාරීන්ගේ වයස සහ ආදායම බහුවිධ සුදුසුකම් සඳහා ආයෝජනය කිරීමේ හැකියාව කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරයි. එසේම සිංහල ජන වර්ගයට අයත් නොවන උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් සඳහා ආයෝජනය කිරීමට ඇති ඉඩකඩ අඩු අතර කළමනාකරණ හෝ වෘත්තීය රැකියාවන්හි නියැලෙන උපාධිධාරීන් අනෙකුත් රැකියාවන්හි නියැලෙන උපාධිධාරීන්ට සාපේක්ෂව බහුවිධ සුදුසුකම් සඳහා ආයෝජනය කිරීමට වැඩි නැඹුරුවක් දක්වයි. එපමණක් නොව, පුළුල් අධ්‍යාපනික සහ වෘත්තීය අවස්ථා වෙත ප්‍රවේශ වීමේ දී භාෂා කුසලතාවන්ගේ භූමිකාව ඉස්මතු කරමින් එක් භාෂාවකට වඩා සාක්ෂරතාව පවතින උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමේ වැඩි නැඹුරුවක් දැක ගත හැකි විය. කලා උපාධිධාරීන්ට සාපේක්ෂව කලා නොවන උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් සඳහා ආයෝජනය කිරීමේ වැඩි ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත් අධ්‍යයනයට යොදා ගන්නා ලද අනෙකුත් සාධක වන ස්ත්‍රී පුරුෂ බව, විවාහක තත්ත්වය, ග්‍රාමීය හා නාගරික බව යන සාධක උපාධිධාරීන්ගේ ආයෝජන කෙරෙහි වෙසෙසියාත්මක බලපෑමක් ඇති නො කරන බව තහවුරු විය.

**මුඛ්‍ය පද:** බහුවිධ සුදුසුකම්, ශ්‍රී ලංකාවේ උපාධිධාරීන්, ශ්‍රම වෙළඳපොළ, මානව ප්‍රාග්ධන න්‍යාය

## 1.හැඳින්වීම

විකාශනය වන ගෝලීය ශ්‍රම වෙළඳපොළ තුළ, ශ්‍රී ලංකාවේ උගත් තරුණ ජනගහනයේ පවතින විරැකියාව හා ආර්ථික ප්‍රගතිය සම්බන්ධ සැලකිය යුතු අභියෝගවලට මුහුණ දී සිටී. ශ්‍රී ලංකාවේ උගත් පිරිසට අදාළව පවතින විරැකියාව සම්බන්ධව අවධානය යොමු කිරීමේ දී (Department of Census and Statistics, 2022) අනුව වයස අවු:15-24 ත්, අවු:25-29 ත් වයස් කාණ්ඩවල පසුවන පුද්ගලයන්ගේ සේවා වියුක්ත අනුපාතය පිළිවලින් 22.7 හා 11.7ක් වේ. එය අනෙකුත් වයස් මට්ටම්වල පසුවන පුද්ගලයන්ගේ සේවා වියුක්ත අනුපාතයට වඩා සැලකිය යුතු ඉහළ අනුපාතයකි. එසේම අධ්‍යාපන මට්ටම් අනුව ගත් කළ ද ශ්‍රී ලංකාවේ උගත් පුද්ගලයන්ගේ සේවා වියුක්ත අනුපාතය අනෙක් අධ්‍යාපන මට්ටම් සමඟ සැසඳීමේ දී ඉහළ අනුපාතයකි. එහි දී අධ්‍යාපන මට්ටම් අනුව ශ්‍රී ලංකාවේ ඉහළ සේවා වියුක්ත අනුපාතයක් පවතින්නේ, අ.පො.ස. උසස් පෙළ සහ ඊට ඉහළ අධ්‍යාපන මට්ටම් සහිත පුද්ගලයන්ට අදාළ ව ය. එසේ ම ශ්‍රී ලංකාවේ උපාධිධාරීන් අතරින් රැකියා වියුක්ත කලා උපාධිධාරීන්ගේ විරැකියාව අනෙකුත් උපාධි හැදෑරූ උපාධිධාරීන්ට සාපේක්ෂ ව සැලකිය යුතු ඉහළ මට්ටමක පවතී (වගුව 01). ශ්‍රී ලංකාවේ කලා විෂය ධාරාවේ උපාධිධාරීන්ගේ විරැකියා තත්ත්වය සඳහා එම උපාධිධාරීන් අනුගමනය කරන වෘත්තීය පාඨමාලාවල සැලකිය යුතු බලපෑමක් පවතින බව හඳුනා ගෙන ඇති (Gunarathne & Jayasinghe, 2021) අතර බොහෝ විට කලා/මානව ශාස්ත්‍ර උපාධිධාරීන් අනෙකුත් උපාධිධාරීන්ට සාපේක්ෂ ව තරමක් ඉහළ විරැකියා තත්ත්වයන් කෙරෙහි මුහුණ දෙයි (Kakooza & et al, 2019).

*වගුව 01: සේවා වියුක්ත උපාධිධාරීන්, 2022*

| උපාධිය | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|
| සේවා වියුක්ත මුළු උපාධිධාරීන් | 35,077 | 100.0 |
| කලා උපාධිධාරීන් | 13,349 | 38.1 |
| කලා නොවන උපාධිධාරීන් | 21,728 | 61.9 |

*මූලාශ්‍රය:Department of Census and Statistics, Labor Force Survey, 2022*

පුද්ගලයන් විසින් විරැකියා තත්ත්වය අවම කර ගැනීම සඳහා අමතර සුදුසුකම් ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු කරනු ලබයි. මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ව අනෙකුත් සුදුසුකම් මත ආයෝජනය කිරීම, පුද්ගලයන්ට රැකියාවක් ලබා ගැනීමට වඩාත් තීරණාත්මක සාධකයක් වී ඇත (Castro & et al., 2022). ඒ අනුව රැකියා වෙළඳපළ තුළ තරඟකාරීත්වය පවත්වා ගැනීමට සුදුසුකම් මත ආයෝජනය කිරීමට උපාධිධාරීන් යොමු වේ. ශ්‍රී ලංකාව තුළ ද මෙකී තත්ත්වය ඒ ආකාරයෙන් දැක ගත හැකි වේ (Pushpakumara & et al, 2016). කෙසේ නමුත් ශ්‍රී ලංකාව තුළ උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කළ ද එම සුදුසුකම් සහ වෘත්තීය අවශ්‍යතා අතර නොගැළපීමේ ගැටලුවක් දැක ගත හැකි වේ (Senarath & Patabendige, 2014). ඒ අනුව එම සුදුසුකම් සහ ශ්‍රම වෙළඳපළ වෘත්තීය අවශ්‍යතා අතර පවතින පරස්පරතාව උගත් තරුණ පුද්ගලයන්ට අදාළ ව ඔවුන්ගේ විරැකියාව සඳහා බලපාන මූලික සාධකයක්

ව ඇත (Wion, 1999). පුද්ගලයන් අතර බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීම යන සංසිද්ධිය විවිධ සාධක මත බලපා ඇති අතර ඒවායින් සමහරක් සමාජ ආර්ථික හා සංස්කෘතික සන්දර්භයන් තුළ ගැඹුරින් මුල් බැස ගෙන ඇත. අමතර සුදුසුකම් සඳහා ඇති ඉල්ලුම තනි පුද්ගල අභිලාෂයන් පමණක් නොව පුළුල් සමාජ ප්‍රවණතා, දෙමාපියන්ගේ අපේක්ෂාවන්, මූල්‍ය තත්ත්වයන් මගින් ද හැඩගැසී ඇත (Hashim & Ghani, 2020), (Bai & et al, 2020), (Rivera, 2011). ඒ හැරුණු විට විවාහක අවිවාහක බව උපාධිධාරීන්ගේ බහුවිධ සුදුසුකම් කෙරෙහි වන ආයෝජන සඳහා වෙනස් අයුරින් බලපෑමට හැකිය (Feldman, 1973). සමාජීය අපේක්ෂාවන් සහ සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ භූමිකාවන් නිසා කාන්තාවන්ට සාපේක්ෂ ව පිරිමි පුද්ගලයන් බහුවිධ සුදුසුකම් සඳහා ප්‍රවේශ වීමට වැඩි ඉඩක් ඇති බව (Estévez-Abe, 2005) විසින් පෙන්වා දෙයි. කෙසේ වෙතත්, ඉහත දක්වා ඇති බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමට බලපාන සාධක සැමවිට ම සැම රටකට ම අදාළ ව ඒකාකාරී නො විය හැක. එලෙස ම උපාධිධාරීන්ගේ ආයෝජන තීරණ කෙරෙහි බලපාන සාධක ද සැම පාර්ශවයකට ම අදාළ ව ඒකාකාරී නො විය හැක. එසේ ම බහුවිධ සුදුසුකම් කෙරෙහි ආයෝජනය කිරීමට බලපාන සාධක සම්බන්ධව, (දේශීය හැසිරීම් සම්බන්ධව) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සීමිත පර්යේෂණ ප්‍රමාණයක් පවතින බැවින්, ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ ඒ සම්බන්ධව පවතින දැනුම තවදුරටත් ගැටලු සහගත වේ. එබැවින් ශ්‍රී ලංකාවේ උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමට බලපාන සාධක සම්බන්ධව විමර්ශනය කිරීම සඳහා පුළුල් පර්යේෂණ ප්‍රවේශයක අවශ්‍යතාවක් පවතී.

## 2.සාහිත්‍ය විමර්ශනය

සුදුසුකම් සඳහා ආයෝජනය කිරීමට බලපාන සාධක පිළිබඳ පර්යේෂණ බොහෝ විට මානව ප්‍රාග්ධන න්‍යාය සහ සංඥා න්‍යාය වැනි ස්ථාපිත න්‍යායයන් මත පදනම් වේ. මානව ප්‍රාග්ධන න්‍යාය ප්‍රකාශ කරන්නේ පුද්ගලයන් තම කුසලතා සහ දැනුම වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යාපනය සහ පුහුණුව සඳහා ආයෝජනය කරන අතර එමගින් ඔවුන්ගේ ඵලදායිතාව සහ ඉපයීමේ හැකියාව වැඩි කරන බවයි (Becker, 2009). මානව ප්‍රාග්ධන න්‍යාය, ආර්ථික වර්ධනයේ සහ පුද්ගල සාර්ථකත්වයේ ප්‍රධාන සාධකයක් ලෙස අධ්‍යාපනය, පුහුණුව සහ කුසලතා සඳහා වන ආයෝජන අවධාරණය කරයි. මෙම න්‍යායට අනුව, අධ්‍යාපනය, පුහුණුව සහ පළපුරුද්ද හරහා ලබා ගන්නා විවිධ සුදුසුකම් හරහා මානව ප්‍රාග්ධනය රැස් කර ගැනීමෙන් පුද්ගලයන්ට තම ඵලදායිතාව සහ ඉපයීමේ හැකියාව වැඩි කර ගත හැකිය. බහුවිධ සුදුසුකම් පුද්ගලයෙකුගේ මානව ප්‍රාග්ධන තොගය වැඩි කරන අතර, එම පුද්ගලයන් ශ්‍රම වෙළඳපොළ තුළ අනුවර්තන සහ තරඟකාරී හැකියාවෙන් යුක්ත වේ. බහුවිධ සුදුසුකම් මානව ප්‍රාග්ධන න්‍යායේ මූලධර්ම සමඟ සමපාත වන රැකියාවන්ට අනුවර්තනය වීමේ හැකියාව, කාර්ය සාධනය සහ සමස්ත ඵලදායිතාව වැඩි දියුණු කරන වටිනා ආයෝජන ලෙස සැලකේ. මානව ප්‍රාග්ධන න්‍යායට අනුව, බහුවිධ සුදුසුකම් කුසලතා සහ දැනුම සමුච්චය කිරීමට දායක වන අතර, එය ඵලදායිතාව සහ ඉපයීමේ හැකියාව වැඩි කිරීමට හේතු වේ.

අනෙක් අතට, සංඥා න්‍යාය (Signalling theory) යෝජනා කරන්නේ, පුද්ගලයාගේ හැකියාවන්, ලක්ෂණ සහ කැපවීම පිළිබඳ ව සේවා යෝජකයන්ට පුද්ගල සුදුසුකම් සංඥා සපයන බවයි (Spence, 1974). පුද්ගලයන් සුදුසුකම් සඳහා ආයෝජනය කරන්නේ අදාළ කුසලතා ලබා ගැනීමට පමණක් නොව, ඔවුන්ගේ ගුණාත්මක භාවය සහ රැකියාව සඳහා යෝග්‍යතාව සංඥා කිරීම සඳහා ය. සුදුසුකම් අපේක්ෂකයෙකුගේ හැකියාවන් සහ අභිප්‍රේරණ පිළිබඳ ව සේවා යෝජකයන්ට සංඥා සපයන බව සංඥා න්‍යාය තුළින් ප්‍රකාශ කරයි. අසම්පූර්ණ තොරතුරුවලින් යුක්ත ශ්‍රම වෙළඳපොළ තුළ, බහුවිධ සුදුසුකම්, වඩා යෝග්‍ය රැකියා අපේක්ෂකයින් ව වෙන් කර හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ වටිනාකම ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමට හැකියාව ලබා දෙයි. පුද්ගල මානව ප්‍රාග්ධනය ඉහළ නැංවීමේ දී සහ සේවා යෝජකයන්ට රැකියා අපේක්ෂකයින්ගේ වටිනාකම සංඥා කිරීමේ දී බහුවිධ සුදුසුකම්වල වැදගත්කම මෙම න්‍යායන් තුළින් පැහැදිලි කර ගත හැකිය. එලෙසම, බහුවිධ සුදුසුකම් මගින් පුද්ගලයන්ට තම හැකියාවන් සේවා යෝජකයන්ට ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමට හැකි වන අතර, රැකියා අපේක්ෂකයන්ට අදාළ ව ඔවුන්ට අවශ්‍ය රැකියා අවස්ථා සුරක්ෂිත කර ගැනීමට වැඩි අවස්ථාවක් පවතින බව සංඥා න්‍යාය තුළින් ඉස්මතු කරයි.සමස්තයක් වශයෙන්, මෙම න්‍යායන් වර්තමාන ගතික ශ්‍රම වෙළඳපොළ තුළ බහුවිධ සුදුසුකම්වල වැදගත්කම පිළිබඳ වැදගත් අවබෝධයක් සපයන අතර මෙහි ඉදිරිපත් කර ඇති න්‍යායික සාහිත්‍ය සමාලෝචනය බහුවිධ සුදුසුකම් සඳහා පුද්ගල ආයෝජනයේ බහුමාන ස්වභාවය, න්‍යායික පසුබිම පිළිබඳ ව ද අවධාරණය කරයි. මානව ප්‍රාග්ධන න්‍යාය සහ සංඥා න්‍යාය වැනි ස්ථාපිත න්‍යායයන් මෙන් ම විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් යුතු ආනුභාවික සාක්ෂි බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීම සඳහා බලපාන සාධක පිළිබඳ අවබෝධයක් සපයයි.

එසේ ම සුදුසුකම් සඳහා ආයෝජනයට බලපාන සාධක පිළිබඳ ව විවිධ පර්යේෂකයන් විසින් අධ්‍යයනයන් සිදු කර ඇත. (Chevalier & Lindley, 2009) විසින් කරන ලද අධ්‍යයනයක් මගින් එක්සත් රාජධානියේ උපාධිධාරීන් අතර අධික අධ්‍යාපනය නිපුණතා (සුදුසුකම්) අත් කර ගැනීම මානව ප්‍රාග්ධනය ඌන උපයෝජනය වීම කෙරෙහි සහ වැටුප් සඳහා සැලකිය යුතු ලෙස බලපාන බව සොයා ගන්නා ලදී. මීට අමතර ව, අධ්‍යයනයෙන් හෙළි වූයේ පුද්ගලයන් අධික සුදුසුකම් ළඟා කර ගැනීමෙන් මූල්‍ය ප්‍රතිලාභ සහ රැකියා සුරක්ෂිතභාවය කෙරෙහි එය විවිධ අයුරින් බලපෑම් කරන බවයි. ගිණුම්කරණ සිසුන්ගේ වෘත්තීය සුදුසුකම් මත ආයෝජනය කිරීම කෙරෙහි බලපාන සාධක සම්බන්ධව (Hashim & Ghani, 2020) විසින් සිදු කර ඇති පර්යේෂණයට අනුව සිසුන්ගේ රැකියා අපේක්ෂාවන් පිළිබඳ විශ්වාසය බොහෝ සෙයින් ඔවුන් වෘත්තීය සුදුසුකම් මත ආයෝජනය කිරීම කෙරෙහි බලපාන බව තහවුරු කර ඇත. එසේම ඔවුන්ගේ සමාජ විශ්වාසයන් සහ හැකියාවන් පිළිබඳ පවතින විශ්වාසයන් ද අදාළ සුදුසුකම් මත ආයෝජනය කිරීමේ දී වැඩි දුරටත් බලපාන බව පර්යේෂණ තහවුරු කරයි. උපාධිධාරී වෘත්තිකයින්ට අදාළ ව

ඔවුන් සුදුසුකම් ලබා ගැනීමේ දී බලපාන ප්‍රධාන සාධක කිහිපයක් සම්බන්ධව (Bai & et al, 2020) විසින් සිදු කර ඇති අධ්‍යයන තුළින් පර්යේෂණාත්මක තහවුරු කිරීමක් සිදු කර ඇත. ඒ අනුව එම පර්යේෂණය මගින් ආර්ථික මට්ටම, රැකියා මට්ටම, අධ්‍යාපනික මට්ටම, ස්ත්‍රී පුරුෂ බව සුදුසුකම් මත ආයෝජනය කිරීමේ දී බලපාන සාධක වශයෙන් හඳුනා ගෙන ඇත. මෙම අධ්‍යයනයන් සුදුසුකම් සඳහා ආයෝජනයේ බහුවිධ ස්වභාවය පිළිබඳ වටිනා අවබෝධයක් ලබා දෙන අතර මෙම සංසිද්ධිය අවබෝධ කර ගැනීමේ දී පුද්ගල සහ රැකියා ආශ්‍රිත සාධක යන දෙක ම සලකා බැලීමේ වැදගත්කම ඉස්මතු කරයි. (Ambepitiya, 2016) අධ්‍යයනයට අනුව පුද්ගල දැනුම ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා සමඟ පෙළගැස්වීමේ වැදගත්කම අවධාරණය කරයි. එසේම උපාධිධාරීන් ශ්‍රම වෙළඳපොළේ ඔවුන්ගේ වෙළඳපොළ හැකියාව සහ තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා අමතර සුදුසුකම් හඹා යාමට පෙලඹෙන බව එම පර්යේෂණයේ සොයා ගැනීම්වලින් තහවුරු වේ. අධ්‍යයන සුදුසුකම් සහ ප්‍රායෝගික ප්‍රවීණත්වයේ සම්මිශ්‍රණයක් ඇති අපේක්ෂකයින් හට වැඩි රැකියා අවස්ථා හිමි වන බව (Ambepitiya, 2016) පර්යේෂණ ඔස්සේ වැඩි දුරටත් අවධාරණය කරයි.එලෙස ම විවිධ පර්යේෂකයින් සුදුසුකම් කෙරෙහි ආයෝජනය කිරීමට බලපාන සාධක සම්බන්ධව අධ්‍යයනය කිරීම සඳහා තමන්ට අනන්‍ය වූ පර්යේෂණය තුළ එකිනෙකට වෙනස් සාධක බහුවිධ සුදුසුකම් කෙරෙහි බලපාන්නේ කෙසේ ද යන්න විවිධාකාරයෙන් අධ්‍යයනයට බඳුන් කර ඇත. ඒ අනුව (Chevalier & Lindley, 2009) විසින් සිදු කරන ලද පර්යේෂණයේ දී, අධික ලෙස උපාධිධාරීන් අධ්‍යාපනය ඇතුළු අනෙකුත් සුදුසුකම් ලබා ගැනීම කෙරෙහි බලපාන සාධක ප්‍රධාන වශයෙන් විමර්ශනය කෙරෙයි. එහි දී සුදුසුකම් කෙරෙහි බලපාන ප්‍රධාන සාධක වශයෙන් වයස, ස්ත්‍රී පුරුෂ බව, ජන වාර්ගිකත්වය, දෙමාපියන්ගේ රැකියාව, අධ්‍යාපනය ලැබූ පාසලේ ස්වභාවය, විශ්වවිද්‍යාලයේ ස්වභාවය (පැරණි/ මෑත කාලීන), උපාධි සාමාර්ථය, උපාධියේ ස්වරූපය (කලා, විද්‍යා, වාණිජ ආදී), විශ්වවිද්‍යාලය තුළින් ලබා ගත් කුසලතා, වැඩ කරන කලාපය යන සාධක පර්යේෂණ තුළින් අධ්‍යයනයට බඳුන් කර ඇත. වෘත්තීය සුදුසුකම් මත ආයෝජනය කිරීම කෙරෙහි බලපාන සාධක සම්බන්ධව (Hashim & Ghani, 2020) විසින් සිදු කර ඇති පර්යේෂණය තුළ අදාළ බලපෑම් සාධක වශයෙන් රැකියා අපේක්ෂාව පිළිබඳ විශ්වාසය, සමාජ විශ්වාසය, හැකියාව පිළිබඳ විශ්වාසය හා මනාපය යන සාධක පර්යේෂණ තුළින් අධ්‍යයනයට බඳුන් කර ඇත. සහතික කිරීම්වල පවතින ඌනතාව, අඩු අධ්‍යාපන තත්ත්වය, පළපුරුද්ද නොමැතිකම යන විචල්‍යයන් ප්‍රධාන කොට ගෙන නිපුණතාව, දැනුම, හැකියාව, ආකල්ප යන විචල්‍යයන් ද ඇතුළු ව විචල්‍යයන් ගණනාවක බලපෑම කාර්මීකරණ රැකියා සිදු කරන උපාධිධාරී පුද්ගලයින්ගේ සුදුසුකම් මත බලපාන ආකාරය සම්බන්ධව (Bai & et al, 2020) විසින් අධ්‍යයනයට බඳුන් කර ඇත. බටහිර ඉන්දීය කොදෙව් විශ්වවිද්‍යාලයේ සිසුන්ගේ අධ්‍යයන කාර්ය සාධනය සම්බන්ධව (Mlambo, 2011) විසින් සිදු කර ඇති පර්යේෂණය තුළ දී මූලික වශයෙන් ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ඉගෙනීමේ විලාසය සහ

ඇතුළත් වීමේ සුදුසුකම් යන විචල්‍යයන් අධ්‍යයනය සඳහා පාදක කර ගෙන ඇත. බහුවිධ සුදුසුකම් සඳහා ආයෝජනය කිරීමට බලපාන සාධක විමර්ශනය කිරීම සඳහා සිදු කරනු ලබන, මෙම පර්යේෂණයේ දී, වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ආදායම, ජන වාර්ගිකත්වය, විවාහක තත්ත්වය, රැකියාව, ග්‍රාමීය හා නාගරික බව, සාක්ෂරතාව සහ උපාධි ක්ෂේත්‍රය යන විචල්‍යයන් බලපෑම් සාධක වශයෙන් යොදා ගැනීමක් සිදු කරන අතර ඒ සඳහා බහුවිධ සුදුසුකම් සම්බන්ධ සිදු කර ඇති අදාළ ආනුභාවික පර්යේෂණයන් මෙම පර්යේෂණය සඳහා වැදගත් පදනම සපයනු ලබයි.

සුදුසුකම් සඳහා ආයෝජනයට බලපාන සාධක සම්බන්ධව සිදු කර ඇති පර්යේෂණය අතරින් (Daguplo, 2017) විසින් උසස් අධ්‍යාපනය හැදෑරීමට සිසුන්ගේ අභිප්‍රාය තීරණය කිරීම සඳහා ද්වීමය ලොජිස්ටික් ප්‍රතිපායන විශ්ලේෂණ ක්‍රමවේදය භාවිතා කර ඇත. අධ්‍යාපනික සුදුසුකම් සම්බන්ධව තේරීම් අවබෝධ කර ගැනීමේ දී එහි අදාළත්වය ඉස්මතු කර ඇත. (Munzara & Sunge, 2015) විසින් ගුරුවරුන්ගේ අධ්‍යාපනික තීරණ කෙරෙහි බලපාන සාධක විශ්ලේෂණය කිරීමේ දී, එහි සඵලතාව පෙන්නුම් කරමින් උපාධිධාරී ගුරුවරුන් විසින් සුදුසුකම් ලබා ගැනීමට ඇති කැමැත්ත අධ්‍යයනය කිරීම සඳහා ද්වීමය ලොජිස්ටික් ප්‍රතිපායන විශ්ලේෂණ ක්‍රමවේදය භාවිතා කර ඇත. එලෙස ම අධ්‍යාපනයට බලපාන විවිධ සමාජ ආර්ථික සාධක පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා (Rahman & Uddin, 2009) විසින් ද්වීමය ලොජිස්ටික් ප්‍රතිපායන විශ්ලේෂණ ක්‍රමවේදය භාවිතා කර ඇත. සමස්තයක් වශයෙන්, පුද්ගලයින් සුදුසුකම් කෙරෙහි ආයෝජනය කිරීමට පෙලඹෙන විවිධ සාධක සම්බන්ධව අධ්‍යයනය කිරීම සඳහා යොදා ගෙන ඇති විශ්ලේෂණ ක්‍රමවේදයක් ලෙස ද්වීමය ලොජිස්ටික් ප්‍රතිපායන විශ්ලේෂණ ක්‍රමවේදය පෙන්වා දිය හැක. ඒ අනුව ශ්‍රී ලාංකික උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජන කිරීමට බලපාන සාධක අධ්‍යයනය කිරීම සඳහා මෙම පර්යේෂණයට අදාළ ව යොදා ගෙන ඇත්තේ ද ද්වීමය ලොජිස්ටික් ප්‍රතිපායන විශ්ලේෂණ ක්‍රමවේදය යි. මෙම විශ්ලේෂණ ක්‍රමවේදය පරායත්ත විචල්‍යය තුළ ගුණාත්මක ප්‍රතිචාර දෙකක් පවතින අවස්ථාවල දී, ද්විමය ප්‍රතිඵල පුරෝකථනය කිරීම සඳහා යොදා ගන්නා විශ්ලේෂණ ක්‍රමවේදයකි (IMB, 2021). ඒ අනුව ශ්‍රී ලංකාවේ උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් සඳහා ආයෝජනයට බලපාන සාධක සම්බන්ධව අධ්‍යයනය කිරීමේ දී බහුවිධ සුදුසුකම් සහිත උපාධිධාරීන් හා බහුවිධ සුදුසුකම් රහිත උපාධිධාරීන් යන ද්වීමය අවස්ථාවන් සලකා බලමින් අදාළ ප්‍රතිපායනය සිදු කරන නිසා මේ සඳහා ද ද්වීමය ලොජිස්ටික් ප්‍රතිපායන විශ්ලේෂණ ක්‍රමවේදය යොදා ගැනීම සුදුසු වේ.

මෙම අධ්‍යයනයේ අධ්‍යයන මාතෘකාවට අනුව එක් ප්‍රධාන විචල්‍යයක් හඳුනා ගත හැකි අතර සුදුසුකම් යනු එම විචල්‍යය යි. පහත දැක්වෙන්නේ සුදුසුකම් සම්බන්ධව ඉදිරිපත් ව ඇති පිළිගත් අර්ථ දැක්වීම් කිහිපයක් සහ මෙම පර්යේෂණය සඳහා බහුවිධ සුදුසුකම් යන විචල්‍යය න්‍යායාත්මක කිහිපයක් සහ මෙම පර්යේෂණය සඳහා බහුවිධ සුදුසුකම් යන විචල්‍යය න්‍යායාත්මකරාමුවක් යටතේ යොදා ගනු ලබන ආකාරය යි. *පහත නිර්වචන එක් ව, විවිධ අවස්ථා වල දී පුද්ගලයන් සතු විය හැකි විවිධ සුදුසුකම් සම්බන්ධව පුළුල් දැක්මක් සපයයි. මෙම පර්යේෂණයට අදාළ ව බහුවිධ සුදුසුකම් ලෙස සලකනු ලබන්නේ උපාධිධාරීන්*

විසින් සිදු කරන ලද ඩිප්ලෝමා, පශ්චාත් උපාධි, රැකියාවකට හෝ ස්වයං රැකියාවකට අදාළ ව සාර්ථක ව නිම කරන ලද විධිමත් වෘත්තීය හා තාක්ෂණික පුහුණු වීම් ය. උපාධිධාරීන්ට අදාළ ව, බහුවිධ සුදුසුකම් පිළිබඳ ව අධ්‍යයනය කරන බැවින්, 2022 ශ්‍රම බලකා සමීක්ෂණය දත්ත මූලාශ්‍රවල ඇතුළත් අධ්‍යාපන සුදුසුකම් යටතේ අ.පො.ස. සාමාන්‍ය පෙළ, අ.පො.ස. උසස් පෙළ සහ මූලික උපාධි සුදුසුකම් මෙහි දී සෑම උපාධිධාරියකුට ම අදාළ ව පවතින නිසා එම අධ්‍යාපන සුදුසුකම් මෙහි දී බහුවිධ සුදුසුකම් ගණයට ඇතුළත් කර නොමැත.

*වගුව 02: සුදුසුකම් යන්න සම්බන්ධව ඉදිරිපත් වී ඇති අර්ථ දැක්වීම්*

| මූලාශ්‍රය | අර්ථ දැක්වීම |
|---|---|
| (Wang, 2023) | සුදුසුකම් යනු උපාධි, වෘත්තීය සහතික කිරීම් වැනි විවිධ ආකාර අධ්‍යාපන සහ විවිධ අවස්ථාවන් හරහා ලබාගත් ශාස්ත්‍රීය, වෘත්තීය සහ කුසලතාවන් ය. ගෝලීය සංචලනය සක්‍රීය ව සිදු වීමට සහ පුද්ගලයන්ගේ කුසලතා සහ ජයග්‍රහණ සඳහා ජාත්‍යන්තර පිළිගැනීම සහතික කිරීම සඳහා මෙම සුදුසුකම් හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. |
| (Indeed Editorial Team, 2023) | සුදුසුකම් යනු යම්කිසි අපේක්ෂකයෙකුට නිශ්චිත කාර්යභාරයක් සඳහා අවස්ථාව ලැබීමට සහ සාර්ථක වීමට අවශ්‍ය අවශ්‍යතා වන අතර පුද්ගලයන් විසින් සාමාන්‍ය වශයෙන් වෘත්තීය පළපුරුද්ද, අධ්‍යාපනය සහ පුහුණුව තුළින් සුදුසුකම් ළඟා කර ගනී. සාමාන්‍යයෙන් සුදුසුකම් ගණයට විවිධ මට්ටමේ උපාධි, සහතික පත්‍ර, බලපත්‍ර, මූලික නිපුණතා, පෞරුෂ ලක්ෂණ, විවිධ ජයග්‍රහණ ඇතුළත් වේ. |
| (Bergan, 2007) | පුද්ගලයෙකුට නිශ්චිත තනතුරකට හෝ කාර්යයකට ගැළපෙන ඕනෑම ගුණාංගයක්, ජයග්‍රහණයක් හෝ හැකියාවක් ලබා ගැනීමට අවශ්‍ය මූලික දෑ සුදුසුකම් ය. |
| (UNESCO, 2011) | සුදුසුකම් යනු සාමාන්‍යයෙන් අධ්‍යාපනික වැඩසටහනක් හෝ වැඩසටහනක අදියරක් සාර්ථක ව නිම කිරීම, ලියවිල්ලක ස්වරූපයෙන් නිල වශයෙන් තහවුරු කිරීමකි. සුදුසුකම් ලබා ගත හැක්කේ:<br>I. සම්පූර්ණ වැඩසටහනක් සාර්ථක ව නිම කිරීම.<br>II. වැඩසටහනක අදියරක් සාර්ථක ව නිම කිරීම.<br>III. එවැනි වැඩසටහන් සඳහා සහභාගී වීමෙන් ස්වාධීන ව දැනුම, කුසලතා සහ නිපුණතා අත්පත් කරගැනීමෙනි. |

*මූලාශ්‍රය: පර්යේෂකයා විසින් සංවර්ධනය කරන ලදී.*

මෙම නිර්වචන එක් ව, විවිධ අවස්ථා වල දී පුද්ගලයන් සතු විය හැකි විවිධ සුදුසුකම්

සම්බන්ධව පුළුල් දැක්මක් සපයයි. මෙම පර්යේෂණයට අදාළ ව බහුවිධ සුදුසුකම් ලෙස සලකනු ලබන්නේ උපාධිධාරීන් විසින් සිදු කරන ලද ඩිප්ලෝමා, පශ්චාත් උපාධි, රැකියාවකට හෝ ස්වයං රැකියාවකට අදාළ ව සාර්ථක ව නිම කරන ලද විධිමත් වෘත්තීය හා තාක්ෂණික පුහුණු වීම් ය. උපාධිධාරීන්ට අදාළ ව, බහුවිධ සුදුසුකම් පිළිබඳ ව අධ්‍යයනය කරන බැවින්, 2022 ශ්‍රම බලකා සමීක්ෂණය දත්ත මූලාශ්‍රවල ඇතුළත් අධ්‍යාපන සුදුසුකම් යටතේ අ.පො.ස. සාමාන්‍ය පෙළ, අ.පො.ස. උසස් පෙළ සහ මූලික උපාධි සුදුසුකම් මෙහි දී සෑම උපාධිධාරියකුට ම අදාළ ව පවතින නිසා එම අධ්‍යාපන සුදුසුකම් මෙහි දී බහුවිධ සුදුසුකම් ගණයට ඇතුළත් කර නොමැත. එසේ ම මූලික ඩිජිටල් හා භාෂා සාක්ෂරතාව ද ඒ ආකාරයෙන් ම උපාධිධාරීන්ගේ බහුවිධ සුදුසුකම් සැලකිල්ලට ගැනීමේ දී බහුවිධ සුදුසුකමක් ලෙස සලකා බලා නැත. උපාධිධාරියෙකුට අදාළ ව කිසියම් හෝ එක් භාෂාවක් සඳහා වත් අනිවාර්යයෙන් ම භාෂා සාක්ෂරතාව පැවතීම ඊට හේතුවයි. මූලික ඩිජිටල් හැකියාව වර්ධනය කරන විෂයයන් උපාධිධාරීන්ගේ අනිවාර්ය ඉගැන්නුම් විෂයයට ඇතුළත් වන අතර එම හේතුව පාදක කර ගෙන පරිගණක සාක්ෂරතාව මෙහි දී බහුවිධ සුදුසුකම් සැලකිල්ලට ගැනීමේ දී බහුවිධ සුදුසුකමක් ලෙස සලකා බලා නැත. ඒ අනුව අදාළ අර්ථකථනයන් ට සාපේක්ෂ ව බහුවිධ සුදුසුකම් යන සංකල්පය වඩාත් පුළුල් වන අතර මෙම පර්යේෂණයේ දී එම සංකල්පය යම්කිසි සීමාවක් යටතේ අධ්‍යයනයට යොදා ගෙන ඇත. ප්‍රධාන වශයෙන් ම ද්වීතීක දත්ත මත පදනම් ව පර්යේෂණය සිදු කරන බැවින් බහුවිධ සුදුසුකම් යන සංකල්පයේ න්‍යායාත්මක සීමාවන් මෙම පර්යේෂණයට අදාළ ව පවතී.

## 3. පර්යේෂණ ගැටලුව

උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීම, යන සංසිද්ධිය සම්බන්ධව සලකා බැලීමේ දී ඒ හා සම්බන්ධ මූලික ගැටලු කිහිපයක් හඳුනා ගත හැකි වේ. ඉන් එක් ගැටලුවක් වන්නේ ඇතැම් අවස්ථා වල දී බහුවිධ සුදුසුකම් සහිත උපාධිධාරීන් හා සම්බන්ධව මානව ප්‍රාග්ධනය ඌන උපයෝජනය වීමයි. මෙම ඌන උපයෝජනය මානව ශක්‍යතා සහ මානව ප්‍රාග්ධනය නාස්ති වීමකි. එසේම (Senarath & Patabendige, 2014) විසින් සිදු කරන ලද අධ්‍යයනයන් මඟින් පැහැදිලි කරන ආකාරයට උපාධිධාරීන්ගේ සුදුසුකම් ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතාවන් සමඟ නොගැළපීම, තවත් ගැටලුවක් වන අතර ඒ තුළින් බහුවිධ සුදුසුකම් මත සිදු කල ආයෝජනයන් අපතේ යාමක් සිදු වේ.

ඇතැම් අවස්ථාවන් හී දී උපාධිධාරීන්ට සේවා නියුක්ත වීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් පැවතිය ද, බහුවිධ සුදුසුකම් මත ආයෝජනය නොකළ හේතුව මත ඔවුන්ට පවතින රැකියා අවස්ථා අඩු වීමක් සිදු විය හැක. රැකියාව තුළ රාජකාරිය සිදු කිරීමට අවශ්‍ය නොවන සුදුසුකම් අනවශ්‍ය වන විට දී පවා ඉහළ අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් රැකියාවක් ලබාගැනීම සඳහා වන අවම අවශ්‍යතා ව බවට පත් වන මෙම තත්ත්වය (Castro & et al., 2022) ශාස්ත්‍රීය උද්ධමනය (Credential Inflation) ලෙස හැඳින්වේ. තවද, බහුවිධ සුදුසුකම් මත වැඩි වශයෙන් ආයෝජනය කිරීම අනපේක්ෂිත ප්‍රතිවිපාකවලට තුඩු දිය හැකිය. සුදුසුකම්

රැකියා අවශ්‍යතා ඉක්මවා ගිය විට, එය පුද්ගල අපේක්ෂාවන් සහ රැකියා යථාර්ථය අතර නොගැළපීමක් ඇති කළ හැක (Liu & Wang, 2012). බහුවිධ සුදුසුකම් හා සම්බන්ධ මෙම ගැටලු ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ විමර්ශනය කිරීමෙන් සහ යථාර්ථවාදී ව ගවේෂණය කිරීමෙන්, මෙම පර්යේෂණය අරමුණු කරන්නේ උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමට බලපාන සාධක පිළිබඳ අධ්‍යයනය කිරීම යි.

### *3.1. පර්යේෂණ අරමුණ*

ශ්‍රී ලංකාවේ උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීම සඳහා බලපාන සාධක සම්බන්ධව අධ්‍යයනය කිරීම.

### *3.2. පර්යේෂණයේ වැදගත්කම*

මෙම පර්යේෂණය ශ්‍රී ලාංකේය උපාධිධාරීන්ට බහුවිධ සුදුසුකම් සඳහා ආයෝජනය කිරීමට ඔවුන් ගන්නා තීරණයන් ට බලපාන සාධක පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් ලබා දීම සම්බන්ධයෙන් මෙහි වැදගත්කමක් පවතී. අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය, වෘත්තීය සහ තාක්ෂණික පුහුණු ආයතන, සේවා යෝජකයින් සහ ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනවලට, විවිධ සුදුසුකම් මට්ටම් සහිත උපාධිධාරීන් දිරිමත් කරන හෝ ඔවුන්ට සරිලන නිපුණතා සංවර්ධනය, අධ්‍යාපනික වැඩසටහන් පිරිනැමීම් සහ ශ්‍රම වෙළඳපොළ උපාය මාර්ග සම්බන්ධ ප්‍රතිපත්තිමය තීන්දු තීරණවලට එළඹීමට අවශ්‍ය ඇතැම් කරුණු සම්බන්ධව පැහැදිලි කිරීමක් මෙම පර්යේෂණය මගින් ලබා ගත හැකි වෙයි. එසේ ම මෙම පර්යේෂණයේ ආනුභාවික සහ න්‍යායික වැදගත්කම පවතින්නේ මානව ප්‍රාග්ධන ආයෝජනය පිළිබඳ පවතින දැනුම සඳහා එහි ඇති දායකත්වය හේතුවෙනි. මෙම පර්යේෂණයේ ප්‍රතිඵල, ශ්‍රී ලංකාව පදනම් කර ගෙන මානව ප්‍රාග්ධන සංවර්ධනයට අදාළ තීරණ හැඩ ගස්වන්නේ කෙසේ ද යන්න පිළිබඳ විවේචනාත්මක අවබෝධයක් ලබා දෙනු ඇත. ක්‍රමවේදාත්මක වැදගත්කම අනුව, අධ්‍යයනයට යොදා ගෙන ඇති විශ්ලේෂණ ශිල්පීය ක්‍රමවේදය මේ හා සමාන අනාගත පර්යේෂණ සඳහා පූර්වාදර්ශයක් ද සපයනු ඇත.

### *3.3. පර්යේෂණ ක්‍රමවේදය*

පර්යේෂණය මූලික වශයෙන් 2022 ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණය මගින් රැස් කර ගන්නා ලද ද්විතීයික දත්ත මත රඳා පවතී. ශ්‍රී ලංකාවේ මුළු උපාධිධාරීන් මෙම පර්යේෂණයට අදාළ මුළු සංගහනය වන අතර, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2022 ශ්‍රම බලකා සමීක්ෂණය සඳහා තෝරා ගෙන ඇති මුළු නියැදිය තුළ උපාධිධාරීන් 2520ක ප්‍රමාණයක් සිටින අතර මෙම අධ්‍යයනයට පාදක කර ගෙන ඇත්තේ එම උපාධිධාරීන් ප්‍රමාණයට අදාළ දත්ත වේ. ප්‍රමාණාත්මක සංඛ්‍යාන ආකෘතික ක්‍රමවේදය මෙම අධ්‍යයනයේ මූලික විශ්ලේෂණ ක්‍රමවේදය වේ. විචල්‍යයන් අතර සහසම්බන්ධතා හඳුනා ගනිමින් විශාල දත්ත කට්ටල වඩා නිරවද්‍ය ලෙස විශ්ලේෂණය කිරීමට මෙම ප්‍රමාණාත්මක ශිල්පීය ක්‍රමය යොදා ගන්නා අතර දත්ත විශ්ලේෂණ මෘදුකාංගය ලෙස

යොදා ගන්නේ STATA මෘදුකාංගය යි. ශ්‍රී ලංකාවේ උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීම සඳහා බලපාන සාධක සම්බන්ධව අධ්‍යයනය කිරීමට ද්වීමය ලොජිස්ටික් ප්‍රතිපායන ආකෘති ක්‍රමවේදය මෙම පර්යේෂණය සඳහා යොදා ගෙන ඇත.

අධ්‍යයනයට අදාළ ද්වීමය ලොජිස්ටික් ප්‍රතිපායන ආකෘතිය,

$$P(Y = 1 \mid X) = \frac{1}{1 + e^{-(\beta 0 + \beta 1X1 + \beta 2X2 + \beta 3X3 + \beta 4X4 + \beta 5X5 + \beta 6X6 + \beta 7X7 + \beta 8X8 + \beta 9X9 + e)}}$$

I. *P(Y=1|X)* ස්වායත්ත විචල්‍යවල බලපෑම මත ලබා දී ඇති සිදුවීමේ (බහුවිධ සුදුසුකම් සඳහා ආයෝජනය කිරීමේ) සම්භාවිතාව නියෝජනය කරයි. (පුද්ගලයෙකු බහුවිධ සුදුසුකම් සඳහා ආයෝජනය කර ඇති නම් *Y=1* සහ උපාධිධාරියා බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කර නැති නම් *Y=0* වේ.)

II. *X1;, X2;,... , Xk ;* ස්වායත්ත විචල්‍යවල අගයන් *(X1- වයස, X2- ස්ත්‍රී පුරුෂ බව, X3- ආදායම, X4- ජන වාර්ගිකත්වය, X5- විවාහක තත්ත්වය, X6- රැකියාව, X7- ග්‍රාමීය හෝ නාගරික බව, X8- සාක්ෂරතාව, X9- උපාධි ක්ෂේත්‍රය)* නියෝජනය කරයි.

III. *β0* = අන්තඃඛණ්ඩය හා *β1, β2..., βk* එක් එක් ස්වායත්ත විචල්‍යයට සම්බන්ධ සංගුණක වේ.

IV. *e* යන්නෙන් natural logarithm යන්න අදහස් වේ.

## 4. ප්‍රතිඵල සහ සාකච්ඡාව

උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමට බලපාන සාධක සම්බන්ධව අධ්‍යයනය කිරීමට යොදා ගන්නා ලද නියැදිය තුළ 2520ක් වූ මුළු උපාධිධාරීන් අතරින් උපාධිධාරීන් 773කට අදාළ ව කිසියම් හෝ බහුවිධ සුදුසුකමක් හෝ කිහිපයක් පවතී (වගුව 03). වගු අංක 03 ට අනුව අදාළ උපාධිධාරීන්ගේ මධ්‍යන්‍යය වයස 42 වන අතර සම්මත අපගමනය 14.3කි. උපාධිධාරීන්ගේ මධ්‍යන්‍යය ආදායම රු.61 843ක් වන අතර එහි සම්මත අපගමනය සැලකිය යුතු ඉහළ අගයක් ගනී. සහභාගි වන්නන්ගෙන් ගැහැනු පාර්ශවයේ පිරිස 1976ක් හා පිරිමි පාර්ශවයේ පිරිස 1044ක් ද වේ. මෙය ස්ත්‍රී පුරුෂභාවය අතර සාපේක්ෂ වශයෙන් නිරීක්ෂණ සංඛ්‍යාවෙහි සමතුලිත ව්‍යාප්තියක් පෙන්නුම් කරයි. ජන වාර්ගිකත්වය, විවාහක අවිවාහක බව, රැකියාව යන විචල්‍යයන්ට අදාළ ව නිරීක්ෂණ සංඛ්‍යාවෙහි ඉහළ සමතුලිත ව්‍යාප්තියක් දැක ගත නොහැකි නමුත් යොදා ගනු ලබන සෑම විචල්‍යයකට අදාළව ම සැලකිය යුතු ඉහළ මට්ටමේ නිරීක්ෂණ සංඛ්‍යාවක් පැවතීම අධ්‍යයනයේ ප්‍රතිඵලවල නිරවද්‍යතාව තහවුරු කිරීමට හේතු වේ. උපාධිධාරීන් අතර කලා උපාධියක් සහිත හා කලා උපාධියක් රහිත යන පාර්ශව දෙක අතර නිරීක්ෂණ සංඛ්‍යාවේ සමතුලිත ව්‍යාප්තියක් දැක ගත හැකි වේ. වගුව 03 ඉදිරිපත් කර ඇති විස්තරාත්මක සංඛ්‍යාතීන්ට අදාළ තොරතුරු මගින් නියැදියේ ලක්ෂණ වඩාත් හොඳින් ඉස්මතු කරයි.

*වගුව 03: පර්යේෂණයේ විස්තරාත්මක සංඛ්‍යාතීන*

| විචල්‍යය | නිරීක්ෂණ සංඛ්‍යාව | මධ්‍යනාය / සමානුපාතිකය | සම්මත අපගමනය | අවම අගය | උපරිම අගය |
|---|---|---|---|---|---|
| **බහුවිධ සුදුසුකම් *(d)*** | 2,520 | 0.307 | 0.461 | 0 | 1 |
| බහුවිධ සුදුසුකම් නොපවති. - *(0)* | 1,747 | | | | |
| බහුවිධ සුදුසුකම් පවතින - *(1)* | 773 | | | | |
| **වයස *(x)*** | 2,520 | 42.158 | 14.385 | 20 | 96 |
| **ස්ත්‍රී පුරුෂ බව *(d)*** | 2,520 | 0.414 | 0.493 | 0 | 1 |
| ගැහැණු - *(0)* | 1,476 | | | | |
| පිරිමි - *(1)* | 1,044 | | | | |
| **ආදායම (1000 බර තබන ලද) *(x)*** | 2,520 | 61.843 | 86.937 | 0 | 2000 |
| **ජන වාර්ගිකත්වය *(d)*** | 2,520 | 0.206 | 0.404 | 0 | 1 |
| සිංහල ජාතික - *(0)* | 2,001 | | | | |
| සිංහල ජාතික නොවන - *(1)* | 519 | | | | |
| **විවාහක අවිවාහක බව *(d)*** | 2,520 | 0.222 | 0.416 | 0 | 1 |
| කෙදිනක හෝ විවාහ වූ - *(0)* | 1,961 | | | | |
| කිසි දා විවාහ නොවූ - *(1)* | 559 | | | | |
| **රැකියාව *(d)*** | 1,942 | 0.884 | 0.320 | 0 | 1 |
| කළමනා. හා වෘත්තීය රැකියා නොකරන(පුහුණු ශ්‍රමිකයන්)- *(0)* | 732 | | | | |
| කළමනාකරණ හෝ වෘත්තීය රැකියා කරන - *(1)* | 1,210 | | | | |
| **ජීවත්වන ප්‍රදේශ. අයත් අංශය *(d)*** | 2,520 | 0.309 | 0.462 | 0 | 1 |
| නාගරික ව ජීවත් වන - *(0)* | 1,741 | | | | |
| වතු හෝ ග්‍රාමීය ව ජීවත් වන - *(1)* | 779 | | | | |
| **සාක්ෂරතාව *(d)*** | 2,518 | 0.880 | 0.325 | 0 | 1 |
| එක් භාෂාවකට සාක්ෂරතාව පවතින - (0) | 302 | | | | |
| භාෂා දෙකකට හෝ තුනකට සාක්ෂරතාව පවතින - *(1)* | 2,216 | | | | |
| **උපාධිය *(d)*** | 2,520 | 0.541 | 0.498 | 0 | 1 |
| කලා උපාධියක් පවතින - *(0)* | 1,157 | | | | |
| කලා නොවන උපාධිය. ඇති- *(1)* | 1,363 | | | | |

*සටහන:(d) මගින් පඹ විචල්‍යන් නිරූපණය කරයි, (x) මගින් අඛණ්ඩ සංඛ්‍යාත්මක විචල්‍යයන් නිරූපණය කරයි. (0) මගින් පඹ විචල්‍යන්ට අදාළ පදනම් කාණ්ඩය හා (1) අනෙක් කාණ්ඩය නිරූපණය වේ.*

*මූලාශ්‍රය: 2022, ක්ෂුද්‍ර දත්ත භාවිතයෙන් සිදු කළ පර්යේෂකයාගේ ගණනය කිරීම්*

අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලද නියැදියේ 2520 ක් වූ මුළු උපාධිධාරීන් සංඛ්‍යාවෙන් බහුවිධ සුදුසුකමක් හෝ කිහිපයක් වෙත ආයෝජනය කළ උපාධිධාරීන්ගේ අනුපාතය මුළු උපාධිධාරීන්ට සාපේක්ෂ ව 30.67% කි. උපාධිධාරීන් ඇතුළු උපාධිධාරී නොවන LFS (2022) හි 78,275 වූ මුළු නියැදි ප්‍රමාණයෙන් කිසියම් හෝ බහුවිධ සුදුසුකමක් හෝ කිහිපයක් වෙත ආයෝජනය කර ඇත්තේ මුළු පිරිසෙන් 5.50%කි. ඒ අනුව උපාධිධාරී නොවන පිරිසට සාපේක්ෂ ව උපාධිධාරීන් වැඩි වශයෙන් බහුවිධ සුදුසුකමක් හෝ කිහිපයක් වෙනුවෙන් ආයෝජනයන් සිදු කර ඇත.

*ප්‍රස්තාරය 01: ජනවර්ගය අනුව උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජන කර ඇති ආකාරය*




*මූලාශ්‍රය: 2022, ක්ෂුද්‍ර දත්ත භාවිතයෙන් සිදු කළ පර්යේෂකයාගේ ගණනය කිරීම්*

ශ්‍රී ලංකාව තුළ උපාධිධාරීන්ගෙන් වැඩි පිරිසක් සිංහල ජන වර්ගයට අයත් වන අතර, ජනවර්ග අනුව ගත් කල ද වැඩි වශයෙන් ම බහුවිධ සුදුසුකම් මත ආයෝජනයන් සිදු කර ඇත්තේ ද සිංහල ජන වර්ගයට අයත් උපාධිධාරීන් ය. ඒ අනුව සිංහල ජනවර්ගයට අයත් මුළු උපාධිධාරීන්ගෙන් බහුවිධ සුදුසුකම් මත 33.43%ක ප්‍රමාණයක් ආයෝජනය කර ඇත (ප්‍රස්තාරය 01). අනෙකුත් ජනවර්ගයට අයත් උපාධිධාරීන්ට සාපේක්ෂ ව අඩු ම වශයෙන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කර ඇත්තේ දෙමළ ජනවර්ගයට අයත් (ශ්‍රී ලංකා දෙමළ හා ඉන්දියානු දෙමළ) උපාධිධාරීන් ය. මුස්ලිම් හා වෙනත් ජනවර්ගයන් ට අයත් උපාධිධාරීන් ද සිංහල ජනවර්ගයට අයත් උපාධිධාරීන්ට සාපේක්ෂ ව අඩු වශයෙන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කර ඇත. ඒ අනුව ජන වර්ගය අනුව ශ්‍රී ලංකාවේ උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කර ඇති ආකාරය සම්බන්ධව අවධානය යොමු කිරීමේ දී සිංහල නොවන අනෙකුත් ජනවර්ගයන්ට අයත් උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත සිංහල ජන වර්ගයට සාපේක්ෂ ව අඩු වශයෙන් ආයෝජනය කර ඇති බව හඳුනා ගත හැකි වෙයි.

*ප්‍රස්තාරය 02 - රැකියාව අනුව බහුවිධ සුදුසුකම් සහිත හා රහිත උපාධිධාරීන්ගේ ව්‍යාප්තිය*




*මූලාශ්‍රය: 2022, ක්ෂුද්‍ර දත්ත භාවිතයෙන් සිදු කළ පර්යේෂකයාගේ ගණනය කිරීම්*

ප්‍රස්තාරය 02 ට අනුව කළමනාකරණ වෘත්තීන්වල නියැලෙන මුළු උපාධිධාරීන්ගෙන් 44.44% ක තරම් වූ ඉහළ ප්‍රමාණයක් බහුවිධ සුදුසුකම් මත

ආයෝජනය කර ඇත. ඒ අනුව රැකියාව පදනම් කර ගෙන වැඩි ම අනුපාතයක් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කර ඇත්තේ කළමනාකරණ වෘත්තීන්වල නියැලෙන උපාධිධාරියන් ය. කළමනාකරණ රැකියා ක්ෂේත්‍රය ඉතා තරඟකාරී වන අතර, අතිරේක සුදුසුකම් හරහා රැකියා අපේක්ෂකයින්ට තමන්ගේ අද්විතීය භාවය ළඟා කර ගැනීම සඳහා ඔවුන් වැඩි වශයෙන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමට වැඩි ඉඩකඩක් පවතී. එසේම කළමනාකරණ භූමිකාවන් සඳහා නායකත්වය, උපායමාර්ගික චින්තනය සහ තාක්ෂණික දැනුම ඇතුළු පුළුල් කුසලතා සමූහයක් අවශ්‍ය වේ. බහුවිධ සුදුසුකම් මගින් උපාධිධාරීන්ගේ මෙකී කුසලතා සපිරෙන අතර ඔවුන් වැඩි වශයෙන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමට මෙකී හේතු බලපෑ හැකිය. නියැදිය තුළ සිටින මුළු උපාධිධාරීන්ගෙන් 50.72% ප්‍රමාණයක් වෘත්තිකයින් වුවත් උපාධිධාරී මුළු වෘත්තිකයින්ගෙන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කර ඇත්තේ 31.78%ක ප්‍රමාණයකි. තාක්ෂණිකයින් සහ ආශ්‍රිත වෘත්තික මුළු උපාධිධාරීන්ගෙන් බහුවිධ සුදුසුකම් මත ආයෝජන සිදු කර ඇත්තේ 24.53% ක ප්‍රමාණයකි. එය රැකියාවන් අනුව බලන කළ උපාධිධාරීන් විසින් අඩුවෙන් ම බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කළ රැකියා අංශය වේ.

*ප්‍රස්තාරය 03: උපාධි ක්ෂේත්‍රය අනුව බහුවිධ සුදුසුකම් සහිත උපාධිධාරීන්ගේ ව්‍යාප්තිය*




*මූලාශ්‍රය: 2022, ක්ෂුද්‍ර දත්ත භාවිතයෙන් සිදු කළ පර්යේෂකයාගේ ගණනය කිරීම්*

ප්‍රස්තාරය 03 මගින් දැක්වෙන්නේ එක් එක් උපාධි ක්ෂේත්‍රයට අනුව අදාළ උපාධිය හදාරා ඇති උපාධිධාරීන්ගෙන් කොපමණ ප්‍රතිශතයක් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කර තිබේ ද යන්න යි. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ බහුතරයක් වූ කලා උපාධිධාරීන්ගෙන් 23.85%ක ප්‍රමාණයක් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කර ඇත. වෙනත් උපාධි ක්ෂේත්‍ර යන කොටසට අදාළ මුළු උපාධිධාරීන්ගෙන් 59.35%ක් තරම් වූ ඉහළ ප්‍රතිශතයක් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය සිදු කර ඇති අතර, එය ඉහළ ම ප්‍රතිශතය වශයෙන් ද හඳුනා ගත හැක (ප්‍රස්තාරය 03). එය හැරුණු විට වර්තමාන ශ්‍රම වෙළඳපොළ තුළ වඩාත් තරඟකාරී හා ඉහළ රැකියා අවස්ථා පවතින

තොරතුරු තාක්ෂණික හා ව්‍යාපාර ආශ්‍රිත රැකියා සඳහා අදාළ වන උපාධි පාඨමාලා (පරිගණක විද්‍යාව/ IT, කළමනාකරණ, වාණිජ උපාධි පාඨමාලා) හදාරන උපාධිධාරීන්ගෙන් සැලකිය යුතු පිරිසක් (ආසන්න වශයෙන් අදාළ පාඨමාලාවන් හදාරන උපාධිධාරීන්ගෙන් 36% ක ප්‍රමාණයක්) බහුවිධ සුදුසුකම් මත ආයෝජනයන් සිදු කර ඇත.

*ප්‍රස්තාරය 04: සාක්ෂරතාව අනුව බහුවිධ සුදුසුකම් සහිත හා රහිත උපාධිධාරීන්ගේ ව්‍යාප්තිය*




*මූලාශ්‍රය: 2022, ක්ෂුද්‍ර දත්ත භාවිතයෙන් සිදු කළ පර්යේෂකයාගේ ගණනය කිරීම්*

ප්‍රස්තාරය 04 මගින් දැක්වෙන්නේ සාක්ෂරතාව අනුව බහුවිධ සුදුසුකම් සහිත හා රහිත උපාධිධාරීන්ගේ ව්‍යාප්ති ප්‍රතිශතය යි. ඒ අනුව සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා අතරින් භාෂා දෙකකට පමණක් සාක්ෂරතාව පවතින මුළු උපාධිධාරීන් අතරින් 32.85%ක් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කර ඇත. මෙහි දී විශේෂයෙන් දැක ගත හැකි තත්ත්වයක් වන්නේ අදාළ භාෂා අතරින් එක් භාෂාවකට වඩා උපාධිධාරීන්ට සාක්ෂරතාව පවතින්නේ නම් (එනම් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා අතරින් භාෂා දෙකකට හෝ භාෂා තුනට සාක්ෂරතාව පවතින) ඔවුන් වැඩි වශයෙන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කර ඇති බවයි. බහු භාෂා සාක්ෂරතාව විවිධ අධ්‍යාපන හා රැකියා අවස්ථාවන් ළඟා කර ගැනීම සඳහා බොහෝ විට හේතු වෙයි. බහු භාෂා කුසලතා ඇති උපාධිධාරීන්ට පුළුල් පරාසයක අධ්‍යාපනික වැඩසටහන්, ශිෂ්‍යත්ව සහ රැකියා අවස්ථා සඳහා වැඩි ප්‍රවේශයක් තිබිය හැකි අතර, ඒ අනුව බහු භාෂා සාක්ෂරතාව උපාධිධාරීන්ට අදාළ ව පවතින්නේ නම් එය බහුවිධ සුදුසුකම් සඳහා කරන ආයෝජනය දිරි ගැන්වීමට හේතු පාදක වේ.

*ප්‍රස්තාරය 05: බහුවිධ සුදුසුකම් අනුව උපාධිධාරීන්ගේ සේවා නියුක්ති තත්ත්වය*




*මූලාශ්‍රය: 2022, ක්ෂුද්‍ර දත්ත භාවිතයෙන් සිදු කළ පර්යේෂකයාගේ ගණනය කිරීම්*

නියැදියේ මුළු පිරිමි උපාධිධාරීන් හා මුළු කාන්තා උපාධිධාරීන් අතරින් වැඩි වශයෙන් ම බහුවිධ සුදුසුකම් මත ආයෝජනයන් සිදු කර ඇත්තේ පිරිමි උපාධිධාරීන් ය (ප්‍රස්තාර ය 05). ඒ අනුව මුළු පිරිමි උපාධිධාරීන්ගෙන් 33.43%ක ප්‍රමාණයක් බහුවිධ සුදුසුකම් මත ආයෝජනයන් සිදු කර ඇති අතර කාන්තා උපාධිධාරීන්ට අදාළ ව එම ප්‍රමාණාත්මක අනුපාතය 29%කි. විශේෂයෙන් ම ශ්‍රී ලංකාව තුළ, කාන්තා උපාධිධාරීන්, පිරිමි උපාධිධාරීන්ට සාපේක්ෂව බහුවිධ සුදුසුකම් සඳහා සිදු කරනු ලබන ආයෝජනය අඩු වීමට සාධක කිහිපයක් හේතු විය හැක. ඒ අනුව සමාජීය වශයෙන් සලකා බලන විට සාම්ප්‍රදායික ව බොහෝ විට කාන්තාවන්ට වැඩි වගකීම් සමුදායක් පවතී. විශේෂයෙන් විවාහයෙන් පසුව, ඔවුන් වැඩිදුර අධ්‍යාපනය සඳහා ඔවුන්ගේ අවස්ථා සහ අමතර සුදුසුකම් සඳහා ආයෝජනය කිරීම සීමා කරයි. මෙම වගකීම්වලට ගෘහ කළමනාකරණය සහ ළමා රැකවරණය ඇතුළත් වන අතර එමඟින් කාන්තාවන්ගේ කාලය හා සම්පත් සීමා වීමක් සිදු වේ. මීට අමතර ව, අධ්‍යාපනික සහ වෘත්තීය අවස්ථා සඳහා ප්‍රවේශය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විෂමතා මෙම තත්ත්වය කෙරෙහි තවදුරටත් බලපෑම් එල්ල කල හැක

*ප්‍රස්තාරය 06: මාසික ආදායම් කාණ්ඩ අනුව බහුවිධ සුදුසුකම් සහිත උපාධිධාරීන්ගේ ව්‍යාප්තිය*




*මූලාශ්‍රය: 2022, ක්ෂුද්‍ර දත්ත භාවිතයෙන් සිදු කළ පර්යේෂකයාගේ ගණනය කිරීම්*

මාසික ආදායම් තත්ත්වය අනුව බහුවිධ සුදුසුකම් සහිත උපාධිධාරීන්ගේ ව්‍යාප්ති අනුපාතය ප්‍රස්තාර අංක 06 තුළින් දැක්වේ. ඒ අනුව මාසික ආදායම රු.120,000 හා ඊට වැඩි ආදායම් ලබන උපාධිධාරීන්ගෙන් 42.27% ක ප්‍රමාණයක් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කර ඇත. මාසික ආදායම රු.30,000 - රු.59,999 අතර ආදායම් ලබන මුළු උපාධිධාරීන්ගෙන් 23.79% ක ප්‍රමාණයක් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කර ඇති අතර එය අනෙකුත් ආදායම් කාණ්ඩ හා සැසඳීමේ දී අඩු අගයකි. ආදායම වැඩිවෙත් ම උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමට නැඹුරු වීමක් ප්‍රස්තාරය 06 තුළින් දැක ගත හැක. ඉහළ ආදායම් මට්ටම් සහිත උපාධිධාරීන්ට ඉහළ මූල්‍ය සම්පත් පැවතීමේ හැකියාවක් ඇති අතර, ඒ තුළින් උපාධිධාරීන්ට අමතර

සුදුසුකම් මත ආයෝජනය කිරීමේ හැකියාව ඉහළ නංවයි. තවද, ඉහළ ආදායම් ඇති පුද්ගලයන් බහුවිධ සුදුසුකම් ලබා ගැනීමෙන් ආයෝජනය මත සැලකිය යුතු ප්‍රතිලාභයක් ලබා ගැනීමට වැඩි ඉඩක් ඇත. මන්ද මෙම බහුවිධ සුදුසුකම් තවදුරටත් වෘත්තීය දියුණුව, ඉහළ වැටුප් සහ වඩා හොඳ රැකියා සුරක්ෂිතභාවයකට හේතු විය හැකි බැවිනි. අනෙක් අතට, අඩු ආදායම්ලාභී උපාධිධාරීන් වැඩිදුර බහුවිධ සුදුසුකම් සඳහා ආයෝජනය කිරීමට වඩා ක්ෂණික මූල්‍ය අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දිය හැකිය. මන්ද ඔවුන්ගේ සීමිත සම්පත් අමතර සුදුසුකම් ලබා ගැනීමේ හැකියාව සීමා කරන බැවිනි.

*වගුව 04: ද්විමය ලොජිස්ටික් ප්‍රතිපායන විශ්ලේෂණයේ ප්‍රතිඵල සහ එහි සාමාන්‍ය ආන්තික බලපෑම*

| බහුවිධ සුදුසුකම් පැවතීම *(y)* | සංගුණකය | dy/dx | සම්මත දෝෂය | z | P>z |
|---|---|---|---|---|---|
| වයස *(x)* | 0.023* | 0.005* | 0.005 | 4.28 | 0.000 |
| පිරිමි වීම *(d)* | -0.080 | -0.016 | 0.109 | -0.74 | 0.460 |
| මාසික ආදායම *(x)* | 0.002* | 0.000* | 0.001 | 2.84 | 0.005 |
| සිංහල නොවන *(d)* | -0.768* | -0.153* | 0.142 | -5.40 | 0.000 |
| අවිවාහක *(d)* | -0.123 | -0.025 | 0.147 | -0.84 | 0.402 |
| කළමනාකරණ හෝ වෘත්තීය රැකියා කරන *(d)* | 0.195* | 0.039* | 0.112 | 1.74 | 0.081 |
| වතු හෝ ග්‍රාමීය ව ජීවත් වන *(d)* | -0.170 | -0.034 | 0.115 | -1.48 | 0.140 |
| භාෂා 2කට හෝ 3කට සාක්ෂරතාව ඇති *(d)* | 0.640* | 0.128* | 0.187 | 3.42 | 0.001 |
| කලා නොවන උපාධියක් ඇති *(d)* | 0.239* | 0.048* | 0.119 | 2.01 | 0.044 |
| අන්තඃකණ්ඩය | -2.423* | 0.005* | 0.316 | -7.67 | 0.000 |
| | | | | Number of obs = | 1,942 |
| | | | | LR chi2(9) = | 127.99 |
| | | | | Prob > chi2 = | 0.000 |
| | | | | Pseudo R2 = | 0.053 |

*සටහන: (d) මගින් පඹ විචල්‍යයන් නිරූපණය කරයි, (x) මගින් අඛණ්ඩ සංඛ්‍යාත්මක විචල්‍යයන් නිරූපණය කරයි. (*) මගින් ප්‍රතිපායනයේ වෙසෙසියාත්මක[1] වූ විචල්‍යයන්ට අදාළ සංගුණක පෙන්වා දෙයි.*

*මූලාශ්‍රය: 2022, ක්ෂුද්‍ර දත්ත භාවිතයෙන් සිදු කළ පර්යේෂකයාගේ ගණනය කිරීම්*

[1] *අධ්‍යයනයේ සියලු විශ්ලේෂණයන් ට අදාළ ව වෙසෙසියාත්මක මට්ටම ($P \leq 0.10$) යන $P$ අගය මත තීරණය කර ඇත.*

**පදනම් කාණ්ඩය :** ප්‍රතිපායන ආකෘතිය 01 සඳහා යොදා ගන්නා ලද පඹ විචල්‍යන්ට අදාළ ව පදනම් කාණ්ඩය වන්නේ සිංහල ජන වර්ගයට අයත් , විවාහක, කළමනාකරණ හෝ වෘත්තීය නොවන රැකියා සිදු කරන (පුහුණු ශ්‍රමිකයන් වන), නාගරික ප්‍රදේශවල ජීවත් වන, එක් භාෂාවක් සඳහා සාක්ෂරතාව පවතින, කලා උපාධියක් සහිත කාන්තා උපාධිධාරීන් වේ.

ශ්‍රී ලංකාවේ උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමට බලපාන සාධක හඳුනා ගැනීම සඳහා සිදු කළ Binary Logit Regression ආකෘතිය සමහර වශයෙන් වෙසෙසියාත්මක වූ අතර (Prob > chi2 = 0.000), විශ්ලේෂණයට අදාළ ව වයස, මාසික ආදායම, ජන වාර්ගිකත්වය, භාෂා සාක්ෂරතාව, උපාධි ක්ෂේත්‍රය යන විචල්‍යයන් බහුවිධ සුදුසුකම් මත උපාධිධාරීන්ගේ ආයෝජන කෙරෙහි වෙසෙසියාත්මක බලපෑමක් ඇති කරන බව තහවුරු විය. එසේ ම ස්ත්‍රී පුරුෂ බව, විවාහක අවිවාහක බව, රැකියාව, ජීවත් වන ප්‍රදේශය අයත් අංශය යන විචල්‍යයන් බහුවිධ සුදුසුකම් මත උපාධිධාරීන්ගේ ආයෝජන කෙරෙහි වෙසෙසියාත්මක බලපෑමක් ඇති නොකරන බව තහවුරු විය.

ඇස්තමේන්තු කරන ලද ප්‍රතිපායන ආකෘතියට අනුව වයස යන සාධකය සහ උපාධිධාරීන්ගේ බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමට ඇති හැකියාව අතර ධන සම්බන්ධතාවයක් පවතී (0.023). එනම් වයස ඒකකයකින් වැඩිවෙත් ම උපාධිධාරින් බහුවිධ සුදුසුකම් වෙත ආයෝජනය කිරීමට ඇති හැකියාව 0.05% වැඩි වන බවයි. පුද්ගලයන් තරුණ වියට සාපේක්ෂව වයසින් වැඩි වන විට, ඔවුන්ගේ ආයෝජන තීරණ වැඩිදියුණු කරන තවත් සුදුසුකම් හෝ අත්දැකීම් ලබා ගත හැක. වයස වැඩිවෙත් ම මූල්‍ය ස්ථාවරත්වය වැඩි වීම, ආයෝජන අවස්ථා පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීම වැනි කරුණු නිසා බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමට වැඩි අවකාශයක් පවතී. මානව ප්‍රාග්ධන න්‍යායට අනුව, පුද්ගලයන් අධ්‍යාපනය සහ සේවා පළපුරුද්ද තුළින් කාලයත් සමඟ කුසලතා, දැනුම සහ සුදුසුකම් ලබා ගනී. පුද්ගලයන්ගේ වයස වැඩිවෙත් ම ඒ තුළින් වැඩි අත්දැකීම් ලබා ගන්නා විට, ඔවුන්ගේ ආයෝජන තීරණ කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළ හැකි ඉහළ මට්ටමේ මානව ප්‍රාග්ධනයක් ඔවුන් සතු වේ.

එසේ ම උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමට ඇති හැකියාව හා ආදායම යන සාධකය සමඟ පවතින්නේ ධන සම්බන්ධතාවකි. ඉහළ ආදායම් මට්ටම් ඔස්සේ පුද්ගලයන්ට අමතර සුදුසුකම් වෙත ආයෝජනය කිරීමට වඩාත් ශක්‍යතාවයක් හිමි වේ. එබැවින්, ආදායම වැඩි වන විට, බහුවිධ සුදුසුකම් ලබා ගැනීම සඳහා පුද්ගලයන් ආයෝජනයන් වැඩි කිරීමට වැඩි ඉඩක් ඇත. අධ්‍යාපනය අත් කර ගැනීම් සහ ආදායම අතර ධන සම්බන්ධතාවය තහවුරු කරන, (Carvalhaes et al., 2023) විසින් සිදු කර ඇති පර්යේෂණයේ සොයා ගැනීම් සමඟ මෙම තත්ත්වය සමපාත වේ.

උපාධිධාරී තැනැත්තා සිංහල ජාතිකයකු නොවීම, බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමට ඇති හැකියාව අඩු කිරීම සඳහා හේතුවේ. එනම් උපාධිධාරී පුද්ගලයා සිංහල ජාතිකයකු වන්නේ නම් ඔහු කිසියම් හෝ බහුවිධ සුදුසුකමක් මත ආයෝජනය කර

තිබීමේ වැඩි සම්භාවිතාවක් පවතින බවයි. මෙහි දී ජනවාර්ගික කණ්ඩායම් අතර ආයෝජන හැසිරීම්වල වෙනස්කම්වලට සමාජ ආර්ථික විෂමතා හෝ සංස්කෘතික සාධක දායක විය හැක. සිංහල නොවන උපාධිධාරීන් සිංහල උපාධිධාරීන් හා සසඳන විට සම්පත් සඳහා අසමාන ප්‍රවේශය හෝ බහු සුදුසුකම් සඳහා ආයෝජනය කිරීම අධෛර්යමත් කරන සංස්කෘතික සම්මතයන් වැනි බාධකවලට මුහුණ දිය හැකිය. විශේෂයෙන් ම ජනවාර්ගික පදනම මත සුදුසුකම් මත ආයෝජනය කිරීමට ඇති හැකියාවේ වෙනස්කම් සඳහා බලපාන හේතු සම්බන්ධ ව එක්සත් ජනපදය පදනම් කර ගනිමින් (Neal, 2006) විසින් අධ්‍යයනයක් සිදු කර ඇති අතර එයට අනුව කළු-සුදු ජන වර්ග අතර කුසලතා සහ සුදුසුකම් සම්බන්ධයෙන් පවතින වාර්ගික විෂමතා සඳහා හේතු වන සාධක ලෙස වෙනස් කොට සැලකීම, පවුල් ව්‍යුහයේ වෙනස්කම්, ගෘහ ආදායම සහ අධ්‍යාපන ප්‍රතිපත්ති වැනි සමාජ ආර්ථික සංස්කෘතික සාධක බලපාන බව තහවුරු කර ඇත.

මීළඟට බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමට ඇති හැකියාව කෙරෙහි උපාධිධාරියා කළමනාකරණ හා වෘත්තීය රැකියා කරන අයෙකු වීම ඇති කරනු ලබන්නේ ධනාත්මක බලපෑමකි (0.039). එනම් උපාධිධාරියෙකු කළමනාකරණ හා වෘත්තීය රැකියාවක් සිදු කරන්නේ නම් ඔහු බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමට (පුහුණු ශ්‍රමික රැකියා සිදු කරන්නෙකුට සාපේක්ෂව) වැඩි සම්භාවිතාවක් ඇති බවයි. කළමනාකරණ නොවන වෘත්තීන් හා සසඳන විට කළමනාකරණ හා වෘත්තීය රැකියා බොහෝවිට ඉහළ වැටුප් සහ වැඩි රැකියා ස්ථාවරත්වයක් සහිත වෘත්තීන් වේ. කළමනාකරණ තනතුරුවල සිටින පුද්ගලයින්ට අමතර සුදුසුකම් හෝ පුහුණුව සඳහා ආයෝජනය කිරීමට වැඩි මූල්‍ය සම්පත් පවතී. කළමනාකරණ තනතුරු සඳහා උසස් නිපුණතා සහ සුදුසුකම් අවශ්‍ය වන අතර, මෙම භූමිකාවන්හි සිටින පුද්ගලයින් තම වෘත්තීය දියුණුව සඳහා වැඩිදුර අධ්‍යාපනය හෝ වෘත්තීය සංවර්ධනය සඳහා ආයෝජනය කිරීමට වැඩි ඉඩක් ඇත.

එසේම උපාධිධාරියෙකුට භාෂා දෙකක් හෝ තුනක් සඳහා සාක්ෂරතාව පැවතීම, එක් භාෂාවක් සඳහා සාක්ෂරතාව පවතින උපාධිධාරියෙකුට සාපේක්ෂව බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමේ හැකියාව කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරයි. එනම් භාෂා දෙකක් හෝ තුනක් සඳහා උපාධිධාරියෙකුට සාක්ෂරතාව පවතින්නේ නම් එම උපාධිධාරියා බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමට වැඩි සම්භාවිතාවයක් තිබෙන බවයි. බහු භාෂා ප්‍රවීණත්වය නව සුදුසුකම් ලබා ගැනීමට සහ විවිධ අධ්‍යාපනික පරිසරයන් සඳහා අනුවර්තනය වීමට ඉතා වැදගත් වේ. බහු භාෂා ප්‍රවණතාව විවිධ අධ්‍යාපන හා රැකියා අවස්ථාවන් ලබා කර ගැනීම සඳහා බොහෝ විට හේතු වෙයි. භාෂා කුසලතා ඇති පුද්ගලයින්ට පුළුල් පරාසයක අධ්‍යාපනික වැඩසටහන්, ශිෂ්‍යත්ව සහ රැකියා අවස්ථා සඳහා වැඩි ප්‍රවේශයක් තිබිය හැකි අතර, එය බහුවිධ සුදුසුකම් සඳහා කරන ආයෝජනය දිරි ගැන්වීමට හේතු වේ. ගෝලීයකරණය වූ ලෝකයක, බහු භාෂා පිළිබඳ ප්‍රවණතාව වඩාත් වටිනා මානව ප්‍රාග්ධනයකි. භාෂා කුසලතා ඇති පුද්ගලයින් බහු සංස්කෘතික

පරිසරයක් තුළ වැඩ කිරීමට සහ සහයෝගයෙන් කටයුතු කිරීමට වඩා වැඩි අවස්ථාවක් පවති, එය අනෙක් අතට බහුවිධ සුදුසුකම් සඳහා ආයෝජනය කිරීමේ හැකියාව වැඩි දියුණු කරයි. වෘත්තීය නිපුණතා අත්පත් කර ගැනීම සඳහා සාක්ෂරතාවයේ බලපෑම සම්බන්ධව (Adedokun & Oluwagbohumni 2013) විසින් සිදු කර ඇති පර්යේෂණයේ සොයා ගැනීම් මගින් ද තහවුරු කරනුයේ මීට සමාන තත්ත්වයකි.

මීළඟට උපාධිධාරියා කලා උපාධිධාරියෙකු නොවීම, බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමේ හැකියාව කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරයි. එනම් උපාධිධාරියා කලා උපාධිධාරියෙකු නො වීම හේතුවෙන් අදාළ උපාධිධාරියාට බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීමට වැඩි සම්භාවිතාවක් පවතින බවයි.

## 5. නිගමනය

විශ්ලේෂණයේ ප්‍රතිඵල ශ්‍රී ලංකාවට අදාළව උපාධිධාරීන්ගේ බහුවිධ සුදුසුකම් සම්බන්ධව සොයා ගැනීම් කිහිපයක් හෙළිදරව් කරයි. පළමුව වයස, ආදායම, ජන වාර්ගිකත්වය, භාෂා සාක්ෂරතාව, රැකියාව සහ උපාධි ක්ෂේත්‍රය, බහුවිධ සුදුසුකම් සඳහා උපාධිධාරීන්ගේ ආයෝජන තීරණ කෙරෙහි සැලකිය යුතු ලෙස බලපාන බව නිරීක්ෂණය විය. විශේෂයෙන්, වයස වැඩිවෙත් ම සහ ඉහළ ආදායම් ලබන අය වැඩි වශයෙන් බහුවිධ සුදුසුකම් සඳහා ආයෝජනය කිරීමට වැඩි අවස්ථාවක් ඇත. උපාධිධාරීන් සිංහල නොවන වෙනත් ජන වර්ගයකට අයත් වීම බහුවිධ සුදුසුකම් සඳහා උපාධිධාරීන්ගේ ආයෝජන තීරණ කෙරෙහි ඍණාත්මක බලපෑමක් පෙන්නුම් කරයි. භාෂා එකකට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා සාක්ෂරතාව පවතින උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජන කිරීම සඳහා නැඹුරුතාවයක් පෙන්නුම් කරයි. මීට අමතරව, කලා නොවන උපාධි සහිත උපාධිධාරීන්, කලා උපාධි සහිත උපාධිධාරීන් හා සසඳන විට බහුවිධ සුදුසුකම් සඳහා ආයෝජනය කිරීමට වැඩි නැඹුරුතාවයක් පෙන්නුම් කරයි. මෙම සොයා ගැනීම් උපාධිධාරීන්ගේ බහුවිධ සුදුසුකම් මත වන ආයෝජන හැසිරීම් හඳුනා ගැනීමේ දී සමාජ ආර්ථික සාධකවල බලපෑම සම්බන්ධව අවධාරණය කරන අතර ම ශ්‍රී ලංකාවේ උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීම සම්බන්ධව අවබෝධයන් කිහිපයක් ඉස්මතු කරයි.

බහුවිධ සුදුසුකම් වෙත උපාධිධාරීන්ගේ ආයෝජන තීරක: විශ්ලේෂණය මගින් උපාධිධාරීන් අතර ප්‍රජා විද්‍යාත්මක සාධක (වයස, ජන වාර්ගිකත්වය), මාසික ආදායම, භාෂා සාක්ෂරතාව, රැකියාව, උපාධි ක්ෂේත්‍රය යන සාධක සහ ආයෝජන හැසිරීම් අතර පවත්නා සහසම්බන්ධතා අනාවරණය විය. ඒ අනුව මෙම සොයා ගැනීම්වලට අනුව උපාධිධාරීන්ගේ ඵලදායී ආයෝජන කෙරෙහි දැනුවත් භාවයෙන් යුතු ව තීරණ ගැනීම සඳහා පහසුකම් සැලසීමට සමාජ ආර්ථික විෂමතා විසඳීම, භාෂා කීපයක් සඳහා සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම පර්යේෂණ සොයා ගැනීම් මගින් අවධාරණය කරයි.

## 6. කෘතඥතාව

ශ්‍රී ලංකාවේ උපාධිධාරීන් බහුවිධ සුදුසුකම් මත ආයෝජනය කිරීම සඳහා බලපාන සාධක සම්බන්ධව අධ්‍යයනය කිරීම යන මාතෘකාව යටතේ සිදු කළ මෙම පර්යේෂණය සාර්ථකව සිදු කර ගැනීමට මූලික වශයෙන් අවශ්‍ය වූ, දත්ත ලබා ගන්නා ලද්දේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද 2022 ශ්‍රම බලකා සමීක්ෂණය පදනම් කර ගනිමිනි. එබැවින් එම අදාළ සමීක්ෂණය හරහා එක් රැස් කර ගන්නා ලද දත්ත වෙත ප්‍රවේශය ලබා දීම සම්බන්ධයෙන් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට ස්තූතිය පුද කරමි.

## 7. ආශ්‍රිත ග්‍රන්ථ

Adedokun, M. O., & Oluwagbohumni, M. F. (2013). The Impact of Literacy on Vocational Skills Acquisition for Better Community Participation. *International Journal of Education and Literacy Studies*, 1(2), 12-17.

Ambepitiya, K. R. . (2016). Employability of graduates of public and private management education institutes: A case study of two institutes in Sri Lanka.

Bai, L., Bao, T., Zhang, K., Shi, H., Wang, Z., & Bai, S. (2020). Influencing factors for the promotion of international vocational qualification and certification: Evidences from international project manager professionals in china. *Sustainability*, 12(5), 1772.

Becker, G. S. (2009). Human capital: A theoretical and empirical analysis, with special reference to education. *University of Chicago press*.

Bergan, S. (2007). Qualifications: introduction to a concept (Vol. 6). *Council of Europe*.

Castro, J., Ortega, L., Yamada, G., & Mata, D. (2022). The magnitude and predictors of Overeducation and Overskilling in Latin America: Evidence from PIAAC.

Chevalier, A., & Lindley, J. (2009). Overeducation and the skills of UK graduates. *of the Royal Statistical Society Series A: Statistics in Society*, 172(2), 307-337.

Daguplo, M. (2017). Binary logistic predictive model in determining students' intention to take higher education. *Pacific Journal of Multidisciplinary Research*, 5(4), 138-143.

Department of Census and Statistics. (2023). Annual Report of the Sri Lanka Labour Force Survey 2022.

Estévez-Abe, M. (2005). Gender bias in skills and social policies: The varieties of capitalism perspective on sex segregation. *Social Politics: International Studies in Gender, State & Society*, 12(2), 180-215.

Feldman, S. D. (1973). Impediment or stimulant? Marital status and graduate education. *American Journal of Sociology*, 78(4), 982-994.

Gunarathne, L., & Jayasinghe, C. L. (2021). Factors affecting unemployment

duration of the science and arts stream university graduates in Sri Lanka. *Advanced Journal of Social Science*, 8(1), 96-120.

Hashim, H. H., & Ghani, E. K. (2020). Belief, Preference and Constraint Factors influencing Malaysian accounting students' intention to pursue professional qualification. *Journal of Educational Research*, 8(3), 1078-1091.

Heiskanen, E., Thidell, Å., & Rodhe, H. (2016). Educating sustainability change agents: The importance of practical skills and experience. *Journal of Cleaner Production*, 123, 218-226.

IMB. (2021, 12 07). *Binary logistic regression*. Retrieved from IMB: https://www.ibm.com/docs/en/spss-statistics/beta?topic=regression-binary-logistic

Indeed Editorial Team. (2023, August 25). *Qualifications vs. Skills: Definition, Differences and Examples*. Retrieved from Indeed: https://www.indeed.com/career-advice/career-development/qualifications-vs-skills

Kakooza, V., Wamala, R., Wokadala, J., & Bwire, T. (2019). Do Graduates from Arts-Related Disciplines have a Higher Impact on Unemployment than Graduates from the Science-Related Disciplines?

Liu, S., & Wang, M. (2012). Perceived overqualification: A review and recommendations for research and practice. The role of the economic crisis on occupational stress and well being. 1-42.

Mlambo, V. (2011). An analysis of some factors affecting student academic performance in an introductory biochemistry course at the University of the West Indies. *The Caribbean Teaching Scholar*.

Munzara, A. T., & Sunge, R. (n.d.). 2015. *Human Capital Investment Decisions: A Logit Model of Willingness to Attain Professional Teaching Qualifications by Uncertified Graduate Teachers in Harare Province, Zimbabwe*.

Neal, D. (2006). Why has black–white skill convergence stopped? *Handbook of the Economics of Education*, 1, 511-576.

Pushpakumara, M., Ranasinghe, A., & Siddhisena, P. (2016). Can graduates increase earnings by acquiring multiple qualifications? *Sri Lanka Forum of University Economists (SLFUE), Department of Economics, Faculty of Social Sciences, University of Kelaniya*.

Rahman, A. U., & Uddin, S. (2009). Statistical Analysis of Different Socio Economic Factors Affecting Education of NW. FP (Pakistan). *Journal of applied quantitative methods*, 4(1), 88-94.

Rivera, L. A. (2011). Ivies, extracurriculars, and exclusion: Elite employers' use of educational credentials. *Research in Social Stratification and Mobility*, 29(1), 71-90.

Senarath, S. A. C. L., & Patabendige, S. S. J. (2014). Job-education mismatch

among the graduates. *A Sri Lankan perspective. Ruhuna Journal of Management and Finance*, 1(2), 1-16.

Spence, M. (1974). Competitive and optimal responses to signals: An analysis of efficiency and distribution. *Journal of Economic theory*, 7(3), 296-332.

UNESCO. (2011). *International Standard Classification of education*. Retrieved fromUNESCO:https://uis.unesco.org /sites/default/files/documents/international-standard-classification-of-education-isced-2011-en.pdf

Wang, L. ( 2023, September 4). *Qualifications recognition: a door to collective progress*. Retrieved from UNESCO: https://www.unesco.org/en/articles/qualifications-recognition-door-collective-progress

Wion, S. A. R. (1999). Sri Lanka A Fresh Look at Unemployment.